325 වන කාණ්ඩය - 12 වන කලාපය
தொகுதி 325 - இல. 12
Volume 325 - No. 12

2026 මාර්තු 17වන අඟහරුවාදා
2026 மார்ச் 17, செவ்வாய்க்கிழமை
Tuesday, 17th March, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය [තීරුව 2101]
"ශ්‍රී ලංකා සර්ට්" මඟින් පවත්වන වැඩමුළුව [තීරුව 2101]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 2107]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 2109-2151]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
මැද පෙරදිග යුද තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක්ව ඇති බලශක්ති සුරක්ෂිතතාව [තීරුව 2151]
ක්‍රිප්ටෝ මුදල් සහ ඩිජිටල් වත්කම් ගනුදෙනු නියාමනය [තීරුව 2163]

**දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 2165]

**සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 2166]

**බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 2166]

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවා නියුක්තයන්:**
පාරිශ්‍රමික හා සේවා කොන්දේසි [තීරු 2168-2284]

**කල්තැබීමේ යෝජනාව:**
සංවර්ධන නිලධාරින්ගේ වැටුප් ගැටලු විසඳීම [තීරු 2285-2294]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 2295-2296]

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
சபாநாயகரது சான்றுரை [ப: 2101]
SLCERTஇனால் நடாத்தப்படும் கருத்தரங்கு [ப: 2101]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 2107]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 2109-2151]

**தனி அறிவித்தல் மூல வினா:**
மத்திய கிழக்கில் நிலவும் போர்ச் சூழலால் தாக்கத்துக்குள்ளான வலுசக்தி பாதுகாப்பு [ப: 2151]
CRYPTOCURRENCY மற்றும் டிஜிட்டல் சொத்து பரிவர்த்தனைகளின் ஒழுங்குமுறை [ப: 2163]

**உண்ணாட்டரசிறை (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 2165]

**சமூகப் பாதுகாப்பு உதவுதொகை அறவீடு (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 2166]

**மீட்பு, புனர்வாழ்வு மற்றும் கடனிறுக்கவகையின்மை (கூட்டிணைப்பு மற்றும் தனிப்பட்ட) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 2166]

**இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவின் அலுவலர்கள் மற்றும் ஊழியர்கள்:**
வேதனம் மற்றும் சேவை நிபந்தனைகள் [ப: 2168-2284]

**ஒத்திவைப்புப் பிரேரணை:**
அபிவிருத்தி உத்தியோகத்தர்களின் சம்பளப் பிரச்சினைகளுக்குத் தீர்வு காணல் [ப: 2285-2294]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 2295-2296]

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate [Col. 2101]
Workshop Conducted by SLCERT [Col. 2101]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 2107]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2109-2151]

QUESTION BY PRIVATE NOTICE:
Energy Security Impacted by Middle East War Situation [Col. 2151]
Regulation of Cryptocurrency and Digital Asset Transactions [Col.2163]

INLAND REVENUE (AMENDMENT) BILL:
Read the First time [Col. 2165]

SOCIAL SECURITY CONTRIBUTION LEVY (AMENDMENT) BILL:
Read the First time [Col. 2166]

RESCUE, REHABILITATION AND INSOLVENCY (CORPORATE AND PERSONAL) BILL
Read the First time [Col. 2166]

OFFICERS AND EMPLOYEES OF THE COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION: REMUNERATION AND CONDITIONS OF SERVICE [Cols. 2168-2284]

ADJOURNMENT MOTION :
Resolution of Salary Issues of Development Officers [Cols. 2285-2294]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 2295-2296]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 මාර්තු 17වන අඟහරුවාදා***
*2026 மார்ச் 17, செவ்வாய்க்கிழமை*
*Tuesday, 17th March, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
*சபாநாயகரது சான்றுரை*
SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මවිසින් 2026 මාර්තු 06 දින "විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන)" හා "අධිකරණ සංවිධාන (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත්හි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## II

### "ශ්‍රී ලංකා සර්ට්" මඟින් පවත්වන වැඩමුළුව
SLCERTஇனால் நடாத்தப்படும் கருத்தரங்கு
WORKSHOP CONDUCTED BY SLCERT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

රජයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සමගාමීව, සයිබර් ආරක්ෂණ දැනුවත්භාවය, ආරක්ෂිත ඩිජිටල් භාවිතය, නායකත්ව වගකීම සහ ඩිජිටල් ක්ෂේත්‍රයේ වගවීම ඇතුළු ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින්, "ඩිජිටල් යුගයේ සයිබර් තර්ජනවලට මුහුණ දීම" පිළිබඳව ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (ශ්‍රී ලංකා සර්ට්) විසින් මෙහෙයවනු ලබන වැඩමුළුවක් සියලු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා අද දින පස්වරු 1.30 සිට පස්වරු 3.30 දක්වා කාරක සභා කාමර අංක 1 හිදී පැවැත්වීමට නියමිත බැවින්, එම වැඩමුළුව සඳහා සහභාගි වන මෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත දැනුම් දීමට කැමැත්තෙමි.

## III

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2026 මාර්තු 17වන අඟහරුවාදා, එනම් අද දින පූර්ව භාග 11.45 ට කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the -

(i) Annual Report and Accounts of the University of Moratuwa for the year 2023; and

(ii) Annual Report and Annual Accounts of the Institute of Technology of the University of Moratuwa for the year 2024.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the -

(i) Annual Report of the Hotel Developers (Lanka) Ltd. for the year 2024; and

(ii) Annual Report of the Sri Lanka Accounting and Auditing Standards Monitoring Board for the year 2024.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Economic Development and International Relations.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I present the -

(i) Regulations made by the Minister of Defence under Sections 29 and 155 of the Army Act (Chapter 357) and published in Gazette Extraordinary No. 2423/34 of 15th February, 2025;

(ii) Regulations made by the Minister of Defence under Section 161 of the Navy Act (Chapter 358) and published in Gazette Extraordinary No. 2423/35 of 15th February, 2025; and

(iii) Regulations made by the Minister of Defence under Sections 29 and 155 of the Air Force Act (Chapter 359) and published in Gazette Extraordinary No. 2423/36 of 15th February, 2025.

I move that these Regulations be referred to the Ministerial Consultative Committee on Defence.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I present the Rules made by the Chairperson of the Governing Board and Governor of the Central Bank of Sri Lanka under Section 105 read with Sections 7(1)(c) and Part VI of the Central Bank of Sri Lanka Act, No.16 of 2023 with regard to Repatriation of Export Proceeds into Sri Lanka and published in Gazette Extraordinary No. 2473/30 of 30th January, 2026.

I move that these Rules be referred to the Committee on Public Finance.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2021 වර්ෂය සඳහා මිල්කො (ප්‍රයිවට්) ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2024 වර්ෂය සඳහා ඉඩම් මැනුම් සභාවේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ කොළඹ මහා නගර සභාව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ සබරගමුව පළාත් සභාව යටතේ වූ පළාත් පාලන ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)
Hon. Speaker, I present the Annual Report of the Civil Aviation Authority of Sri Lanka for the year 2024.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Infrastructure and Strategic Development.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මම, 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 34 වගන්තිය යටතේ තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව 2026 සම්බන්ධයෙන් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජනවාරි 16 දිනැති අංක 2471/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කරමි.

මෙම නියෝග තරුණ කටයුතු සහ ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කාරක සභා වාර්තා පිළිගැන්වීම.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මෙම සතියේ බ්‍රහස්පතින්දා සහ සිකුරාදා විශේෂිත වූ ප්‍රශ්නයක් ගැන පාර්ලිමේන්තුවේ විවාදයක් පවත්වන්නට අපි එකඟ වුණා. ඒ කියන්නේ, මැද පෙරදිග යුද්ධය සහ එහි බලපෑම පිළිබඳව සාකච්ඡා කරන්න එකඟ වුණා. නමුත්, බොහෝදුරට සිකුරාදා දිනයේ රාමසාන් උත්සවය යෙදෙන්නට පුළුවන්. ඉස්ලාම් ආගමිකයන්ට - මුස්ලිම් ප්‍රජාවට - එය ඉතාම වැදගත් ආගමික දිනයක්. බොහෝදුරට මේ සිකුරාදා රාමසාන් දිනය බවට පත් වෙන්නට පුළුවන්. ඒ නිසා බොහෝ දුරට එදින නිවාඩු දිනයක් වීමේ ඉඩකඩ තිබෙනවා. එබැවින්, ජාත්‍යන්තර වශයෙන් පමණක් නොවෙයි රට පැත්තෙනුත් හිතලා, ඒ අයටත් කරන ගෞරවයක් හැටියට සිකුරාදා දිනයේ තිබෙන විවාදය හෙට දිනයේ දී - බදාදා දිනයට - ලබා ගැනීම ඉතාම වැදගත් කියන එක මම මේ අවස්ථාවේ දී යෝජනා කරනවා. හෙට දිනයේ මේ විවාදය ආරම්භ කරන්නට අපට අවස්ථාව ලබා දෙන්න කියන එක සම්බන්ධයෙන් මම විශේෂයෙන්ම ඔබතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අද දිනයේ පෙ.ව 11.45ට අපි Parliamentary Business Committee එක යොදා ගෙන තිබෙනවා. එහිදී විපක්ෂ නායකතුමාගේ යෝජනාව ගැන සාකච්ඡා කරමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව පිළිගැන්වීම, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මම හිතන විධියට එම ඉල්ලීම කරන්නේ, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අපි අද පෙ.ව 11.45ට ඒ ගැන කථා කරමු, ගරු මන්ත්‍රීතුමා.

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 71 වගන්තිය යටතේ නියෝග

(2025 දෙසැම්බර් 29 දිනැති අංක 2469/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද); සහ

(ii) 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි තීරණය කිරීම

(2026 මාර්තු 06 දිනැති පාර්ලිමේන්තුවේ අංක 3(8) දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකයේ ඇතුළත් කරන ලද)

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, කාරණා දෙකක් ගැන කියන්න මට විනාඩි දෙකක් දෙන්න.

කොළඹ වරාය නගරය අපේ කමිටුවට ඉදිරිපත් කරලා තිබුණේ ඒකේ building height යනාදී සාමාන්‍ය කරුණු සම්බන්ධයෙන් විතරයි. නමුත් එතැනදී අපට අනාවරණය වෙච්ච දෙයක් තිබුණා. ලංකාවේ ප්‍රධාන දේපළ සංවර්ධන companies දෙකක් අනුමැතියෙන් තොරව පත්තරවල දැන්වීම් පළ කරලා තිබුණා, ඒ apartments විකුණන්න. ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය තිබෙන්න ඕනෑ. කරුණාකරලා අපි තේරුම් ගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. වරාය නගරයේ නීති සම්පාදනය වෙන්නේ මේ පාර්ලිමේන්තුවෙන්. Colombo Port City Economic Commission එකට අපේ පාර්ලිමේන්තුවේ තිබෙන බලතල delegate වෙන්න බැහැ. ඒක නිසා අපි ඒ පිළිබඳව දීර්ඝව සාකච්ඡා කරලා, වහාම ඒ දැන්වීම් නවත්වන්න කියලා එම companiesවලට අවවාද කරලා තිබෙනවා. මොකද, පාර්ලිමේන්තුවේ බලය කිසියම් විධියකට කොමිෂන් සභාව විසින් අත්පත් කර ගන්න හැකියාවක් නැති නිසා. ඒක පළමුවැනි කාරණය.

දෙවැනි කාරණය මෙයයි. දූෂණ විරෝධී පනත යටතේ, අපි දිගින් දිගටම මේ කාරණයට එකඟ වුණේ නැහැ. මුදල් කොමිෂන් සභාව 2023දී මේක ගෙනෙන කොටත් එවකට හිටපු ජනාධිපතිවරයා සමඟත් අපි එකඟ වුණේ නැහැ, කොමිෂන් සභාවේ සභාපති සහ ඒ Commissionersලාගේ වැටුප පිළිබඳව. ඔවුන් අපට එදාත් undertaking එකක් දුන්නා. ඒක තවම දීලා තිබෙනවා, Court of Appealහි විනිසුරුවන්ගේ වැටුපට සමාන වන විධියට තමයි ඒ Commissionersලාගේයි, Director Generalගේයි වැටුප සකස් විය යුත්තේ කියලා. හැබැයි, තවම ඒක සිද්ධ වෙලා නැහැ. මොකද, අපි පාර්ලිමේන්තුවෙන් සම්මත කළේ Deputy Director Generalගේ ඉඳලා පහළට විතරයි. එතැනදීත් නීතිපති දෙපාර්තමේන්තුවේ සිටින නීතිඥවරුන් සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ නීතිඥවරුන් අතර කිසි වෙනසක් නැහැ. නමුත් නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥවරුන්ගේ take-home salary එක, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ නීතිඥවරුන්ගේ take-home salary එකට වඩා වැඩියි. ඉතින්, එහෙම විය යුතු නැහැ. ඒ නිසා අපි ඔවුන්ට උපදෙස් දුන්නා, කරුණාකරලා එම වෙනස මඟ හරවා ගන්න amendment එකක් ගෙනෙන්න කියලා.

බොහොම ස්තුතියි.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ජුලම්පිටිය, ගල්පොත්තයාය, අංක 108/1 ඒ යන ලිපිනයෙහි පදිංචි තිලක් ඉන්දික විදානගම මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අශෝක ගුණසේන මහතා**
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)

ගරු කථානායකතුමනි, නාරම්මල, දෙමටගහවෙල යන ලිපිනයෙහි පදිංචි සී.එම්.එම්.ආර්. ජයසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

Hon. Speaker, I present the following petitions:

(1) A petition from Mrs. G. Denisarath of No. 90, 1/1, Hinny Appuhamy Mawatha, Colombo 13;

(2) A petition from Mr. K. Kathiramalai of Thunnalai North, Karaveddy, Jaffna;

(3) A petition from Mrs. Kanapathipillai Balakangeswari of Muththaram, Kanapathipillai Principal Street, Arayampathi, Batticaloa; and

(4) A petition from Mr. T. Kajendhiran of Poompolil, Vattu North, Chithankerni, Jaffna.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -230/2024- (1), ගරු අජිත් පී. පෙරේරා මහතා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -460/2025- (1), ගරු එස්.එම්. මරික්කාර් මහතා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## 2021 සිට මාළු, කරවල සහ ටින් මාළු ආනයනය: විස්තර
## 2021இலிருந்து மீன், கருவாடு மற்றும் டின் மீன் இறக்குமதி: விபரம்
## IMPORT OF FISH, DRIED FISH AND CANNED FISH SINCE 2021: DETAILS

464/2025

3. **ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2021 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාව මාළු ආනයනය කර තිබේද;

(ii) එසේ නම්, 2021 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂයේදී ආනයනය කරන ලද මාළු වර්ගය, ප්‍රමාණය, ඒවායෙහි වටිනාකම සහ ගෙන්වන ලද රට වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එසේ ආනයනය කරන ලද්දේ දේශීය පරිභෝජනය සඳහාද, නැතහොත් ප්‍රතිඅපනයනය සඳහාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එසේ ආනයනය කරන ලද්දේ දේශීය පරිභෝජනය සඳහා නම්, උපයන ලද තීරු බදුවල වටිනාකම කොපමණද;

(ii) ආනයනය කරන ලද්දේ ප්‍රතිඅපනයනය කිරීම සඳහා නම්, එකතු කළ අගය සහ උපයන ලද විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

(iii) ආනයනය කරන ලද කරවල, හාල්මැස්සන් සහ උම්බලකඩ ප්‍රමාණය, වටිනාකම සහ ගෙන්වන ලද රටවල් කවරේද;

(iv) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද කරවල, හාල්මැස්සන් සහ උම්බලකඩ ප්‍රමාණය කොපමණද;

(v) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද ටින් මාළු ප්‍රමාණය සහ එහි වටිනාකම කොපමණද;

(vi) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද ටින් මාළු ප්‍රමාණය කොපමණද;

යන්නත් 2021 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2 0 2 1ஆம் ஆண்டிலிருந்து இற்றைவரை இலங்கைக்கு மீன் இறக்குமதி செய்யப் பட்டுள்ளதா என்பதையும்;

(ii ) அவ்வாறெனில், 2021ஆம் ஆண்டிலிருந்து இற்றைவரை, ஒவ்வோர் ஆண்டுக்குமாக வெவ்வேறாக, மீன்களின் வகை, அளவு, பெறுமதி மற்றும் இறக்குமதி செய்யப்பட்ட நாடுகள் ஆகியவற்றையும்;

(iii ) அத்தகைய இறக்குமதிகள் உள்ளூர் நுகர்வுக்காகவா அல்லது மீள் ஏற்றுமதிக்காகவா மேற்கொள்ளப்பட்டன என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) 2021ஆம் ஆண்டிலிருந்து இற்றைவரை ஒவ்வோர் ஆண்டுக்குமாக -

(i) அவ்வாறு இறக்குமதி செய்யப்பட்டது உள்ளூர் நுகர்வுக்காகவெனில், ஈட்டப்பட்ட தீர்வையின் பெறுமதி;

(ii) இறக்குமதி செய்யப்பட்டது மீள் ஏற்றுமதிக்காக வெனில், சேர்க்கப்பட்ட பெறுமதி மற்றும் ஈட்டப்பட்ட அந்நியச் செலாவணி;

(iii ) இறக்குமதி செய்யப்பட்ட கருவாடு, நெத்தலி மற்றும் மாசி ஆகியவற்றின் அளவு, பெறுமதி மற்றும் அவை இறக்குமதி செய்யப்பட்ட நாடுகள்;

(iv ) இலங்கையில் உற்பத்தி செய்யப்பட்ட கருவாடு, நெத்தலி மற்றும் மாசி ஆகியவற்றின் அளவு;

[ගරු රවී කරුණානායක මහතා]

(v ) இலங்கைக்கு இறக்குமதி செய்யப்பட்ட தகரத்தில் அடைக்கப்பட்ட மீனின் அளவு மற்றும் பெறுமதி;

(vi ) இலங்கையில் உற்பத்தி செய்யப்பட்ட தகரத்தில் அடைக்கப்பட்ட மீனின் அளவு;

ஆகியவை யாவை என்பதை வெவ்வேறாக அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries, Aquatic and Ocean Resources:

(a) Will he inform this House -

(i) whether Sri Lanka has imported fish from 2021 to date;

(ii) if so, the type, quantity, value and country of import in each year from 2021 to date, separately; and

(iii) whether such imports were for local consumption or for re-export?

(b) Will he also inform this House for each year from 2021 to date, separately-

(i) if for local consumption, the value of duty earned;

(ii) if for re-export, the value added and foreign exchange earned;

(iii) the quantity, value and countries of import of dried fish, sprats and Maldives fish imported;

(iv) the quantity of dried fish, sprats and Maldives fish produced in Sri Lanka;

(v) the quantity and value of canned fish imported to Sri Lanka; and

(vi) the quantity of canned fish produced in Sri Lanka?

(c) If not, why?

**ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)

(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)

ගරු කථානායකතුමනි, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) දේශීය පරිභෝජනය සඳහා ගෙන්වන ලද මසුන් සම්බන්ධ තොරතුරු ඇතුළත් ලේඛනය ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කරමි.

(iii) දේශීය පරිභෝජනය සඳහා සහ ප්‍රතිඅපනයනය යන අවශ්‍යතා දෙකම සඳහා මසුන් ආනයනය සිදු කර ඇත.

(ආ) (i) පහත වගුවේ දැක්වේ.

2021.01.01 සිට 2025.10.27 දක්වා දේශීය, පරිභෝජනය සඳහා මාළු ආනයනයන්ගේ සාරාංශය

| YEAR | NET MASS (KG) | CIF (RS) | CID | PAL | SCL | VAT | SSL |
|---|---|---|---|---|---|---|---|
| 2021 | 9,887,745 | 3,202,051,697 | 8,584,479 | 5,722,992 | 884,179,763 | 6,104,905 | - |
| 2022 | 3,572,674 | 1,719,500,265 | 9,567,655 | 6,378,441 | 444,181,583 | 10,651,800 | 725,602 |
| 2023 | 5,794,195 | 2,492,078,373 | 10,733,130 | 5,645,797 | 533,719,151 | 11,786,942 | 1,964,494 |
| 2024 | 11,651,757 | 5,092,106,661 | 16,454,034 | 7,682,750 | 841,383,584 | 20,634,115 | 2,865,861 |
| 2025 | 14,995,113 | 6,743,062,947 | 19,261,610 | 8,246,150 | 1,040,498,057 | 24,020,393 | 3,336,174 |

(ශ්‍රී ලංකා රේගුව විසින් ඉදිරිපත් කරන ලද අතර, 2025.10.27 සිට මේ දක්වා තොරතුරු ලබා ගැනීමට එම දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.)

(ii) ඇමුණුම් 02 සහ 03 මඟින් දක්වා ඇත.

(මෙම තොරතුරු ශ්‍රී ලංකා රේගුව මඟින් ලබා ගත් අතර, 2025.09.30 සිට මේ දක්වා තොරතුරු ලබා ගැනීමට එම දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.)

(iii) ඇමුණුම 04 මඟින් දක්වා ඇත.

(iv)

| වර්ෂය | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| සමස්ත නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) | 51,340 | 22,960 | 22,340 | 24,850 | 31,080 |

(v)

| වර්ෂය | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| ආනයනික ටින් මාළු ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | 8,758.1 | 3,431.0 | 7,904.4 | 4,476.0 | 601.1 |
| වටිනාකම (රුපියල් මිලියන) | 4,891.0 | 2,671.9 | 6,172.6 | 3,317.8 | 1,019.0 |

(vi)

| වර්ෂය | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| ටින් මාළු ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | 9,251.37 | 5,827.82 | 11,802.62 | 12,305.39 | 18,325.80 |

(ඈ) අදාළ නොවේ.

ඇමුණුම් 01, 02, 03 සහ 04 **සභාගත*** කරමි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ උත්තරයට අනුව මම අතුරු ප්‍රශ්න දෙක අහන්නම්. පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ රටට ටින් මාළු ආනයනය කිරීම සම්බන්ධයෙන් ඔබතුමා දැන් දත්ත ඉදිරිපත් කර තිබෙනවා. 2015දී මේ කටයුත්තට පුනර්ජීවයක් ලබා දීලා නැවතත් කොම්පැනි 8ක් පටන් ගත්තා. හැබැයි, දැන් මේ කොම්පැනි වහගෙන යනවා. මේකේ තිබෙන para-tariff නැති කරනවා. මාළු ආනයනය කිරීම සම්බන්ධයෙන් ගත්තාම, ඔය කියන සාඩින් සහ ගාල්ල පැත්තෙන් අල්ලන පොඩි මාළු ටික ගෙනෙන එක සම්බන්ධයෙන් මම හිතන විධියට ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා.

ඩීසල්වල මිල වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම ධීවරයින්ට මුහුදු යනකොට අවශ්‍ය ඩීසල්වලට අද රුපියල් 128ක tax එකක් ගහලා තිබෙනවා. ඒගොල්ලන්ගේ නිෂ්පාදනය වැඩි වුණාට, දැන් මේ නිසා මාළු ආනයනය කිරීම ඊට වඩා ලාභදායක වෙලා තිබෙනවා. ඔබතුමා ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය ඇමතිතුමා වශයෙන් ධීවරයින්ට සහ පාරිභෝගිකයන්ට සෙත සලසන ගමන් ඒ companies 8 ආරක්ෂා කරන්න කටයුතු කරන්නේ මොන ආකාරයෙන්ද? 2015දී පටන් ගත්ත කොම්පැනියේ මාළු ටින් එකක මිල රුපියල් 155යි. ඒ මිල 2020 අවුරුද්ද වෙනකම් තිබුණා. දැන් එහි මිල රුපියල් 500 දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. ආනයනය සඳහා පනවා තිබෙන ඔක්කොම taxes නැති කරලා තිබෙන නිසා ඒ අයට ලොකු පාඩුවක් වෙලා තිබෙනවා. ඒ නිසා තරගකාරී තත්ත්වයක් ඇති කරලා, මේගොල්ලන්ගේ ජීවනෝපාය ඉදිරියට ගෙන යන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් ඔබතුමාට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
ගරු කථානායකතුමනි, ටින් මාළු මෙරටට ආනයනය කිරීම පසුගිය කාලයට වඩා අඩු වෙලා තිබෙනවා. මේ පිළිතුරේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා, 2024දී ආනයනික ටින් මාළු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 4,476ක් සහ 2025දී ආනයනික ටින් මාළු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 601ක් බව. එහි සැලකිය යුතු අඩු වීමක් තිබෙනවා. ඒ අනුව සියයට 90ක වාගේ ප්‍රමාණයක් ආනයනය කර තිබෙනවා. වටිනාකම ගත්තත් එහෙමයි. ගරු මන්ත්‍රීතුමනි, අපි මාළු සුළු ප්‍රමාණයක් ලංකාවට ආනයනය කරනවා. එහෙම ගෙනෙන්නේ දේශීය හා විදේශීය සංචාරකයින්ට අවශ්‍ය මාළු. අපි සූරියකාන්ත තෙල් භාවිතයෙන් සාදන ලද ටින් මාළු ප්‍රමාණයක් ලංකාවට ආනයනය කරනවා.

පසුගිය කාලය තුළ ලංකාවේ දෛනික ටින් මාළු නිෂ්පාදනය 180,000යි. දැන් එය 250,000 අභිභවා ගිහිල්ලා තිබෙනවා. එය සැලකිය යුතු තරමින් විශාල ප්‍රමාණයක්. කර්මාන්තශාලාවල දෛනිකව නිෂ්පාදනය කරන ටින් මාළු ප්‍රමාණයේ වැඩිවීමක් වෙලා තිබෙනවා. විශාල සේවක පිරිසකුත් දැන් රැකියාවලට පැමිණෙමින් සිටිනවා.

ඒ වාගේම, පසුගිය වර්ෂයේ ඉඳලා මෙරටින් ටින් මාළු ප්‍රමාණයක් අපනයන වෙළෙඳ පොළට යොමු කළා; අපනයනය කළා. පසුගිය අවුරුද්දේ අප්‍රේල් මාසයේ ඉඳලා කැනඩාව සහ මැද පෙරදිග රටවල් කිහිපයකට ටින් මාළු අපනයනය කිරීම ආරම්භ කළා. ඒ තත්ත්වය අපට වර්ධනය කර ගන්න පුළුවන්. දැනට ලංකාවේ කර්මාන්තශාලා 6ක් ටින් මාළු අපනයනය සඳහා සම්බන්ධ වෙලා තිබෙනවා. ඒ ප්‍රමාණය අපි ඉදිරියේදී වැඩි කරනවා. මෙහි ප්‍රගතියක් තිබෙනවා. මේ කාලය තුළ ආනයනික ටින් මාළු ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් -සියයට 90කින්- අඩු වෙලා, අපනයනය සඳහා ප්‍රවිෂ්ට වී තිබෙනවා. අපි දකිනවා, ඒක සුබදායී තත්ත්වයක් කියලා. ඒ තත්ත්වය නිසා ගරු මන්ත්‍රීතුමනි, කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක අලුතින් රැකියා අවස්ථා ලබා ගැනීමටත් අපට හැකි වෙලා තිබෙනවා. ඒ වාගේම, අපේ ධීවරයින් නෙළා ගෙන එන මත්ස්‍ය සම්පත -මාළු අස්වැන්න- මේ කර්මාන්තශාලාවලට මිලදී ගැනීමේ හැකියාව වැඩි වෙලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ඔබතුමා කියන කාරණය පැහැදිලි නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා පිළිතුර ලබා දී අවසන් කරන්න. *[බාධා කිරීමක්]*

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
ගරු මන්ත්‍රීතුමනි, mike එක on කර ගන්නවාද? ඔබතුමා කියන කාරණය මට පැහැදිලි නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා පළමුවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුර ලබා දීලා අවසන් කරන්න. ඊට පසුව දෙවැනි අතුරු ප්‍රශ්නය ඇසීමට එතුමාට ඉඩ දෙන්නම්. නැත්නම් ඔබතුමා අතුරු ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා ගන්නා කාලය වැඩි වෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා පළමුවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුර ලබා දීලා අවසන් කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
ඒක අවසන් කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ වාගේ කපලා දමනවාද, නියෝජ්‍ය ඇමතිවරු.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මම උපකල්පනය කරනවා, අර වගුවේ තිබෙන දත්ත අනුව අපනයනය කිරීමේ ප්‍රමාණයත් අඩු වෙලා තිබෙනවා කියලා. අපි අල්ලන මාළු ටික ජපානයටත්, අනෙක් පැත්තෙන් යුරෝපයටත් යවනවා. යුරෝපයට යවන කොට සියයට 65ක් අද air freight කරන්නේ මැදපෙරදිග ඉඳලා එන airlines ටික. මේ සම්බන්ධයෙන් සියයට සියයක් air freight charges වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම GSP එක ගැනත් මේ අවස්ථාවේදී කථා කරමින් සිටිනවා. මේ අපනයනය වැඩි කිරීම සහ ස්ථාවර මිලක් ඇති කරන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළකට යාමේදී, cargo මිල වැඩි වන එකට කොයි ආකාරයෙන්ද තරගකාරි තත්ත්වය ඇති කර දෙන්න පුළුවන් වෙන්නේ, මේ අපනයනකරුවන්ට? මොකද, අල්ලන මාළු ටික අපනයනය කරන්න බැරි වුණොත් ඒක සම්පූර්ණයෙන්ම අපතේ යනවා. ඒ සම්බන්ධයෙන් air freight rate එක වැඩි වෙලා තිබෙන එකේදී කොහොමද ඔබතුමන්ලා උදවු කරන්නේ කියන එක සම්බන්ධයෙන් දැනුවත් කරන්න.

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා ප්‍රශ්නය යොමු කරන්නේ මේ කාලයත් සමඟද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
GSP එක-

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
ගරු කථානායකතුමනි, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා යොමු කරන ප්‍රශ්නයේ හතර වටෙන් ප්‍රශ්න කිහිපයක්ම යොමු කරනවා. හතර පැත්තකින් දමනවා, මේ ප්‍රශ්නය. ගරු රවී කරුණානායක මැතිතුමා තුන් තේරවිල්ලක් අහන්නේ. මේ තුන් තේරවිල්ලට උත්තරය මෙතැන නැහැ. මේ තුන් තේරවිල්ලක් එතුමා අහන්නේ. ඒකට උත්තරයක් නැහැ, මෙතැන. ඔබතුමාගේ ප්‍රශ්න වාර දෙක අවසන්. *[බාධා කිරීමක්]* ඔබතුමා මෙතැන තුන් තේරවිල්ලක් අහන්නේ. *[බාධා කිරීමක්]* ඔබතුමා හරියට ප්‍රශ්නය අහන්න; නිවැරදිව ප්‍රශ්නය යොමු කරන්න. ඔබතුමා තුන් තේරවිල්ලක් නේ, අහන්නේ මෙතැනදී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදයකට පැටලෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පැය 24ක් ඇතුළත අපනයනය කළේ නැත්නම් ඒ තොගය සම්පූර්ණයෙන් අපතේ යනවා. ඒ freight rate එක සියයට 125කින් වැඩි වෙලා තිබෙනවා. ඒ අපනයනකරුවන් අපේ රටට ඩොලර් ටික ගෙනෙන අය. සාපේක්ෂව යම් විධියකින් මිල වැඩි වුණාම කොහොමද ඒ අපනයනකරුවන්ට උදව් කරන්නේ? ඒකට වෙන ඒවා කියලා හරියන්නේ නැහැ. ඔබතුමන්ලා ඇවිදින පුස්තකාල. අපි වාගේ වල් පැළවලට උත්තර දෙන්න පුළුවන් නේ.

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
ඔබතුමා අදහස්, යෝජනා ටිකක් ඉදිරිපත් කළා නේ. ඉදිරියේදී මේ කටයුතු සම්බන්ධව ඔබතුමාගේ අදහස්, යෝජනා ටිකත් සැලකිල්ලට ගෙන ටින් මාළු අපනයනකරුවන් වෙනුවෙන් කටයුතු කරන්න අපි මැදිහත් වෙන්නම්. *[බාධා කිරීමක්]* දැන් හරි නේ. ඔබතුමා ඉදිරිපත් කළා යෝජනා ටිකක්. මේ ටින් මාළු කර්මාන්තයේ අනාගතය වෙනුවෙන් අපි ඒ යෝජනා, අදහස් අරගෙන කටයුතු කරන්නම්. හරි නේ? පාර්ලිමේන්තුවෙන් වෙන්න ඕනෑ ඕක නේද? ඔබතුමාගේ යෝජනා, අදහස් ටික බාර ගත්තා, සැලකිල්ලට ගත්තා. *[බාධා කිරීමක්]* අපි ඒක යොදා ගත්තා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. දැන් අවසන් කරන්න, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා.

ප්‍රශ්න අංක 4, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නයෙන් ඇහුවේ දේශීය වශයෙන් සිදු කරන ටින් මාළු කර්මාන්තය ගැනයි. දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් ඇහුවේ අපනයනය කිරීම සම්බන්ධයෙන්. *[බාධා කිරීමක්]* ඉතින්, වයර් මාරු වෙලා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වයර් මාරු වුණාද, නැද්ද නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. එතුමා ලබා දුන් පිළිතුර බාර ගන්න.

ප්‍රශ්න අංක 4, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා.

## නොරොච්චෝලේ "ලක් විජය" විදුලි බලාගාරය: 2020 සිට උත්පාදනය සහ බිඳවැටීම්
### நுரைச்சோலை "லக் விஜய" மின்னுற்பத்தி நிலையம்: 2020 முதல் மின்னுற்பத்தியும் செயலிழப்பும்
### NOROCHCHOLAI "LAK VIJAYA" POWER PLANT: POWER GENERATION AND BREAKDOWNS FROM 2020

682/2025

**4. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා නොරොච්චෝලේ "ලක් විජය" විදුලි බලාගාරයෙන් ජාතික විදුලිබල පද්ධතියට ලැබුණු දායකත්වය කොපමණද;

(ii) එම කාලය තුළ ඉහත විදුලි බලාගාරය ඇණ හිටි අවස්ථා සංඛ්‍යාව සහ දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් ඇණ හිටීම් හේතුවෙන් අඛණ්ඩ විදුලිබල සැපයුමට එල්ලවූ බාධා කවරේද;

(iv) ඉහත බලාගාරයේ ඇති විදුලි ජනන යන්ත්‍ර නිරන්තරයෙන් ඇණ හිටීමට හේතු කවරේද;

(v) ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2020ஆம் ஆண்டு முதல் இதுவரை நுரைச்சோலை "லக் விஜய" மின்னுற்பத்தி நிலையத்திலிருந்து தேசிய மின்சாரக் கட்டமைப்புக்குக் கிடைக்கப்பெற்ற பங்களிப்பு எவ்வளவு என்பதையும்;

(ii) மேற்குறித்த காலப்பகுதியினுள் மேற்படி மின்னுற்பத்தி நிலையம் செயலிழந்த சந்தர்ப்பங்களின் எண்ணிக்கை மற்றும் திகதிகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) மேற்கூறப்பட்ட செயலிழப்புகள் காரணமாகத் தொடர்ச்சியான மின்சக்தி வழங்கலை மேற்கொள்வதில் ஏற்பட்ட தடைகள் யாவை என்பதையும்;

(iv) மேற்படி நிலையத்திலுள்ள மின் பிறப்பாக்கி இயந்திரங்கள் தொடர்ச்சியாக செயலிழப்பதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) இது தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) the contribution made to the National Grid by the Norochcholai "Lak Vijaya" Power Plant from 2020 to the present;

(ii) the number of times and specific dates on which the above power plant broke down during that period, separately;

(iii) the disruptions that were caused to the continuous power supply due to the aforementioned breakdowns;

(iv) the reasons for frequent breakdowns of the generators at the said power plant; and

(v) the measures that will be taken in that regard?

(b) If not, why?

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2020 සිට 2025 දක්වා ලක් විජය බලාගාරය ජාතික විදුලිබල පද්ධතිය වෙත ලබා දී ඇති වාර්ෂික දායකත්වය පහත දක්වා ඇත.

| වර්ෂය | ශුද්ධ ජනනය (ගිගාවොට් පැය) | | | |
|---|---|---|---|---|
| | ඒකක 1 | ඒකක 2 | ඒකක 3 | ඒකක 4 |
| 2020 | 1,947.86 | 2,036.50 | 1,769.97 | 5,754.33 |
| 2021 | 1,901.93 | 1,876.56 | 1,740.55 | 5,519.04 |
| 2022 | 2,033.04 | 1,295.42 | 1,845.31 | 5,173.78 |
| 2023 | 1,593.41 | 1,875.53 | 1,176.58 | 4,645.52 |
| 2024 | 1,428.87 | 2,010.40 | 2,042.27 | 5,481.54 |
| 2025 | 1,309.00 | 1,780.83 | 1,780.45 | 4,870.28 |

[ගරු කුමාර ජයකොඩි මහතා]

(ii) එක් එක් ජනන ඒකක වසා දැමුණු අවස්ථා ගණන, අදාළ දිනයන් සහ වසා දැමීමට හේතු ඇතුළත්ව, සැලසුම් කළ සහ සැලසුම් නොකළ සියලුම වසා දැමීම් පිළිබඳ වාර්තාව ඇමුණුම 2A, ඇමුණුම 2B සහ ඇමුණුම 2C මඟින් ඒ ඒ ජනන යන්ත්‍ර අනුව දක්වා ඇත. ඇමුණුම සභාගත කරමි.

සමස්ත විදුලි පද්ධතිය බිඳවැටීම් සහ සම්ප්‍රේෂණ ජාලයේ දෝෂ වැනි බාහිර බාධාවන් හේතුවෙන්ද දෝෂ සිදු වී තිබූ අතර, ඒ පිළිබඳව විශේෂ සටහන් තීරුවේ දක්වා ඇත. විශේෂයෙන්ම ඇතැම් අවස්ථාවලදී පද්ධති පාලන මධ්‍යස්ථානයේ ඉල්ලීම් අනුව ප්‍රධාන වශයෙන් ඉල්ලුම අඩුවීම හේතු කොටගෙන ඒකක වසා තැබීම සිදු කර ඇත.

(iii) මෙම ප්‍රශ්නය සඳහා පිළිතුර සැපයීමට කාලය අවශ්‍ය වන අතර පද්ධති පාලන මධ්‍යස්ථානයෙන් එම තොරතුරු ලබා ගෙන හැකි විගස වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.

ගරු කථානායකතුමනි, ඒකට ගොඩක් සංකීර්ණ දත්ත ටිකක් සොයා ගන්න තිබෙන්නේ. ඒකට ටිකක් කාලය අරගෙන පිළිතුර ලබා දෙන්නම්. මට ඒ ප්‍රශ්නයට විතරක් සති දෙකක කාලයක් දෙන්න. මොකද, විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණයත් එක්ක එතැන යම් යම් වැඩවල පොඩි වැඩිවීමක් තිබෙනවා. මෙය සාමාන්‍යයෙන් ඒ system එකේ generate වන දත්තයක් නොවෙයි. ඒ නිසා මෙය ගැන වෙනම ලංකාවේම දත්ත අරගෙන බලන්න ඕනෑ. ඒ ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ "ඉහත සඳහන් ඇණ හිටීම් හේතුවෙන් අඛණ්ඩ විදුලිබල සැපයුමට එල්ල වූ බාධා කවරේද?" යන්නයි. ඒක ටිකක් ලොකු thesis එකක්. අපි ඒක හදලා බලලා කියන්නම්.

(iv) එක් එක් ජනන ඒකක වසා දැමුණු අවස්ථා ගණන, අදාළ දිනයන් සහ වසා දැමීමට හේතු ඇතුළත්ව, සැලසුම් කළ සහ සැලසුම් නොකළ සියලුම වසා දැමීම් පිළිබඳ වාර්තාව මා කලින් කිව්වා වාගේ ඇමුණුම 2A, ඇමුණුම 2B සහ ඇමුණුම 2C හි දක්වා ඇත.

සමස්ත විදුලි පද්ධතිය බිඳවැටීම් සහ සම්ප්‍රේෂණ ජාලයේ දෝෂ වැනි බාහිර බාධා හේතුවෙන් ද දෝෂ ඇති වුණු අවස්ථා විශේෂ සටහන් තීරුවේ දක්වා ඇත. කලින් පිළිතුරේ වාගේම ඇතැම් අවස්ථාවලදී පද්ධති පාලන මධ්‍යස්ථානයේ ඉල්ලීම අනුව, ප්‍රධාන වශයෙන් ඉල්ලුම අඩු වූ අවස්ථාවලදී වසා දැමීම් සිදු කර ඇත.

(v) බලාගාරයේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වය අඛණ්ඩව පවත්වා ගෙන යෑම සඳහා මේ වන විටත් නිසි ක්‍රියාමාර්ග ගෙන ඇත.

තවද, බාහිර දෝෂ හේතුවෙන් අනවශ්‍ය ලෙස ක්‍රියා විරහිත වීම් - trippings - ඇති වීම වළක්වා ගැනීම සඳහා පාලන පද්ධති නවීකරණ කටයුතු - control system logic modifications - සහ පිළියවනවල - ROCOF relays - ආරක්ෂණ සැකසුම් - protection settings - වැඩි දියුණු කිරීම මේ දිනවල සිදු කර ඇත.

මීට අමතරව, ටර්බයින ඩයප්‍රම පිපිරී යෑම වැළැක්වීම සහ එමඟින් අලුත්වැඩියාවන් සඳහා දීර්ඝ කාලයක් ගත වීම මඟ හරවා ගැනීම තුළින් සමස්ත පද්ධති බිඳ වැටීමකින් පසුව විදුලි බලාගාරය යළි පණ ගැන්වීම ප්‍රමාදයන්ට ලක් වීම අවම කරලීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී.

ඇමුණුම් 2A, 2B සහ 2C **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න පෙර මම ගරු අමාත්‍යතුමාට කියන්න ඕනෑ, මට අවශ්‍යම කරලා තිබුණු ප්‍රශ්නවලට එතුමා පිළිතුරු දුන්නේ නැති බව. ඒ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න අවශ්‍ය වාර්තා ලබා ගන්න සහ සකස් කරන්න යම්කිසි කාලයක් අවශ්‍ය බව එතුමා කිව්වා. තවත් දින අරගෙන හරි කමක් නැහැ, සම්පූර්ණ වාර්තා ටිකත් අරගෙන ඔබතුමාට සම්පූර්ණ පිළිතුර දෙන්න තිබුණා, ගරු ඇමතිතුමනි. හැබැයි, දැන් මෙහෙම වුණාම මොකක්ද සිද්ධ වෙන්නේ, ගරු කථානායකතුමනි? මේකෙන් සිද්ධ වෙන්නේ, රටේ සමස්ත ජනතාව නොමඟ යන එකයි. ඒ ඇයි? ගරු ඇමතිතුමා මේ ප්‍රශ්නයේ කොටස් කිහිපයකට පිළිතුරු දීලා කියනවා, අනෙක් එකට පසුව පිළිතුරු දෙන්නම්, ඒ සඳහා කාලය අවශ්‍යයි කියලා. නමුත්, කවදාවත් පිළිතුරු දෙන්නේ නැහැ. ඒ වාගේම ඔබතුමන්ලා ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කරන්නේත් නැහැ. ඒ ටික හංගනවා. එහෙම නම්, එතැන වෙලා තිබෙන්නේත් එක්තරා විධියක හොරකමක් හෝ වංචාවක් හෝ වෙන්න ඕනෑ.

ඊළඟ කාරණාව මේකයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, එහෙම නම් මම පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්නද? ඒ සඳහා ඔබතුමා අවසර දෙනවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්, පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මම අහන්නම්. ගරු කථානායකතුමනි, මම මේ වාර්තා ටික ගරු ඇමතිතුමාගෙන් ගන්න හැදුවේ, වර්තමානයේ නොරොච්චෝලේ බලාගාරයට බාල ගල් අඟුරු නිසා ඇති වෙලා තිබෙන ප්‍රශ්නය පිළිබඳව කථා කරන්නයි. තොරතුරු සංසන්දනය කරන්න තමයි ඒ අවස්ථාව ගන්න හැදුවේ. හැබැයි, ඒ අවස්ථාව දුන්නේ නැහැ. දැන් testings කරද්දී, විශේෂයෙන්ම ඒ වාර්තා ටික සකස් කරන කොට පැහැදිලිව අවබෝධ වෙලා ඉවරයි, මේ කාලය තුළ බාල ගල් අඟුරු නිසා නැව් 8කින් රුපියල් බිලියන 8.4ක පාඩුවක් රටට සිදු

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

වෙලා තිබෙනවා කියලා. ඒ පිළිබඳ වාර්තාවකුත් දීලා තිබෙනවා. පාරිසරික කරුණුත් එක්ක ඊළඟට බලපාන කරුණු ගොඩක් එකතු වෙලා තිබෙන බව ඒ වාර්තාවත් එක්ක අපට පෙනෙනවා. පාරිසරික කරුණු වාගේම, විශේෂයෙන්ම බලාගාරයේ බොයිලේරු ටික කඩාගෙන වැටෙන එක හෝ ඊට අදාළ මොනවාහරි ප්‍රශ්න, විශේෂයෙන්ම ඉන්ධන පරිභෝජනය වැඩි වන විධියට ජෙනරේටර්වලින් විදුලිය ලබා ගන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ පිළිබඳ ප්‍රශ්න ආදි සියල්ල එකට ගොඩ ගැහිලා තිබෙනවා. මේ වැඩ පිළිවෙළ තුළම අමාත්‍යතුමාට පිටතින් වෙනම බරපතළ ප්‍රශ්න ටිකක් ඇවිල්ලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. මේ ප්‍රශ්න සියල්ල ගෙන බලද්දී පෙනෙන දේ මොකක්ද? මේ ආණ්ඩුව පත් වෙනකොට කිව්වේ, වල් පැළ වෙනුවට මල් පැළ ටිකක් පත් කරනවා කියලායි. එහෙම නම්, මේ අමාත්‍යතුමා කරපු ජාවාරම් වැරැදිවලට, මේ අමාත්‍ය ධුරයෙන් ඉල්ලා අස් වෙන්නේ කවදාද කියන එක තමයි පළමුවැනි අතුරු ප්‍රශ්නය හැටියට විශේෂයෙන්ම අහන්නේ.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, කෙනෙකු පුරුද්දකට ඇබ්බැහි වුණාම හැම දෙයක් ගැනම හිතෙන්නේ ඒවාත් තමන් කරනවා වාගේ දේවල් කියලායි. මම විශේෂයෙන්ම ඒ බව කියන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, මම ඉතාම වගකීමෙන් කියනවා, ඔබතුමාගේ ප්‍රශ්නයේ ඉතිරි කොටසට පිළිතුර ඉදිරියේදී මම අනිවාර්යයෙන් සභාගත කරන බව. පළමු අතුරු ප්‍රශ්නය විධියට ඉදිරිපත් කරපු කාරණය මෙතැනට අදාළ නැහැ. ඒක අවුරුදු 10කට, 11කට ප්‍රථම සිදුවීමක්. ඒක මෙතැනට අදාළ නැහැ. මම අමාත්‍ය ධුරයට පත් වෙලා අවුරුද්දයි. එම නිසා ඒක මෙතැනට අදාළ නැහැ. *[බාධා කිරීම්]* ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
අදාළයි නේද, ගරු බිමල් ඇමතිතුමා? අදාළයි නේද? *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීම්]*

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, මේ සද්දය නිසා මට ඇහෙන්නේ නැහැ. *[බාධා කිරීම්]* මෙහෙමයි, - *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, *[බාධා කිරීම්]* කාලය කළමනාකරණය කර ගැනීමත් අවශ්‍යයි. *[බාධා කිරීම්]* ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීම්]*

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
නිශ්ශබ්ද වෙන්න. *[බාධා කිරීම්]* සංවර වෙන්න. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් අහපු පළමුවැනි අතුරු ප්‍රශ්නයට උත්තර දුන්නේ නැහැ. *[බාධා කිරීම්]* එතුමා අදාළ නැහැ කිව්වා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකර දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
එතුමා එම ප්‍රශ්නයට උත්තර දුන්නේ නැහැ නේ. ඒ නිසා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න මම ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, පසුගිය දවස්වල අපට වාර්තා වුණා, මෙගාවොට් 900ක බලාගාරයේ 300 units 3ක් තිබෙනවා, ඒ unit එකකින් සාමාන්‍යයෙන් මෙගාවොට් 260ක් විතර තමයි generate වෙන්නේ කියලා. ඒ කියන්නේ මෙගාවොට් 900න් මෙගාවොට් 780ක් විතර තමයි generate වෙන්නේ. මෙගාවොට් 120ක් විතර generate වෙන්නේ නැහැ, මේ බාල ගල් අඟුරු නිසා. එතකොට ඒ මෙගාවොට් 120 අපට ලබා ගන්න වෙන්නේ අතිරේකව. ඒ කියන්නේ, ඩීසල් turbinesවලින් ඉන්ධන දහනය කරලා. මේ වාගේ ඉන්ධන අර්බුදයක් තිබෙන වෙලාවක මෙගාවොට් 120කට අපට විශාල ඉන්ධන ප්‍රමාණයක් වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මම ගරු ඇමතිතුමාගෙන් පළමුවෙන්ම අහන්න කැමැතියි, ඒක පිළිගන්නවාද කියලා.

දෙවැනි කාරණය මේකයි. අපි දැක්කා, COPE එකේ සභාපතිවරයා මේ කාරණය ශුද්ධ කරනවා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
හරි, මම ප්‍රශ්නය අහනවා. මේ සියල්ලම ප්‍රශ්න තමයි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දැන් විනාඩි 2ක් අරගෙන තිබෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඔබතුමන්ලාටත් දැන් පෝලිමේ ගිහින් තෙල් ගහගන්න වෙලා තිබෙන්නේ මේ ප්‍රශ්නය හින්දා. මම කෙටියෙන් අතුරු ප්‍රශ්නය අහන්නම්.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා රාජ්‍ය නිලධාරියෙකුට අධිචෝදනා ගොනු වුණොත් එහෙම වැඩ තහනම් වන බව. දැන් ඔබතුමාට අධිචෝදනා ගොනු වෙලා තිබෙනවා. *[බාධා කිරීම්]* ඔබතුමා අමාත්‍යාංශයේ තවදුරටත් ඉන්නවාද, එහෙම නැත්නම් ඔබතුමා අයින් වෙලා සාධාරණය ඉෂ්ට කරනවාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ප්‍රශ්නය මොකක්ද?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහන්නේ අසා තිබෙන ප්‍රධාන ප්‍රශ්නයට අදාළ නොවන අතුරු ප්‍රශ්නයක් නිසා මම පිළිතුරු දීමෙන් වැළකී සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 - ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා - *[බාධා කිරීමක්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු බලශක්ති ඇමතිතුමනි, QR code එක සම්බන්ධව මම අහන්නේ. ගරු කථානායකතුමනි, අලුත් වාහනවලටයි, පරණ වාහනවලටයි -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මට මේ ගැන අහන්න අවස්ථාව දෙන්න. මේක රටේම තිබෙන ප්‍රශ්නයක්. මට තත්පරයක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -882/2025- (2), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 -914/2025- (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු එරංග වීරරත්න නියෝජ්‍ය ඇමතිතුමා විසින් QR code සම්බන්ධ කරුණ පිළිබඳව උදේ වරුව තුළදී චාමර සම්පත් මන්ත්‍රීතුමාට පිළිතුරු ලබා දේවි.

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිවිල් ආරක්ෂක බළකා මූලස්ථාන: භට පිරිස්

### அநுராதபுர மாவட்டத்திலுள்ள சிவில் பாதுகாப்புப் படைத் தலைமையகங்கள்: சிப்பாய்கள்

### CIVIL DEFENCE FORCE HEADQUARTERS IN ANURADHAPURA DISTRICT: TROOPS

1245/2025

7. **ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති සිවිල් ආරක්ෂක බළකායේ මූලස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් මූලස්ථානය වෙත අනුයුක්ත කර සිටින නිලධාරීන් හා භටයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට එම නිලධාරීන් සහ භටයන් යොදවා ඇති කාර්යයන් කවරේද;

(iv) එම එක් එක් කාර්යයට අනුයුක්ත කර ඇති නිලධාරීන් හා භටයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත මූලස්ථාන විසින් ගොවිපළ හා ව්‍යාපාර පවත්වාගෙන යන්නේද;

(ii) එසේ නම්, එම ගොවිපළ හා ව්‍යාපාර කවරේද;

(iii) එම එක් එක් ගොවිපළට/ව්‍යාපාරයට අයත් භූමි ප්‍රමාණය, පිහිටුවා ඇති ප්‍රදේශය සහ අනුයුක්ත කර ඇති නිලධාරීන් හා භටයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2024 සහ 2025 වර්ෂවල ඉහත සඳහන් එක් එක් ගොවිපළේ/ව්‍යාපාරයේ ආදායම හා වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுர மாவட்டத்தில் தாபிக்கப்பட்டுள்ள சிவில் பாதுகாப்புப் படைத் தலைமையகங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு தலைமையகத்துக்கும் சேவை இணைப்புச் செய்யப்பட்டுள்ள அலுவலர்கள் மற்றும் சிப்பாய்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) தற்போது மேற்படி அலுவலர்கள் மற்றும் சிப்பாய்கள் எவ்வகையான பணிகளில் ஈடுபடுத்தப்பட்டுள்ளனர் என்பதையும்;

(iv) மேற்படி ஒவ்வொரு பணிகளுக்கும் சேவை இணைப்புச் செய்யப்பட்டுள்ள அலுவலர்கள் மற்றும் சிப்பாய்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி தலைமையகங்களால் பண்ணை நடவடிக்கைகளும் தொழில்முயற்சிகளும் மேற்கொள்ளப்படுகின்றனவா என்பதையும்;\

(ii) ஆமெனில், மேற்படி பண்ணைகள் மற்றும் தொழில்முயற்சிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பண்ணைக்கும்/ தொழில்முயற்சிக்கும் சொந்தமான நிலத்தின் அளவு, அவை அமைக்கப்பட்டுள்ள பிரதேசம் மற்றும் அவற்றுடன் சேவை இணைப்புச் செய்யப்பட்டுள்ள அலுவலர்கள் மற்றும் சிப்பாய்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iv) 2024 மற்றும் 2025ஆம் ஆண்டுகளில் மேற்குறிப்பிடப்பட்ட ஒவ்வொரு பண்ணையினதும் / தொழில்முயற்சியினதும் வருமானம் மற்றும் செலவு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House the -

(i) number of Civil Defence Force Headquarters established in the Anuradhapura District;

(ii) number of officers and troops attached to each of those headquarters, separately;

(iii) tasks that those officers and troops have been currently assigned to; and

(iv) number of officers and troops assigned to each task, separately?

(b) Will he also inform this House-

(i) whether the above-mentioned headquarters maintain farms and enterprises;

(ii) if so, the names of those farms and enterprises;

(iii) the extent of land belonging to each farm/ enterprise, the area in which it is located and the number of officers and troops attached to it, separately; and

(iv) the income and expenditure of each of the above-mentioned farms/ enterprises in the years 2024 and 2025, separately?

(c) If not, why?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point එක කියන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92 (2) (ආ) යටතේ රීති ප්‍රශ්න ගැන සඳහන් වෙනවා. ඔබතුමා තමයි දැන් මූලසුනේ ඉන්නේ, ගරු කථානායකතුමනි. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කියන්නේ, 92 - *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, කලින් ප්‍රශ්නයේදී "අදාළ නැහැ" කියලා ඇමතිතුමා වාඩි වුණා. ගරු කථානායකතුමනි, ඔබතුමා තේරුම් ගන්න, අසා තිබෙන ප්‍රශ්නය. ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ 2020 වර්ෂයේ සිට මේ දක්වා නොරොච්චෝලේ විදුලි බලාගාරයෙන් - *[බාධා කිරීම්]* ඒ කියන්නේ, මේ දක්වා. මේ දක්වා. ඉතින්, අදාළ නැති වෙන්නේ කොහොමද? *[බාධා කිරීම්]* අදාළ නැති වෙන්නේ කොහොමද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ, ගරු මන්ත්‍රීතුමා. අසා තිබෙන ප්‍රධාන ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්නයක් නොවෙයි, එතුමා ඇහුවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඔබතුමා තේරුම් ගන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, 7වැනි ප්‍රශ්නයට පිළිතුර ලබා දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) බළකා මූලස්ථාන - 06කි.

(ii)

| බලකාය | ත්‍රිවිධ හමුදා/ පොලිස් නිලධාරින් | ත්‍රිවිධ හමුදා සෙසු නිලයන් | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සාමාජිකයන් | එකතුව |
|---|---|---|---|---|
| අනුරාධපුර | 03 | 11 | 1937 | 1951 |
| වැලිඔය (සම්පත් නුවර) | 03 | 01 | 1797 | 1801 |
| විල්පත්තුව (තන්තිරිමලේ) | 01 | 03 | 1737 | 1741 |
| හොරොව්පතාන | 02 | 04 | 756 | 762 |
| කැබිතිගොල්ලෑව | 01 | 03 | 1126 | 1130 |
| ගල්කිරියාගම | 01 | 06 | 542 | 549 |
| එකතුව | 11 | 28 | 7895 | 7934 |

(iii) 1. අණදෙන නිලධාරි/ දෙවන අණදෙන නිලධාරි රාජකාරි

2. බලකා/ උපබලකා/අනුකලාප ලිපිකරු/ පාලන/ සුභසාධක රාජකාරි.

3. පොලිස් ස්ථාන රාජකාරි

4. වෙඩි බෙහෙත් ගබඩා ආරක්ෂක රාජකාරි

5. ආගමික ස්ථාන රාජකාරි

6. බලකාය තුළ ව්‍යාපෘති රාජකාරි (ආදායම් ලබන)

7. පුරාවිද්‍යා ස්ථාන රාජකාරි

8. ඇහලුම් කම්හල් රාජකාරි

9. පෙර පාසල් ගුරු රාජකාරි

10. පාසල් ගුරු රාජකාරි

11. ආරක්ෂක රාජකාරි

12. ක්‍රීඩා සංචිතය

13. ජීවිතාරක්ෂක රාජකාරි

14. සෞන්දර්ය රාජකාරි

15. මත්ද්‍රව්‍ය නිවාරණ රාජකාරි

16. ඉදිකිරීම් හා වෙනත් රාජකාරි යා කිරීම් (ශ්‍රමය පමණි)

17. ජල පෙරණ යන්ත්‍ර නඩත්තු රාජකාරි

18. රාජ්‍ය ආයතන ආරක්ෂක රාජකාරි (මුදල් අපයන)

19. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රාජකාරි.

20. ආවරණ රාජකාරි.

(iv) ඇමුණුම 01හි දක්වා ඇත.

ඇමුණුම 01:

| | යොදවා ඇති රාජකාරිය | අනුරාධපුර | වැලිඔය | විල්පත්තුව | හොරොව්පොතාන | කැබිතිගොල්ලෑව | ගල්කිරියාගම | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | අණදෙන නිලධාරි | 1 | 1 | 1 | 1 | 1 | 1 | 06 |
| 2 | දෙවන අණදෙන නිලධාරි | 1 | 1 | - | 1 | - | - | 03 |
| 3 | අධීක්ෂණ රාජකාරි | 12 | 2 | 3 | 4 | 3 | - | 24 |
| 4 | උපදේශක රාජකාරි | - | - | - | - | - | 5 | 05 |
| 5 | රියදුරු (සිවිල් නිලධාරි) | - | - | - | - | - | 1 | 01 |
| 6 | බලකා මූලස්ථාන රාජකාරි | 94 | 99 | 132 | 73 | 71 | 74 | 543 |
| 7 | උප බලකා මූලස්ථාන රාජකාරි | - | 203 | 49 | - | - | 30 | 282 |
| 8 | අනු කලාප මූලස්ථාන රාජකාරි | 227 | - | 47 | 166 | 130 | 32 | 602 |
| 9 | පොලිස් ස්ථාන රාජකාරි | 257 | 40 | 163 | 38 | 27 | 19 | 544 |
| 10 | වෙඩි බෙහෙත් ගබඩා ආරක්ෂක රාජකාරි | 2 | - | - | - | - | 11 | 13 |
| 11 | ආගමික ස්ථාන රාජකාරි | 352 | 65 | 83 | 35 | 76 | 30 | 641 |
| 12 | බලකාය තුළ ව්‍යාපෘති රාජකාරි (ආදායම් ලබන) | 224 | 671 | 634 | 268 | 507 | 8 | 2312 |
| 13 | පුරාවිද්‍යා ස්ථාන | - | 50 | - | - | - | 10 | 60 |
| 14 | ඇහළුම් කම්හල් රාජකාරි | 74 | 94 | 69 | - | - | - | 237 |
| 15 | පෙර පාසල් ගුරු රාජකාරි | 23 | 74 | - | 28 | 21 | 1 | 147 |
| 16 | පාසල් ගුරු රාජකාරි | 16 | 26 | 15 | 4 | 25 | 1 | 87 |
| 17 | ආරක්ෂක රාජකාරි | 67 | - | 12 | - | 7 | - | 86 |
| 18 | ක්‍රීඩා සංචිතය | 4 | 8 | - | - | 1 | 1 | 14 |
| 19 | ජීවිතාරක්ෂක රාජකාරි | 12 | - | - | 1 | - | - | 13 |
| 20 | සෞන්දර්ය රාජකාරි | 30 | 15 | 12 | 12 | 11 | 4 | 84 |
| 21 | මත්ද්‍රව්‍ය නිවාරණ රාජකාරි | 1 | 7 | - | 1 | - | - | 9 |
| 22 | ඉදිකිරීම් හා වෙනත් රාජකාරි යා කිරීම් (ශ්‍රමය පමණි) | 9 | 13 | 18 | 16 | 8 | 4 | 68 |
| 23 | ඉදිකිරීම් හා වෙනත් රාජකාරි යා කිරීම් (මුදල් උපයන) | - | - | - | 20 | 10 | 1 | 31 |
| 24 | ජල පෙරණ යන්ත්‍ර නඩත්තු රාජකාරි | 38 | 108 | 34 | 27 | 11 | 7 | 225 |
| 25 | රාජ්‍ය ආයතන ආරක්ෂක රාජකාරි (මුදල් උපයන) | 135 | 12 | - | 12 | 3 | 93 | 255 |
| 26 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු රාජකාරි | 152 | 213 | 266 | 10 | 2 | 193 | 836 |
| 27 | විශ්‍රාම පූර්ව නිවාඩු | 8 | 7 | 36 | 1 | - | 1 | 53 |
| 28 | ප්‍රසූත නිවාඩු (වැටුප් ලබන) | 2 | 1 | - | 1 | - | - | 4 |
| 29 | අසනීප නිවාඩු (වැටුප් ලබන) | 78 | 29 | 49 | 2 | 55 | 5 | 218 |
| 30 | වැටුප් නොලබන සංඛ්‍යාව | 12 | 62 | 1 | 41 | - | 17 | 133 |
| 31 | අතිරික්ත භට පිරිස් ප්‍රමාණය (ආවරණ රාජකාරි) | 120 | - | 117 | - | 161 | - | 398 |
| | මුළු එකතුව | 1951 | 1801 | 1741 | 762 | 1130 | 549 | 7934 |

(ආ) (i) ඔව්.

(ii)

| අනු කලාපය | ව්‍යාපෘතිය/ව්‍යාපාර |
|---|---|
| මරදම්මඩුව | පේර (යටිවගා) ව්‍යාපෘතිය |
| | කටු අනෝදා ව්‍යාපෘතිය |
| | දෙහි ව්‍යාපෘතිය |
| | කෙසෙල් (සරුසාර) ව්‍යාපෘතිය |
| | එළු ව්‍යාපෘති |
| | අඳ වී |
| පෙරියකුලම | පේර ව්‍යාපෘතිය |
| | නව පේර ව්‍යාපෘතිය |
| | පොල් ව්‍යාපෘතිය - 1 |
| | පොල් ව්‍යාපෘතිය - 2 |
| | නව පොල් ව්‍යාපෘතිය - 2 |
| | කෙසෙල් ව්‍යාපෘතිය |
| | අඳ වී |
| සිගිරිවත්ත | දෙහි ව්‍යාපෘතිය |
| | අඳ වී |
| මිමින්නාවල | පොල් ව්‍යාපෘතිය |
| | අඳ වී |
| පාසල් වත්ත | පොල් (ගැමුණු) ව්‍යාපෘතිය |
| | කුළුබඩු ව්‍යාපෘතිය |
| | කාබනික පොහොර ව්‍යාපෘතිය |
| | අඳ වී |
| කුඹුගොල්ලෑව | අඳ වී |
| අරිප්පුව | අඳ වී |
| තම්මැන්නා ඇලවක | අඳ වී |
| මැදවච්චිය | අඳ වී |
| පරණහල්මිල්ලෑව | අඳ වී |
| පුල් එළිය | අඳ වී |

(iii) ඇමුණුම 02හි ඇති වගුවේ (i), (iii) හා (iv) තීරු මඟින් දක්වා ඇත.

*ඇමුණුම 02:*

| ස්ථිර බෝග | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (i) | (ii) | (iii) | (iv) | (v) | | (vi) | |
| | | | | 2024 | | 2025 | |
| අනු කලාපය | ව්‍යාපෘතිය | අක්කර ගණන | හට සංඛ්‍යාව | වියදම(රු.) | ආදායම(රු.) | වියදම(රු.) | ආදායම(රු.) |
| මරදම්මඩුව | පේර (යටිවගා) ව්‍යාපෘතිය | 1 | 1 | | 35890.00 | 7440.00 | 99035.00 |
| පෙරියකුලම | පේර ව්‍යාපෘතිය | 0.25 | 1 | 4384.00 | 39332.50 | - | 32115.00 |
| පෙරියකුලම | නව පේර ව්‍යාපෘතිය | 1 | 2 | | 9225.00 | - | 37840.00 |
| එකතුව | | **2.25** | **4** | 4384.00 | 84447.50 | 7440.00 | 168990.00 |
| සැගිරිවත්ත | දෙහි ව්‍යාපෘතිය | 1 | 2 | - | - | - | අස්වනු නෙලන මට්ටමේ පවතී |
| එකතුව | | **1** | **2** | - | - | - | |
| ත/ඇලවක | කටුඅනෝදා (ප්‍රගති) ව්‍යාපෘතිය | 2.5 | 3 | 8925.00 | - | 6580.00 | |
| මරදම්මඩුව | කටුඅනෝදා ව්‍යාපෘතිය | 1.5 | 2 | | - | 27540.00 | |
| එකතුව | | **4** | **5** | 8925.00 | - | 34120.00 | |
| මිමින්නාවල | පොල් ව්‍යාපෘතිය | 1 | 3 | - | - | 5780.00 | - |
| පාසල්වත්ත | පොල් (ගැමුණු) ව්‍යාපෘතිය | 1 | 2 | - | 56668.00 | 7225.00 | - |
| පෙරියකුලම | පොල් ව්‍යාපෘතිය -1 | 1 | 2 | - | 54500.00 | 37370.00 | - |
| පෙරියකුලම | පොල් ව්‍යාපෘතිය - 3 | 2 | 2 | - | - | 6580.00 | - |
| පෙරියකුලම | නව පොල් ව්‍යාපෘතිය -2 | 1 | 1 | - | - | 37370.00 | - |
| එකතුව | | **6** | **10** | - | 111168.00 | 94325.00 | 179341.00 |
| මරදම්මඩුව | දෙළුම් ව්‍යාපෘතිය | 1.5 | 2 | 15300.00 | - | 27540.00 | අස්වනු නෙලන මට්ටමේ පවතී |
| එකතුව | | **1.5** | **2** | 15300.00 | - | 27540.00 | |

| වාර්ෂික බෝග ව්‍යාපෘති | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2024 | | 2025 | |
| අනුකලාපය | ව්‍යාපෘතිය | අක්කර ගණන | හට සංඛ්‍යාව | වියදම(රු.) | ආදායම(රු.) | වියදම(රු.) | ආදායම(රු.) |
| පෙරියකුලම | කෙසෙල් ව්‍යාපෘතිය | 1 | 2 | 12400.00 | 90030.00 | 14060.00 | 42400.00 |
| මරදම්මඩුව | කෙසෙල් (සරුසාර) ව්‍යාපෘතිය | 1 | 4 | 15680.00 | 58730.00 | 10990.00 | 17400.00 |
| එකතුව | | **2** | **6** | **28080.00** | **148760.00** | **25050.00** | **59800.00** |

| කෘෂි නොවන ව්‍යාපෘති | | | | | | |
|---|---|---|---|---|---|---|
| අනුකලාපය | ව්‍යාපෘතිය | හට සංඛ්‍යාව | 2024 | | 2025 | |
| | | | වියදම(රු.) | ආදායම(රු.) | වියදම(රු.) | ආදායම(රු.) |
| මරදම්මඩුව | එළු ව්‍යාපෘතිය | 1 | - | - | - | - |
| පාසල්වත්ත | කුළු බඩු | 3 | 99495.00 | 265780.50 | 168249.50 | 156887.50 |
| පාසල්වත්ත | කාබනික පොහොර ව්‍යාපෘතිය | 5 | 7560.00 | 194100.00 | | 146250.00 |
| එකතුව | | **9** | 107055.00 | 459880.50 | 168249.50 | 303137.50 |

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

**1. 2023/2024 මහ කන්නය**

| අනු අංකය | අනු කලාපය | වගා කරන ලද බෝගය | වගා කල අක්කර ප්‍රමාණය | යෙදවූ හට සංඛ්‍යාව | සම්පූර්ණ වියදම (රු.) | ලබාගත් අස්වැන්න | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | අලෙවි කළ ප්‍රමාණය(කි.ග්‍රෑ) | අදායම(රු.) |
| 1 | මරදම්මඩුව | වී | 5 | 6 | 136,256.00 | 5685 | 667987.50 |
| 2 | පෙරියකුලම | වී | 2 | 2 | 54,360.00 | 1,210 | |
| 3 | සැගිරිවත්ත | උඳු | 10 | 5 | 194,500.00 | 520 | 4,213,365.00 |
| 4 | පෙරියකුලම | උඳු | 5 | 6 | 110,250.00 | 733 | |
| 5 | පාසල්වත්ත | උඳු | 5 | 5 | 97,250.00 | 2,228 | |
| 6 | මරදම්මඩුව | උඳු | 31 | 35 | 797,250.00 | 1,143 | |
| 7 | අරිප්පුව | උඳු | 10 | 5 | 194,500.00 | 1,040 | |
| 8 | පුල්එලිය | උඳු | 9 | 9 | 198,450.00 | 1,210 | |
| එකතුව | | | 77 | 73 | 1,782,816.00 | 12,559 | 4,881,352.50 |

**2. 2024 යල කන්නය**

| අනු අංකය | අනු කලාපය | වගා කරන ලද බෝගය | වගා කල අක්කර ප්‍රමාණය | යෙදවූ හට සංඛ්‍යාව | සම්පූර්ණ වියදම (රු.) | ලබාගත් අස්වැන්න | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | අලෙවි කළ ප්‍රමාණය(කි.ග්‍රෑ) | අදායම(රු.) |
| 1 | මරදම්මඩුව | වී | 4 | 4 | 32,968.00 | 1,615 | 208,335.00 |

**3. 2024/2025 මහ කන්නය**

2024/2025 මහ කන්නයේ වගාව අද පදනම මත වී වගා කටයුතු සිදුකර ඇති බැවින් වැයදැරීම් සිදුකර නොමැත.

**4. 2025 යල කන්නය**

| අනු අංකය | අනු කලාපය | වගා කරන ලද බෝගය | වගා කල අක්කර ප්‍රමාණය | යෙදවූ හට සංඛ්‍යාව | සම්පූර්ණ වියදම (රු.) | ලබාගත් අස්වැන්න | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | අලෙවි කළ ප්‍රමාණය(කි.ග්‍රෑ) | අදායම(රු.) |
| 1 | තම්මැන්නාඇලවක | තල | 11 | 11 | 26,700.00 | 1,929 | 520,830.00 |
| 2 | පුල්එලිය | මඤ්ඤොක්කා | 0.75 | 1 | - | අස්වනු නෙලීමට ඇත | |
| එකතුව | | | 11.75 | 12 | 26,700.00 | 1,929 | 520,830.00 |

*(iv)* ඉහත ඇමුණුම 02හි ඇති වගුවේ (v) සහ (vi) තීරු මඟින් දක්වා ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා ලබා දුන් පිළිතුර අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිවිල් ආරක්ෂක බළකායේ මූලස්ථාන හයක් තිබෙනවා. මම (ආ) යටතේ යොමු කළ ප්‍රශ්නය තමයි, එම මූලස්ථාන විසින් පවත්වාගෙන යන ගොවිපළවල් ප්‍රමාණය කොච්චරක්ද සහ ඒවා වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්න කියන එක. හැබැයි, ඒ ඉදිරිපත් කළ පිළිතුරේ ගරු කථානායකතුමනි, කැබිතිගොල්ලෑව බළකා මූලස්ථානයේ තොරතුරු සඳහන් වෙලා නැහැ. සමහර ගොවිපළවල් සම්බන්ධයෙන්, සමහර ආදායම් මාර්ග සම්බන්ධයෙන් එම පිළිතුරේ නිශ්චිත ලෙස සඳහන් වෙලා නැහැ කියන අදහසක් තමයි මට තිබෙන්නේ. එම නිසා ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් නැවත විධිමත් වාර්තාවක් ලබා දීමට අදාළ මැදිහත් වීමක් කරන්නේද කියන කාරණය මම පළමු අතුරු ප්‍රශ්නය හැටියට ඔබතුමාට යොමු කරනවා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කියනවා නම් (ආ) (ii) ප්‍රශ්නයට ලබා දුන් පිළිතුර ප්‍රමාණවත් නැහැයි කියලා, ඉදිරි කාලයේ ඊට අදාළව ප්‍රමාණවත් පිළිතුරක් සපයන්න පොරොන්දු වනවා.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්තව රාජකාරි කරන හට පිරිසෙන් 10,000ක් පොලිස් දෙපාර්තමේන්තුවටත්, 5,000ක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටත් ගන්න පසුගිය දවස්වල රජය තීරණයක් ගත්තා, වනඅලි ප්‍රශ්නයට අවශ්‍ය මැදිහත්වීම කරන්න ඕනෑය කියන අරමුණින්. හැබැයි, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටත්, පොලිස් දෙපාර්තමේන්තුවටත් අනුයුක්ත කළ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ එම හට පිරිස් ස්ථානගත කරද්දී විධිමත් ලෙස ස්ථානගත කිරීම් වෙලා නැහැ. එතැනදී මානුෂීයව බැලිය යුතු සමහර කාරණා තිබෙනවා. හැබැයි, එම මානුෂීය කාරණා නොසලකා සමහර තැන්වලට අවිධිමත් ලෙස ස්ථානගත කිරීම් කරනවා. එම නිසා පහළ සිටින හට පිරිස්වලින් අපට බොහෝ පැමිණිලි එනවා, මේ සම්බන්ධයෙන් මැදිහත් වීමක් කරන්න කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එම ස්ථානගත කිරීම් විධිමත් ලෙස සිදු කර තිබෙනවාද, එසේ නොමැති නම් අමාත්‍යාංශය විසින් විධිමත් ලෙස ස්ථානගත කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරනවාද කියලා මම අහනවා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, එම රාජකාරි සඳහා බඳවා ගැනීමේදී දිවයිනේ ඕනෑම තැනක රාජකාරියට සූදානම් බවට ඔවුන්ගෙන් ප්‍රතිඥා අරගෙන තමයි බඳවා ගන්නේ. නමුත්, කිසියම්

නිලධාරියෙකුට ඇත්ත මානුෂීය හේතු මත තමන්ගේ පෞද්ගලිකත්වය පදනම් කරගෙන යම් යම් ගැටලුවක් ඇති වුණොත් ගරු කථානායකතුමනි, අභියාචනා ක්‍රියාවලියක් තිබෙනවා. ඒ අභියාචනා ක්‍රියාවලියට යටත්ව තමයි සෑම නිලධාරියෙකුම ස්ථානමාරු කිරීම සිදු කරන්නේ. සිවිල් ආරක්ෂක බලකායේ සියලු නිලධාරින්ට එම අයිතිය හිමිව තිබෙනවා. කිසියම් නිලධාරියෙකුට යම් ගැටලුවක් ඇති වෙලා නම් අභියාචනා ක්‍රියාවලියට යටත්ව අපි එම ප්‍රශ්නය විසඳනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 8 -1372/ 2025- (1), ගරු චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

## නායයෑම් තර්ජනයට ලක් වූ මොරවක මහෙස්ත්‍රාත් අධිකරණ ගොඩනැඟිල්ල: ප්‍රතිසංස්කරණය

### மண்சரிவு அச்சுறுத்தலுக்கு உள்ளாகியுள்ள மொறவக்க நீதவான் நீதிமன்ற கட்டிடம்: புனரமைப்பு

### LANDSLIDE PRONE MORAWAKA MAGISTRATE'S COURT BUILDING: RENOVATION

1678/2025

**9. ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නායයෑමේ තර්ජනයක් හේතුවෙන් මොරවක මහෙස්ත්‍රාත් අධිකරණය 2021 වර්ෂයේ සිට ගැටබරු රජමහා විහාරයේ ශාලාවක තාවකාලිකව පවත්වාගෙන යන බවත්;

(ii) ඒ සඳහා විශාල මුදලක් මාසික කුලිය ලෙස වැයවන බවත්;

(iii) තාවකාලික ගොඩනැඟිල්ලේ ඉඩ ප්‍රමාණය, භෞතික සම්පත් සහ තාක්ෂණික පහසුකම් ප්‍රමාණවත් නොවීමෙන් අධිකරණ කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට නොහැකිවී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මෙම මූල්‍ය පාඩුව වළක්වා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) මහෙස්ත්‍රාත් අධිකරණය පෙර පැවති භූමිය පිළිබඳව භූ විද්‍යාත්මක තත්ත්ව වාර්තාවක් මේ වනවිට ලැබී තිබේද;

(iii) එම වාර්තාව මඟින් ලබාදී ඇති නිර්දේශ කවරේද;

(iv) මොරවක මහෙස්ත්‍රාත් අධිකරණය ස්ථිරව ස්ථානගත කිරීම සඳහා ගතවන කාලවකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மண்சரிவு ஏற்படக்கூடிய அச்சுறுத்தல் இருப்பதன் காரணமாக மொறவக்க நீதவான் நீதிமன்றம் 2021ஆம் ஆண்டிலிருந்து கெட்டபரு ரஜமஹா விகாரையின் வளாகத்திலுள்ள கட்டிடமொன்றில் தற்காலிகமாக இயங்கி வருகின்றது என்பதையும்;

(ii) இக்கட்டிடத்துக்கான மாதாந்த வாடகையாகப் பெருந்தொகைப் பணம் செலவிடப்படுகின்றது என்பதையும்;

(iii) மேற்படி தற்காலிக கட்டிடத்தில் காணப்படும் இடவசதி, பௌதிக வளங்கள் மற்றும் தொழில்நுட்ப வசதிகள் பற்றாக்குறை காரணமாக நீதிமன்ற செயற்பாடுகளை வினைத்திறன் மிக்க வகையில் மேற்கொள்ள முடியாதுள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) தற்போது ஏற்பட்டுள்ள நிதி ரீதியான நட்டத்தை தவிர்ப்பதற்கு எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) நீதிவான் நீதிமன்றம் முன்னர் அமைந்திருந்த காணி சம்பந்தமாக புவிச்சரிதவியல் தரத்தை உறுதிப்படுத்தும் அறிக்கை இன்றளவில் கிடைத்துள்ளதா என்பதையும்;

(iii) ஆமெனின், இவ்வறிக்கையில் குறிப்பிடப் பட்டுள்ள விதப்புரைகள் யாவை என்பதையும்;

(iv) மொறவக்க நீதவான் நீதிமன்றத்தை நிரந்தரக் கட்டிடமொன்றில் இயங்கச் செய்வதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Is he aware that -

(i) the Morawaka Magistrate's Court has been operating temporarily in a hall at the Gatabaru Rajamaha Viharaya since 2021 due to a threat of landslide;

(ii) a large sum is being incurred as monthly rent for the aforementioned premises; and

(iii) the inadequacy of space, physical resources and technical facilities in this temporary building has hindered the efficient conduct of the court's proceedings?

(b) Will he inform this House -

(i) the steps that have been taken to prevent this financial loss;

(ii) whether a report on the geological condition of the land on which the Magistrate's Court was previously located has been received by now;

(iii) the recommendations given in that report; and

(iv) the expected time frame for the permanent relocation of the Morawaka Magistrate's Court?

(c) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අධිකරණ ගොඩනැඟිල්ලට ඉහළින් ඇති රූඳවුම් බෑම්මේ කොටසක් ඉරිතැලීමට ලක්ව ඉදිරියට නෙරා ඒම සහ ඉහළින් ඇති කඳු බෑවුම අස්ථාවර වීම හේතුවෙන් ගොඩනැඟිල්ලට හා එය භාවිතයට ගන්නන්ට ඇති වූ අවදානම් තත්ත්වය සලකා බලා අධිකරණය 2021.01.18 දින සිට කොටපොළ ගැටබරුව රජමහා විහාරස්ථානයේ කුලී පදනමකට ලබාගත් ගොඩනැඟිල්ලක පිහිටුවා ඇත.

(ii) එම ගොඩනැඟිල්ල සඳහා රුපියල් 440,000.00ක මුදලක් මාසික කුලිය ලෙස ගෙවීම් කරනු ලැබේ.

(iii) අධිකරණය පවත්වාගෙන යන්නේ තාවකාලිකව කුලියට ගත් නොඩනැඟිල්ලක බැවින්, භෞතික සම්පත් සහ තාක්ෂණික පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සේවාලාභීන් හා අධිකරණ නිලධාරීන් අවම පහසුකම් යටතේ අධිකරණ කටයුතු පවත්වාගෙන යනු ලබයි. එසේම, නඩු භාණ්ඩ ගබඩා කිරීම සඳහා දැනටමත් භාවිත කරන්නේ මොරවක අධිකරණ ගොඩනැඟිල්ල වේ.

(ආ) (i) අධිකරණයට ඉහළින් ඇති රූඳවුම් බෑම්ම හා කඳු බෑවුම ස්ථාවර කිරීම සඳහා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය මඟින් 2021 වසරේ දී නිර්දේශ හා ඇස්තමේන්තු ලබා දී ඇත. එහෙත්, රට තුළ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වී ඇත.

(ii) නැවතත් අධිකරණය මෙම ගොඩනැඟිල්ල තුළ ස්ථාපනය කිරීමේ අරමුණෙන් 2025 වසරේදී ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය මඟින් නිර්දේශ, සැලසුම් හා ඇස්තමේන්තු ලබා ගෙන ඇත.

(iii) එමඟින් රූඳවුම් බෑම්මේ උස යම්තාක් දුරකට අඩුකර, රූඳවුම් බෑම්මට ඉහළින් ඇති කඳු බෑවුම පස් සවිවර ගැන්වීමේ - soil nailing - ක්‍රමය ඔස්සේ ස්ථාවර කිරීම සඳහා නිර්දේශ ලබා දී ඇත.

(iv)

- එම ව්‍යාපෘතිය ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ උපදේශක සේවා ලබා ගනිමින් ක්‍රියාත්මක කිරීම සඳහා අමප/25/1299/818/082 හා 2025/08/04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇත.

- එම අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දීමෙන් අනතුරුව, මෙම කාර්යය ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය මඟින් ක්‍රියාත්මක කරනු ලබන, "ස්ථායිකරණ ක්‍රමවේද මඟින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය" හරහා ඉටු කළ හැකි බව දන්වා තිබූ බැවින් එලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශයේ එකඟතාවය දන්වා ඇත. ඒ සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව - AIIB - හා ශ්‍රී ලංකා රජය අතර ඇති වූ ගිවිසුම්ගත ණය මුදලක් හරහා මූල්‍ය ප්‍රතිපාදන සපයන බව දන්වා ඇත.

- ඒ අනුව, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රසම්පාදන කටයුතු ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය මඟින් සිදු කරමින් පවතී.

  මෙම කටයුතු අවසන් කිරීමෙන් අනතුරුවඅධිකරණ ගොඩනැඟිල්ල ද අලුත්වැඩියා කළ යුතුව පවතී. ඒ අනුව වසරක කාලයක දී අධිකරණය එම ගොඩනැඟිල්ල වෙත විතැන් කළ හැකි වෙතැයි අපේක්ෂා කෙරේ.

  මෙම ව්‍යාපෘතිය, අප්‍රේල් මාසයේදී -ඒ කියන්නේ තවත් සති කිහිපයකින්, තුන්වන සතිය වන විට - ආරම්භ කිරීමට අපේක්ෂා කරනවා. ඒ වාගේම මාස හයක් ඇතුළත දී එම ස්ථාවර කිරීමේ කටයුතු අවසන් කිරීමට හැකි වෙතැයි ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය විසින් දන්වා තිබෙනවා. එම කාල සීමාව තුළදීම අධිකරණ සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු අවසන් කර මෙම වසරේ දෙසැම්බර් මාසයේ දී අධිකරණය එහි ස්ථාපිත කිරීමට අපේක්ෂා කරනවා.

(ඇ) පැන නොනඟී.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඇත්තටම මේ ප්‍රශ්නය වසර හතරකට වැඩි කාලයක් දිග් ගැස්සුණු ප්‍රශ්නයක්. අපි බලයට පත් වෙලා පැවැත්වුණු පළමුවැනි සම්බන්ධීකරණ කමිටුවේ ඉඳලාම මහජනතාව, නීතිඥයන් සහ ඒ අදාළ පාර්ශ්ව විසින් දිගින් දිගටම මේ පිළිබඳව ප්‍රශ්න කෙරුණා. අපි ඒ ගැන සාකච්ඡා කළා. ඒ හැම අවස්ථාවකදීම මම දැකපු කාරණයක් තමයි, මෙය හොඳ පැත්තට ඉටු කිරීම සඳහා වූ කටයුතු කිරීම සම්බන්ධයෙන් අදාළ නිලධාරි මහත්වරුන්ගේ පැත්තෙන් ප්‍රමාදයක් සිදු වෙමින් තිබුණු බව. ඔබතුමා ඒ පිළිබඳව හඳුනාගෙන තිබෙනවාද කියලා මම දැන ගන්න කැමැතියි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ඒ පිළිබඳව හඳුනා ගැනීමක් තිබෙනවා. සත්‍ය වශයෙන්ම කියනවා නම් අපි රජය භාර ගන්නකොට ආර්ථික අර්බුදය නිසා මඟ නැවතුණු ව්‍යාපෘති 60කට ආසන්න සංඛ්‍යාවක් තිබුණා. ගරු ලාල් ප්‍රේමනාත් මන්ත්‍රීතුමා විසින් මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. එවැනි ප්‍රශ්නයක් තිබෙන බව මටත් මුලින්ම දැන ගන්න ලැබෙන්නේ මගේ අමාත්‍යාංශය මඟින් නොවෙයි. ඔබතුමා මැදිහත් වෙලා ඒ පිළිබඳව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ කථා කරලා අපට දැනුම් දීපු ලිපිය හරහා තමයි මට මුලින්ම ඒ දැනුවත් වීම සිදු වෙන්නේ. ඉන් පසුව අපි අමාත්‍ය කාර්ය මණ්ඩලය සමඟ කටයුතු කරමින් කැබිනට් පත්‍රිකා දාලා අවශ්‍ය කටයුතු කළා. ඉන් පසුව ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය සමඟ සම්බන්ධ වෙලා අපි මේ පිළිබඳව කටයුතු කළා. නමුත් පසුගිය අවුරුද්දේ ඇති වෙච්ච "දිට්වා" සුළි කුණාටු තත්ත්වය නිසා ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයට අධික රාජකාරි ප්‍රමාණයක් පැවරී ඇති බව අපි හැමෝම දන්නා කාරණයක්. ඒ නිසා යම් පමාවීමක් සිදු වෙලා තිබෙනවා. එම පමා වීම නිවැරදි කරගෙන මේ වසරේ එය අවසන් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා, ගරු මන්ත්‍රීතුමනි. මේ ප්‍රශ්නය ඇසීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
ගරු ඇමතිතුමනි, මගේ ඊළඟ අතුරු ප්‍රශ්නය සහ යෝජනාවක් හැටියට ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න තිබෙනවා. මේ ප්‍රශ්නය

නිසා දැනටත් අවශ්‍ය අවම සනීපාරක්ෂක පහසුකම්වත් නොමැති තැනක තමයි මේ උසාවි කටයුතු සිදු වෙමින් පවතින්නේ. ඒ නිසා මහජනතාව, සාක්ෂිකරුවන් සහ ඇපකරුවන් ඇතුළු ඒ ස්ථානයට පැමිණෙන බොහෝ දෙනාට තමන්ගේ අවම පහසුකම්වත් සපුරා ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ වාගේම එය පවත්වාගෙන යන ස්ථානය වන ගැටබරු රජමහා විහාරය කියන්නේ බැතිමතුන් විශාල වශයෙන් පැමිණෙන ස්ථානයක්. උසාවි කටයුතු ඒ ස්ථානයේ පවත්වාගෙන යාම නිසා එම බැතිමතුන්ට තමන්ගේ ආගමික කටයුතු සඳහා ලොකු බාධාවක් ඇති වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු වීම ගැන ස්තුතිවන්ත වෙනවා. මෙය ඉතා ඉක්මනින් අවසන් කිරීම සඳහා කටයුතු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ඔව්, ඉතා ඉක්මනින් අවසන් කරන්න කටයුතු කරනවා. ගරු මන්ත්‍රීතුමනි, මා එම උසාවියේ තිබෙන අවම පහසුකම් සම්බන්ධව සාධාරණීකරණය කරන්න හදනවා නොවෙයි. එය පිළිගත නොහැකි තත්ත්වයක්. නමුත්, බහුතරයක් උසාවිවල වසර ගණනාවක් තිස්සේ පවතින ගැටලුවලට පිළිවෙළින් පිළියම් යොදනවා. විශේෂයෙන්ම ඔබතුමා නඟපු ප්‍රශ්නයට අදාළ උසාවියේ වැඩ නම් මේ වසරේ අවසන් කළ යුතුයි. මක්නිසාද, හොඳ ගොඩනැඟිල්ලක් තබාගෙන තවත් තැනකට කුලී ගෙවමින් ඉන්න එක පිළිගන්න පුළුවන් තත්ත්වයක් නොවෙයි. ඒ නිසා පහසුකම් සහිත එම අධිකරණය ස්ථාපිත කරන්න මේ වසර තුළම හැකි සෑම උත්සාහයක්ම ගන්නවා. එය සාර්ථක වෙයි කියා මම බලාපොරොත්තු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 10 -1711/2025- (1), ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## දීමනා පත්‍ර හෝ ඉඩම් බලපත්‍රලාභීන්: කෝරළේපත්තු ප්‍රා.ලේ. කොට්ඨාසය
## அளிப்புப் பத்திரங்கள் அல்லது காணி உரிமப் பத்திரங்கள் பெற்றவர்கள்: கோரளைப்பற்று பிரதேச செயலாளர் பிரிவு
## RECIPIENTS OF DEEDS OF GRANT OR LAND PERMITS : KORALAIPATTU DS DIVISION

882/2025

**5. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Dr.) M.L.A.M. Hizbullah)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළේපත්තුව, වාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති රජයේ ඉඩම් සඳහා 2017.01.01 සිට 2025.03.31 දක්වා කාලවකවානුව තුළ රජයේ 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' ලබා දුන් ඉඩම්වල ජනතාව පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2017.01.01ஆம் திகதி தொடக்கம் 2025.03.31ஆம் திகதி வரையான காலப்பகுதியில், மட்டக்களப்பு மாவட்டத்தின், கோரளைப்பற்று, வாழைச்சேனை பிரதேச செயலாளர் பிரிவில் அரசாங்கத்தால் 'அளிப்புப் பத்திரங்கள்' அல்லது 'காணி உரிமப் பத்திரங்கள்' ஊடாக வழங்கப்பட்ட அரச காணிகளில் மக்கள் வசிக்கின்றார்கள் என்பதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், அவ்வாட்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள் மற்றும் ஏற்புடைய தகவல்கள் என்பன யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that people have settled in State lands for which Deeds of Grant or Land Permits were given during the period from 01.01.2017 to 31.03.2025, out of the State lands situated in the Divisional Secretary's Division of Koralaipattu, Valaichenai in the Batticaloa District; and

(ii) if so, the total number of such people, their names and other relevant information?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2017.01.01 සිට 2025.03.31 දක්වා බලපත්‍ර 125 හා දීමනා පත්‍ර 229 නිකුත් කර ඇත.

(ii) ඉඩම්ලාභීන් එම ඉඩම් සංවර්ධනය කර භුක්ති විඳින බව ප්‍රාදේශීය ලේකම් දැනුම් දී ඇත. (ඇමුණුම A**)

(ආ) අදාළ නොවේ.

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

## ගවයින්ගේ කෘත්‍රිම සිංචනය: විස්තර
பசுக்களுக்கு செயற்கை முறைக் கருவூட்டல்: விபரம்
ARTIFICIAL INSEMINATION OF CATTLE: DETAILS

914/2025

**6. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, පශු සම්පත් සංවර්ධන උපදේශකවරුන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ගවයින්ගේ කෘත්‍රිම සිංචනය සඳහා එම උපදේශකවරුන්ට අමතරව කොන්ත්‍රාත් සේවකයන් සිටින්නේද;

(iii) එම සේවකයන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඔවුන්ට දීමනා ගෙවන පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) කෘත්‍රිම සිංචනය සඳහා ගාස්තුවක් අය කරන්නේද;

(ii) එක් කෘත්‍රිම සිංචනයකට ගාස්තුව කොපමණද;

(iii) ඉහත උපදේශකවරයෙකු සහ කොන්ත්‍රාත් සේවකයෙකු එක් කෘත්‍රිම සිංචනයකට අය කරන ගාස්තුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත ගාස්තු දෙකම සමාන නම්, එය විෂමතාවයක් නොවන්නේද;

(v) දෙවැනි හෝ තෙවැනි කෘත්‍රිම සිංචනයේදීත් ඉහත ගාස්තුවම අය කරන්නේද;

(vi) එසේ නම්, එය අසාධාරණයක් නොවන්නේද;

(vii) කෘත්‍රිම සිංචනයේ ඵලදායිතාවය ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(viii) ගවයන්, එළුවන් සහ ඌරන් ආදී සතුන්ගේ රෝගවලට ප්‍රතිකාර කිරීමට ගොවිපළට පැමිණෙන පශු වෛද්‍ය නිලධාරීන්ට/පශු සම්පත් සංවර්ධන උපදේශකවරුන්ට ගාස්තු ගෙවිය යුතුද;

(ix) එසේ නම්, එම ගාස්තු ප්‍රවාහනයටද, ඖෂධවලටද යන්න වෙන් වෙන්ව ලදුපත්වල සඳහන් කළ යුතු නොවන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கால்நடை உற்பத்தி மற்றும் சுகாதாரத் திணைக்களத்திலுள்ள கால்நடை அபிவிருத்தி ஆலோசகர்களின் எண்ணிக்கை ஒவ்வொரு மாவட்ட வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) பசுக்களுக்கு செயற்கை முறைக் கருவூட்டல் செய்வதற்காக மேற்படி ஆலோசகர்களுக்கு மேலதிகமாக ஒப்பந்த அடிப்படையிலான ஊழியர்கள் உள்ளனரா என்பதையும்;

(iii) மேற்படி ஊழியர்களின் எண்ணிக்கை ஒவ்வொரு மாவட்ட வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iv) அவர்களுக்குக் கொடுப்பனவு வழங்கப்படும் அடிப்படை யாது என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) செயற்கை முறைக் கருவூட்டல் செய்வதற்காக கட்டணம் அறவிடப்படுகின்றதா என்பதையும்;

(ii) ஒரு செயற்கை முறைக் கருவூட்டலுக்கான கட்டணம் எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி ஆலோசகர் ஒருவர் மற்றும் ஒப்பந்த அடிப்படையிலான ஊழியர் ஒருவர் செயற்கை முறைக் கருவூட்டல் ஒன்றைச் செய்வதற்காக அறவிடும் கட்டணம் வெவ்வேறாக யாது என்பதையும்;

(iv) மேற்படி இரண்டு கட்டணங்களும் சமமானதாக இருக்குமாயின், அது முரண்பாடாக அமையாதா என்பதையும்;

(v) இரண்டாவது அல்லது மூன்றாவது செயற்கை முறைக் கருவூட்டலின்போதும் மேற்கூறப்பட்ட கட்டணம் அறவிடப்படுகின்றதா என்பதையும்;

(vi) ஆமெனில், அது அநீதியாக அமையாதா என்பதையும்;

(vii) செயற்கை முறைக் கருவூட்டல் ஆக்கத்திறனின் சதவீதம் யாது என்பதையும்;

(viii) பசுக்கள், ஆடுகள் மற்றும் பன்றிகள் போன்ற கால்நடைகளின் நோய்களுக்குச் சிகிச்சை யளிப்பதற்கு பண்ணைகளுக்கு வருகைதரும் கால்நடை வைத்தியர்கள்/கால்நடை அபிவிருத்தி ஆலோசகர்களுக்குக் கட்டணம் செலுத்த வேண்டுமா என்பதையும்;

(ix) ஆமெனில், மேற்படி கட்டணங்கள் போக்கு வரத்துக்கா அல்லது மருந்துகளுக்கா என்பதைப் பற்றுச்சீட்டுகளில் வெவ்வேறாகக் குறிப்பிட வேண்டியதில்லையா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he state -

(i) the number of Livestock Development Instructors of the Animal Production and Health Department available in each district, separately;

(ii) whether contract workers also conduct artificial insemination on cattle, in addition to the Instructors;

(iii) the breakdown of such workers, according to districts; and

(iv) the basis on which payments are made to their contract workers?

(b) Will he also state -

(i) whether a fee is charged for artificial insemination;

(ii) the fee per artificial insemination;

(iii) the fee charged per artificial insemination by an instructor and a contract worker, separately;

(iv) if both the above-mentioned fees are same, whether it does not amount to an anomaly;

(v) whether the same fee is charged at the second and the third artificial inseminations;

(vi) if so, whether it is not an injustice;

(vii) the productivity ratio of artificial insemination, as a percentage;

(viii) whether fees have to be paid to Veterinary Officers/Livestock Development Instructors visiting farms to treat diseases of animals such as cattle, goats and pigs; and

(ix) if so, whether respective fees need not be stated in receipts as for travelling, medicines et cetera?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල සේවයේ නියුතු සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| පළාත | දිස්ත්‍රික්කය | සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් සංඛ්‍යාව |
|---|---|---|
| මධ්‍යම පළාත | මහනුවර | 35 |
| | මාතලේ | 17 |
| | නුවරඑළිය | 11 |
| බස්නාහිර පළාත | කොළඹ | 13 |
| | ගම්පහ | 36 |
| | කළුතර | 20 |
| නැඟෙනහිර පළාත | අම්පාර | 23 |
| | මඩකලපුව | 15 |
| | ත්‍රිකුණාමලය | 09 |
| උතුරු පළාත | යාපනය | 30 |
| | කිලිනොච්චි | 11 |
| | මන්නාරම | 10 |
| | මුලතිව් | 11 |
| | වවුනියා | 09 |
| දකුණු පළාත | ගාල්ල | 20 |
| | මාතර | 22 |
| | හම්බන්තොට | 11 |
| වයඹ පළාත | කුරුණෑගල | 82 |
| | පුත්තලම | 27 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | 42 |
| | පොළොන්නරුව | 14 |
| ඌව පළාත | බදුල්ල | 45 |
| | මොනරාගල | 31 |
| සබරගමුව පළාත | කෑගල්ල | 24 |
| | රත්නපුර | 24 |
| එකතුව | | 592 |

(ii) කොන්ත්‍රාත් සේවකයින් නොමැත. පෞද්ගලික කෘත්‍රිම සිංචන ශිල්පීන්ගෙන් සේවාව ලබා ගනී.

(iii) පෞද්ගලික කෘත්‍රිම සිංචන ශිල්පීන් සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව පහත පරිදි වේ.

| පළාත | දිස්ත්‍රික්කය | පෞද්ගලික කෘත්‍රිම සිංචන ශිල්පීන් සංඛ්‍යාව |
|---|---|---|
| මධ්‍යම පළාත | මහනුවර | 11 |
| | මාතලේ | 04 |
| | නුවරඑළිය | 24 |
| බස්නාහිර පළාත | කොළඹ | 01 |
| | ගම්පහ | 01 |
| | කළුතර | 01 |
| නැඟෙනහිර පළාත | අම්පාර | 24 |
| | මඩකලපුව | 06 |
| | ත්‍රිකුණාමලය | 05 |
| උතුරු පළාත | යාපනය | 14 |
| | කිලිනොච්චි | 07 |
| | මන්නාරම | 10 |
| | මුලතිව් | 02 |
| | වවුනියා | 01 |
| දකුණු පළාත | ගාල්ල | 01 |
| | මාතර | 00 |
| | හම්බන්තොට | 02 |
| වයඹ පළාත | කුරුණෑගල | 07 |
| | පුත්තලම | 00 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | 29 |
| | පොළොන්නරුව | 07 |
| ඌව පළාත | බදුල්ල | 09 |
| | මොනරාගල | 00 |
| සබරගමුව පළාත | කෑගල්ල | 01 |
| | රත්නපුරය | 03 |
| එකතුව | | 170 |

(iv) පෞද්ගලික කෘත්‍රිම සිංචන සේවා සැපයීම ස්වයං රැකියාවකි.

පෞද්ගලික කෘත්‍රිම සිංචන ශිල්පීන් සඳහා රජයෙන් වැටුප් හෝ කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ. මෙම ශිල්පීන්

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

සඳහා මූලික පුහුණුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් ලබා දෙන අතර, කෘත්‍රිම සිංචන උපකරණ පමණක් ඔවුන් වෙත ලබා දී ඇත. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත මුදල් ගෙවා ගවශුක්‍ර වඩි ලබා ගන්නා අතර ඔවුන් කෘත්‍රිම සිංචනය සඳහා ගාස්තුවක් ගොවීන්ගෙන් අයකර ගනු ලැබේ.

(ආ) (i) ඔව්.

(ii) එක් කෘත්‍රිම සිංචනයකට අය කරනු ලබන ගාස්තුව දිස්ත්‍රික්ක අනුව පහත පරිදි වේ.

| පළාත | දිස්ත්‍රික්කය | එක් කෘත්‍රිම සිංචනයකට අය කරන මුදල (රු.) |
|---|---|---|
| මධ්‍යම පළාත | මහනුවර | රු. 800.00 |
| | මාතලේ | |
| | නුවරඑළිය | |
| බස්නාහිර පළාත | කොළඹ | රු. 750.00 |
| | ගම්පහ | |
| | කළුතර | |
| නැගෙනහිර පළාත | අම්පාර | • ශුක්‍ර වඩියක් සඳහා රු.100/= සහ දුර අනුව ගාස්තු අය කළ හැක. |
| | මඩකලපුව | |
| | ත්‍රිකුණාමලය | |
| උතුරු පළාත | යාපනය | • ශුක්‍ර වඩියක් සඳහා ගාස්තුව රු. 100.00 |
| | කිලිනොච්චි | |
| | මන්නාරම | |
| | මුලතිව් | |
| | වවුනියා | |
| දකුණු පළාත | ගාල්ල | රු. 600.00 |
| | මාතර | |
| | හම්බන්තොට | |
| වයඹ පළාත | කුරුණෑගල | රු. 800.00 |
| | පුත්තලම | |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | රු. 700.00 |
| | පොළොන්නරුව | |
| ඌව පළාත | බදුල්ල | රු. 700.00 |
| | මොනරාගල | |
| සබරගමුව පළාත | කෑගල්ල | • රජයේ මෝටර් බයිසිකලයක් භාවිත කිරීමේ දී රු. 100.00 • පෞද්ගලික මෝටර් බයිසිකලයක් භාවිත කිරීමේ දී රු. 400.00 |
| | රත්නපුර | |

(iii) සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් විසින් අය කරනු ලබන ගාස්තු පහත පරිදි වේ.

පෞද්ගලික කෘත්‍රිම සිංචන ශිල්පීන් සඳහා රජයෙන් ගාස්තු නිර්දේශ කර නොමැත.

| පළාත | දිස්ත්‍රික්කය | සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් විසින් අය කරන ගාස්තුව (රු.) | පෞද්ගලික කෘත්‍රිම සිංචන ශිල්පීන් විසින් අය කරන ගාස්තුව (රු.) |
|---|---|---|---|
| මධ්‍යම පළාත | මහනුවර | රු. 800.00 | • ශුක්‍ර වඩියක් සඳහා ගාස්තුව රු. 100.00 • අනෙකුත් ගාස්තු අය කිරීම් පිළිබඳව තොරතුරු පශු වෛද්‍ය කාර්යාල වෙත වාර්තා නොකෙරේ. |
| | මාතලේ | | |
| | නුවරඑළිය | | |
| බස්නාහිර පළාත | කොළඹ | රු. 750.00 | |
| | ගම්පහ | | |
| | කළුතර | | |
| නැගෙනහිර පළාත | අම්පාර | • ශුක්‍ර වඩියක් සඳහා රු. 100/= සහ දුර අනුව ගාස්තු අය කළ හැක. | |
| | මඩකලපුව | | |
| | ත්‍රිකුණාමලය | | |
| උතුරු පළාත | යාපනය | • ශුක්‍ර වඩියක් සඳහා ගාස්තුව රු. 100.00 | |
| | කිලිනොච්චි | | |
| | මන්නාරම | | |
| | මුලතිව් | | |
| | වවුනියා | | |
| දකුණු පළාත | ගාල්ල | රු. 600.00 | |
| | මාතර | | |
| | හම්බන්තොට | | |
| වයඹ පළාත | කුරුණෑගල | රු. 800.00 | |
| | පුත්තලම | | |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | රු. 700.00 | |
| | පොළොන්නරුව | | |
| ඌව පළාත | බදුල්ල | රු. 700.00 | |
| | මොනරාගල | | |
| සබරගමුව පළාත | කෑගල්ල | • රජයේ මෝටර් බයිසිකලයක් භාවිත කිරීම රු. 100.00 • පෞද්ගලික මෝටර් බයිසිකලයක් භාවිත කිරීම රු. 400.00 | |
| | රත්නපුර | • රජයේ මෝටර් බයිසිකලයක් භාවිත කිරීම රු. 100.00 • පෞද්ගලික මෝටර් බයිසිකලයක් භාවිත කිරීම රු. 400.00 | |

(iv) ගාස්තු දෙකම සමාන නොවේ.

(v) ඔව්.

(vi) නැත.

මක්නිසාදයත්, එම කාර්යය සඳහා අවශ්‍ය ශුක්‍ර වඩ් සහ ප්‍රවාහන ගාස්තු අය කිරීමක් සිදු කරනු ලබයි.

(vii) කෘත්‍රිම සිංචන ඵලදායිතාව පිළිබඳ තොරතුරු පහත වගුවේ පරිදි වේ.

| පළාත | දිස්ත්‍රික්කය | කෘත්‍රිම සිංචන ඵලදායිතාවය ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|
| මධ්‍යම පළාත | මහනුවර | 30% |
| | මාතලේ | 30% |
| | නුවරඑළිය | 30% |
| බස්නාහිර පළාත | කොළඹ | 44% |
| | ගම්පහ | 41% |
| | කළුතර | 44% |
| නැගෙනහිර පළාත | අම්පාර | 34% |
| | මඩකලපුව | 31% |
| | ත්‍රිකුණාමලය | 34% |
| උතුරු පළාත | යාපනය | 17.91% |
| | කිලිනොච්චි | 15.86% |
| | මන්නාරම | 31.92% |
| | මුලතිව් | 30.22% |
| | වවුනියාව | 28.73% |
| දකුණු පළාත | ගාල්ල | 45% |
| | මාතර | 45% |
| | හම්බන්තොට | 45% |
| වයඹ පළාත | කුරුණෑගල | 37% |
| | පුත්තලම | 37% |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | 33% |
| | පොළොන්නරුව | 33% |
| ඌව පළාත | බදුල්ල | 33% |
| | මොනරාගල | 33% |
| සබරගමුව පළාත | කෑගල්ල | 39% |
| | රත්නපුරය | 39% |

(viii) සතුන්ගේ රෝගවලට ප්‍රතිකාර කිරීම පශු වෛද්‍ය නිලධාරීන් විසින් පමණක් සිදු කරනු ලබන අතර සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් රෝගවලට ප්‍රතිකාර කිරීම සිදු නොකරයි. භාවිත කරන ඖෂධ සඳහා ගාස්තු අය කිරීමේදී පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු මඟින් නියම කරන ලද වටිනාකම අනුව එම අය කිරීම් තීරණය කරනු ලබයි.

(ix) ඖෂධවලට පමණක් ගාස්තු අය කිරීම සිදු කරනු ලබන බැවින් අවශ්‍යතාවක් පැන නොනඟී.

(ආ) අදාළ නොවේ.

කෘත්‍රිම සිංචනය සඳහා ගාස්තු අය කිරීම හා සම්බන්ධයෙන් පොදු ක්‍රමවේදයක් සකස් කිරීම සම්බන්ධව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව - COPA - විසින් ලබා දුන් උපදෙස් අනුව සියලුම පළාත් අධ්‍යක්ෂවරුන්ගෙන් අදාළ තොරතුරු ලබාගෙන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරන ලද කමිටුවක් මඟින් කෘත්‍රිම සිංචනය සඳහා ගාස්තු අය කිරීම හා ඒ සම්බන්ධව පොදු ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.

## අනාථ දරුවන් සඳහා නිසි රැකවරණය: ගෙන ඇති පියවර

## அநாதைப் பிள்ளைகளுக்கான முறையான பராமரிப்பு: நடவடிக்கை

## PROPER CARE FOR ORPHANS: MEASURES TAKEN

1372/2025

**8. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය)**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு (திருமதி) சமிந்திராணி கிரிஎல்லே சார்பாக)

(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Mrs.) Chamindranee Kiriella)

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සිය දෙමාපියන් අහිමි, නිසි රැකවරණයක් නොමැති දරුවන් ලෙස හඳුනාගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

(ii) එම දරුවන්ගේ රැකවරණය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) මෙම දරුවන් හඳුනාගැනීම සහ ඔවුන්ට රැකවරණය සැලසීම සඳහා සෑම ග්‍රාම නිලධාරී වසමක්ම ආවරණය වන පරිදි රජයේ නිලධාරියෙක් පත් කර තිබේද;

(iv) එසේ නම්, එම නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) එම නිලධාරීන්ගේ කාර්යභාරය අධීක්ෂණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தங்களது பெற்றோரை இழந்து, முறையான பராமரிப்பு இல்லாத பிள்ளைகளென அடையாளம் காணப்பட்டுள்ளவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி பிள்ளைகளின் பராமரிப்புக்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) மேற்படி பிள்ளைகளை இனங்காணுதல் மற்றும் அவர்களைப் பராமரித்தல் தொடர்பாக ஒவ்வொரு கிராம அலுவலர் பிரிவையும் உள்ளடக்கும் வகையில் அரச உத்தியோகத்தர் ஒருவர் நியமிக்கப்பட்டுள்ளாரா என்பதையும்;

(iv) ஆமெனில், அவ்வுத்தியோகத்தர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) மேற்படி உத்தியோகத்தர்களின் பணிப்பொறுப்பை மேற்பார்வை செய்வதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා ]

asked the Minister of Women and Child Affairs:

(a) Will she inform this House -

(i) the number of children who have been identified as orphans and are deprived of proper care;

(ii) the measures that have been taken to provide proper care for those children;

(iii) whether a government officer has been appointed to cover each Grama Niladhari Division to identify these children and provide them with proper care;

(iv) if so, the number of such officers appointed; and

(v) the measures that will be taken to monitor the duties of such officers?

(b) If not, why?

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) දෙමව්පියන් අහිමි හා රැකවරණය අවශ්‍ය ළමුන් බරපතළ අවදානමකට ලක්වීමේ ළමුන් ලෙස හඳුනාගත් අවස්ථාවලදී රැකවරණ සැලසුම් සකස් කර ක්‍රියාවට නංවන අතර එවැනි දරුවන් 13,521දෙනෙකු 2025 වර්ෂයේදී හඳුනාගෙන ඇත.

(ii) එම දරුවන්ගේ රැකවරණය වෙනුවෙන් ඒ ඒ දරුවාගේ රැකවරණයට බලපා ඇති කරුණු සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව අදාළ මැදිහත්වීම් ඒකාබද්ධ ප්‍රවේශයක් යටතේ පහත පරිදි සිදු කෙරේ.

Ø රැකවරණ සැලසුම් සකස් කර ක්‍රියාවට නැංවීම

Ø විවිධ ආධාර ලබා දීම (අධ්‍යාපන, පෝෂණ, වෛද්‍ය, හදිසි විපත්, නිවුන් දරු ආධාර වැනි)

Ø දරුවන් පවුල තුළ සුරක්ෂිත කිරීම සඳහා විකල්ප රැකවරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම

Ø දරුවන්ගේ සහභාගිත්ව අයිතිය සුරක්ෂිත කිරීම සඳහා ළමා සමාජ සහ ළමා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

Ø බරපතළ අවදානමට ලක්වී නොමැති දරුවන් හඳුනා ගැනීමට ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු ක්‍රියාවට නැංවීම

Ø ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම මෙන්ම දරුවන්ගේ රැකවරණය වෙනුවෙන් සමාජ ව්‍යූහය ස්ථාපිත කිරීම හා බලගැන්වීම උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

(iii) පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින් සහ ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාරවරුන් අනුයුක්ත කර ඇති අතර, එම නිලධාරින් සෑම ග්‍රාම නිලධාරි වසමක්ම ආවරණය වන පරිදි රාජකාරි කටයුතු සඳහා යොදවා ඇත.

(iv) 393කි.

| | |
|---|---|
| ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින් | - 189 |
| ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර (ක්ෂේත්‍රගත) | - 201 |
| ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර (දෙපාර්තමේන්තුගත) | - 03 |

(ක්ෂේත්‍රගත ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින් සහ ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර අනුමත කාර්ය මණ්ඩල නිලධාරින් සංඛ්‍යාව 426ක් වන අතර, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින් විශ්‍රාම යාමෙන් පසුව එම තනතුර අහෝසි වන බැවින් ඒ සඳහා සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරින් ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර ලෙස අනුයුක්ත කිරීමට හැකියාවක් නොමැති බැවින් ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි තනතුරු පුරප්පාඩු වී ඇත. මේ පිළිබඳව දැනුම් දෙමින් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි තනතුරේ පුරප්පාඩු සඳහා සංවර්ධන නිලධාරින් අනුයුක්ත කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා ඇත.)

(v) මෙම නිලධාරින්ගේ කාර්යභාරය පිළිබඳව සෘජු අධීක්ෂණය එම නිලධාරින් අනුයුක්ත කර සිටින ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රාදේශීය ලේකම් සහ සහකාර ප්‍රාදේශීය ලේකම් විසින් සිදු කරනු ලබන අතර, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් එම නිලධාරින්ගේ කාර්යභාරය මාසික ප්‍රගති වාර්තා ගෙන්වා ගැනීම මඟින් අධීක්ෂණයට ලක් කරනු ලබයි.

ඊට අමතරව, දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමින් පැවැත්වෙන ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී මෙම නිලධාරින්ගේ කාර්යභාරය අධීක්ෂණයට ලක් කෙරෙන අතර, අහඹු ලෙස ක්ෂේත්‍ර මට්ටමට ගොස් නිලධාරින්ගේ කාර්යයන් අධීක්ෂණයට ලක් කිරීම ද සිදු කරනු ලබයි.

(ආ) අදාළ නොවේ.

## කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රා.ලේ. කොට්ඨාස: 2025 වසර සඳහා ප්‍රතිපාදන
### களுத்துறை மாவட்டத்தின் பிரதேச செயலாளர் பிரிவுகள்: 2025ஆம் ஆண்டுக்கான நிதி ஒதுக்கீடு
### DIVISIONAL SECRETARIES' DIVISIONS OF KALUTARA DISTRICT: ALLOCATIONS FOR 2025

1711/2025

**10. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහිත අබේගුණවර්ධන මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Rohitha Abeygunawardhana)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2025 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා ලබාදී ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඒ යටතේ අධ්‍යාපන, මාර්ග සහ යටිතල පහසුකම් යන අංශයන්ට ලබාදී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වන විට, ඉහත ප්‍රතිපාදනවලින් වියදම් කර ඇති ප්‍රමාණය ඉහත (ii)හි සඳහන් අංශ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ව්‍යාපෘතිවලින් 2025.12.31 වන දිනට අවසන් වීමට නියමිතව තිබූ ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2025ஆம் ஆண்டு களுத்துறை மாவட்டத்தின் பிரதேச செயலாளர் பிரிவுகளுக்கு வழங்கிய மொத்த நிதி ஒதுக்கீடு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) அதன்கீழ் கல்வி, வீதிகள் மற்றும் உட்கட்டமைப்பு வசதிகள் போன்ற துறைகளுக்கு வழங்கிய நிதி ஒதுக்கீடு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி நிதி ஒதுக்கீட்டில் தற்போது வரை செலவிடப்பட்டுள்ள நிதி, மேற்படி(ii)இல் குறிப்பிடப்பட்டுள்ள ஒவ்வொரு துறை வாரியாக எவ்வளவு என்பதையும்;

(iv) மேற்படி கருத்திட்டங்களுள் 2025.12.31ஆம் திகதியளவில் நிறைவு செய்யப்படவிருந்த கருத்திட்டங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the total allocations made for each of the Divisional Secretaries' Division of the Kalutara District for the year 2025, separately;

(ii) under such allocations, the amounts allocated to the education, roads and infrastructure sectors, separately;

(iii) the expenditure incurred so far from the above allocations, categorized according to the sectors mentioned in (ii) above, separately; and

(iv) the projects that had been scheduled to be completed by 31.12.2025?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 14 සඳහා ප්‍රාග්ධන වැය විෂයන් මගින් රුපියල් මිලියන 509.28 වෙන් කර දී ඇත.

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | වෙන් කර දී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මිලි.) |
|---|---|---|
| 01 | පානදුර | 33.94 |
| 02 | බණ්ඩාරගම | 32.16 |
| 03 | හොරණ | 37.07 |
| 04 | ඉංගිරිය | 30.20 |
| 05 | බුලත්සිංහල | 32.55 |
| 06 | මදුරාවල | 32.31 |
| 07 | මිල්ලනිය | 28.90 |
| 08 | කළුතර | 51.50 |
| 09 | බේරුවල | 27.80 |
| 10 | දොඩන්ගොඩ | 35.81 |
| 11 | මතුගම | 48.46 |
| 12 | අගලවත්ත | 33.99 |
| 13 | පාලින්දනුවර | 28.73 |
| 14 | වලල්ලාවිට | 55.86 |
| මුළු එකතුව | | 509.28 |

(ii)

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | වෙන් කර දී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මිලි.) | | |
|---|---|---|---|---|
| | | අධ්‍යාපන | මාර්ග | යටිතල පහසුකම් |
| 01 | පානදුර | අධ්‍යාපන අංශයට අදාළව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ප්‍රතිපාදන වෙන් කරනු නොලබන අතර ඊට අදාළ ප්‍රතිපාදන වෙන් කරනු ලබන්නේ විෂය භාර රේඛීය අමාත්‍යාංශයට සහ බස්නාහිර පළාත් සභාවේ පළාත් අමාත්‍යාංශයට වේ. | 23.37 | 2.50 |
| 02 | බණ්ඩාරගම | | 31.16 | නැත |
| 03 | හොරණ | | 26.19 | 6.59 |
| 04 | ඉංගිරිය | | 24.70 | 4.5 |
| 05 | බුලත්සිංහල | | 26.55 | 6.00 |
| 06 | මදුරාවල | | 19.25 | 6.21 |
| 07 | මිල්ලනිය | | 25.40 | 3.00 |
| 08 | කළුතර | | 47.30 | 2.00 |
| 09 | බේරුවල | | 15.90 | 11.10 |
| 10 | දොඩන්ගොඩ | | 30.29 | 4.00 |
| 11 | මතුගම | | 35.37 | 10 |
| 12 | අගලවත්ත | | 27.91 | 2.58 |
| 13 | පාලින්දනුවර | | 22 | 1.5 |
| 14 | වලල්ලාවිට | | 45.30 | 8.98 |
| මුළු එකතුව | | | 400.69 | 68.96 |

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

(iii)

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | වෙන් කර දී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.) | | | | |
|---|---|---|---|---|---|---|
| | | අධ්‍යාපන | මාර්ග | වියදම (රු.මි.) | යටිතල පහසුකම් | වියදම (රු.මි.) |
| 01 | පානදුර | ඉහත දක්වා ඇති පරිදි අධ්‍යාපන අංශය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ප්‍රතිපාදන වෙන් කරනු නොලබන බැවින් වියදම් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය අදාළ නොවේ. | 23.37 | 21.44 | 2.50 | 2.36 |
| 02 | බණ්ඩාරගම | | 31.16 | 29.80 | නැත | නැත |
| 03 | හොරණ | | 26.19 | 25.19 | 6.59 | 5.67 |
| 04 | ඉංගිරිය | | 24.70 | 24.44 | 4.5 | 4.37 |
| 05 | බුලත්සිංහල | | 26.55 | 25.01 | 6.00 | 5.85 |
| 06 | මදුරාවල | | 19.25 | 18.74 | 6.21 | 6.04 |
| 07 | මිල්ලනිය | | 25.40 | 23.91 | 3.00 | 2.70 |
| 08 | කළුතර | | 47.30 | 38.82 | 2.00 | 1.93 |
| 09 | බේරුවල | | 15.90 | 15.79 | 11.10 | 10.46 |
| 10 | දොඩන්ගොඩ | | 30.29 | 28.04 | 4.00 | 3.80 |
| 11 | මතුගම | | 35.37 | 33.59 | 10 | 8.39 |
| 12 | අගලවත්ත | | 27.91 | 26.17 | 2.58 | 2.5 |
| 13 | පාලින්දනුවර | | 22 | 21.65 | 1.50 | 1.49 |
| 14 | වලල්ලාවිට | | 45.30 | 42.94 | 8.98 | 8.01 |
| මුළු එකතුව | | | 400.69 | 375.53 | 68.96 | 63.57 |

(iv) සියලු ව්‍යාපෘති 2025.12.31වන දිනට අවසන් කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### මැද පෙරදිග යුද තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක්ව ඇති බලශක්ති සුරක්ෂිතතාව
### மத்திய கிழக்கில் நிலவும் போர்ச் சூழலால் தாக்கத்துக்குள்ளான வலுசக்தி பாதுகாப்பு
### ENERGY SECURITY IMPACTED BY MIDDLE EAST WAR SITUATION

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, 2022 වර්ෂයේදී ශ්‍රී ලංකාව මුහුණ දුන් ඉන්ධන අර්බුදය හේතුවෙන් විදුලි නිෂ්පාදනය, ප්‍රවාහනය, සෞඛ්‍ය හා කර්මාන්ත ක්ෂේත්‍රය බරපතළ ලෙස කඩා වැටුණු අතර, ඒ හරහා දරුණු ආර්ථික අර්බුදයක් නිර්මාණය විය. මේ සිදුවීම තුළින් පාඩම් ඉගෙන ගෙන තිබේද යන්න වර්තමානයේ මැද පෙරදිග කලාපයේ පවතින යුදමය වාතාවරණය හමුවේ ලංකාවේ ඇති වී තිබෙන ඉන්ධන අර්බුදය තුළ විශේෂයෙන් විමසිය යුතුව ඇත.

එබැවින්, රටේ බලශක්ති ආරක්ෂාව - energy security - සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු පිළිබඳව මෙම සභාවට පැහැදිලි කිරීමක් ලබා දෙන ලෙස මම රජයෙන් ඉල්ලීමක් කරනවා.

1. මැද පෙරදිග කලාපයේ පවතින ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලංකාවට බොරතෙල් හා ඉන්ධන ආනයනයේදී - ගෑස්වලටත් එසේමයි - ඇති විය හැකි අවදානම් පිළිබඳව රජය විසින් අවදානම් තක්සේරුවක් සිදු කර තිබේද?

ගරු කථානායකතුමනි, මීට දින කිහිපයකට පෙර පැවති පාර්ලිමේන්තු සැසිවාරයකදී අපි පෙන්වා දුන්නා, හෝමුස් සමුද්‍ර සන්ධිය වසා දැමීම තුළ ඇති වී තිබෙන අන්තරායදායක තත්ත්වය. නමුත් රජයෙන් ලැබුණු ප්‍රතිචාරය තමයි, කිසි ප්‍රශ්නයක් නැහැ, ඒකෙන් අපට බලපෑමක් නැහැ කියන එක. නමුත්, මේක වැදගත් කාරණාවක් නිසා පොඩි විස්තරයක් කරන්නට ඕනෑ. මේ සම්බන්ධයෙන් මම ඔබතුමාටත් කියන්න කැමැතියි. පිරිපහදු තෙල්, බොරතෙල්, LNG, LPG, petrochemicals, පොහොර, තවත් රසායන ද්‍රව්‍ය, metals, industrial materials, food and agricultural trade, ධාන්‍ය වර්ග - grain shipments - ආදී ලොකු ලැයිස්තුවක් මේ සම්බන්ධව තිබෙනවා. මේ හෝමුස් සමුද්‍ර සන්ධිය වසා දැමීම තුළ ඒ දේවල් සම්බන්ධව ඇති වී තිබෙන අවදානම අපි බලන්න ඕනෑ. ඇත්තවශයෙන්ම රජය මේක ගණන් ගත්තේ නැහැ. මම අහන්න කැමැතියි, මේ සම්බන්ධව අවදානම් තක්සේරුවක් ඉදිරිපත් කර තිබෙනවාද, අවදානම් තක්සේරුවක් නිර්මාණය කර තිබෙනවාද, ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවාද කියලා.

2. වර්තමානයේ රටේ පවතින ඉන්ධන සංචිත ප්‍රමාණය කොපමණද? එය ප්‍රමාණවත් වන්නේ තවත් දින කීයක් සඳහාද?

පසුගිය දවසක ගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියනවා අපි දැක්කා, භය වෙන්න දෙයක් නැහැ, අපේ රටට අවශ්‍ය ඩීසල් දින 33කට තිබෙනවා, පෙට්‍රල් දින 27කට තිබෙනවා, ගුවන් යානා ඉන්ධන දින 49කට තිබෙනවා කියලා. නමුත්, එසේ කියලා දින 7කට පස්සේ අර පරණ තොගවලටම මිල වැඩි කළා; ඉන්ධන මිල වැඩි කළා. ඒ වාගේම කිව්වා, දින 44කට සරිලන බොරතෙල් සංචිතයකුත් අපට තිබෙනවා කියලා. ඒකත් කිව්වා. නමුත්, එහෙම කියලා පරණ තොගවලට මිල වැඩි කළා. එම නිසා කරුණාකරලා රටට සත්‍ය තොරතුරු ටික ඉදිරිපත් කරන්න, අද රටේ තිබෙන ඉන්ධන සංචිත ප්‍රමාණය පිළිබඳව.

3. හදිසි අවස්ථා සඳහා භාවිත කළ හැකි ඛනිජ තෙල් සංචිතයක් ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනවාද? එසේ නම් එහි ප්‍රමාණය කොපමණද?

ගරු කථානායකතුමනි, මේක ඉතාම වැදගත් ප්‍රශ්නයක්. අපට එදා කිව්වා, වරායේ ගොඩබාන මිලටම තෙල් ටික ලබා දෙනවා කියලා. ඒ නිසා වහාම ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බද්ද - VAT එක, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද, නිෂ්පාදිත බද්ද, රේගු ආනයන බද්ද, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ආදී වන මේ ඔක්කෝම බදු තෙල්වලින් ඉවත් කරන්න; එම බදු තෙල්වලින් ඉවත් කරන්න. මේ 159දෙනාම පත් වුණේ වරායේ ගොඩබාන මිලටම තෙල් ටික දෙනවා කියලා නේ. ඒ නිසා කරුණාකරලා මේ වෙලාවේ තෙල් මිල වැඩි කරන්න නොවෙයි, අඩු කරන්න කටයුතු කිරීම වැදගත් කියන එක මම රජයට යෝජනා කරන්න කැමැතියි. ඒක පිළිබඳව කරුණාකරලා අපට දැනුවත් කරන්න.

4. ගෝලීය තෙල් සැපයුමට බාධාවීමෙන් හෝ මිල ගණන් තියුණු ලෙස ඉහළ යෑමක් සිදුවන අවස්ථාවක මෙරට ඉන්ධන සැපයුම අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා බලශක්ති අමාත්‍යාංශය විසින් අනුගමනය කරනු ලබන හදිසි කළමනාකරණ සැලැස්ම කුමක්ද?

කරුණාකර එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා මම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා.

5. ගෝලීය වෙළෙඳ පොළේ තෙල් මිල සියයට 20ත්, 30ත් අතර ප්‍රමාණයකින් ඉහළ යෑමක් සිදුවුවහොත් එය මෙරට ඉන්ධන ආනයන වියදම් කෙරෙහි මෙන්ම ජාතික ආර්ථිකයට,

උද්ධමනයට ඇති කළ හැකි බලපෑම බලශක්ති අමාත්‍යාංශය විසින් ගණනය කර තිබෙනවාද?

හැබැයි, මේකට කියන්න පුළුවන්, මේක කරන්නේ මුදල් අමාත්‍යාංශයෙන් කියලා. ඇත්තවශයෙන්ම මේ crisis එකේදි මේ අමාත්‍යාංශ සියල්ලක්ම එකට එකතු වෙලා වැඩ කරන්න ඕනෑ. මෙහි බලපෑම් සම්බන්ධව ඔබතුමන්ලා යම් අධ්‍යයනයක් කරලා තිබෙනවාද? එහෙම නම් ඒ බලපෑම් අධ්‍යයනයේ තොරතුරු ටික පාර්ලිමේන්තුවට ලබා දෙන්න. මොකද රජයේ පාර්ශ්වයෙන් අපට අහන්න ලැබුණා, මහා භාණ්ඩාගාරයේ, මුදල් අමාත්‍යාංශයේ මුදල් පිරී ඉතිරී ගිහිල්ලා තිබෙනවා කියන කාරණාව. ඉතින් මුදල් පිරී ඉතිරී ගිහිල්ලා තිබෙන තත්ත්වය තුළ මම අහන්න කැමැතියි, අපේ රටේ 75 ලක්ෂයක් වන විදුලි පාරිභෝගිකයින්ටත්, ඒ වාගේම සමස්ත පාරිභෝගික ජනතාවටත් යම් සහනයක් ලබා දෙන්නට රජය කටයුතු කරනවාද, නැද්ද කියන කාරණාව.

6. මැද පෙරදිග කලාපය ආශ්‍රිත ජාත්‍යන්තර සමුද්‍රීය මාර්ගවලට බාධා ඇතිවීම තුළින් මෙරට ඉන්ධන සැපයුමට ඇතිවිය හැකි බලපෑම පිළිබඳව හා විකල්ප බලශක්ති ප්‍රවාහන මාර්ග යොදා ගැනීම පිළිබඳව, විකල්ප ක්‍රමවේද යොදා ගැනීම පිළිබඳව රජය විසින් තක්සේරුවක් කරලා තිබෙනවාද?

අපි රජයට කියන්න කැමැතියි, බැරි වෙලාවත් ඉරානයේ Kharg Island එකේ ඉන්ධන පිරිපහදුවලට - petroleum refineriesවලට - යම්කිසි attack එකක් සිදු වුණොත් ඇත්තවශයෙන්ම බරපතළ ඛේදනීය තත්ත්වයක් නිර්මාණය වන බව, මහා ඛේදවාචකයක් නිර්මාණය වන බව. ඔබතුමන්ලා මේ පිළිබඳව අධ්‍යයනයක් කරලා තිබෙනවාද? Kharg Island එකට attack එකක් කරලා එහි තිබෙන petroleum resourcesවලට හානියක් වුණොත්, ඒ attack එකත් එක්ක ප්‍රතිප්‍රහාරත් සිදු කළොත් ඇති වන තත්ත්වය තුළ රටේ තෙල් අවශ්‍යතාව සපුරා ගන්නා ක්‍රමවේද පිළිබඳව, විකල්ප ක්‍රමවේද පිළිබඳව යම්කිසි අධ්‍යයනයක් කරලා තිබෙනවාද කියන එක මම අහන්න කැමැතියි.

7. ඒ වාගේම 2026.03.15 සිට යළි ක්‍රියාත්මක කර ඇති QR කේත පදනම් කරගත් ඉන්ධන බෙදා හැරීමේ ක්‍රමය යටතේ නියම කර ඇති සතිපතා ඉන්ධන කෝටාව හඳුන්වා දී ඇත්තේ මොන විද්‍යාත්මක පදනමක් සහිතවද? මෙම කෝටාව ජනතාවගේ එදිනෙදා අවශ්‍යතාවට ප්‍රමාණවත් නොවන බව බලශක්ති අමාත්‍යාංශය විසින් පිළිගන්නේද? එසේ නම්, එම කෝටාව සංශෝධනය කළ යුතු නොවේද?

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ, මේකේ තවත් ප්‍රශ්නයක් තිබෙන බව. වාහන විකිණීම හේතුවෙන් අයිතිකරුවන් මාරු වීම, එහෙමත් නැත්නම් QR කේත පද්ධතිය තුළ තවමත් පෙර අයිතිකරු ලියාපදිංචි වූ කේත ඇතුළත් වීම නිසා QR කේතයක් සඳහා ලියාපදිංචි වීමට වත්මන් අයිතිකරුවන්ට නොහැකි තත්ත්වයක් වාර්තා වනවා. මේ පිළිබඳව රජය දැනුවත්ද? දැනුවත් නම්, ඒ තත්ත්වය අවබෝධ කරගෙන QR කේත ක්‍රමය පිළිවෙළකට, කාර්යක්ෂමව ක්‍රියාත්මක නොකළේ ඇයි? විශේෂයෙන්ම අද වන විට බොහෝ පිරිසක් මේ ප්‍රශ්නය තුළින් දැඩි පීඩාවකට ලක් වනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම බස් රථවලට ලීටර් 60, මෝටර් සයිකලයට ලීටර් 5, වෑන් රථවලට ලීටර් 40, මෝටර් රථවලට ලීටර් 15, මෝටර් ලොරිවලට ලීටර් 200, ඉඩම් වාහනවලට ලීටර් 25, ත්‍රිරෝද රථවලට ලීටර් 15, විශේෂ කාර්ය වාහනවලට ලීටර් 40 යනාදී වශයෙන් සතියකට වෙන් කරපු ඉන්ධන ප්‍රමාණ කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ කියන එක තමයි රටේ ජනතාවගේ මතය. එම නිසා ඒ ගැන කරුණු අවබෝධ කරගෙන, සාධාරණව මේ ප්‍රමාණ වෙනස් කරන්නට රජය කටයුතු කරනවාද?

විශේෂයෙන්ම මම කියන්න කැමැතියි, බස් රථ ක්ෂේත්‍රය, ත්‍රිරෝද රථ ක්ෂේත්‍රය, පාසල් වෑන් රථ ක්ෂේත්‍රය වාගේම ගොවි ජනතාව ගැනත්. මේ, අස්වැන්න නෙළන කාල වකවානුවක්. අද වන විට ඒ අයට අස්වනු නෙළන උපකරණ පාවිච්චි කරන්න බැහැ. ඒ වාගේම තමයි ධීවර ප්‍රජාවත්. ඒ වාගේම සෞඛ්‍ය ක්ෂේත්‍රය, වෛද්‍ය ක්ෂේත්‍රය වාගේ අත්‍යවශ්‍ය සේවාවල නියැළී සිටින පුද්ගලයින්, ආනයන බහලුම් ප්‍රවාහන රථ හිමිකරුවන්, වාහන ආනයනකරුවන් ඇතුළු සමස්ත ක්ෂේත්‍රය මේ allocate කර තිබෙන quota එක පිළිබඳව ලොකු මැසිවිල්ලක් නඟනවා. ඒ සම්බන්ධයෙන් රජය ලබා දෙන විසඳුම මොකක්ද කියලා මම මේ අවස්ථාවේදී අහන්න කැමැතියි.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

8. ඉන්ධන සැපයුම සීමා වී ඇති මෙවැනි මොහොතක විදුලි නිෂ්පාදනය, සෞඛ්‍ය සේවා සහ ප්‍රවාහන සේවා ඇතුළු අත්‍යවශ්‍ය සේවා සඳහා ඉන්ධන වෙන් කිරීම වෙනුවෙන් සකස් කර ඇති ජාතික ප්‍රමුඛතා යන්ත්‍රණය කුමක්ද?

මට සඳහන් කරන්න අමතක වුණා, tourism sector එක ගැන. දැන් අපේ රටට ලොකු හයියක් ලැබෙන්නේ tourism sector එකෙන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට මේ වනකොට විනාඩි 10ක කාලයක් ලබා ගෙන තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට විතරක් ඔය විනාඩි ගණන බලන්න එපා. මේක රටේ මිනිසුන්ගේ හුස්ම පිළිබඳ ප්‍රශ්නයක්. ඒ නිසා කරුණාකර මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න මට අවස්ථාව ලබා දෙන්න.

ඊළඟට, මම මේ කාරණයත් අහන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා මට ලබා දුන් ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයේ සඳහන් කරුණුවලට අමතරව ලොකු කථාවක් කරනවා. කෙටියෙන් අහන්න, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ප්‍රශ්නය අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා මට ලබා දුන් ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයේ සඳහන්ව තිබෙන වචන ප්‍රමාණයයි, ඒ කරුණුවලට අමතරව ඔබතුමා මේ සභාවේදී කථා කරපු වචන ප්‍රමාණයයි, මම ඔබතුමාට පෙර වරු 11.45ට Parliamentary Business Committee එකේදී ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඔබතුමා දැන් ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ගැන කථා කරනවා නේ. එහි සඳහන් කරුණු ලිව්වේ ඊයේ. තත්පරයෙන් තත්පරය ප්‍රශ්න වැඩි වෙනවා. ඒකයි මම tourism sector එක ගැන ඇහුවේ. සංචාරක ක්ෂේත්‍රය ගැන ඇහුවාට අමනාප වෙන්න එපා. මේවාට උත්තර සපයන්න. තමුන්නාන්සේලා ඉන්නේ උත්තර සපයන්න නේ. *[බාධා කිරීමක්]* පොළේ ගිහිල්ලා? පොළේ ගියේ මමද, ඔබතුමන්ලාද කියන එක ගැන හොයා බලන්නකෝ. පොළේ ගිහිල්ලා කිව්ව කථා ගැන බලන්නකෝ. *[බාධා කිරීමක්]* පොළේ ගිහිල්ලා කියපු කථා හින්දා තමයි අද අමාරුවේ වැටිලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා දැන් ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය අසා අවසන් කරන්න. ඔබතුමා මේ වනවිට විනාඩි 11ක් අරගෙන තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විශේෂයෙන්ම මම අහන්න කැමැතියි, සංචාරක ක්ෂේත්‍රය වෙනුවෙනුත් ලබා දෙන විසඳුම මොකක්ද කියලා.

9. ඇමෙරිකාව රුසියාවට පනවා තිබූ තෙල් සම්බාධකවලට ලබා දුන් දින 30ක විරාමයත් සමඟ, රුසියාව සමඟ සාකච්ඡාකොට අප රටට අවශ්‍ය බොර තෙල් ලබා ගැනීමේ විශේෂ වැඩ පිළිවෙළක් සකස් කිරීම සඳහා රජය කඩිනම් තීරණයක් නොගන්නේ කවර හේතු නිසාද?

ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය මතු කරනකොට ඔබතුමාත් හිටියා. පසුගිය සතියේ තමයි මම මේ ගැන කිව්වේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇමෙරිකාව රුසියානු සම්බාධක ඉවත් කරලා දින 30ක විරාමයක් දුන්නා. ඒ අතරතුර රුසියාවෙන් හරි අපේ රටට තෙල් සම්පත ලබා ගන්න යම්කිසි forward purchase agreementsවලට මේ රජය එළඹුණාද?

10. International Energy Agency එක විසින් දින කිහිපයකට පෙර තෙල් බැරල් මිලියන 400ක් වෙළෙඳ පොළට නිකුත් කිරීමට එකඟතාව පළ කරලා තිබෙනවා.

අපි දන්නවා, අපට ගබඩා පහසුකම් තිබෙන්නේ සීමාසහිත ප්‍රමාණයක් බව. යම්කිසි forward purchase agreementsවලට - ඉදිරි තෙල් මිලදී ගැනීමේ ගිවිසුම්වලට - යන්නට, මේ තෙල් බැරල් මිලියන 400ක් වෙළෙඳ පොළට නිකුත් කිරීම ප්‍රයෝජනයට අරගෙන යම්කිසි ගිවිසුමකට ප්‍රවේශ වෙලා තිබෙනවාද කියන එක මම අහන්න කැමැතියි.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීම සඳහා ඔබතුමා විනාඩි 13ක් ගත්තා. මේක බරපතළ කාරණයක්. එකඟතාවලට අනුගත වෙලා වැඩ කරන්න පුළුවන් වෙන්න ඕනෑ, අපි සියලුදෙනාට.

ගරු අමාත්‍යතුමා.

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා මතු කරන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. ඔව්.

   i. දිනපතාම අවදානම් තත්ත්වය පිළිබඳ විශ්ලේෂණයක් සිදු කරනු ලබයි. දැනට ඇණවුම් කර ඇති තෙල් තොග පිළිබඳ අදාළ සැපයුම්කරුවන් සමඟ නියමිත තෙල් ප්‍රමාණය හා නියමිත වේලාවට ලබා ගැනීම පිළිබඳව සාකච්ඡා පවත්වනු ලබයි.

   ii. නව සැපයුම්කරුවන් හරහා තෙල් ලබා ගැනීම පිළිබඳව උත්සාහයන්ද සිදු කරමින් පවතී.

   iii. ශ්‍රී ලංකා රජය තෙල් නිෂ්පාදනය කරනු ලබන රටවල් සමඟ තෙල් ලබා ගැනීමේ හැකියාව පිළිබඳව දැනටමත් සාකච්ඡා පවත්වා ඇති අතර, ඒ හරහා තෙල් ලබා ගැනීම පිළිබඳව අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

   iv. දැනට ලියාපදිංචි තෙල් සැපයුම්කරුවන් හැර අනෙකුත් සැපයුම්කරුවන්ගෙන් ලැබෙන යෝජනා පිළිබඳවද සලකා බලමින් පවතී.

   ඊට අදාළ විශේෂ ක්‍රමවේදයක් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය අනුව දැනට ආරම්භ කර තිබෙන බව දැනුම් දෙන්න කැමැතියි.

2.

| | ඉන්ධන වර්ගය | සංචිත ප්‍රමාණවත් වන දින ගණන |
|---|---|---|
| i. | ඩීසල් | අප්‍රේල් මස 12වන දින දක්වා (සාමාන්‍ය පරිභෝජනයට යටත්ව) |
| ii. | සුපර් ඩීසල් | මැයි මස 10වන දින දක්වා |
| iii. | 92 පෙට්‍රල් | අප්‍රේල් මස 23වන දින දක්වා |
| iv. | 95 පෙට්‍රල් | මැයි මස 10වන දින දක්වා |

වර්තමානයේ ගබඩා කර ඇති ප්‍රමාණය වාගේම මෙම මාසයේ සැපයුම ස්ථිර කර ඇති නැව් තොග පිළිබඳ විස්තරද ඉහත වගුවේ ඇතුළත් වන බව කාරුණිකව සලකන්න.

3. නැත. ප්‍රධාන ගබඩාවල ඇති සංචිත පමණක් මේ සඳහා යොදා ගනු ලබයි.

4. අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා හදිසි මිලදී ගැනීම් සඳහා කමිටුවක් පත් කර ඇත.

5. මුදල් අමාත්‍යාංශය වෙත තොග ගණන් හා විස්තර සපයා දී ඇත.

   ඒ ගැන මම පැහැදිලි කරන්න ඕනෑ. ඇත්තටම මෙම තත්ත්වය අනුව ඉන්ධන ආනයන වියදම් කෙරෙහි මෙන්ම ජාතික ආර්ථිකයට හා උද්ධමනයට ඇති කළ හැකි බලපෑම පිළිබඳව බලශක්ති අමාත්‍යාංශය විසින් ගණනය කිරීමක් සිදු කර තිබේද කියන කාරණය තමයි මේ යටතේ අසා තිබෙන්නේ. මම හිතන විධියට, ඒ පිළිබඳව අපි අවබෝධයක් තබා ගන්න ඕනෑ. ඒක මුදල් අමාත්‍යාංශය විසින් තමයි සිදු කරන්නේ. ඒකට අවශ්‍ය දත්ත අපි මුදල් අමාත්‍යාංශය වෙත ලබා දීලා තිබෙන්නේ. එම නිසා අපට ඒ ගැන සෘජු පිළිතුරක් ලබා දෙන්න බැහැ.

6. ඔව්.

   WTI, Saharan Blend, Miri Light යන බොර තෙල් ලබා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවා ඇත.

   ඒක අද දිනයේ - 17වැනි දා - විවෘත කිරීමට නියමිතයි.

7. ඔව්.

   එම ප්‍රශ්නයේම ඊළඟ කොටසින් අහනවා, "මෙම කෝටාව ජනතාවගේ එදිනෙදා අවශ්‍යතාවට ප්‍රමාණවත් නොවන බව බලශක්ති අමාත්‍යාංශය විසින් පිළිගන්නෙහිද?" කියා. පිළිතුර, ඔව්.

   "එසේ නම්, එම කෝටාව සංශෝධනය කළ යුතු නොවේද?" යන්නට පිළිතුර "නැත" යන්නයි. මෙම කෝටාව පොදුවේ ලබා දී ඇත. විශේෂ අවස්ථා සඳහා විද්‍යානුකූල පදනමක් මත සංශෝධනය කෙරේ.

8. අත්‍යවශ්‍ය අමාත්‍යාංශ කැඳවා ඔවුන්ගේ අවශ්‍යතා ලැයිස්තුගත කර, එය අධ්‍යයනය කිරීමෙන් අනතුරුව අවශ්‍ය කරන ඉන්ධන කෝටාව ලබා දීම සඳහා කමිටුවක් පත් කර ඇත.

9. මේ සම්බන්ධව සාකච්ඡා සිදු කෙරෙමින් පවතී.

10. International Energy Agency තොගවලින් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

විශේෂයෙන්ම මේ පිළිබඳව මෙම සභාව අවබෝධයක් ලබා ගන්න ඕනෑ කියලා මම හිතනවා. International Energy Agency හරහා තොග නිකුත් කිරීම ආරම්භ කළාට logistics, ඒ කියන්නේ, නැව්වල පටවා ගෙනෙන්න අපහසුව තමයි තිබෙන්නේ. මොකද, අපි ටෙන්ඩර් කරලා තෝරා ගත් සැපයුම්කරුවන්ටත් තිබෙන්නේ ඒ ප්‍රශ්නය තමයි. නැව් සහ භාණ්ඩ සඳහා රක්ෂණ ගාස්තු ඉහළ යෑම සහ රක්ෂණය කිරීමෙන් වැළැකීම මත බොහෝ නැව් තමන්ගේ කාර්යයට ඉදිරිපත් වීමෙන් වැළකී සිටිනවා. දැන් තෙල් තිබෙනවා. අපි ළඟ සල්ලි තිබෙනවා; ඩොලර් තිබෙනවා. හැබැයි, තෙල් ගෙනෙන්න නැවක් නැතුව තිබෙනවා. ඒ වාගේ ප්‍රායෝගික ප්‍රශ්නයක් තිබෙනවා.

ඊළඟට, මේ කාරණයත් මම කියන්න ඕනෑ, ගරු කථානායකතුමනි. මේ තත්ත්වය අපි ඇති කරපු එකක්වත්, ලංකාවේ ජනතාව හෝ ආණ්ඩුව ඇති කරපු තත්ත්වයක්වත් නොවෙයි. මේක ගෝලීය ප්‍රශ්නයක්. අපි මේ කළමනාකරණයක් කරන්නේ. මේ හැම දෙයක්ම තිබුණු තත්ත්වයෙන්ම සිදු වෙන්න ඕනෑ කියලා හිතනවා නම් මෙතැන යුද්ධයකුත් නැහැ, කිසිම ප්‍රශ්නයකුත් නැහැ. එහෙම නොවෙයි ලෝකයේ තිබෙන්නේ. බාහිර pressure එකක් මේ තිබෙන්නේ. ඒ නිසා අපි මේක නිසි ලෙස කළමනාකරණය කරගෙන දවසින් දවස මේ ගැන නිරීක්ෂණය කරමින්, තීරණ වෙනස් කරමින් ඉස්සරහට යනවා මිසක්, අපිට මාස ගණන් ඉස්සරහට පුරෝකථනය කරන්න බැහැ. මොකද, මේක අපි කරන යුද්ධයකුත් නොවෙයි; අපි මේකේ වින්දිතයෝ විතරයි, යම් මට්ටමකින්.

ඒක හින්දා තිබුණු මට්ටමින්ම හැම දෙයක්ම ලැබෙනවා කියලා හිතන්න එපා. මොකද, ඒ තත්ත්වයට අපේ රට ගෙනෙන්න නම් මේ යුද්ධය නවතින්න ඕනෑ. එහෙම වුණොත් අපට රට ඒ තත්ත්වයට ගෙනෙන්න පුළුවන්. ඒක පදනම් කරගෙන හැමෝම වැඩ කළොත්, ඉල්ලීම් කළොත් පහසුයි කියලා මම හිතනවා. මොකද, මේක ආණ්ඩු පක්ෂයටවත්, ආණ්ඩුවේ කාටවත් අවශ්‍ය විධියට තමන්ට විතරක් බෙදා ගැනීමක් නොවෙයි. මේක රටේම පවතින තත්ත්වය. යුද්ධය සන්සිඳෙන තෙක් අපි මේ තත්ත්වය කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. අපි ඒක හොඳින් කරගෙන යනවා කියලා අප හිතනවා. ඉදිරියටත් විපක්ෂයෙන්ද ඒ සඳහා සහයෝගය ලැබෙයි කියලා මම හිතනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට කෙටි පැහැදිලි කර ගැනීමක් කර ගන්න පුළුවන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, පෙර වරු 11.00 සිට 11.30 වෙනකම් තිබෙනවා නේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න වෙනුවෙන්. අපි අද වේලාසනින් තමයි මේ කටයුත්ත පටන් ගත්තේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පෙර වරු 11.00 ඉඳලා 11.30 වෙනකම් ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නවලට නේ වෙන් කර තිබෙන්නේ. *[බාධා කිරීමක්]* මට මේ කාරණය කියන්න අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමාට අපි පැහැදිලිව කියන්න කැමැතියි, ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න අහනකොට කරුණාකර පිළිගත් Standing Orders සහ පිළිගත් ක්‍රමවේදයට අනුව කටයුතු කරන්න කියලා. ඔබතුමා අද ස්ථාවර නියෝග 27(2) ප්‍රශ්නය යටතේ ප්‍රශ්න 10ක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ හැම ප්‍රශ්නයටම ඔබතුමා වෙනම කථාවක් කිව්වා. එහෙම කරන්න බැහැ, ගරු විපක්ෂ නායකතුමනි. මේ පාර්ලිමේන්තු ක්‍රමය හදන්න ඔබතුමා උදවු කරන්න ඕනෑ. ඒ අනුව ඔබතුමා කටයුතු කරන්න. ඔබතුමා සහ අපි කවුරුත් ස්ථාවර නියෝග අනුව කටයුතු කළ යුතුයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කියන කාරණය පැහැදිලියි.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා කෙටියෙන් පැහැදිලි කර ගන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ කෙටි පැහැදිලි කර ගැනීමට පෙර මම අහන්න කැමැතියි, "පූර්ව භාග 11.00 සිට 11.30 දක්වා පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න" කියන එක මුද්‍රණ දෝෂයක්ද කියලා?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම් අපි ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න පෙරවරු 11.00ට පටන් ගන්න ඕනෑ, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක මුද්‍රණ දෝෂයක්ද කියායි මම අහන්නේ. නැත්නම් කියනවා නේ මේ සභාවේ වැරදි දේවල් කියනවා කියලා. හොඳයි, මම දැන් මගේ පැහැදිලි කර ගැනීමට එන්නම්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය සකස් කරද්දී ඒ සඳහා සභානායක කාර්යාලය ලෙස අපි මැදිහත් වෙනවා. ඔබතුමාට අපිත් යෝජනා ඉදිරිපත් කරනවා, මේ කටයුතු කරගෙන යද්දී. වේලාව ආරක්ෂා කර ගැනීම සඳහා තමයි ඒ විධියට වේලාව වෙන් කරලා තිබෙන්නේ. නමුත් අපි පාර්ලිමේන්තුවේ දිගටම පවත්වාගෙන යන ක්‍රමය මේකයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නොපැමිණීම නිසා හෝ කුමන හෝ තත්ත්වයක් මත කාලය ඉතුරු වුණොත් ඒ අනුව පාර්ලිමේන්තුවේ කටයුතු පටන් ගන්නවා. එහෙම නැත්නම් දැන් පාර්ලිමේන්තුව කල් තියන්න ඕනෑ; දැන් ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න පටන් ගන්න බැහැ. ඔය තර්කය අනුව එහෙනම් දැන් ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න අහන්න දෙන්න බැහැ. එහෙම නම් පාර්ලිමේන්තුව suspend කරලා පෙර වරු 11.00ට පටන් ගන්න ඕනෑ. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට නිසි ගෞරව ඇතුවයි මම මේ කාරණය කියන්නේ. ඔබතුමා කරුණාකර Standing Orders අනුව කටයුතු කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉතාම කෙටියෙන් පැහැදිලි කර ගන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා වැඩිය පුරෝකථනය කරන්නට බැහැ, මේක බාහිර ප්‍රශ්නයක් කියලා. ඔව්, අපි එතුමා කියන කාරණය පිළිගන්නවා. මැද පෙරදිග ප්‍රශ්නය නිසා රටේ පැවති ප්‍රශ්නය උග්‍ර වුණා.

මම විශේෂයෙන්ම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, එක පැත්තකින් පෙර සූදානම, ක්‍රමෝපායික සැලසුම් - strategic planning - සකස් කිරීම, ඒ වාගේම scenario planning ගැන. මොකද, ඉරානයට ඊශ්‍රායලයයි, ඇමෙරිකා එක්සත් ජනපදයයි බෝම්බ දැම්මේ අද ඊයේ නොවෙයි, මීට මාස ගණනාවකට පෙර. ඇත්ත වශයෙන්ම මේ වාගේ අර්බුදයක් නිර්මාණය වෙයි කියන පුරෝකථනය කරන්නට තිබුණා.

ඒ වාගේම මම වැදගත්ම කාරණාවක් අහන්න කැමැතියි. ගරු කථානායකතුමනි, අපි දැන් කථා කරන්නේ බලශක්ති සුරක්ෂිතභාවය - energy security - ගැන. මෙතැනදී ලොකු ප්‍රශ්නයක් එනවා, ගරු කථානායකතුමනි. ඒ තමයි, අපේ රටේ විදුලිය උත්පාදනය කරන බලාගාරවලින් නිශ්චිත ප්‍රමාණයට විදුලිය උත්පාදනය නොවෙන කොට, ඩීසල් බලාගාරවලට යන්න සිද්ධ වෙනවා. එතකොට ඩීසල් බලාගාරවලට ගිහිල්ලා විදුලිය උත්පාදනය කරනකොට, එක පැත්තකින් පාරිභෝගිකයාට මිල වැඩි වෙනවා. ලෝකයේ නිර්මාණය වෙලා තිබෙන ඩීසල් හිඟතාව තුළළ එතැනත් ප්‍රශ්නයක් එනවා. සමහර විට විදුලි කප්පාදුවලට යන්න සිද්ධ වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය කෙටි කරන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඒක කියන්නේ, මෙන්න මේ නිසා. ඇත්තවශයෙන්ම ගත්තොත්, 13වැනි දා නොරොච්චෝලේ විදුලි උත්පාදනය මෙගාවොට් 130කින් අඩුයි, 14වැනි දා මෙගාවොට් 135කින් අඩුයි, ඒ වාගේම 15වැනි දා මෙගාවොට් 132කින් අඩුයි. ඒ වාගේම 16වැනි දා - ඊයේ - මෙගාවොට් 148කින් අඩුයි. දැන් මේ අඩු වුණු ප්‍රමාණය, මේ මදිපාඩුව අනිවාර්යයෙන්ම ඩීසල් බලාගාරවලින් ලබා ගන්න සිද්ධ වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ තත්ත්වය තුළ, අද ලෝකයේ නිර්මාණය වෙලා තිබෙන මේ භිහතාවය තුළ ඇත්ත වශයෙන්ම බරපතළ ප්‍රශ්නයක් මතු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
PUCSL එක කියනවා, අප්‍රේල්, ජුනි, ජුලි මාසවල විදුලි කප්පාදුවක් සිද්ධ වෙනවා කියලා. මේ අනාරක්ෂිත, මේ අවදානම් තත්ත්වයට විසඳුමක් ලබා දෙන්නට ඔබතුමන්ලා අරගෙන තිබෙන පැහැදිලි සැලැස්ම මොකක්ද කියලා ඉදිරිපත් කරන්න. ඔබතුමා පෙර ප්‍රශ්නවලට උත්තර දීමේදීත් සැලැස්ම ඉදිරිපත් කළේ නැහැ, ගරු ඇමතිතතුමනි. දත්ත කේන්ද්‍රීය පිළිතුරක් ඉදිරිපත් කරන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, ඉරානයේ යුද තත්ත්වය ගැන හිත හිතා හිටියා නම්, 1980 ගණන්වල ඉඳලාම අපි QR code එකෙන් තමයි තෙල් දෙන්න ඕනෑ. *[බාධා කිරීම්]* මොකද, ඒ කාලයේ ඉඳන්ම ඉරානයෙන්, ඉරාකයෙන් තෙල් ගේන්න බැරි ප්‍රශ්නයක් ආවා; යුද්ධය දිගටම තිබුණා. එහෙම හිතලා නොවෙයි, අපි කොහොමත් ඉරාන කලාපයෙන් තෙල් ගේන එක නවත්තලා තිබෙනවා. මොකද, ඒ කාලයේ ඉඳලා ආණ්ඩු කරපු අය ඒකට සරිලන ගබඩා පහසුකම් හැදුවාද? ඒ කාලයේ ඒවාට ඔරොත්තු දෙන්න ගබඩා පහසුකම් හැදුවාද? ඒක නිසා ඉස්සෙල්ලා තම තමන්ගේ වගකීම් ගැන මතක් කරගෙන කථා කරන්න. *[බාධා කිරීම්]* ඉරානයේ ආධ්‍යාත්මික නායකයාට බෝම්බ ප්‍රහාරය එල්ල වෙනකොට, ඒගොල්ලෝ දන්නෙත් නැහැ. ඒගොල්ලන් දන්නෙත් නැහැ, ඒගොල්ලන්ගේ ඔච්චර බුද්ධි සේවයක් තිබිලාත්. අපි අපේ තෙල් ටැංකි ඔක්කොම සම්පූර්ණයෙන් full කරලා තිබුණේ. අපි අගෝස්තු වෙනකම් ප්‍රමාණවත් පරිදි ටෙන්ඩර් කරලා, ඇණවුම් කරලා තිබුණේ. අපි ඔක්කොම පෙර තියා දැකලා - මේවා ආවා හෝ නැතා - රජයක් විධියට, ආයතන විධියට ගන්න ඕනෑ ක්‍රියාමාර්ග අරගෙන තිබුණේ, ගරු කථානායකතුමනි. එහෙම නැත්නම් මෙච්චර කල් මේ විධියට යන්නේ නැහැ. දැන් මේ region එකේ ඉන්දියාවේ සිට අනෙක් රටවල් ගැන බලන්න. මේ region එකේ රටවල විතරක් නොවෙයි, සවුදි අරාබියේ පිරවුම්හල්වලත් තෙල් ගණන් යැව්වා. අපි තෙල් මොකුත්ම නිෂ්පාදනය කරන්නේ නැති රටක්. අපි මේකට මුහුණ දෙන්නේ කොහොමද? ඒ අතින් ඇත්තටම ඔබතුමන්ලා සන්තෝෂ වෙන්න ඕනෑ. අපේ රජයේ කළමනාකාරිත්වය හින්දා තවම එක පැයක්, එක විනාඩියක්වත් විදුලිය කපන්නේ නැතිව පවත්වාගෙන යනවා. ඒකේ වියදමක් තිබෙනවා තමයි. ඒකට තමයි ආණ්ඩුවක් තිබෙන්නේ. හැබැයි, විදුලිය කපන්න වෙන වෙලාවකුත් තිබෙන්න පුළුවන්. අපි පුළුවන් තරම් ජනතාවට සහන සලසලා කර්මාන්ත ඇතුළු හැම දෙයක්ම සාමාන්‍ය විධියට පවත්වාගෙන යන්න තමයි මේ උපරිම උත්සාහ ගන්නේ. විපක්ෂය කියන විධියට නම් කලින්ම - මේ මාසයේ මුල - විදුලිය කපන්නයි තිබුණේ. අපි ඊට වැඩිය මේ රට ගැන, ජනතාව ගැන, කර්මාන්ත ගැන හිතනවා. ඒකේ ප්‍රතිඵලයක් විධියට තමයි අපි මේ කළමනාකරණය කරගෙන යන්නේ.

හැබැයි අපට දැන් මේවා මාස ගණනකට plan කරන්න බැහැ. මොකද, යුද්ධය පටන් ගත්ත මිනිසුන්ටත් එහෙම plan කරගන්න බැරුව ඉන්නේ. ඇමෙරිකාව මොකක්ද කිව්වේ? සති හතරෙන් ඉවරයි කිව්වා. දැන් ඒගොල්ලන්ට පුළුවන්ද, ඔච්චර දේවල් තිබිලා? ඇමෙරිකාවේ ජනාධිපතිවරයාම කිව්වා, මේක උපරිම සති හතරයි තිබෙන්නේ කියලා. දැන් guarantee කරන්න පුළුවන්ද මේවා? මොකද, ඒගොල්ලන් විතරක් නොවෙයි නේ. ඒගොල්ලන්ටත් අනෙක් අය ගහනවා නේ. තනියෙන් තීරණ ගන්න බැහැ. අපි මේ කොහේ හරි කෙළවරක ඉඳලා බැට කනවා. ඇත්තටම වගකිව යුතු විපක්ෂයක් නම් මේවා තේරුම් ගන්න ඕනෑ. ඒ හින්දා මම කියන්නේ ඔය වාගේ බොළඳ ප්‍රශ්න අහන්න එපා කියලායි. අපට තෙල් ගෙනැල්ලා දාගන්න තැනක් තිබුණා නම් අපි ගෙනැවිත් දානවා. දැනට දවස් 22කට වැඩිය තෙල් ගබඩා කරන්න ලංකාවේ ඉඩ නැහැ. අපි plan කරලා, දවස් 45කට අවශ්‍ය තෙල් ගබඩා කරන්න අවශ්‍ය ටැංකි හදන්න දැන් පටන් අරගෙන තිබෙන්නේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, අවසන් කරන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ඒ නිසා වගකීමෙන් කරුණු කියන්න ඕනෑ. විපක්ෂයක් විධියට ජනතාවගේ ඡන්ද අරගෙන නේ ඔය මන්ත්‍රීවරු පණස් ගණනක් පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ. එහෙම ජනතාවක් ඉන්නවා. ඒ ගැන හරි හිතන්න. අපි හැමෝමට සලකන්න තමයි හදන්නේ. අඩු ගණනේ මේ මන්ත්‍රීවරයෙකුටවත්, ඇමතිවරයෙකුටවත් තෙල් කෝටා එකක් වෙනම අරගෙන නැහැ. අපි හැමෝම එක මට්ටමේ තමයි කටයුතු කරන්නේ. ඒක තේරුම්

[ගරු කුමාර ජයකොඩි මහතා ]

අරගෙන කථා කළොත් හොඳයි. mediaවලට ප්‍රශ්න ඉදිරිපත් කරන්න නොවෙයි, අපි පුළුවන් තරම් මේ රටේ ජනතාව ගැන හිතලායි වැඩ කරන්නේ. අපි පක්ෂ, විපක්ෂ හැමෝටම එක විධියටයි සලකන්නේ, ජනතාව විධියට. ඒ කාරණයත් මතක් කරමින් මම නිහඬ වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

## II

## ක්‍රිප්ටෝ මුදල් සහ ඩිජිටල් වත්කම් ගනුදෙනු නියාමනය

CRYPTOCURRENCY மற்றும் டிஜிட்டல் சொத்து பரிவர்த்தனைகளின் ஒழுங்குமுறை
REGULATION OF CRYPTOCURRENCY AND DIGITAL ASSET TRANSACTIONS

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මම පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

මෑතකදී පරීක්ෂණ පවත්වන රුපියල් මිලියන 290ක ගුප්තකේතන මුදල් වංචාව සහ වත්මන් නියාමන රාමුවේ පවතින හිඩැස් හේතුවෙන් ගුප්තකේතන මුදල් ගනුදෙනු හරහා මුදල් රටින් පිටව යන බවට කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත්වරයා - Magistrate - කළ නිරීක්ෂණ සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ ගුප්තකේතන මුදල් - cryptocurrency - සහ ඩිජිටල් වත්කම් ගනුදෙනු සම්බන්ධයෙන් නියාමන තත්ත්වය, අධීක්ෂණ අසාර්ථකත්වයන් සහ ව්‍යවස්ථාදායක ප්‍රමාදය පිළිබඳව ප්‍රශ්නයක් ඇසීමට කැමැත්තෙමි. ගරු කථානායකතුමනි, "Daily Mirror" online edition එකට භාග්‍යා සිල්වා report කරනවා, "Rs. 290 M crypto scam: …" කියලා.

ගරු කථානායකතුමනි, අනාගත ගැටලුවක් බව වටහාගෙන මම මෙම කාරණය 2025 ජනවාරි මාසයේ 23වැනි දින රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී - Committee on Public Financeහිදී - මතු කළ අතර, එහිදී හෙළිදරවු වුණේ, මේ ගුප්තකේතන මුදල් ගනුදෙනු නීත්‍යානුකූල හෝ නීති විරෝධී නොවන බවයි. එතැන් සිට "Binance" වැනි ගුප්තකේතන මුදල් වේදිකා හරහා විශාල මුදල් ප්‍රමාණයක් විදේශගත කරන බවට වාර්තා වන අතර, එවැනි කටයුතුවලින් ලැබෙන ඉපැයීම් බොහෝ දුරට බදුකරණයට හා නියාමනයට යටත් නොවන බව පෙනේ.

කරුණාකර පහත ප්‍රශ්නවලට පිළිතුරු ලබාදෙන මෙන් මම මේ අවස්ථාවේ ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

1. ශ්‍රී ලංකාවේ ගුප්තකේතන මුදල් වෙළෙඳාම, ඩිජිටල් වත්කම් හුවමාරු සහ blockchain පාදක මූල්‍ය ගනුදෙනු සම්බන්ධයෙන් මහ බැංකුවේ සහ මුදල් අමාත්‍යාංශයේ වර්තමාන ප්‍රතිපත්තිමය තත්ත්වය කුමක්දැයි රජය ප්‍රකාශ කරන්නේද?

ඒ කියන්නේ, මෙක tax-free. Legality එකකුත් නැහැයි කියන කාරණය තමයි තිබුණේ, ගරු කථානායකතුමනි. මහ බැංකු අධිපතිතුමා Public Finance Committee එකට ආපු වෙලාවේ මම මේ පිළිබඳව කෙළින්ම ප්‍රශ්නයක් ඇහුවාම එතුමා පැනලා ගියා මිසක් උත්තරයක් දුන්නේ නැහැ. එහි ප්‍රතිවිපාක උසාවියේදී Magistrate විසින් අද පෙන්වා දී තිබෙනවා.

2. 2025.01.23 දින මහ බැංකු අධිපතිවරයාගෙන් ප්‍රශ්න කළ ද, ගුප්තකේතන මුදල් ආශ්‍රිත ගනුදෙනු නිරීක්ෂණය කිරීමට හෝ නියාමනය කිරීමට ගෙන ඇති නියාමන හෝ අධීක්ෂණ ක්‍රියාමාර්ග මොනවාද?

ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. එතුමාත් මේ පිළිබඳව සාක්ෂි දරාවි.

3. පැහැදිලි නීතිමය රාමුවක් නොමැතිකම නිසා 2017 අංක 12 දරන විනිමය පාලන පනත යටතේ ඇති ආරක්ෂණ ක්‍රමය මඟ හරිමින් ගුප්තකේතන මුදල් නාලිකා හරහා ප්‍රග්ධනය විදේශගත වීමට හැකියාව ලැබී ඇති බව රජය පිළිගන්නවාද?

ගරු කථානායකතුමනි, Hawala System හරහා සීමිත විදේශ සම්පත් එළියට යනවා. ගරු අනිල් ජයන්ත ඇමතිතුමා මෙතැන සිටියා නම් මගෙත් එක්ක එකඟ වේවි. මොකද, එතුමන්ලාගේ මූල්‍ය පනත මහ බැංකුවට අදාළ නිසා මේවායේ ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. මම ඔබතුමන්ලා වෙනුවෙන් මේ ප්‍රශ්න අහන්නේ ඇයි කියලා ඔබතුමන්ලාට පෙනෙනවා ඇති. මේවා පාලනය කිරීමේ ශක්තිය ඔබතුමන්ලාගේ අතේ තිබෙන්නට ඕනෑ.

4. 2023, 2024 සහ 2025 වර්ෂවලදී ශ්‍රී ලංකාවෙන් ආරම්භ වූ ගුප්තකේතන මුදල් ආශ්‍රිත ගනුදෙනුවල ඇස්තමේන්තුගත වටිනාකම කොපමණද? එවැනි ගනුදෙනු ප්‍රවාහ නිරීක්ෂණය කිරීමට පවතින යන්ත්‍රණ මොනවාද?

ඇත්ත වශයෙන්ම මම අගය කරනවා, ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා මෙය නූතන ලෝකයට ගෙනාවා. ඔබතුමා කරපු එක වැරැද්දක් නොවෙයි. ඒක නීතිගත කරන්න කියලා මම ඉල්ලපු එක තමයි මහ බැංකුව ප්‍රතික්ෂේප කළේ. එතකොට, නිකරුණේ ඔබතුමා මෙක නීතිය අනුව ප්‍රශ්නයක් ලෙස ගන්නවා. මේ විධියට තමයි රජයේ නිලධාරීන් දේශපාලනය කරන්නේ. ඊට පස්සේ ප්‍රශ්න කරන්නේ දේශපාලනඥයින්ගෙන්. අපි මෙක අත්විඳලා තිබෙන නිසා තමයි වගකීමක් ඇති විපක්ෂයක් ලෙස හැසිරෙන්නේ.

5. ගුප්තකේතන මුදල් වෙළෙඳාමෙන් ලැබෙන ලාභ හෝ ප්‍රාග්ධන ලාභ දැනට බදුකරණයට යටත්ද?

උත්තරය "නැහැ" තමයි. නමුත් එහෙම වෙන්නේ කොහොමද කියලා අපි බලමු.

එසේ නම්, එවැනි ආදායම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රකාශ කළ පුද්ගලයින් හෝ ආයතන කීයක් සිටීද?

6. ගුප්තකේතන මුදල් ආශ්‍රිත මූල්‍ය වංචා, මුදල් විශුද්ධිකරණය සහ ප්‍රාග්ධන පිටතට ගලා යෑම - capital outflow - හඳුනා ගැනීම සඳහා මහ බැංකුව, මූල්‍ය බුද්ධි ඒකකය සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඒකාබද්ධව යන්ත්‍රණයක් ස්ථාපිත කර තිබේද?

7. ඩිජිටල් වත්කම් සඳහා නියාමන රාමු හඳුන්වා දී ඇති ඉන්දියාව, සිංගප්පූරුව, තායිලන්තය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය වැනි සම වයස්කාර ආර්ථිකයන් හා සසඳන

විට ශ්‍රී ලංකාව ජාත්‍යන්තර හොඳම භාවිතයන්ට - best practicesවලට - වඩා පසුගාමීව ඇති බව රජය පිළිගන්නවාද?

That means, we are behind our peer countries, which are well ahead in this. The Hon. Wasantha Samarasinghe is also well ahead in this, and I appreciate that.

එසේ නම්, ගනු ලබන නිවැරැදි ක්‍රියාමාර්ග මොනවාද?

8. ඩිජිටල් වත්කම් සහ ගුප්තකේතන මුදල් හුවමාරු පාලනය කරන නීති හෝ නියාමන රීති හඳුන්වා දෙන්නේද යන්න සහ එසේ නම් එහි කාල රාමුව කුමක්දැයි රජය ප්‍රකාශ කරනු ඇත්ද?

ගරු කථානායකතුමනි, වචන 350කට සීමා කරමින් මේ ප්‍රශ්නය ඇහුවේ, වෙලාව ඉතිරි කර ගන්නයි. ගරු ඇමතිතුමා මෙම ප්‍රශ්නයට පිළිතුර දෙයි කියා මම විශ්වාස කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විනාඩි 6ක් ඇතුළත ඒ ප්‍රශ්නය ඉදිරිපත් කළා. ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරියටම විනාඩි 6න් ඒ කටයුත්ත කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විනාඩි 6යි, ඔබතුමා ගත්තේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද එම ප්‍රශ්නයට පසුව පිළිතුරු ලබා දෙනවා.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත
### உண்ணாட்டரசிறை (திருத்தம்) சட்டமூலம்
INLAND REVENUE (AMENDMENT) BILL

"Bill to amend the Inland Revenue Act, No. 24 of 2017."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය විසිනි.***

***2026 අප්‍රේල් 07වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 ஏப்பிரல் 07, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Harini Amarasuriya, Prime Minister and Minister of Education, Higher Education and Vocational Education; to be read a Second time upon Tuesday, 07th April, 2026 and to be printed; and to be referred to the Committee on Public Finance.*

### සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත් කෙටුම්පත
### சமூகப் பாதுகாப்பு உதவுதொகை அறவீடு (திருத்தம்) சட்டமூலம்
SOCIAL SECURITY CONTRIBUTION LEVY (AMENDMENT) BILL

"Bill to amend the Social Security Contribution Levy Act, No. 25 of 2022."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය විසිනි.***

***2026 අප්‍රේල් 07වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*
*2026 ஏப்பிரல் 07, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டத*

*Presented by the Hon. (Dr.) Harini Amarasuriya, Prime Minister and Minister of Education, Higher Education and Vocational Education; to be read a Second time upon Tuesday, 07th April, 2026 and to be printed; and to be referred to the Committee on Public Finance.*

### බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත
### மீட்பு, புனர்வாழ்வு மற்றும் கடனிறுக்கவகையின்மை (கூட்டிணைப்பு மற்றும் தனிப்பட்ட) சட்டமூலம்
RESCUE, REHABILITATION AND INSOLVENCY (CORPORATE AND PERSONAL) BILL

"තැනැත්තන් සහ සමාගම් බේරා ගැනීමට, පුනරුත්ථාපනය කිරීමට සහ තැනැත්තන්ගේ සහ සමාගම්වල වස්තුභංගත්වයට අදාළ නීතිය සංශෝධනය කිරීම සහ ඒකාබද්ධ කිරීම සඳහා ද; (97 වන අධිකාරය වූ) වස්තුභංගත්ව ආඥාපනත ඉවත් කිරීම සඳහා ද; 2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා ද; 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා ද; 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි."

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

*පිළිගන්වන ලද්දේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසිනි.*

***2026** අප්‍රේල් **07**වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.*

*நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 ஏப்பிரல் 07, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Harshana Nanayakkara, Attorney-at-Law, Minister of Justice and National Integration; to be read a Second time upon Tuesday, 07th April, 2026 and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අර්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු කථානායකතුමනි, Standing Order 29 (1), (2) සහ 118 (2) (අ) යටතේ මම අහන්නේ. ගරු කථානායකතුමනි, අපිට Jaffna ඉඳලා කොළඹට එන්න දැන් දීලා තිබෙන්නේ ඉන්ධන ලීටර් 15යි. එහෙම නම් මම සතියකට කලින් අනුරාධපුරයට ඇවිල්ලා නිදාගෙන, ඊළඟ සතියේ QR code එක අරගෙන, කොළඹට ඇවිල්ලා සතියක් ඉඳලා නිදාගෙන, යාපනයට යන්න වෙන්නේ තවත් සති 2කින් විතර.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් මහ ලේකම්තුමිය දැනුවත් කිරීමක් කර තිබෙනවා; විමසීම් කටයුතු කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් පිළිතුරක් ලැබුණාට පසුව ඔබතුමන්ලාට දැනුම් දෙන්නම්.

ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, දූෂණ විරෝධී පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි තීරණය කිරීම අනුමත කිරීම සඳහා ඉදිරිපත් කිරීම, ගරු අග්‍රාමාත්‍යතුමිය. You have 14 minutes.

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවා නියුක්තයන්: පාරිශ්‍රමික හා සේවා කොන්දේසි

## இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவின் அலுவலர்கள் மற்றும் ஊழியர்கள்: வேதனம் மற்றும் சேவை நிபந்தனைகள்

## OFFICERS AND EMPLOYEES OF THE COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION: REMUNERATION AND CONDITIONS OF SERVICE

[පූ.භා. 11.03]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"දූෂණ විරෝධී පනත පැනවීමේ දී පෙර පැවති පනත් තුනක් එනම්; (26 වැනි අධිකාරය වූ) අල්ලස් පනත, 1994 අංක 19දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත පරිච්ඡින්න කොට ඒ වෙනුවට එම පනත්වල ඇතුළත්ව තිබූ සියලු වැරදි සම්බන්ධව කටයුතු කිරීමේ බලතල සහ වගකීම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සතු වන පරිදි 2023අංක 9දරන දූෂණ විරෝධී පනත බලාත්මක කර ඇති හෙයින් ද;

1994 අංක 19දරන පනතින් ස්ථාපිත කර තිබූ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැවති බලතල හා වගකීම්වලට වඩා වැඩි සුවිශාල වගකීම් ප්‍රමාණයක් 2023අංක 9 දරන දූෂණ විරෝධී පනත මඟින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැවරී ඇති හෙයින් ද;

එම බලතල සහ වගකීම් ක්‍රියාත්මක කිරීම සඳහා 'ඇමුණුම-I' හි දැක්වෙන කාර්ය මණ්ඩලය අවශ්‍ය වන බවට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් තීරණය කර ඇති හෙයින් ද, කොමිෂන් සභාවට පැවරී ඇති සුවිශේෂ කාර්යයන් සැලකීමේ දී එම කාර්ය මණ්ඩලය සඳහා ඉහළ නිපුණතාවකින් සහ අත්දැකීම්වලින් සපිරුණු නිලධාරීන් ආකර්ෂණය කර ගැනීමට සහ එවැනි නිලධාරීන් බඳවා ගැනීමට හැකි වන පරිදි පාරිශ්‍රමික ව්‍යුහයක් පැවතීම අවශ්‍යව ඇති හෙයින් ද;

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අවශ්‍ය බවට සලකන නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික සහ සේවා කොන්දේසි පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතු බව පනතේ 26(2) වගන්තියෙහි දක්වා ඇති හෙයින් ද;

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් දූෂණ විරෝධී පනතේ 26(1) වගන්තිය යටතේ තීරණය කරන ලද 'ඇමුණුම-I' හි දැක්වෙන නිලධරයන් සහ සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික සම්බන්ධ යෝජනාවලියට 'ඇමුණුම-II' කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2025.08.11 දිනැති හා 2025.12.19 දිනැති ලිපි මඟින් මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාව ලැබී ඇති බව දන්වා ඇති බැවින් ද, එම යෝජනාවලිය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් දූෂණ විරෝධී පනතේ 26(2) වගන්තිය ප්‍රකාරව සුදුසු බවට තීරණය කර ඇති හෙයින් ද;

එම පාරිශ්‍රමික යෝජනාවලිය යටතේ වන දීමනා ගෙවීම සඳහා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට එම දීමනා හිමි ගන්වා ඇති චක්‍රලේඛ විධිවිධාන අදාළ කර ගැනීමේ දී අදාළ චක්‍රලේඛවල උක්ත දීමනා හිමි නිලධර කාණ්ඩ/ තනතුරු තීරණය කිරීම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් සිදු කිරීම කළ යුතු හෙයින් ද;

දූෂණ විරෝධී පනතේ 26(2) වගන්තියෙහි වන සේවා කොන්දේසි, පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් නිශ්චය කර එම රීතීන් පනතේ 32(2) සහ 157(1) වගන්ති අනුව සකස් කිරීමේ බලතල එම කොමිෂන් සභාවට පැවරිය යුතු හෙයින්ද; සහ

1994 අංක 19 දරන පනත යටතේ ස්ථාපිත කොමිෂන් සභාවේ ධුර දරන ලද සහ 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ ස්ථාපිත කරන ලද කොමිෂන් සභාවට පත් කරනු ලබන නිලධාරීන් සහ සේවකයින් (නිලධාරීන් 63 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක්) දූෂණ විරෝධී පනතේ 163(2)(ඌ) වගන්තියට අනුකූලව සහ එහි දැක්වෙන පරිදි නව කොමිෂන් සභාවේ විශ්‍රාම වැටුප් සහිත සුදුසු තනතුරක (දූෂණ විරෝධී පනතේ 26(1) වගන්තිය යටතේ අනුමත කළ) හා සුදුසු වැටුප් පියවරක පිහිටුවීම, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් සිදු කළ යුතු හෙයින්;

ඒ අනුව, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 26(2) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි තීරණය කිරීම මෙම පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

ඇමුණුම - I

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 26(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් එහි කටයුතු කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය බවට තීරණය කරනු ලබන කාර්ය මණ්ඩලය

| | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| 2 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| 3 | ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ | 02 |
| 4 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 06 |
| 5 | අධ්‍යක්ෂ | 09 |
| 6 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 01 |
| 7 | ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ ජනරාල් | 16 |
| 8 | සහකාර අධ්‍යක්ෂ ජනරාල් | 58 |
| 9 | සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | 45 |
| 10 | අභ්‍යන්තර විගණක | 01 |
| 11 | පර්යේෂණ නිලධාරී | 03 |
| 12 | පරිපාලන නිලධාරී | 04 |
| 13 | ප්‍රවාහන නිලධාරී | 01 |
| 14 | තාක්ෂණ නිලධාරී | 01 |
| 15 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 04 |
| 16 | ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී | 47 |
| 17 | ජ්‍යෙෂ්ඨ දූෂණ නිවාරණ නිලධාරී | 12 |
| 18 | විමර්ශන නිලධාරී | 337 |
| 19 | දූෂණ නිවාරණ නිලධාරී | 50 |
| 20 | පුස්තකාලයාධිපති | 01 |
| 21 | භාෂා පරිවර්තක හා භාෂණ පරිවර්තක | 06 |
| 22 | නීති සහකාර | 07 |
| 23 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 06 |
| 24 | සහකාර පුස්තකාලයාධිපති | 01 |
| 25 | දූෂණ විරෝධී කළමනාකරණ සේවා නිලධාරී ** | 113 |
| 26 | යතුරු ලේඛක හා ලඝුලේඛක | 45 |
| 27 | සන්නිවේදන සහකාර | 07 |
| 28 | රියදුරු | 69 |
| 29 | කාර්යාල කාර්ය සහයක | 117 |
| | එකතුව | 971 |

** දූෂණ විරෝධී පනතේ 26(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව බඳවා ගැනීමට තීරණය කර ඇති තනතුර "දූෂණ විරෝධී කළමනාකරණ සේවා නිලධාරී" වේ. මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාව ලැබී ඇති බවට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇති තනතුරු නාමය වන්නේ "කළමනාකරණ සහකාර" තනතුර ය. තනතුරු නාමයන් වෙනස් වුව ද පැවරෙන රාජකාරි සමාන ස්වභාවයක් ගනු ලබන බැවින් හා තවත් කරුණු ගණනාවක් සලකා බලා කොමිෂන් සභාව තීරණය කර ඇත්තේ "දූෂණ විරෝධී කළමනාකරණ සේවා නිලධාරී" යන තනතුරු නාමය වේ.

ඇමුණුම - II

**දූෂණ විරෝධී පනතේ 26(2) වගන්තිය ප්‍රකාරව මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය සහිතව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදුව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පාරිශ්‍රමික යෝජනාවලිය**

01. යෝජිත වැටුප් ව්‍යුහය

| | තනතුර | වැටුප් කේතය | මූලික පියවර | වර්ෂ | 1වැනි පියවර | වර්ෂ | 2වැනි පියවර | වර්ෂ | 3වැනි පියවර | වර්ෂ | 4වැනි පියවර | උපරිම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | AC-E 4 - 2025 | 212,000 | 10 | 4,950 | | | | | | | 261,500 |
| 2 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්/ ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ | AC-E 3 - 2025 | 194,000 | 10 | 4,500 | | | | | | | 239,000 |
| 3 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්/ අධ්‍යක්ෂ/ ප්‍රධාන අභ්‍යන්තර විගණක | AC-E 2 - 2025 | 176,000 | 10 | 4,250 | | | | | | | 218,500 |
| 4 | ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ ජනරාල් | AC-E 1-2 - 2025 | 151,900 | 10 | 3,900 | | | | | | | 190,900 |
| 5 | සහකාර අධ්‍යක්ෂ ජනරාල් | AC-E 1-1 - 2025 | 131,300 | 10 | 2,940 | | | | | | | 160,700 |
| 6 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ/ අභ්‍යන්තර විගණක/ පර්යේෂණ නිලධාරී | AC-E 1 - 2025 | 131,300 | 10 | 2,940 | 10 | 3,595 | | | | | 196,650 |
| 7 | පරිපාලන නිලධාරී | AC-JM 1-2 - 2025 | 74,010 | 10 | 1,360 | 18 | 2,040 | | | | | 124,330 |
| 8 | ප්‍රවාහන නිලධාරී | AC-JM 1-2 - 2025 | 74,010 | 10 | 1,360 | 18 | 2,040 | | | | | 124,330 |
| 9 | තාක්ෂණ නිලධාරී | AC-JM 1-2 - 2025 | 74,010 | 10 | 1,360 | 18 | 2,040 | | | | | 124,330 |
| 10 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | AC-JM 1-2 - 2025 | 74,010 | 10 | 1,360 | 18 | 2,040 | | | | | 124,330 |
| 11 | ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී | AC-MA 5-3 - 2025 | 79,440 | 10 | 2,040 | 20 | 2,230 | | | | | 144,440 |
| 12 | ජ්‍යෙෂ්ඨ දූෂණ නිවාරණ නිලධාරී | AC-MA 5-3 - 2025 | 79,440 | 10 | 2,040 | 20 | 2,230 | | | | | 144,440 |
| 13 | විමර්ශන නිලධාරී | AC-MA 5-1 - 2025 | 58,740 | 10 | 1,190 | 15 | 1,360 | 11 | 1,670 | | | 109,410 |
| 14 | දූෂණ නිවාරණ නිලධාරී | AC-MA 5-1 - 2025 | 58,740 | 10 | 1,190 | 15 | 1,360 | 11 | 1,670 | | | 109,410 |
| 15 | පුස්තකාලයාධිපති | AC-MA 4 - 2025 | 64,320 | 10 | 1,360 | 15 | 1,670 | 5 | 2,040 | | | 113,170 |
| 16 | භාෂා පරිවර්තක හා භාෂණ පරිවර්තක | AC-MA 4 - 2025 | 64,320 | 10 | 1,360 | 15 | 1,670 | 5 | 2,040 | | | 113,170 |
| 17 | නීති සහකාර | AC-MA 3 - 2025 | 53,940 | 10 | 800 | 11 | 1,190 | 10 | 1,320 | 5 | 1,350 | 94,980 |
| 18 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | AC-MA 2-1 - 2025 | 50,540 | 10 | 540 | 7 | 630 | 4 | 890 | 20 | 1,190 | 87,710 |
| 19 | සහකාර පුස්තකාලයාධිපති | AC-MA 1-1 - 2025 | 46,220 | 10 | 540 | 7 | 630 | 4 | 890 | 20 | 1,190 | 83,390 |
| 20 | කළමනාකරණ සහකාර | AC-MA 1-1 - 2025 | 46,220 | 10 | 540 | 7 | 630 | 4 | 890 | 20 | 1,190 | 83,390 |

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

| | තනතුර | වැටුප් කේතය | මූලික පියවර | වර්ෂ | 1වැනි පියවර | වර්ෂ | 2වැනි පියවර | වර්ෂ | 3වැනි පියවර | වර්ෂ | 4වැනි පියවර | උපරිම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 21 | යතුරු ලේඛක හා ලඝුලේඛක | AC-MA 1-1 - 2025 | 46,220 | 10 | 540 | 7 | 630 | 4 | 890 | 20 | 1,190 | 83,390 |
| 22 | සන්නිවේදන සහකාර | AC-MA 1-1 - 2025 | 46,220 | 10 | 540 | 7 | 630 | 4 | 890 | 20 | 1,190 | 83,390 |
| 23 | රියදුරු | AC-PL 3 - 2025 | 43,280 | 10 | 490 | 10 | 540 | 10 | 590 | 12 | 630 | 67,040 |
| 24 | කාර්යාල කාර්ය සහායක | AC-PL 1 - 2025 | 40,500 | 10 | 450 | 10 | 490 | 7 | 540 | 15 | 590 | 62,530 |

02. යෝජිත දූෂණ විරෝධී අවදානම් දීමනාව

| | තනතුර | වැටුප් කේතය | දූෂණ විරෝධී අවදානම් දීමනාව |
|---|---|---|---|
| 1 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | AC-E 4 - 2025 | 140,000 |
| 2 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | AC-E 3 - 2025 | 128,750 |
| 3 | ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ | AC-E 3 - 2025 | 48,000 |
| 4 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | AC-E 2 - 2025 | 117,500 |
| 5 | අධ්‍යක්ෂ/ ප්‍රධාන අභ්‍යන්තර විගණක | AC-E 2 - 2025 | 44,000 |
| 6 | අධ්‍යක්ෂ (විමර්ශන) | AC-E 2 - 2025 | 70,000 |
| 7 | ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ ජනරාල් | AC-E 1-2 - 2025 | 105,250 |
| 8 | සහකාර අධ්‍යක්ෂ ජනරාල් | AC-E 1-1 - 2025 | 94,000 |
| 9 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ/අභ්‍යන්තර විගණක/ පර්යේෂණ නිලධාරී | AC-E 1 - 2025 | 33,000 |
| 10 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (විමර්ශන) | AC-E 1 - 2025 | 52,000 |
| 11 | පරිපාලන නිලධාරී | AC-JM 1-2 - 2025 | 19,000 |
| 12 | ප්‍රවාහන නිලධාරී | AC-JM 1-2 - 2025 | 19,000 |
| 13 | තාක්ෂණ නිලධාරී | AC-JM 1-2 - 2025 | 19,000 |
| 14 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | AC-JM 1-2 - 2025 | 19,000 |
| 15 | ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී | AC-MA 5-3 - 2025 | 31,000 |
| 16 | ජ්‍යෙෂ්ඨ දූෂණ නිවාරණ නිලධාරී | AC-MA 5-3 - 2025 | 20,000 |
| 17 | විමර්ශන නිලධාරී | AC-MA 5-1 - 2025 | 23,000 |
| 18 | දූෂණ නිවාරණ නිලධාරී | AC-MA 5-1 - 2025 | 15,000 |
| 19 | පුස්තකාලයාධිපති | AC-MA 4 - 2025 | 16,000 |
| 20 | භාෂා පරිවර්තක හා භාෂණ පරිවර්තක | AC-MA 4 - 2025 | 16,000 |
| 21 | නීති සහකාර | AC-MA 3 - 2025 | 14,000 |
| 22 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | AC-MA 2-1 - 2025 | 13,000 |
| 23 | සහකාර පුස්තකාලයාධිපති | AC-MA 1-1 - 2025 | 12,000 |
| 24 | කළමනාකරණ සහකාර | AC-MA 1-1 - 2025 | 12,000 |
| 25 | යතුරු ලේඛක හා ලඝුලේඛක | AC-MA 1-1 - 2025 | 12,000 |
| 26 | සන්නිවේදන සහකාර | AC-MA 1-1 - 2025 | 12,000 |
| 27 | රියදුරු | AC-PL 3 - 2025 | 11,000 |
| 28 | කාර්යාල කාර්ය සහායක | AC-PL 1 - 2025 | 10,000 |

03. යෝජිත කාර්ය සාධන දීමනාව

ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරි සහ විමර්ශන නිලධාරි යන තනතුරු සඳහා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන රු. 10,000/- ක් දක්වා වන කාර්ය සාධන දීමනාවක් ගෙවීම.

04. ඉහත 02 සහ 03 හැර යෝජිත අනෙක් දීමනා

ඉහත දූෂණ විරෝධී අවදානම් දීමනාව සහ කාර්ය සාධන දීමනාවට අමතරව කොමිෂන් සභාවේ නිලධාරීන් හා සේවකයන් සඳහා අනෙකුත් දීමනා (අතිකාල දීමනාව/අමතර සේවා දීමනාව හා නිවාඩු දින වැටුප්, සංයුක්ත දීමනාව, ජීවන වියදම් දීමනාව, වෘත්තීය දීමනාව, ප්‍රවාහන දීමනාව, ඉන්ධන දීමනාව සහ සන්නිවේදන දීමනාව ඇතුළු අනෙකුත් දීමනාවන්) ගෙවීමේ දී රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලය සඳහා එම දීමනා හිමි ගන්වා ඇති චක්‍රලේඛ විධිවිධාන අදාළ කර ගැනීම."

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, ඉතාම කෙටි පැහැදිලි කරවා ගැනීමක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අවස්ථාව ලැබුණාට පසුව එය ඉදිරිපත් කරන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අද දවසේ මට කථාවක් නැහැ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කථාවකට අවස්ථාවක් විපක්ෂයෙන් ඉල්ලා ගන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
නැහැ, නැහැ, මට පොඩි පැහැදිලි කරවා ගැනීමක් තමයි අවශ්‍ය.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ගරු අගමැතිතුමිය දැනටමත් යෝජනාව ඉදිරිපත් කරලායි තිබෙන්නේ. එම යෝජනාව සම්බන්ධයෙන් එතුමිය කථා කළාට පසුව ඔබතුමාගේ පැහැදිලි කිරීම කරගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමිය.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Thank you, Hon. Speaker.

ගරු කථානායකතුමනි, අද දින මේ ඉදිරිපත් කර තිබෙන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි තීරණය කිරීමේ යෝජනාව ඉතාම වැදගත් සහ ඓතිහාසික යෝජනාවක් ලෙස මම සලකනවා. ගරු කථානායකතුමනි, මෙහි වැදගත්කම මෙයයි. අප කාලයක් තිස්සේ කථා කරපු සහ මේ රටේ ආර්ථිකයට, සමාජ තත්ත්වයට, දේශපාලන සංස්කෘතියට ඍජුවම සහ ඉතාම බැරෑරුම් ලෙස බලපෑ දූෂණය, වංචාව, නාස්තිය කියන සියල්ල වෙනුවෙන් කාලයක් තිස්සේ කළ මැදිහත්වීම් තුළ සහ අවුරුදු ගණනාවක් තිස්සේ දූෂණය අවම කිරීමට, මර්දනය කිරීමට සහ දේශපාලන සංස්කෘතියෙන් එය ඉවත් කිරීමට ගන්නා උත්සාහයන් තුළ අතිශයින් වැදගත් තැනකට අද අප ඇවිත් තිබෙනවා කියන එක මම කියන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පත් කිරීමට අදාළව දූෂණ විරෝධී පනත 2023 වසරේදී සම්මත වුණාට එම පනතේ තිබෙන අන්තර්ගතය, ඒකේ තිබෙන spirit එක හරියාකාරව ක්‍රියාත්මක කිරීමේදී ප්‍රායෝගික ගැටලු ගණනාවක් මතු වුණා. මොකද, එම පනත සම්මත කර ගත්තාට විතරක් ප්‍රමාණවත් වුණේ නැහැ. එම පනත 2023දී පාර්ලිමේන්තුවේදී සම්මත වුණාට ඇත්ත වශයෙන්ම එවැනි කොමිෂන් සභාවක් තිබෙනවා කියලා දැනෙන්න පටන් ගත්තේ 2025 සිටයි. ඇත්ත වශයෙන්ම, එතැන ඉඳලා වුණත් එය ක්‍රියාත්මක කිරීමේදී එම කොමිෂන් සභාවට ප්‍රශ්න ගණනාවක් මතු වුණා. විශේෂයෙන්ම ඔවුන්ගේ මූල්‍ය කටයුතු පිළිබඳව තිබුණු ස්වාධීනත්වයත්, නිලධාරින් බඳවා ගැනීමේදී තිබුණු සීමාවනුත් නිසා මෙම කොමිෂන් සභාවට අවශ්‍ය පරිදි ක්‍රියාත්මක වීමට බාධක, අභියෝග ගණනාවක් තිබුණා.

ගරු කථානායකතුමනි, අපි උදාහරණයක් ගනිමු. CIABOC එකට හරියාකාරව ක්‍රියාත්මක වෙන්න නම් ඔවුන්ගේ කාර්ය මණ්ඩලයේ දීමනා තීරණය කර ගැනීමේ නිදහස, ක්‍රියාත්මක වීමට අවශ්‍ය රීති සහ රෙගුලාසි සකස් කිරීමේ නිදහස, නිලධාරින් බඳවා ගැනීමේ නිදහස, ඔවුන්ගේ වාර්ෂික සැලැස්මට අවශ්‍ය වන ප්‍රතිපාදන සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේ නිදහස වැනි ප්‍රායෝගික කාරණා ගණනාවකුත් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කොන්දේසි සහ තත්ත්වයන් ඇති කළ යුතුව තිබුණා. මෙතෙක් කාලයක් එය නොකිරීම තුළ ඇත්ත වශයෙන්ම එම කොමිෂන් සභාවට අවශ්‍ය පරිදි උපරිමයෙන් ක්‍රියාත්මක වීමේදී අභියෝග ගණනාවකට මුහුණ දෙන්න සිද්ධ වුණා. උදාහරණයක් හැටියට ගත්තොත්, නීති නිලධාරින් හිටියේ 31දෙනෙකු පමණයි. කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ජනවාරි මාසයේ පත් කරන විට, විමර්ශන අවසන් කර නඩු නොපැවරූ ලිපිගොනු 4,000කට අධික ප්‍රමාණයක් තිබුණා. කොමිෂන් සභාවට බඳවා ගන්න අනුමත වෙලා තිබුණු නිලධාරින් ප්‍රමාණයවත් බඳවා ගන්න අපොහොසත් වෙලා තිබුණේ. අද ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාව හරහා ගරු කථානායකතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ස්වාධීනව කටයුතු කිරීමේ හැකියාව ලැබෙනවා. ඇත්ත වශයෙන්ම අමාත්‍යවරයෙකුගේ මැදිහත් වීමක් හෝ බලපෑමක් නැතුව නිදහසේ, ස්වාධීනව ක්‍රියාත්මක වීමට අවශ්‍ය අවකාශය නිර්මාණය වනවාය කියන එක තහවුරු වනවා. ඒක තමයි අද ඉදිරිපත් කරන මේ යෝජනාවේ තිබෙන වැදගත්කම. මේ යෝජනාව සම්මත වීමත් සමඟම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට - CIABOC එකට- පුළුවන් වනවා, ඔවුන්ගේ නිලධාරින් තෝරා පත් කර ගැනීම, ඔවුන්ට අවශ්‍ය දීමනා තීරණය කර ගැනීම සහ මූල්‍ය කටයුතු පිළිබඳව තීන්දු තීරණ ගැනීම ස්වාධීනව කරන්න. ඒ සියල්ල නිදහසේ කරන්න පුළුවන් වනවා. විශේෂයෙන්ම නිලධාරින් බඳවා ගැනීමත් සමඟම කාලයක් තිස්සේ ගොඩ ගැසී තිබුණු ලිපි ගොනු, නිසි ලෙස විමර්ශන ක්‍රියාත්මක නොවී හිර වෙලා තිබුණු කරුණු කාරණා පිළිබඳව ක්‍රියාත්මක වීමට හැකි වනවා. ඇත්ත වශයෙන්ම අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් බලාපොරොත්තු වුණු ඒ කාර්යභාරය ඉෂ්ට කිරීමට හැකි වනවා. ගරු කථානායකතුමනි, අපේ අරමුණත්, අපේ බලාපොරොත්තුවත් ඒකයි. ජාතික ජන බලවේගයේ රජය පත්වීමත් සමඟ අපි රටට දුන්න පොරොන්දුවක් ඒක. අපි දුන්න පොරොන්දුවක් තමයි, දේශපාලන සංස්කෘතිය තුළත්, දේශපාලන අධිකාරියේත්, ඒ වාගේම රාජ්‍ය සේවය තුළත් අල්ලස් හා දූෂණ අවම කිරීමට, ඒවාට එරෙහිව ක්‍රියාත්මක වීමට අවශ්‍ය ක්‍රියාවලිය සකස් කිරීම වෙනුවෙන් අපි පෙනී ඉන්නවා, ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගන්නවා කියන එක.

ගරු කථානායකතුමනි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ අල්ලස් හා දූෂණ පිළිබඳව අපේ රජයේ ප්‍රතිපත්තිය දක්වා තිබෙනවා. ඒ තුළ විශේෂයෙන්ම සඳහන් කළ දෙයක් තමයි, අල්ලස් හෝ දූෂණ

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමත්, ඔවුන්ට ස්වාධීනව ක්‍රියාත්මක වීමට හැකි වන සේ අවශ්‍ය පරිසරය සකස් කර, නිලධාරින්, මූල්‍ය නිදහස කියන ප්‍රායෝගික අවශ්‍යතා සියල්ල ලබා දෙන බව. අන්න ඒ පොරොන්දුව තමයි අපි ඉටු කරන්නේ. ඒ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් අපි ජනතාවට ඉදිරිපත් කළ පොරොන්දුව ඉටු කිරීම සඳහා වන වැදගත් යෝජනාවක් තමයි අපි අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. ගරු කථානායකතුමනි, මේ හරහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වැඩකටයුතු, ඉතාම වැදගත් වූ ඒ කාර්යභාරය ඉෂ්ට කර ගැනීමට හැකි වනවා. විශේෂයෙන්ම කාලයක් තිස්සේ ගොඩ ගැහුණු සිද්ධි පිළිබඳව ක්‍රියාත්මක වීමට අවශ්‍ය වන නිලධාරින් බඳවා ගැනීමට හැකි වනවා. ඒ අවශ්‍ය දක්ෂතා හා කුසලතා තිබෙන අය ආකර්ෂණය කරගනිමින්, ඒ නිලධාරින්ගේ වෘත්තීයභාවය රැක ගනිමින් බඳවා ගැනීමට හැකි වනවා.

ගරු කථානායකතුමනි, මේක ඉතාම ඓතිහාසික මොහොතක්. අපේ රට තුළ අලුත් දේශපාලන සංස්කෘතියක් ඇති කරමින්, දූෂණ හා අල්ලස්වලට එරෙහි වන, එවැනි ක්‍රියා ප්‍රතික්ෂේප කරන, එවැනි කටයුතුවලින් තොර පිරිසිදු රාජ්‍ය සේවයක් ඇති කර ගැනීමට ගන්නා ක්‍රියාවලියට අවශ්‍ය අද ඉතාම වැදගත් යෝජනාවක් තමයි මේ ඉදිරිපත් වෙන්නේ. මෙතෙක් කාලයක් දැනෙන විධියට, ඇත්තවශයෙන්ම 2025 සිට තමයි දැනෙන විධියට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ක්‍රියාත්මක වෙන්න පුළුවන් වුණේ. මීට පෙර නාමිකව අල්ලස් හා දූෂණවලට එරෙහි පනත් අනුමත වුණා. ඒ වාගේම විවිධ ක්‍රියා ගැන විවිධ කොමිෂන් සභා පත් වුණා. ඒවා නාමිකව තිබුණාට, ඇත්තවශයෙන්ම කොමිෂන් සභාව ක්‍රියාත්මක වන තැනකට ගෙනෙන්න පුළුවන් වන පරිසරයක් මෙන්ම, ඒකට අවශ්‍ය ප්‍රතිපාදන, නිදහස හා අනෙක් පහසුකම් ලබා දීම තමයි දැන් සිදු වෙන්නේ. ඒ අනුව, අපි දුන්න තවත් පොරොන්දුවක් ඉෂ්ට කරන්න අපට හැකි වුණා. ගරු කථානායකතුමනි, අද ඒ පනත යෝජනා වෙන අතර, මේ පවතින තත්ත්වය පිළිබඳවත් යම් අදහසක් ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, අද ගරු බලශක්ති ඇමතිතුමා කියූ පරිදි අපේ පාලනයෙන් පිට සිද්ධ වෙන දේවල් නිසා අපේ ආර්ථිකයටත්, අපේ බලශක්ති ක්ෂේත්‍රයටත් අභියෝග ගණනාවකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. අපේ රජය මේ පිළිබඳ ඉතාම කිට්ටුවෙන් නිරීක්ෂණය කරමින් සිටිනවා. මොකද, මේක දිනෙන් දින, පැයෙන් පැය වෙනස් වෙන තත්ත්වයක්. ඒ නිසා අපට මාස තුනකට, හතරකට, අවුරුද්දකට ඉස්සර සිට මේ ගැන පුරෝකථන කරන්න බැහැ. මේක තීන්දු තීරණ, බලපෑම් නිරන්තරයෙන් shift වෙන මොහොතක්. විශේෂයෙන් ඒවා අපේ බලපෑමෙන්, අපේ පාලනයෙන් පිට සිද්ධ වෙන නිසා, ඒ චලන හරියට හඳුනා ගන්න සහ ඒ චලන හරියට තේරුම් ගන්න අපට විශාල වගකීමක් තිබෙනවා. ඒ චලන හරහා අපේ ආර්ථිකයට කරන බලපෑම කළමනාකරණය කරන එක තමයි අපේ රජයේ වගකීම. ඒ සඳහා අපි ගත යුතු ක්‍රියාමාර්ග මේ මොහොතේත් අරගනිමින් ඉන්නේ.

ගරු කථානායකතුමනි, ඊයේ කැබිනට් මණ්ඩලයෙන් අනුමත කළා මේ සඳහා විශේෂ කමිටු හතරක් පත් කරන්න. මේ තත්ත්වය නිරීක්ෂණය කරමින්, මේ තත්ත්වය පාලනය කරමින් සහ කළමනාකරණය කරමින් ජනතාවට අත්‍යවශ්‍ය සේවා නොකඩවා ලබා දීම සඳහා එක කමිටුවකුත්, මේ පවතින තත්ත්වය තුළ රාජ්‍ය සේවයේ වැඩ යම් කිසි විධියකට වෙනස් විය යුත්තේ කොහොමද යන්නත්, අපේ බලශක්තිය පුළුවන් තරම් කළමනාකරණය කරමින් සේවා පවත්වා ගෙන යෑමේ දී ගත යුතු තීන්දු තීරණ සහ ඒ තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීමේ දී එන්න පුළුවන් ගැටලු නිරාකරණය කරමින් කටයුතු කිරීමටත් තව කමිටුවක් පත් කර තිබෙනවා. බලශක්තිය ලබා ගැනීමේදී මේ වන විට ලෝකයේ හැම තැනක්ම ප්‍රශ්න ගණනාවකට මුහුණ දෙමින් සිටිනවා. අපට විතරක් නොවෙයි, රටවල් ගණනාවකට ඔවුන්ගේ බලශක්ති අවශ්‍යතා අනුව තෙල් ලබා ගැනීමේ දී ප්‍රශ්න ගණනාවක් ඇති වෙලා තිබෙනවා. ඒ තරගයේ අපිත් කොටස්කරුවෝ. ඒ කොටස්කරුවන් හැටියට තමයි අපටත් අපේ අවශ්‍යතාවලට තෙල් ලබා ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එම නිසා පවතින ක්‍රමයට අමතරව අත්‍යවශ්‍ය emergency ක්‍රියාමාර්ග අපට ගන්න සිද්ධ වෙනවා. ඒ සඳහා National Procurement Commission එකත් සමඟ සාකච්ඡා කරමින්, තවත් ක්‍රම හඳුනා ගනිමින් අවශ්‍යතාව අනුව අපට තෙල් මිලදී ගැනීමේදී යම්කිසි උපදෙස් ලබා ගැනීම සඳහා කමිටුවකුත්,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Prime Minister, you have two more minutes.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Thank you, Hon. Speaker. I will wind up.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මේ ඇති වෙලා තිබෙන තත්ත්වය තුළ ජනතාවගේ විශේෂ කොටස් තුළින් එන්න පුළුවන් සමාජ බලපෑම සහ ඒවාට දෙන්න පුළුවන් සාධාරණ විසඳුම් සහ සහන හා සුබසාධන කටයුතු සොයා බැලීම සඳහා තවත් කමිටුවකුත් අපි පත් කරලා තිබෙනවා. රට වෙනුවෙන් තමයි අපි මේ තීන්දු ගන්නේ. අපේ ජනතාව වෙනුවෙන් මේ තීන්දු තීරණ ගන්නේ. අපට කියන්න තිබෙන්නේ මෙයයි. මේ තත්ත්වය අපි ඉතාම කිට්ටුවෙන්, ඉතාම හොඳින් නිරීක්ෂණය කරමින් ගත යුතු තීරණ හරි වෙලාවට ගනිමින් කළමනාකරණය කරගෙන යනවා. ඒ සඳහා අපට මේ වෙලාවේ අවශ්‍ය වෙන්නේ මේකයි. ඇත්තවශයෙන්ම මේක අපි සාමූහිකව මුහුණ දිය යුතු තත්ත්වයක්. අපි රටක් හැටියට මුහුණ දිය යුතු තත්ත්වයක්. ගෝලීය වශයෙන් ඇති වෙලා තිබෙන තත්ත්වයක් සඳහා ප්‍රතිචාර දක්වන කොට තනි තනිව නොවෙයි, අපි සියලුදෙනාම එකතුව අපේ රටේ ආර්ථිකය ආරක්ෂා කර ගැනීමත්, ඒ ආර්ථිකය තුළ සිද්ධ වෙන චලන හරියට හඳුනා ගෙන ඒවා කළමනාකරණය කිරීමත් තමයි අපේ අරමුණ විය යුත්තේ. ඒ සඳහා රාජ්‍ය සේවයත්, පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව දේශපාලන අධිකාරියේ සියලුදෙනාත්, ඒ වාගේම රටේ ජනතාවත්, පෞද්ගලික ක්ෂේත්‍රයත් එකතු වෙලා අපි මීට පෙර අභියෝගවලට මුහුණු දුන් විධියටම සාමූහිකව මුහුණ දිය යුතුයි කියන අදහසේ තමයි අපි ඉන්නේ, ගරු කථානායකතුමනි. ඒක නිසා නායකත්වයත්, එය කළමනාකරණයත් හරහා ලෝකයේ තිබෙන තත්ත්වයත් එක්ක අවශ්‍ය වෙලාවට ඒ තීන්දු තීරණ ගනිමින් අපට මේ තත්ත්වයට මුහුණ දෙන්න හැකි වෙයි කියලා මට විශ්වාසයි. ඒ විශ්වාසය තුළින් අපි ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක වෙනවා කියන එක මම මේ වෙලාවේ ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, මට කාලය ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු අගමැතිතුමියනි, මම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විධියට අපේ කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරද්දී යම් වැදගත් කාරණාවක් ඉස්මතු කළා. ඔබතුමියගේ කථාවේදී ඒ පිළිබඳව අවශ්‍ය පිළිතුරක් ලබා දෙයි කියලා මම බලාපොරොත්තු වුණා. හැබැයි, ඔබතුමිය ඒක සම්පූර්ණයෙන්ම මඟහැරියා. 2023 ඉඳලා පිළිගත් තර්කය තමයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ සභාපතිවරයා සහ එම කොමිසමට, අභියාචනාධිකරණයේ සභාපති විනිසුරුගේ salary එකට සමාන හා සාපේක්ෂ වැටුපක් ගෙවන්න ඕනෑ කියන එක. මෙතැන වෙලා තිබෙන්නේ මෙයයි. අභියාචනාධිකරණයේ විනිසුරුතුමන්ලාගේ වැටුප් වැඩි වෙලා තිබෙනවා. නමුත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ හෝ සාමාජිකයන්ගේ වැටුප් වැඩි වෙලා නැහැ. ඒක කරන්න ඕනෑ මේ පාර්ලිමේන්තුවෙන්. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ සහ ජාතික විගණන කාර්යාලයේ සාමාජිකයන්ගේ වැටුප් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්නේ මුදල් අමාත්‍යාංශය නොවෙයි, මේ පාර්ලිමේන්තුවයි කියලා ඔබතුමිය හොඳටම දන්නවා. ඔබතුමියට ඒ වගකීම තිබෙනවා. දීර්ඝව ඉදිරියට යන්න කලින්, 2023 ඉඳලා දීපු පොරොන්දුව - ඒ undertaking එක - ඉෂ්ට කරනවාද කියලා කරුණාකරලා දැන් අපව දැනුවත් කරන්න. භාගයක් දුරට සිදු වුණා, නමුත් 2025දී සිදු වුණේ නැහැ. ඒක කරනවාද, නැද්ද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, මේ යෝජනාවෙන් ඒක කෙරෙන්නේ නැහැ. නමුත්, ඒක ගැන අධිකරණ අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මැතිතුමා පැහැදිලි කිරීමක් ඉදිරිපත් කරාවි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධව පැහැදිලි කිරීම සඳහා මට අවස්ථාව දෙන්න.

ගරු මන්ත්‍රීතුමා, අද ගෙන එන යෝජනාවට කොමසාරිස්වරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික අයත් වෙන්නේ නැහැ. එම පාරිශ්‍රමික දූෂණ විරෝධී පනතේ 9වන සහ 24වන වගන්ති ප්‍රකාරව දැනටමත් තීන්දු කර තිබෙනවා. ඉදිරියේදී මොනවා හරි වැඩි කිරීම් කරන්න සිදු වෙනවා නම් ඒක වෙනම බලන්නට ඕනෑ. ඒක මේ යෝජනාවලියේ නැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා විපක්ෂයේ කාලය ලබා ගන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම සැරින් සැරේට ප්‍රශ්න අහන්නේ නැහැ. ඉඳලා හිටලා ප්‍රශ්න අහන්නේ. මේක වැදගත් ප්‍රශ්නයක්, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක dialogue එකක් වෙනවා නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Dialogue එකක් නොවෙයි, මට දැනගන්නයි මේ ප්‍රශ්නය අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කියන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු අධිකරණ ඇමතිතුමනි, අපි ඒක දන්නවා. මේ යෝජනාවේ ඒක නැහැ කියලා මුලදීම කිව්වා. DGගේ වැටුපත් මේ යෝජනාවේ නැහැ. Commissionersලාගේත්, DGගේත් වැටුප ගැන මේ යෝජනාවේ නැහැ. නමුත් අපට දැන ගන්න ඕනෑ වුණේ මෙයයි. ඔබතුමන්ලා ඒ දේ කරන්න පොරොන්දු වුණා. ඒ දේ කරලා නැහැ. කවදාද කරන්නේ කියන එකයි දැන ගන්න ඕනෑ. අනෙක් අයගේ වැටුප් වැඩි වුණාට මේ අයගේ වැටුප් වැඩි වුණේ නැහැ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ඒකට සාකච්ඡාවක් ගන්න පුළුවන්, ගරු කථානායකතුමනි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව කිසිදු අමාත්‍යාංශයක් යටතට එන්නේ නැහැ. ඒක නිසා අමාත්‍යාංශයකට ඔවුන්ගේ වැටුප් තීරණය කරන්න බැහැ. නමුත් අවශ්‍ය ප්‍රශ්නයක් තිබෙනවා නම් අගමැතිතුමිය වෙත යොමු කරලා ජනාධිපතිතුමාගෙන් අවශ්‍ය පිළිතුරු ගන්න පුළුවන්. මේ සම්බන්ධයෙන් ඔවුන්ට බලතල තිබෙනවා. ඒ පිළිබඳව ඔවුන්ට සාකච්ඡාවක් ගන්න පුළුවන්. ඒ ගැන ගැටලුවක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

Order, please! the Hon. Deputy Speaker will now take the Chair.

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 11.22]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ඉදිරිපත් කරලා තිබෙන්නේ ඉතාම වැදගත් යෝජනාවක්. විපක්ෂය හැටියට අපි මේ යෝජනාවට සම්පූර්ණයෙන් සහාය පළ කරනවා. ඒ වාගේම 2023 අංක 9 දරන පනත සකස් කිරීමේදී ඒකට පදනම් වුණු ඒ මූලික ක්‍රියාදාමයට නායකත්වය දුන් පුද්ගලයා හැටියට, එම පනතේ ඉදිරි ගමන පිළිබඳව වැදගත් පියවරක් තබන එක ගැන මට සතුටක් තිබෙනවා. පාර්ලිමේන්තුවේ නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ අංශික අධීක්ෂණ කාරක සභාවේ පළමුව සාමාජිකයෙක්, දෙවනුව සභාපතිවරයා හැටියට මා කටයුතු කරන කාලයේ, වර්තමානයේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු ධුරය දරන යසන්ත කෝදාගොඩ විනිශ්චයකාරතුමා තමයි යෝජනා කළේ, "අපි මේ රටේ තිබෙන සියලු දූෂණ විරෝධී නීති එක තැනකට අරගෙන එමු. එක නීතියක් ගොඩනහමු" කියලා. යසන්ත කෝදාගොඩ විනිශ්චයකාරතුමාගේ එම අදහස අනුව අපි දීර්ඝ කාලයක් පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාවේ මූලිකත්වයෙන්, වුවමනාවෙන් මේ කෙටුම්පත් කිරීමේ කටයුතු කරගෙන ගියා.

දුෂ්කර කාලයකින් පසුව 2023දී මේ නීතිය සම්මත කර ගන්න පුළුවන්කම ලැබුණා. එම ක්‍රියාදාමයට සම්බන්ධ වුණු සියලුදෙනාට ස්තුති කරනවා. ඇත්ත වශයෙන්ම මේ දූෂණ විරෝධී පරීක්ෂණ, අපරාධ හා සම්බන්ධ පරීක්ෂණ කරන නීතිපති දෙපාර්තමේන්තුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම වාගේ ආයතන බරපතළ වගකීම් දරන ආයතන. ඒ ආයතනවල ස්වාධීනත්වය තහවුරු කරන්න ඔවුන්ගේ වැටුප් හා පරිහාර ප්‍රමාණවත් තරම් ලබා දීම වැදගත් බව පිළිගන්නවා. නීතිපති දෙපාර්තමේන්තුවට ඒ අවශ්‍ය ශක්තිය ලබා දෙන්න එදා අපට පුළුවන් වුණා. 118ක් ලෙස තිබුණු රජයේ අධිනීතිඥවරුන්ගේ cadre එක 218ක් කරන්න, ඔවුන්ගේ වැටුප් හා දීමනා සැලකිය යුතු මට්ටමකින් වැඩි කරලා රජයේ ඉහළම තැනකට අරගෙන එන්න අපට පුළුවන් වුණා. ඒක නිසා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම ශක්තිමත් කිරීම සඳහා වූ මේ යෝජනා මාලාව ඉතා වැදගත්.

ගරු අගමැතිතුමියනි, අද මේ රටේ මතු වෙලා තිබෙන කාරණා අපට පාලනය කරන්න බැරි දේවල් කියලා ඔබතුමිය කිව්වා. පාලනය කරන්න පුළුවන් දේවලුත් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අද තිබෙන්නේ බලශක්ති අර්බුදයක්. ඒක ලෝකයේම තිබෙන අර්බුදයක්. මේ ලෝක අර්බුදයට මුහුණ දීමේදී අපට තිබෙන ප්‍රධානම ගැටලුවක් තමයි, අපේ රටේ විදුලිබල පද්ධතියෙන් තුනෙන් එකකට ආසන්න ප්‍රමාණයක් බලශක්තිය සපයන නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා 2025-2026 ගල් අඟුරු වාරයට ගල් අඟුරු මිලදී ගැනීමේ ක්‍රියාදාමය තුළ සිදුවෙලා තිබෙන අක්‍රමිකතා, දූෂණ සහ පරිපාලන නොහැකියාව. ගරු අගමැතිතුමියනි, ඒක ඔබතුමියගේ ආණ්ඩුවේ පාලනයේ තිබෙන්නේ; ඒක බලශක්ති ඇමතිතුමාගේ පාලනයේ තිබෙන්නේ. දැන් බලන්න, මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. පළමුවැනි නැව් 9න් විතරක් සිදුවෙලා තිබෙන අලාභය රුපියල් බිලියන 8.497ක්. ඒ වාගේම PUCSL එක නිල වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා පැහැදිලිව කියනවා, බලාපොරොත්තු වන විධියට අප්‍රේල් මාසයේ 19වැනි දා - නියමිත දිනය - වන විට අවශ්‍ය ගල් අඟුරු නැව් ප්‍රමාණය අපේ රටට ගෙන්වා ගන්න බැහැයි කියලා. අපි අපේක්ෂා කරනවා, වාරකන් කාලය පටන් ගන්නා දිනය ඒ දිනය කියලා. එක පැත්තකින්, ගෙනෙන ගල් අඟුරු බාලයි. අනෙක් පැත්තෙන්, නැව් ප්‍රමාදයි. හැබැයි මේ තත්ත්වය ජනවාරි මාසයේ මුල් සතියේම නිරීක්ෂණය කළා නම්, අඩු මිලක් දාලා මේ ටෙන්ඩරය ගත්ත Trident Chemphar Limited කියන ඉන්දියානු සමාගමට මේ වැඩේ කරන්න හැකියාවක් තිබෙනවාද, නැද්ද කියලා දැනගන්න පුළුවන්. මොකද, පටන්ගත්ත ගමන්ම ප්‍රමාදයි. පළමුවෙන් ගෙනා නැවේ තිබුණු ගල් අඟුරු තොගය බාලයි. මේ තත්ත්වය තුළ ඒ වෙලාවේ එම ටෙන්ඩරය අවලංගු කරලා, දෙවැනි සහ තුන්වැනි ස්ථාන තිබෙන සැපයුම්කරුවන් එක්ක සාකච්ඡා කරලා මේ ප්‍රශ්නයට විසඳුම් දෙන්න තිබුණා. නමුත්, එලෙස විසඳුම් දුන්නේ නැහැ. ඒවා ඇමතිතුමාට කරන්න පුළුවන් දේවල්; ආණ්ඩුවට කරන්න පුළුවන් දේවල්. ඒක යුද්ධයත් එක්ක සම්බන්ධයක් නැහැ. අද වනකොට වෙලා තිබෙන්නේ මොකක්ද?

14වැනි දා බලාපොරොත්තු වෙච්ච මෙගාවොට් 300 වෙනුවට, මෙගාවොට් 135ක් අඩුවෙන් ලැබුණා. 15වැනි දා මෙගාවොට් 132ක් අඩුවෙන් ලැබුණා. ඊයේ මෙගාවොට් 148ක් අඩුවෙන් ලැබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගල් අඟුරුවලින් උත්පාදනය කරන්න අසමත් වන සෑම මෙගාවොට් එකක් සඳහාම අපට වැඩිපුර ඩීසල් පුච්චන්න සිද්ධ වනවා. රුපියල් 20කට ගල්අඟුරුවලින් විදුලිය ඒකකයක් නිෂ්පාදනය කරන්න පුළුවන්. යුද්ධය පටන් ගන්න කලින් ඩීසල්වලින් නිෂ්පාදනය කරන විදුලිය ඒකකයක් සඳහා රුපියල් 65කට ආසන්න ප්‍රමාණයක් ගෙවන්න සිද්ධ වුණා. අද වන විට ඩීසල් මිල වැඩි වනවා; අසීමිත ලෙස වැඩි වනවා. ඒ වාගේම ගල් අඟුරු බලාගාරයේ බලශක්ති නිෂ්පාදන හැකියාවත් දිනෙන් දින අඩු වනවා. ගල් අඟුරුවල තත්ත්වය දිනෙන් දින බාල වනවා. ඒවා ගැන කටයුතු කිරීම මේ ආණ්ඩුවේ හැකියාව තුළ නැද්ද? ඒ පිළිබඳව වග කියන්න ඕනෑ කවුද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවැනි ගල් අඟුරු ටෙන්ඩරය ජයග්‍රහණය කරපු Trident Chemphar Limited එක නියමිත පරිදි ගල් අඟුරු සපයන්න අසමත් බව තීරණය කරලා, ඒ අයට නියමිත වෙලාවට ගල් අඟුරු අවශ්‍ය ප්‍රමාණය දෙන්න බැහැයි කියලා තීරණය කරලා මෙට්‍රික් ටොන් ලක්ෂ 3ක් සඳහා emergency tender එකක් දැම්මා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, emergency tender එක දමන එකෙන් අපේක්ෂා කරන්නේ මොකක්ද? ටෙන්ඩරය ලබාගෙන දැනට ගල් අඟුරු සපයන සමාගම නියමිත දිනට, නියමිත වේලාවට ගල් අඟුරු ප්‍රමාණවත් ලෙස සපයන්නේ නැති නිසා, මේ හරහා තවත් සමාගමකට අවස්ථාව දෙනවා, සමාන්තරව ගල් අඟුරු සැපයුම් කරන්න. ඔබතුමා පුදුම වෙයි. ඔබතුමාත් ආණ්ඩුවේම සාමාජිකයෙක් නිසා සමහර වෙලාවට ඔබතුමාටත් ලජ්ජා හිතෙයි. දැන් මේ emergency tender එක ජයග්‍රහණය කළේ කවුද? Trident Chemphar Limited එකමයි. ආණ්ඩුවක් තිබෙනවා නම්, තමන්ගේ ඉලක්කය සපුරා ගන්න බැරි, දිගින් දිගටම මේ දක්වා දීලා තිබෙන, මේ දක්වා රටට ඇවිල්ලා තිබෙන හැම ගල් අඟුරු නැවකින්ම ගේන ගල් අඟුරුවල තත්ත්වය බාල නම්, එවැනි සමාගමකට අඩු ගාණේ මේ emergency tender එකට bid කරන්නවත් දෙනවා ද? මොකක්ද මේ ආණ්ඩුව? මේ ආණ්ඩු ද? ඒකට මේ යුද්ධය සම්බන්ධ නැහැ නේ. ඒකට ඇමෙරිකාව

සම්බන්ධ නැහැ නේ;  ඉරානය සම්බන්ධ නැහැ නේ; ඒකට හෝමුස් සමුද්‍ර සන්ධිය සම්බන්ධ නැහැ නේ. අපේ රටට ගල් අඟුරු එන්නේ දකුණු අප්‍රිකාවෙන්, ඕස්ට්‍රේලියාවෙන්, රුසියාවෙන්, ඉන්දුනීසියාවෙන්. මේ ඇති වෙලා තිබෙන යුද්ධයත් එක්ක ඒකේ සම්බන්ධයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මොකද වෙලා තිබෙන්නේ? හොරු අල්ලන්න ඇවිල්ලා හොරු ආණ්ඩුව අල්ලාගෙන. හරිද? ඒක තමයි වෙලා තිබෙන්නේ. ඒකට තව හේතුවක් තිබෙනවා. හොරුන්ට ආණ්ඩුව අල්ලාගන්න ලෙහෙසියි. අද මේ පාර්ලිමේන්තුවේ රාජ්‍ය නිලධාරින්ගේ මැදිරියේ ඉන්නවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා. එතුමාට විශාල පීඩනයක් තිබුණා, බලශක්ති ඇමතිවරයා සම්බන්ධව අධි චෝදනා ගොනු කිරීමේදී. පළමුව අධි චෝදනා ගොනු කිරීමට තීරණයක් ගත්තේ මීට මාස ගාණකට කලින්. ඊට පස්සේ ඇති වුණු පීඩනයත් එක්ක අධි චෝදනා ගොනු කිරීම ප්‍රමාද වුණා. එතුමා පුවත් පත් සාකච්ඡාවක් තියලා ප්‍රසිද්ධියේම කිව්වා, ඇමතිතුමා වෙනුවෙන් මම නීතිඥවරුන්ට අවස්ථාවක් දෙනවා කියලා legal representations කරන්නට. ඒක හරි. ඒක සාධාරණයි. ඒක හොඳයි. ඒ ඔක්කෝම කළාට පස්සේ අද වනකොට ඇමතිතුමාට විරුද්ධව කොළඹ මහාධිකරණයේ අංක 481/2026 දරන නඩුව පවරා තිබෙනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 70 වගන්තිය ප්‍රකාරව දූෂණ - corruption - වරද ගැන.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් රජයේ සේවයේ හිටියා. දූෂණ විරෝධී පනත යටතේ නඩුවක් පවරපු සාමාන්‍ය රජයේ සේවකයෙකුගේ වැඩ තහනම් කරන්න ඕනෑ, අනිවාර්යයෙන්. අනිවාර්යයෙන් වැඩ තහනම් කරන්න ඕනෑ, තෝරා ගැනීමක් නැහැ. මහේස්ත්‍රාත් උසාවියේ නඩු දැම්මත්, වැඩ තහනම් කරනවා. මහාධිකරණයේ නඩු දැම්මත්, වැඩ තහනම් කරනවා. ඒ, සාමාන්‍ය රජයේ සේවකයෙකුගේ. හැබැයි වර්තමාන බලශක්ති ඇමතිවරයා, මීට කලින් පොහොර සමාගමේ රස්සාව කරද්දි දූෂණය කියන වරද සිදු කිරීම ගැන බැලූ බැල්මට සාක්ෂි තිබුණත් මොකුත් වුණේ නැහැ. මේ මන්ත්‍රීවරුන්ට තේරෙන්නේ නැත්නම් අහන්න පුළුවන්, අධ්‍යක්ෂ ජනරාල්තුමා රාජ්‍ය නිලධාරින් රැඳී සිටින මැදිරියේ ඉන්න බව අපට පෙනෙනවා. *Prima facie* evidence තිබෙනවා නම් තමයි indict කරන්නේ. ඉතින් බැලූ බැල්මට සාක්ෂි තියෙද්දි, නීතිඥ සහාය ලබා දීලා ඔක්කෝම කරලා, representation ඔක්කෝම කරලා, clear කරලා, කරන්නම දෙයක් නැති තැන දැන් අධි චෝදනා ගොනු කරලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* එහෙම අධි චෝදනා ගොනු කරලා තිබෙන වෙලාවක රජයේ සේවකයෙක් නම්, ඔහුගේ වැඩ තහනම් වනවා, automatically; අනිවාර්යයෙන්. හැබැයි, වර්තමාන ජනාධිපතිතුමා පත් කරපු, චෝදනා තිබියදී පත් කරපු, මේ පරීක්ෂණ තිබියදී පත් කරපු වර්තමාන ඇමතිතුමා තවම තනතුර දරනවා. මීට කලින් මේ පාර්ලිමේන්තුවේ අවස්ථා ගණනාවක් තිබුණා, ධුර දරන ඇමතිවරුන්ට විරුද්ධව අපරාධ චෝදනා ඉදිරිපත් වුණු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෙහෙළිය රඹුක්වැල්ල හිටපු දූෂිත ඇමතිවරයාට විරුද්ධව චෝදනා ගොනු කරපු වෙලාවේ අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා එවකට විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් පාර්ලිමේන්තුවේ මේ ඉස්සරහ පේළියේ සිටිමින්, එතුමා මේ පාර්ලිමේන්තුවේදී නැඟිටලා කිව්වේ, මේ වාගේ බරපතළ චෝදනාවක් තිබෙනකොට ඉල්ලා අස්විය යුතුය කියලායි. අපේ හරිනි අමරසූරිය මැතිනියත් ඒ විවාදයේදී කථා කළා. එතුමිය කිව්වේ මොකක්ද? විශ්වාස භංගයට එතුමියගේ ඡන්දය දීලා, සහාය දීලා, කථා කරලා කිව්වේ, මේ චෝදනා ලබා තිබෙන කෙහෙළිය රඹුක්වැල්ල අස්වෙන්න ඕනෑ කියලායි. එතකොට දූෂණය - corruption - කියන වරදට අධි චෝදනා ලබා තිබෙන මේ ඇමතිවරයා අස් වෙන්න අවශ්‍ය නැද්ද? ඔය වගකීම දරන්න කීර්තිමත්, ගුණවත්, දක්ෂකම තිබෙන, චරිතවත්, පාරිශුද්ධ ඇමතිවරයෙක්, දක්ෂයෙක් ඔබතුමන්ලාගේ ඔය 159 තුළ නැද්ද? මොකක්ද, මේ ආදරය? Trident Chemphar Limitedට තිබෙන ආදරය මොකක්ද? ඒකයි මේකේ කථාව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ, මෙන්න මේකයි. මේ ඇමතිවරයා මේ ගල් අඟුරු මිලදී ගැනීමේ ක්‍රියාදාමය තුළ ටෙන්ඩරය තියෙද්දි, රුසියාවට ගිහිල්ලා රුසියාවේදී මේ ටෙන්ඩරයට ඉදිරිපත් වෙච්ච සමාගම වන Potencia LLC එකේ සාමාජිකයන් එක්ක, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති එක්ක රැස්වීමක් පැවැත්වූවා. මම පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අමාත්‍යාංශ ලේකම්වරයා වන මහාචාර්ය හේමපාල මහත්මයාගෙන් ප්‍රශ්න කළා, ආණ්ඩුවේ මුදලින්ද මේ ගමන ගියේ කියලා. එතුමා කිව්වා, "ඔව්" කියලා. සාකච්ඡා කරපු දේ කිව්වාද කියලා ඇහුවාම, "නැහැ" කිව්වා. මේ වෙලාවේ මේ අදාළ මේ ප්‍රශ්නගත ටෙන්ඩරය අවසානාත්මක ලෙස දීලා තිබුණේ නැහැ නේද කියලා ඇහුවාම, එතුමා "ඔව්" කිව්වා. එහෙම ටෙන්ඩරයේ කටයුතු අවසන් නොවී තිබියදී bid කරපු සමාගමක් තමයි මේ කලින් supplier. ඒකේ වැදගත්කමක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, your time is up.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව පොඩි වේලාවක් ලබා දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට තව විනාඩි දෙකක් ලබා දෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩි දෙකක් විපක්ෂයේ කාලයෙන් ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අමාත්‍යාංශ ලේකම්තුමා දීපු උත්තරයෙන් මොකක්ද තේරෙන්නේ? මේ, ප්‍රශ්නගත බාල ගල් අඟුරු සපයන සමාගමක්.

ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මම මේ කියන කාරණය අහලා පුදුම වෙයි. මගේ අතේ මේ තිබෙන්නේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව - COPE එක - විසින් කළ ඉල්ලීම අනුව විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ වාර්තාව. එහි කියනවා, "Trident Chemphar Limited ලංකාවට සහල් සැපයීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් අනුගමනය කර නොතිබිණි" කියලා. මේ සිද්ධියට කලින් Trident Chemphar Limited එක ලංකාවට සහල් සැපයීම පිළිබඳ ක්‍රියාදාමයට වරදකරු වෙලා blacklist කරපු සමාගමක්. ගරු අධිකරණ ඇමතිතුමනි, කවුරු හරි මේ සභාවේදී කියනවා ඔබතුමාට ඇහෙන්න ඇති නේ, නිසි ක්‍රමයට ටෙන්ඩරය සිද්ධ වුණා, ඒක අපට අදාළ නැහැ කියාත්. මේ ටෙන්ඩරය පිළිබඳ evaluation කරද්දි, මේ නිශ්චිත සමාගම ලංකාවේ ආණ්ඩුවට සහල් සැපයූ ක්‍රියාදාමය වැරැදියි කියලා ප්‍රසම්පාදනයට එරෙහිව

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ගිහිල්ලා blacklist කරපු සමාගමක්. මේකේ ප්‍රධාන විධායක නිලධාරියා ඉන්දියාවේ Delhi liquor licence case එකේදී අත්අඩංගුවට ගත් කෙනෙක්. මේකේ local agent සහ ඒ සමාගමේ අධ්‍යක්ෂවරු දෙදෙනෙක් අපරාධ නඩුවලට මේ රටේ අධිකරණවලින් චෝදනා ලබා තිබෙන අය. මොකක්ද, මේ කරලා තිබෙන්නේ? බලශක්ති ඇමතිතුමාටත් අධිචෝදනා තිබෙනවා; Local agentටත් චෝදනා තිබෙනවා; supplierටත් ඉන්දියාවේ චෝදනා තිබෙනවා. බඩුත් බාලයි.

අද වනකොට මේ රටේ මතු වෙලා තිබෙන බලශක්ති අර්බුදය ගත්තොත්, ඩීසල් නැති වෙන්න ප්‍රධාන හේතුව මේකයි. අද නැවක් එන්න තිබෙනවා. අද එන නැවේ ධාරිතාවෙන් සියයට 50කට වඩා වැය වෙන්නේ ඩීසල් බලාගාරවලට සපයන්නයි. ප්‍රමුඛතාව දෙන්නේ ඒ වෙනුවෙන්. ඒක තමයි තත්ත්වය. ගොඩක් දෙනෙක් හිතාගෙන ඉන්නවා, අද නැව ආවාම මේක යථා තත්ත්වයට පත් වෙයි කියලා. විදුලිය මූලික දෙයක් නිසා මේ නැති වන ප්‍රමාණය ඩීසල් බලාගාරවලින් ගන්න ඕනෑ. බලන්න, නැති වන ප්‍රමාණය විශාලයි. ඒ ප්‍රමාණය බලාගාරයේ ධාරිතාවෙන් සියයට 25ක් විතර වනවා. මේ ප්‍රමාණය අත්පත් කර ගැනීමට අද වනකොට සිද්ධ වෙලා තිබෙනවා. එම නිසා මතක තබා ගන්න, මේ රටේ මේ මොහොතේදී ඇති වෙලා තිබෙන ඩීසල් අර්බුදයට, ගල් අඟුරු අර්බුදයට, තව මාස කිහිපයකින් රටට ගල් අඟුරු නැති වීම නිසා ඇති වන අර්බුදයට වාගේම විදුලි පද්ධතිය කඩා වැටීමේ අනතුර ඇති වීමට වගකිව යුතු වන්නේ බලශක්ති ඇමතිවරයා බව. ඒ බලශක්ති ඇමතිවරයාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කිරීමට අපි හෙට දවස තුළ කටයුතු කරනවා කියන කාරණය මම කියන්න ඕනෑ. කනගාටුවෙන් වුණත් ඒක අපට කරන්නම වෙලා තිබෙනවා. මන්ත්‍රී ධුර 159ක් තිබුණා කියලා ලොකුවට හිතන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනතාව ඉස්සරහ මේ වාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒ වාගේම දිගින් දිගටම දූෂිත සමාගමක් එක්ක කටයුතු කරන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එක්ක කටයුතු කරනවා හැර පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය තුළ වෙන මඟක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දූෂිතයන් අල්ලන්න ආපු ආණ්ඩුව දූෂිතයන්ට යට වෙලා, දූෂිතයෝ ආණ්ඩුව අල්ලාගෙන. ගරු අගමැතිතුමියනි, ඔබතුමිය බලාපොරොත්තු වුණු ආණ්ඩුවක් නොවෙයි මේ ඇති වෙලා තිබෙන්නේ. ඔබතුමිය ආස වුණත් නැති වුණත්, අපේ අධිකරණ ඇමතිතුමා -අපේ මිත්‍රයා- ආස වුණත් නැති වුණත් මේ ආණ්ඩුව තුළ දූෂිතයෝ ඉන්නවා; දූෂණ වැඩ කෙරෙනවා; දූෂිතයෝ මේ ආණ්ඩුව අල්ලාගෙන තිබෙනවා. ඒක තමයි මේ රටේ මිනිස්සුන්ගේ අවාසනාව; මේ ආණ්ඩුව ගැන මහත් බලාපොරොත්තු තියාගෙන ඡන්දය දීපු මිනිස්සුන්ගේ අවාසනාව. ගෝලීය අර්බුදය එකක්. රටේ තිබෙන අර්බුදය තව එකක්. රටේ තිබෙන අර්බුදයේ කොටසකට වග කියන්න ඕනෑ මේ දූෂිත ආණ්ඩුවයි. ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Eranga Weeraratne. You have 11 minutes.

[පූ.භා. 11.38]

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැදගත් මාතෘකාවක් විවාදයට ගන්නා අද දවසේ අපේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු ප්‍රශ්න නැඟුවා, මේ රටේ ඛනිජ තෙල්වල තත්ත්වය සහ අපේ QR code එක හරහා ඛනිජ තෙල් බෙදා හැරීම කරන ක්‍රමවේදය ගැන පැහැදිලි කිරීමක් අවශ්‍යයි කියන එක සම්බන්ධයෙන්.

අද ලෝකයේ තත්ත්වය දෙස බැලුවාම මැද පෙරදිග ඇති වී තිබෙන යුදමය වාතාවරණය අපේ ඛනිජ තෙල් distribution එකට ලොකුවට බලපා තිබෙනවා. එම නිසා අපි දකිනවා, රටවල් ගණනාවක්ම මේ අර්බුදයට ඉස්සරහට මුහුණ දෙන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් වැඩ පිළිවෙළවල් ඉදිරිපත් කරලා තිබෙන බව. උදාහරණයක් හැටියට ගත්තොත්, දකුණු කොරියාව, බංග්ලාදේශය, මියන්මාරය වාගේ රටවල් ඉන්ධන විකිණීමේ ප්‍රමාණය සීමා කරලා තිබෙනවා. ඒ වාගේම පාකිස්තානය, පිලිපීනය වාගේ රටවල් වැඩ කරන කාලය දින 14ක් දක්වා අඩු කරලා තිබෙනවා. වියට්නාමය ගෙදර සිට වැඩ කරන ක්‍රමවේදයන් ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේ අපේ රටේ ඛනිජ තෙල් සුරක්ෂිතභාවය ඇති කර ගන්න අපිත් යම්කිසි ක්‍රමවේදයක් ගෙනෙන්න අවශ්‍යයි. ක්‍රමවේදයක් ගෙනෙනවා කියන එකෙන් අදහස් වෙන්නේ අර්බුදයක් තිබෙනවා කියන එක නොවෙයි. අපට අවශ්‍ය ප්‍රමාණයට ඛනිජ තෙල් රටේ තිබුණත්, මේ යුදමය වාතාවරණය තුළ අපි ඉස්සරහට යන්නේ කොහොමද කියන එක ගැන හරියට අවබෝධය ඇති කර ගන්නත්, යුදමය වාතාවරණය තවදුරටත් ඉස්සරහට ගියොත් ඒවාට මුහුණ දෙන්නත් අපි සූදානම් විය යුතුයි.

ඒ අනුව තමයි මේ QR code එක ගෙනැල්ලා තිබෙන්නේ. QR code එක හරහා ඉන්ධන විකිණීමේදී සීමා පනවා තිබෙනවා. ඒ හරහා අපට පුළුවන් වෙයි, ඉන්ධන විකිණීමේ ක්‍රියාවලිය ක්‍රමානුකූලව සිදු කරන්න. මොකද, ඕනෑම රටක ජීවත් වන හැම පුද්ගලයෙක්ම බලන්නේ තමන් සුරක්ෂිතව ජීවත් වෙන්නේ කොහොමද කියන එක ගැන බව අපි දන්නවා. ඒ නිසා තමයි කුමන හෝ ව්‍යසනකාරී තත්ත්වයක් ඇති වුණු අවස්ථාවකදී කලබල වෙලා තමන්ට හැම දෙයම එක්රැස් කර ගන්න හැමෝම කටයුතු කරන්නේ. ඉන්ධන වුණත් එහෙමයි. ලෝකයේ තිබෙන වාතාවරණය බලා සමහර දේශපාලනඥයින්, සමහර රූපවාහිනී නාළිකා මේ ප්‍රශ්නය අනවශ්‍ය විධියට මතු කරලා පෙන්වන්න වාගේම මේ ප්‍රශ්නය දෙගුණ තෙගුණ කරලා පෙන්වන්න හදනවා; ඒ හරහා ජනතාව කලබල කරන්න හදනවා. ඒ නිසා ජනතාව කලබල වෙලා, නැවත වතාවක් පෝලිම් හැදිලා තෙල් ගහ ගන්න යෑම තුළින් අපට තිබෙන සංචිත ප්‍රමාණය ඉක්මනින්ම අවසන් වෙන්න අවකාශය තිබෙනවා, අපි මේ වෙනුවෙන් නිවැරදි වැඩ පිළිවෙළක් ගෙනාවේ නැත්නම්. ඒ අනුව තමයි අපි QR code එක ගෙනෙන්න කටයුතු කරලා තිබෙන්නේ. මේ හරහා, ඉන්ධන ලබා දීම සීමා කරනවාට වඩා ක්‍රමානුකූලව ඉන්ධන විකිණීමේ වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ. ඉන්ධන විකිණීම ක්‍රමානුකූල කරනවා වාගේම බදාදා දවස රජයේ කාර්යාලවලට නිවාඩු දවසක් කරලා, ඉන්ධන පාවිච්චි කරන එකත් යම්කිසි ප්‍රමාණයකට අඩු කිරීමට අපි කටයුතු කරලා තිබෙනවා.

ඉන්ධන ලබා දීම සීමා කරන්නේ කොහොමද කියා අපි සොයා බැලුවා. එක ක්‍රමයක් තමයි, මිනිසුන්ට QR පද්ධතියට register වෙන්න සතියක විතර කාලයක් ලබා දීලා, එය ක්‍රියාත්මක කරන

එක. නමුත්, එහි තිබෙන ප්‍රධාන ගැටලුව තමයි, ඒ ගැන කාලයක් තියා නිවේදනය කළාම මිනිස්සු හැමෝම කලබල වීම. ඒ වාගේම විපක්ෂයේ ඉන්න සමහර දේශපාලනඥයින් ඒ අවස්ථාව උපයෝගී කරගෙන රට කලඹන්න සැහෙන උත්සාහයක් දරන්න පුළුවන්. සමහර රූපවාහිනී නාළිකාත් එහෙමයි. එවැනි ක්‍රමයකට ගියොත් අපේ ජනතාව තෙල් ලබා ගන්න සැහෙන උත්සාහයක් දරන්න පුළුවන්. ඒ වාගේම ගෙවල්වල හෝ වෙනත් තැන්වල තෙල් ගබඩා කරන්නත් ඔවුන් උත්සාහ ගනීවි. එහෙම වුණොත් අපට තිබෙන තෙල් සංචිත අඩු වීමේ හැකියාවක් තිබෙනවා. ඒ නිසා නිවේදනය කරලා, කාලයක් ලබා දීම තුළින් මේ පද්ධතියට යන්න හැකියාවක් තිබුණේ නැහැ.

අනෙක් ක්‍රමය තමයි, පෙට්‍රල් විකිණීම දවස් දෙක තුනක් නවත්වා මේ පද්ධතිය ක්‍රියාත්මක කරන එක. දවස් දෙක තුනක් තෙල් විකිණීම නවත්වනවා කියන්නේ, ඇත්තටම රටේ ආර්ථිකය තනිකරම අඩාළ කරනවා කියන එකයි. නමුත්, ඒකත් අපට කරන්න පුළුවන් දෙයක් නොවෙයි.

තුන්වැනි ක්‍රමය තමයි, අපේ පද්ධතිය හරියට සකස් කරලා ඉතා සුළු කාලයක් ඇතුළත එය ක්‍රියාත්මක කිරීම. ඇත්තටම අපි ක්‍රියාත්මක කළේ තුන්වැනි ක්‍රමය. තුන්වැනි ක්‍රමය ක්‍රියාත්මක කරනකොට වුණත් අපි බලන්න ඕනෑ, අපට තිබෙන තෙල් සංචිත ප්‍රමාණය කොපමණද, ලෝකයේ යුද්මය තත්ත්වය අනුව තෙල් බෙදා හැරීම සිදු කරන්නේ කොහොමද කියලා. ඒ අනුව අපි මේ සතියේ මේ ක්‍රමවේදය ක්‍රියාත්මක කරනවාද, ලබන සතියේ ක්‍රියාත්මක කරනවාද, කුමන සතියේද ක්‍රියාත්මක කරන්නේ කියන එක ගැන සොයා බැලුවා. ඒ අනුව අපි තීරණය කළා, තවදුරටත් පමා නොවී පුළුවන් තරම් ඉක්මනට මේ ක්‍රමවේදය ක්‍රියාත්මක කරන්න. එහිදී අපේ ප්‍රධානතම අවශ්‍යතාව වුණේ අපේ ජනතාවට හිරිහැර අවම වන විධියට මේ ක්‍රමවේදය ක්‍රියාත්මක කරන්නයි. ඒ අනුව අපි තීරණය කළා, මේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට හොඳම දවස ඉරිදා දවස කියලා. මොකද, නිවාඩු දවසක් නිසා ඉරිදා දවස තමයි ජනතාව ගොඩක් අඩුවෙන් තෙල් පරිහරණය කරන්නේත්, තෙල් ගහ ගන්න උනන්දු වෙන්නේත්, තෙල් සපයා ගන්න යම්කිසි කාලයක් යොමු කරන්න පුළුවන් වෙන්නේත්.

අනෙක් කාරණය මේකයි. මේ ක්‍රමවේදය නැවත වරක් අලුතින් ක්‍රියාත්මක කරන්න යන නිසා අපේ ජනතාවට සහ ඉන්ධන බෙදා හරින ආයතනවලට ඒ සම්බන්ධයෙන් යම්කිසි දැනුවත් කිරීමක් කරන්න ඕනෑ. ඒ වාගේම ඔවුන්ට ඒ ගැන අවබෝධයක් ලබා ගැනීමට කාලයක් අවශ්‍ය වෙනවා. ඒ නිසා ආරම්භයක් විධියට ඒ සඳහා ඉරිදා දවස හොඳයි කියන එක අපි සියලු දෙනාගේම ඒකමතික තීරණය වුණා. අපට අවශ්‍ය වුණේ මේක ඉරිදා දවසක කරන්නයි. ඒ නිසා සතියක්වත් කල් දමන්නේ නැතුව පසුගිය ඉරිදා දවසේදීම මේ ක්‍රමවේදය ආරම්භ කරන්න යොදා ගත්තේ අන්න ඒ නිසායි. මේ QR කේතය ආරම්භ කරනකොට අපිට තීරණය කරන්න සිද්ධ වුණා, මේක හැමෝටම මුල ඉඳලාම register වෙන්න පුළුවන් වන විධියට ලබා දෙනවාද, එහෙම නැත්නම් ජනතාවට හිරිහැර අවම වන විධියට ක්‍රියාත්මක කරනවාද කියලා.

එහිදී අපි දැක්ක දෙයක් තමයි, අපේ ඩිජිටල් පද්ධතිවල යම්කිසි අඩු පාඩු තිබෙනවා කියන එක. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ගත්තාම, එහි ඩිජිටල් පද්ධතිය සැහෙන කාලයක් පරණ එකක්. ඒකේ තිබෙන performanceවල සීමා තිබෙනවා. ඉතින්, ඒ පද්ධතිවලට එන බර පුළුවන් තරම් අපි අවම කරන්න ඕනෑ. ඒ වාගේම මේ පිළිබඳව ජනතාවට අලුතෙන් ඉගෙන ගෙන ආපහු register වෙන ක්‍රමවේදයත් පුළුවන් තරම් අඩු කරන්න ඕනෑ. මීට අවුරුදු 3කට ඉස්සෙල්ලා මේ පද්ධතිය තුළ ඔවුන් register වෙලා QR code එකක් ලබා ගෙන තිබුණා. ඒ code එක නැවත පාවිච්චි කරන්න අවස්ථාව දීම හරහා ඔවුන්ට සිදු වෙන කරදරය සහ අපහසුව අවම කරගන්න පුළුවන් කියන හැඟීම අපට ආවා. ඒ නිසා තමයි ඉස්සෙල්ලා QR code එකට register වෙලා තිබුණා නම්, ඒක මේ අවස්ථාවේ පාවිච්චි කරන්න පුළුවන් කියන යෝජනාව අපි ගෙනාවේ. එතකොට, කාටවත් අමුතුවෙන් register වෙන්න අවශ්‍ය නැහැ. ඒ QR code එක තිබෙනවා නම්, ඒක පාවිච්චි කරන්න පුළුවන්. නමුත්, 2023දී මේ QR code එක හැදුවාට එය පරිහරණය කරන්න බැරි වෙන අවස්ථා දෙකක් තිබෙනවා. එකක් තමයි, වාහනය විකුණා ඇත්නම්, ඒ වාහනය අලුතෙන් ලබාගත්ත පුද්ගලයාට මේ පද්ධතියේ register වෙන්න අවශ්‍යයි. නමුත්, වාහනය විකුණපු පුද්ගලයා QR code පද්ධතියට ඉස්සෙල්ලා register වෙලා තිබෙනවා නම්, වාහනය ගත්ත පුද්ගලයාට ඒක register කරගන්න බැරි වෙනවා. එතකොට අපි ඒ අවස්ථාව අපේ system එක පැත්තෙන් handle කරන්න අවශ්‍යයි.

දෙවැනි කාරණය මේකයි. මෙහිදී යම්කිසි පුද්ගලයෙක් QR code එක හදන්න පාවිච්චි කරපු ජංගම දුරකථන අංකය වෙනස් කර තිබෙන්න පුළුවන්. එහෙම වුණා නම්, අලුතෙන් ජංගම දුරකථනය හරහා ඔහුට ලියාපදිංචි වෙන්න බැරි වෙනවා, ඉස්සෙල්ලා වෙනත් number එකකින් register කර තිබෙන නිසා. අපි ඒ අවස්ථාවත් handle කරන්න අවශ්‍යයි. මම සතුටින් කියන්න කැමැතියි, අපි මේ සේවාව launch කරනකොටම ජංගම දුරකථන මාරුවීම සම්බන්ධයෙන් තිබෙන ඒ ගැටලුවත් විසඳන්න කටයුතු කළ බව. ජංගම දුරකථන අයිතිය වෙන කෙනෙකුට ගිහිල්ලා තිබෙනවා නම් හෝ ජංගම දුරකථනය අක්‍රිය වෙලා තිබෙනවා නම් ඒ සියලුම registrations - ඉස්සෙල්ලා තිබුණු registrations - අපි system එකෙන් අයින් කළා. ඒ වාගේම, යම්කිසි විධියකට වාහනය විකුණා ඇත්නම්, අලුතෙන් ගත්ත කෙනෙකුට අපහසුවක් නොවෙන පරිදි register වීමේ හැකියාව ඇති කරන්නත් අපට අවශ්‍ය වෙලා තිබුණා.

අනෙක් කාරණය තමයි, එක දවසෙන් අපි මේ QR code එක ගෙනාවාම මේ පද්ධතියට විශාල traffic එකක් එනවා. හැමෝම මේ පද්ධතිය access කරන්න ගන්නවා, register වෙන්න හරි, ඒ පද්ධතිය පාවිච්චි කරලා QR code එක හරහා ඉන්ධන සපයා ගන්න හරි. ඒක නිසා අපට ඕනෑ වුණා පුද්ගලයන් අදියර දෙකකින් මේ පද්ධතිය access කරලා සේවාව ලබාගන්න ක්‍රමයක් ඇති කරන්න. ඒ හරහා අපි ඉස්සෙල්ලාම කළේ, ඉස්සෙල්ලා QR කේතයක් හදාගෙන තිබෙනවා නම් ඒ කණ්ඩායමට අපි ඉස්සෙල්ලාම තෙල් ලබාගන්න අවකාශ ඇති කරපු එකයි. අපි දවසක් පරක්කු කරලා තමයි ඒක ඇති කළේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Eranga Weeraratne, you have two more minutes.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
Sir, I would like to have a couple of minutes more, if possible.

ඊට දවස් දෙකකට විතර පසුව දෙවැනි කණ්ඩායමට මේ සේවාව ලබා ගන්න ක්‍රමයක් ඇති කළා. ඒ හරහා, මේ system එකේ down වෙන්න තිබෙන ප්‍රමාණය අපි පුළුවන් තරම් අවම කරගෙන තිබෙනවා. ඒ වාගේම අඛණ්ඩ සේවාවක් ලබා දීමේ හැකියාවත් ඇති කරගෙන තිබෙනවා. ඒ වාගේම registrations ප්‍රමාණය පුළුවන් තරම් අවම වෙන විධියට වැඩ කටයුතු කිරීම හරහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ඩිජිටල් පද්ධතියට යන බරත් - load එකත් - අවම කරගන්න පුළුවන් වුණා.

[ගරු එරංග වීරරත්න මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ QR code ක්‍රමය දැම්මාට පස්සේ ඒකේ සාර්ථකත්වය මනින්න පුළුවන් ආකාරයේ parameters තත්ත්වයන් තිබෙනවා. මම කියන්නේ නැහැ, මේ පද්ධතිය සියයට 100ක්ම ගැටලුවලින් තොර පද්ධතියක් කියලා. මොකද අපි දන්නවා, සුළු කාලයක් ඇතුළත මේ වාගේ දැවැන්ත වෙනසක් ගෙනෙන පද්ධතියක් ඉදිරිපත් කළාම එහි සුළු සුළු අඩු පාඩු තිබෙන්න පුළුවන්, ගැටලු තිබෙන්න පුළුවන් සහ ඒ සම්බන්ධයෙන් ජනතාව තුළ තිබෙන අවබෝධයේ අඩුපාඩු තිබෙන්න පුළුවන් බව. මේක ගෙනෙනකොටත් අපි දැනගෙන හිටියා, මෙහි යම්කිසි ගැටලු මතු වෙයි කියලා. ඒ නිසා තමයි අපි ඉරිදා දවස තුළ මේ කටයුත්ත ආරම්භ කරන්න යෝජනා කළේ සහ ක්‍රියාත්මක කළේ මෙන්ම මේකෙන් මතුවෙන ගැටලු ඉතාම ඉක්මනින් නිරාකරණය කරන්න වැඩ කටයුතු කළේ. අපි බැලුවා, මේ system එකේ තිබෙන parameters අනුව අද වෙනකොට කොයි වාගේ සාර්ථකත්වයක් තිබෙනවාද කියලා. අප දකින විධියට, මේ වන විට මේ පද්ධතිය පරිහරණය කරන්නන් 5,094,566ක් ඉන්නවා. ඒ වාගේම වාහන 5,103,991ක් මේ පද්ධතිය තුළ දැනට register වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Eranga Weeraratne, you get three extra minutes, starting from now onwards.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම අලුත් වාහන, ඒ කියන්නේ 2023 වනකොට නොතිබුණු, අලුත් වාහන 439,997ක් දැන් වෙනකොට register වෙලා තිබෙනවා. 15වැනි දා 44,000ක්, 16වැනි දා 347,000ක්, අද උදේ වරුවේ 9.00 වනකොට 51,000ක් වශයෙන් අලුතින් වාහන register වෙලා තිබෙනවා. ඇත්තටම මේ පද්ධතියට එන අලුත් registrations ප්‍රමාණයේ සැහෙන්න වැඩි වීමක් අපට පෙනෙනවා. ඒකෙන් අපට පෙනෙනවා, අපේ ජනතාව මේ පද්ධතියට හුරු වෙනවා කියන එක. 2023දී මේ පද්ධතිය නිර්මාණය කරන්න ඉදිරිපත් වෙච්ච MIT සහ ඩයලොග් ආයතන තමයි අපි මේ වතාවෙත් මේ පද්ධතිය නිර්මාණය කර කටයුතු කරගෙන යන්න යොදා ගෙන තිබෙන්නේ. ඔවුනුත් අපට මේ සේවාව ලබා දෙන්නේ නොමිලේ. මම දැක්කා හිටපු අමාත්‍ය, කංචන විජේසේකර මහතාත් මේ ගැන යම් ප්‍රකාශයක් කර තිබුණා, ඔවුන් තමයි ඒ කාලයෙත් මේකට සම්බන්ධ වුණේ කියලා. ඒ වාගේම එතුමා ප්‍රකාශ කර තිබුණා, මේක හදන්න සති 4ක් විතර ගියා කියලා. මේක ජනතාවට ඉදිරිපත් කරලා registration ආරම්භ කරලා සති 2ක් විතර ගියා මේක ඇත්තටම ක්‍රියාත්මක කරවන්න. මොකද, ඒකේ ගැටලු තිබුණා. ආරම්භයේදී මේ පද්ධතිය කඩා වැටෙන ස්වභාවයක් තිබුණා. ඒ නිසා පුද්ගලයන්ට register වීමට අපහසුතා ඇති වන ආකාරයේ යම් යම් බාධා තිබුණා. ඒවා නැති කරන්න සති 2ක් විතර ගියා. එතැන ඉඳන් තව සති 8ක් විතර ගියා, මේකේ තිබෙන අනෙකුත් ප්‍රශ්න විසඳලා මේ පද්ධතිය ඉදිරිපත් කරන්න. නමුත්, මේ වතාවේදී සති දෙකක් වාගේ කාලයක් ඇතුළත තමයි අපි මේක සකස් කළේ. ඒ වාගේම අදට දවස් 3ක් වනවා, ඒක ඉදිරිපත් කරලා. ඒ ඉදිරිපත් කිරීම හරහා දැන් වනකොට හොඳ ස්ථාවර මට්ටමකට මේ පද්ධතිය ගෙනැත් තිබෙනවා.

අනෙක් කාරණාව මේකයි. අපි මේ කාලවකවානු දෙක ගත්තොත්, 2023දී තිබුණු වාතාවරණයත්, අද වාතාවරණයත් සම්පූර්ණයෙන් වෙනස්. 2023දී අපේ ඉන්ධන අර්බුදයක් තිබුණා. ඉන්ධන බෙදා හැරීම සිද්ධ වුණේ නැහැ. මිනිස්සු පෝලිම්වල හිටියා. ඒ වතාවේ සීමාව ලිහිල් කරන්න තමයි මේ පද්ධතිය ගෙනාවේ. නමුත්, අද අපි මේක ගෙනෙනකොට එහෙම සීමා පනවා තිබුණේ නැහැ. මේ පද්ධතිය ගෙනාවේ සීමාවක් ඇති කරන්න. එතකොට අනිවාර්යයෙන්ම යම් කිසි ගැටලුකාරී තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්. අපි දැනගෙන හිටියා එහෙම වෙනවා කියලාත්. ඒ වාගේම ඒකට හරි ක්‍රමවේදයක් ගෙනැල්ලා ඒවා නිරාකරණය කරලා අද වනකොට සියයට 95කට වාගේ ප්‍රමාණයකට මේ පද්ධතිය සාර්ථකව පාවිච්චි කරන්න අපි හැකියාව ඇති කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප බලාපොරොත්තු වනවා, මේ පද්ධතිය පිළිබඳ තවදුරටත් ජනතාවට මොනවා හරි අවහිරයක් වෙන කාරණා තිබෙනවා නම් ඒවා ඉක්මනින්ම නිරාකරණය කරන්න. ඒ වාගේම ජනතාවට මේ පද්ධතිය පාවිච්චි කිරීමේ අපහසුතා තිබෙනවා නම් ඒ පිළිබඳ ඉක්මනින් දන්වන්න ක්‍රමවේදයක් හදන්න. මොකද, අපි දන්නවා, "1919" සේවාවේ මේ වනකොට යම් දුරකට congestion තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා කියලා. නමුත්, අපි වෙනත් විකල්ප මාර්ග ගෙනෙන්න, වට්ස්ඇප් මාර්ගයෙන් වාගේ දන්වන්න,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Eranga Weeraratne, your time is up.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
මම ඉතා ඉක්මනින් අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

වෙනත් මර්ගවලින් ඒකට විසඳුම් ගෙනෙන්න අපි වෙනත් ක්‍රියාමාර්ග ගන්නවා. මේ පද්ධතිය ගෙන ඒම හරහා අපි බලාපොරොත්තු වන්නේ ඛනිජ තෙල් පාවිච්චිය ක්‍රමානුකූල කරලා අපේ රටේ ඛනිජ තෙල් සුරක්ෂිතතාව ඇති කරන්නයි, මේ යුද්මය වාතාවරණය ඉවර වනකල්.

මම ස්තුතිවන්ත වෙනවා, මේ පද්ධතිය හදන්න ඉදිරිපත් වෙච්ච MIT, ඩයලොග් ආයතනවල සියලුදෙනාට. ඒ වාගේම petrol stationsවල ඉන්න සියලු කාර්ය මණ්ඩලයටත් මම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මේ පද්ධතිය නැවතත් පාවිච්චි කරලා තෙල් ගහගන්න යන එකටත්, ඒ වාගේම ඉවසීමෙන් කටයුතු කිරීම ගැනත් මම ජනතාවට ස්තුතිවන්ත වනවා. මම විපක්ෂයෙන් සහ අනෙකුත් මාධ්‍ය ආයතනවලින් ඉල්ලන්නේ, මේක ජාතික අවශ්‍යතාවක්, ඒකට ඔබලා සහයෝගය දෙන්න කියලායි. එහෙම නැතිව ජනතාව අනවශ්‍ය විධියට බිය වද්දන්නවත්, කලබලකාරී තත්ත්වයක් ඇති කරන්නවත් එපා කියා ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Kaveenthiran Kodeeswaran. You have seven minutes.

[மு.ப. 11.53]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் கொண்டுவரப்பட்டுள்ள இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவின் அலுவலர்கள் மற்றும் ஊழியர்களின் வேதனம் மற்றும் சேவை நிபந்தனைகள் தொடர்பான விடயத்தை நான் வரவேற்கின்றேன்.

2021-2022 காலப்பகுதியில் இந்த நாடு திவாலாகி இக்கட்டான சூழ்நிலைக்குத் தள்ளப்பட்டதற்கு, இலஞ்சம் மற்றும் ஊழல் தலைவிரித்தாடியது மட்டுமல்ல, கடந்த கால அரசாங்கங்களின் திட்டமிடப்படாத செயற்பாடுகளும் காரணமாக இருந்தது. இதனால் இந்த நாடு பாரிய பாதிப்புக்கு உள்ளானதுடன், பொருளாதார ரீதியாகவும் வீழ்ச்சியடைந்தது. இரண்டு மாதங்களுக்கு முன்னர், மாண்புமிகு சனாதிபதி அவர்கள் இந்தச் சபையில் உரையாற்றும்பொழுது, திறைசேரியில் போதுமான அளவு நிதி இருப்பதாகக் கூறியிருந்தார். உண்மையிலேயே இந்த விடயத்துக்காக அவரைப் பாராட்டவேண்டிய கடமைப்பாடு எங்களுக்கு இருக்கின்றது. இந்த நாட்டின் பொருளாதாரக் கொள்கையை வலுப்படுத்தக்கூடிய வகையிலும், தேசிய பொருளாதாரத்தை உயர்த்தக்கூடிய வகையிலும், செயற்பாடுகளை முன்னெடுக்க வேண்டிய தேவைப்பாடு இருக்கின்றது. தற்பொழுது, மத்திய கிழக்கில் நிலவுகின்ற யுத்த சூழ்நிலையால் சிறிய நாடான எங்களுடைய நாடு என்னென்ன பிரச்சினைகளை எதிர்நோக்கப் போகின்றது? குறிப்பாக, எரிபொருள் தட்டுப்பாடு ஏற்படக்கூடிய வாய்ப்பு இருக்கின்றது. உலகளாவிய ரீதியில் இருக்கும் இந்தப் பிரச்சினையிலிருந்து சிறிய நாடான இலங்கை தப்பித்துக்கொள்ள முடியாது என்றாலும், எங்களுடைய சிறந்த கொள்கைமூலமும் நடைமுறைப்படுத்துகின்ற திட்டங்கள்மூலமும் இந்த நாட்டைப் பாதுகாத்துக்கொள்ள முடியும்.

தற்போது வட, கிழக்கில் மட்டுமல்ல, நாட்டின் ஏனைய பிரதேசங்களிலும் நெல் விதைப்பு ஆரம்பிக்கப்பட்டு இருக்கின்றது. ஒருபுறம் நெல் அறுவடை இடம்பெறுகின்றது. மறுபுறம் அம்பாறை மாவட்டத்தின் திருக்கோவில், ஆலையடி வேம்பு, அக்கரைப்பற்று, பொத்துவில் போன்ற பிரதேசங்களில் விவசாயிகள் தங்களது நிலத்தைப் பண்படுத்துகின்ற - உழுகின்ற - செயற்பாட்டில் ஈடுபட்டுக் கொண்டு இருக்கின்றார்கள். விவசாயிகளின் வாழ்வாதாரத்தைப் பாதுகாக்க வேண்டும். ஏனெனில், அவர்களுக்குத் தேவையான எரிபொருள் - எண்ணெய், டீசல் - QR குறியீட்டு முறைமை மூலம் ஒரு வாரத்துக்கு 30 லீற்றர் மட்டும்தான் வழங்கப்படுகின்றது. இந்த 30 லீற்றர் எரிபொருளானது, ஓர் ஏக்கர் நிலத்தை உழுவதற்கு - பண்படுத்துவதற்கு - மட்டும்தான் போதுமானதாகக் காணப்படும். ஆனால், அங்கு விவசாயம் செய்கின்ற மொத்த நிலப்பரப்பு கிட்டத்தட்ட 20,000 ஏக்கர் ஆகும். இதற்குத் தேவையான எரிபொருளை எங்கிருந்து எடுப்பது? எனவே, முதலில் இந்த நாட்டு மக்களுக்கு உணவளிக்கின்ற, இந்த நாட்டிலுள்ள ஏழை மக்களின் வயிற்றுப் பசியைப் போக்குகின்ற விவசாயத்துறையை நாங்கள் பாதுகாக்க வேண்டும். அம்பாறை மாவட்டத்தில் 20 சதவீதமான நெல் உற்பத்தி செய்யப்படுகின்றது. உழவு இயந்திரத்துக்கு ஒரு வாரத்துக்கு வழங்கப்படுகின்ற 30 லீற்றர் டீசலானது உண்மையிலேயே போதாது. எனவே, இதனை அரசாங்கம் கவனத்திலெடுத்து, விவசாயிகளின் உழவு இயந்திரங்களுக்கு வழங்கப்படுகின்ற டீசலின் அளவை அதிகரிக்க வேண்டும். உழவு இயந்திரங்களுக்கு ஒரு நாளைக்கு 75-100 லீற்றர் டீசலை வழங்கினால்தான் அங்கு விவசாயத்தைச் சரியாகச் செய்ய முடியும்.

இதனை அரசாங்கம் வழங்காவிட்டால், இந்த நாடு பாரிய உணவுத் தட்டுப்பாட்டை எதிர்நோக்கவேண்டி ஏற்படும். விவசாயிகளுக்குத் தேவையான உரம், கிருமிநாசினி போன்றவற்றை வெளிநாடுகளில் இருந்து இறக்குமதி செய்ய வேண்டும். திறைசேரியில் போதியளவு நிதியிருப்பதாக அரசாங்கம் சொல்கின்றது. எனவே, கூடுதலான நிதியைச் செலவழித்து, பசளையை இறக்குமதி செய்யுங்கள்! ஏனெனில், இப்போது பசளைக்குத் தட்டுப்பாடு ஏற்பட்டுள்ளது. விவசாயிகள் பசளை வாங்குவதற்கு கடைக்குச் சென்றால், அங்கு பசளை இல்லை. பசளை இல்லாத துர்ப்பாக்கிய நிலை ஏற்பட்டால், விளைச்சல் கேள்விக்குறியாகும். விளைச்சல் கேள்விக்குறியானால், உணவு உற்பத்தி மிகவும் பாதிப்படையும். எனவே, அரசாங்கமானது தேவையற்ற விடயங்களுக்கான செலவையும் அபிவிருத்தி வேலைத் திட்டங்களுக்கான செலவையும் குறைத்து அல்லது அவற்றை நிறுத்தி, அத்தியாவசியத் தேவையாக இருக்கின்ற பசளையையும் கிருமிநாசினியையும் இறக்குமதி செய்ய வேண்டும். இவை இல்லாமல் விவசாயிகள் கஷ்டப்படு கின்றார்கள்.

மேலும், மீனவர்களுக்கு எரிபொருள் சரியாகக் கிடைக்கவில்லை என்றால் மீன் உற்பத்தி உட்பட ஒட்டுமொத்த கடலுணவு உற்பத்தியும் பாதிக்கப்படும். இதனை அரசாங்கம் கவனத்திற்கொள்ள வேண்டும். எனவே, விவசாயிகளினதும் மீனவர்களினதும் அத்தியாவசிய தேவைகளைப் பூர்த்தி செய்யுங்கள்! கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த விடயத்தைச் சரியாகச் செய்யாவிட்டால், அதற்கு இங்குள்ள 225 பாராளுமன்ற உறுப்பினர்களும்தான் காரணமாக இருப்பார்கள். இதன் விளைவாக இந்த நாட்டில் அசாதாரண நிலைமை ஏற்பட்டால், அதனை இந்த அரசாங்கமே பொறுப்பேற்க வேண்டுமெனக் கூறி, எனது உரையை முடித்துக்கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. Harshana Nanayakkara. You have 14 minutes.

[අ.භා.12.01]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

Thank you, Hon. Deputy Speaker.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ඉදිරිපත් කර තිබෙන යෝජනාව සම්බන්ධයෙන් කරුණු දක්වන්නටයි මා පැමිණියේ; නමුත්, මට පෙර කථා කළ ඇතැම් කථිකයන් සුපුරුදු පරිදි මෙම සභාවට අසත්‍ය තොරතුරු රාශියක්ම විටින් විට ඉදිරිපත් කළා. කෙසේ වෙතත්, ඒ අසත්‍ය තොරතුරුවලට පිළිතුරු දීමට පෙර අද විවාදයේ විෂයට අදාළව කරුණු දැක්වීම වඩාත් සුදුසුයි කියලා මම හිතනවා.

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

1954 අල්ලස් පනත, 1975 අංක 1 දරන වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනත, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යන පනත් තුනම ඉවත් කර එම පනත් තුළ තිබූ වැරැදි සහ බලයන්ද එකතු කරමින් සහ ශ්‍රී ලංකාව 2004 වර්ෂයේදී අත්සන් තැබූ අන්තර්ජාතික දූෂණ විරෝධී ප්‍රඥප්තියට සමගාමී වන ලෙස 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී සම්මත කළා. 2023 අගෝස්තු මාසයේ 08වන දා එහි සහතිකය සටහන් කළා. එසේ සම්මත වුණත් ඒ පනත ක්‍රියාත්මක කරන්න අවශ්‍ය රෙගුලාසි කිසිවක් තිබුණේ නැහැ. ඒ නිසා ඒක නිකම්ම පනතක් වශයෙනුයි තිබුණේ. නමුත් අපේ රජය පැමිණි පසු එය බලාත්මක කරනු ලැබුවා.

දූෂණ විරෝධී පනතේ 2වන වගන්තියට අනුව එම පනත ක්‍රියාත්මක වන දිනය 2023 සැප්තැම්බර් මස 15 දින ලෙස එවකට සිටි අධිකරණ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කළා. ඒ අනුව එතෙක් පැවැති අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය සම්පූර්ණයෙන් නතර වූ අතර 2023 සැප්තැම්බර් මස 15 දින සිට ක්‍රියාත්මක වන්නේ දූෂණ විරෝධී පනතේ 3වන වගන්තිය ප්‍රකාරව සකස් කරනු ලැබූ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවයි. එම කොමිෂන් සභාව, කිසිදු අමාත්‍යාංශයක් යටතේ නොපවතින අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ දැක්වෙන කොමිෂන් සභාවලට වඩා වෙනස්ව දූෂණ විරෝධී පනත මඟින් සකස් කරනු ලැබූ සුවිශේෂී බලයන් සහ සුවිශේෂී ලක්ෂණ සහිත කොමිෂන් සභාවක්. එම කොමිෂන් සභාවේ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය බවට සලකන යම් නිලධරයන් සහ සේවා නියුක්තයන් මේ පනත යටතේ සාදන ලද රීතින්ට යටත්ව, කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය හැකි බව දූෂණ විරෝධී පනතේ 26(1) වෙනි වගන්තියේ සඳහන් වෙනවා. ඒ වාගේම, එසේ පත් කරනු ලැබූ නිලධරයන් සහ සේවා නියුක්තයන් සඳහා වන පාරිශ්‍රමික සහ සේවා කොන්දේසි මුදල් විෂය පවරා ඇත්තා වූ අමාත්‍යවරයා විමසා කොමිෂන් සභාව විසින් තීරණය කරන පරිදි පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතු බව පනතේ 26(2) වගන්තිය යටතේ සඳහන් වෙනවා.

පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම යෝජනාවලියේ අරමුණ වන්නේ, දූෂණ විරෝධී පනතේ 26(2) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික සහ සේවා කොන්දේසි අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමයි. දූෂණ විරෝධී පනතේ 26(1) සහ 26(2) වගන්ති ඉතා පැහැදිලි අතර, දූෂණ විරෝධී පනත ගෙන ඒමේ අරමුණ වූයේද කොමිෂන් සභාවට ස්වාධීන ලෙස කටයුතු කළ හැකි තමන්ගේම නිලධරයන් හා සේවා නියුක්තයන් පත් කර ගැනීමට ඉඩ සැලසීමයි. කෙසේ වෙතත්, 2023 සිට මේ දක්වා එය සිද්ධ වුණේ නැහැ. ඒකට එක හේතුවක්, ඒ සඳහා දේශපාලන චුවමනාවක් නොතිබීම. තවත් එකක් තමයි, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන හා සම්බන්ධ යම් පැහැදිලි කිරීමක් අවශ්‍යව තිබීම. කෙසේ වෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණය නීතිපතිගේ මතයත් දක්වා තිබෙනවා. 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන දූෂණ විරෝධී පනතේ 26(1)වන වගන්තියේ හෝ 27වන වගන්තියේ සඳහන් පත් කිරීම් සිදු කිරීම සඳහා කිසිදු අදාළත්වයක් නොමැති බව සඳහන් කර තිබෙනවා. ඒ අනුව දැන් මෙම යෝජනා ටික ඉදිරිපත් කරනවා.

Hon. Deputy Speaker, as you know, when our Government came into power, one of our biggest pledges to the country was to fight corruption and bribery. For that, we need a strong, independent body as the institution to fight it. ඔබ දන්නා පරිදි රටක් දියුණු වෙන්න නම්, රටකට ආයෝජන එන්න නම් දූෂණය, වංචාව අවම විය යුතුයි. මොකද, දූෂණය, වංචාව පිරුණු රටකට මිනිස්සු එන්නේ නැහැ. දූෂණයට, වංචාවට එරෙහිව සටන් කරනවා කියන්නේ හුදෙක්ම වැරැදි කරපු කට්ටිය හිරේ දමන එක විතරක්ම නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ සඳහා නොයෙකුත් ක්‍රමවේද තිබෙනවා. You have to establish many procedures to prevent corruption and bribery. First and foremost among these is the political will, which our Government has in abundance. We have also established three full-time courtrooms currently functioning to hear bribery cases. In fact, the Financial Action Task Force in this country has a programme - it is even mentioned in the IMF Governance Diagnostic Assessment Report- which means we are  establishing procedures, rules and regulations, and working methods in every Ministry to combat bribery, corruption, money laundering, and various other offences, because any civilized nation in the world will not come here to invest, if we do not have a strong structure to fight bribery and corruption, as well as money laundering and related activities. අන්න ඒ හේතුව නිසා තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතැනට වෙනම 971ක් කාර්ය මණ්ඩලය ගන්නේ. සමහරු අහන්න පුළුවන්, මේ විමර්ශන කරන්න වෙනම පිරිසක් අවශ්‍ය ඇයි කියලා. Hon. Deputy Speaker, you cannot compare it with an average officer's investigation- ඒ කියන්නේ සාමාන්‍ය නිලධාරියෙකුගේ විමර්ශනයයි, corruption, bribery කියන ඒවායේ විමර්ශනයයි වෙනස්. මොකද, වංචා, දූෂණ කරන අය කොච්චර සංකීර්ණ සහ advanced ක්‍රම භාවිත කරනවාද කියනවා නම්, forensic investigations, accountancy, online transactions and various other things- එතකොට හොරා තාක්ෂණය පැත්තෙන් ඉහළට යනකොට, අපට බැහැ ප්‍රාථමික විධියට විමර්ශන කරන්න. එහෙම නම් ඒ සඳහා කැප වුණු, -dedicated- ඒ සඳහා වෙනම පුහුණුව ලැබූ කණ්ඩායමක් අවශ්‍යයි. ඒ විධියට විතරයි, අපට හැකියාව ලැබෙන්නේ ඉතා සාර්ථක අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවක් පවත්වාගෙන යන්න. අන්න ඒ පදනම මත පිහිටා තමයි, මේ විශේෂිත පුද්ගලයන් ගන්නත්, ඔවුන්ගේ පාරිශ්‍රමිකයන් දරන්නත් අපි මේ යෝජනාවලිය ඉදිරිපත් කරන්නේ. This is part of the promise we made to the people. I must confess that.

අපි බැලුවොත්, අපේ රජය ආවාට පස්සේ පසුගිය අවුරුද්දේ - 2025දී- තමයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවක් තිබෙනවා කියලාත් මිනිස්සුන්ට දැනෙන්න ගත්තේ. 2024 ඉඳලා 2025 අවසන් වෙනකොට, we have climbed up the Corruption Perceptions Index. දූෂණය මනින Index එකේ අපි 121 සිට 107 දක්වා ස්ථාන 14ක් ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. Points 100න් 32 සිට 35 දක්වා points 3ක් වැඩි කරගෙන තිබෙනවා, all within one year. For that purpose, I sincerely thank the Commissioner, the Director General, as well as all the staff and investigators of the Commission to Investigate Allegations of Bribery or Corruption who made this possible. In one year, we have climbed 14 places; we are better, which shows the political will of this Government to push this country forward and fight corruption. Therefore, I would like to draw everyone's attention to the fact that to bring in investments for the country to develop, there must be procedures to prevent corruption and bribery, and we have achieved this for that purpose.

Now, let me answer a few questions. යම් කෙනෙක් කරුණු දක්වනවා, ගල් අඟුරු කථාවක් අරගෙන. ඒ ගල් අඟුරු

කථාව තමයි, බාල අහුරු කියන එක. අහුරු නොවෙයි බාල ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ දේශපාලනය. ඒත් හැමෝම නොවෙයි. අර "පව පෙරේරා" ඇතුළු කිහිපදෙනෙක් ඉන්නවා. නමුත් මම පැහැදිලිව මේක කියන්නට ඕනෑ. මේ ගල් අහුරු ගැන මාසයක් තිස්සේ කථා කරනවා, බාලයි කියනවා. *[බාධා කිරීමක්]* තව එක්කෙනෙක් කථා කරනවා. *[බාධා කිරීමක්]* මගේ ගෙවල් ළඟ එක්කෙනෙක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පව පෙරේරාට" ගහන කොට වෙන කට්ටිය අඬන්නේ. ඒක නේ වැඩේ. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ගල් අහුරු ගැන මෙච්චර කථා කරනවා. මේ පාර්ලිමේන්තුව තිබෙන්නේ, වරප්‍රසාද දීලා තිබෙන්නේ, ජනතාව වෙනුවෙන් ඇත්ත කියන්න නේ. නමුත්, මෙතැන බොරු කියන්නන්ගේ තෝතැන්නක් බවට පත් වෙලා තිබෙනවා. මොකද, මෙතැන කියන ඒවාට අපට පියවර ගන්න බැරි නිසා.

ඒ වාගේම, මේ කියන තත්ත්වය ඇත්ත නම් විපක්ෂයේ උදවිය මෙතැන කිය කියා ඉන්න ඕනෑ නැහැ. ඒ ගැන CID එකට පැමිණිලි කරන්න පුළුවන්, පොලීසියට කියන්න පුළුවන්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කරන්න පුළුවන්. ඒවා ස්වාධීන ආයතන. අපි නීතියේ විධානයේ ආධිපත්‍යය තහවුරු කරලා තිබෙනවා. ඒ නිසා එතැන වරදක් තිබෙනවා නම්, මෙතැන කියවා කියවා ඉන්න ඕනෑ නැහැ. දැන් මාස දෙකක් තිස්සේ බාල ගල් අහුරු ගැන කියනවා. ඒ ගල් අහුරුවලින්ම තමයි, නොරොච්චෝලේ බලාගාරය දුවන්නේ. මම ඔවුන්ගේ අරමුණ පසුව පැහැදිලි කරන්නම්. නමුත්, ඔවුන් මෙතැනදී ඇමතිවරයා අල්ලා ගෙන ඇමතිවරයාට බණිනවා. ඇත්ත කථාව මොකක්ද? 2014දී අපේ බලශක්ති ඇමතිවරයා රජයේ සේවකයකු වශයෙන් හිටපු කාලය තුළ වෙච්ච අතපසුවීමක් නිසා, එතුමාට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් නඩු පවරලා අධි චෝදනා පත්‍රයක් ඇවිල්ලා තිබෙනවා. ඉතින් බලන්න කෝ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව කොච්චර හොඳද කියලා. අපේම ඇමතිවරයෙකුට වුණත් වරදක් කරලා තිබෙනවා නම්, 2014දී වෙච්ච දෙයකට නඩු දමලා තිබෙනවා. ඒකට කලින් ආණ්ඩුවලින් නඩු දැම්මේ නැහැ. දැම්මේ අපේ ආණ්ඩුව යටතේ තිබෙන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන්. ඒකෙන් අදහස් වෙන්නේ මොකක්ද? අපේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ස්වාධීනයි. කිසිදු බලපෑමකින් තොරව ඒ අධි චෝදනා පත්‍ර එනවා. මොකද, ඇමතිවරයාට ඕනෑ නම් ඒකට බලපෑම් කරන්න තිබුණා, ප්‍රශ්නයක් නැහැ. දැන් කියනවා, ඉල්ලා අස්වෙන්නලු. මොකද? විශ්වාසභංග යෝජනාවක් ගෙනෙනවොලු. . විශ්වාසභංග යෝජනාවක් කලිනුත් ගෙනාවා නේ, අපේ හරිනි අගමැතිනියට. ඒක තවම මඟ එනවා ඇති, කොහේ හරි බස් එකක. මම මේ කියන්න උත්සාහ කරන්නේ, එතුමාට ලැබෙන අධිචෝදනා වළක්වා ගන්න එතුමා බලපෑමක් කළේ නැත්නම්, එතුමා අමාත්‍ය ධුරයේ හිටියා කියලා අධිකරණවලට බලපෑම් කරන්න යන්නේ නැහැ කියන එකයි. අපි මේ සිදුවීමෙන් පෙන්වලා තිබෙන්නේ මොකක්ද? අපේම ඇමතිවරයෙක් වුණත්, අපේම මන්ත්‍රීවරයෙක් වුණත් නීතිය හැමෝටම එක හා සමානයි කියන එක.

අන්න ඒ හින්දායි "පව පෙරේරා" ඇතුළු සියලු දෙනාට මම කියන්නේ බාල ගල් අහුරු තිබෙනවා නම්, ගිහිල්ලා කොහේට හරි පැමිණිල්ලක් කරන්න කියලා. ඒ පැමිණිල්ල විමර්ශනය වෙයි. එතකොට අනිවාර්යයෙන්ම නීතිය ඉෂ්ට වෙනවා. මේ කතන්දර කියන්න උත්සාහ කරන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේගොල්ලන් දන්නවා,- Sometimes, I wonder whether the person I referred to earlier even uses his lips to go home and kiss his wife and children, considering the repulsive things he says from his mouth. Nevertheless, that is his upbringing, not ours.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි අසත්‍ය කියන්න හේතු තිබෙනවා. අපි දන්නවා රටක අර්බුද එනවා, ප්‍රශ්න එනවා කියලා. අපි මේ ආණ්ඩුව ගන්නකොට අර්බුදයක් තිබුණා. රටේ ආර්ථිකය බංකොලොත් තත්ත්වයක තිබුණා. භාණ්ඩාගාරයේ සල්ලි තිබුණේ නැහැ. අපි නිල වශයෙන් බංකොලොත්භාවයක හිටියේ. අපේ ජනාධිපතිතුමා ඇතුළු කණ්ඩායම මේක භාර අරගෙන දැන් බිලියන 7ක් දක්වා reserves වර්ධනය කරලා තිබෙනවා. ආර්ථිකය ප්‍රපාතයෙන් ගොඩ ඇවිල්ලා යම් ප්‍රමාණයකට ස්ථායි කරගත්තා. අපි ඒ අභියෝගයට මුහුණ දුන්නා.

අපට දිට්වා ආවා. ඇමෙරිකානු ඩොලර් බිලියන 4.2යි ඒ අලාභය. අපි ඒකට මුහුණ දුන්නා; කළමනාකරණය කළා. දැන් ඉරානය සහ ඇමෙරිකාව අතර යුද්ධයක් තිබෙනවා. ඒක නිසා අපට නොසිතූ දේවල්වලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. අපේ ආණ්ඩුවේ දක්ෂතාව අපි පෙන්නුම් කරන්නේ සුමටව ගලාගෙන යන අවස්ථාවලදී නොවෙයි. අපේ නියම නායකයන් බිහි වන්නේ, අපේ වැඩ පෙන්වන්නේ මේ අභියෝග මධ්‍යයේයි. නමුත් සමහරු කියනවා, ඉරාන-ඇමෙරිකා යුද්ධය සඳහා අරහෙම සූදානම් වෙන්න, මෙහෙම සූදානම් වෙන්න කියලා. Deputy Speaker, we cannot, as policy-makers, run around like headless chicken. We have to perform our duties. ඒක ඒ බරින් ගන්න ඕනෑ; ඒ වගකීමෙන් ගන්න ඕනෑ. කලින් හිටපු කට්ටිය ප්‍රශ්නවලට මුහුණ දුන්නේ කොහොමද? ගංගාවලට මුට්ටි අතහැරියා; පැණි බිව්වා. එහෙම තමයි කලින් කට්ටිය ප්‍රශ්නවලට මුහුණ දුන්නේ. දැන් ඒගොල්ලන් බලාපොරොත්තු වෙනවාද දන්නේ නැහැ, අපිත් ඒවාගේ පිස්සු නටන්න ඕනෑ කියලා? ඒක වෙන්නේ නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි මේ වෙනකොටත් අනුකමිටු හතරක් පත් කරලා තිබෙනවා. ඒ මොනවාටද? බලශක්තිය පිළිබඳ බලන්න, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පිළිබඳව බලන්න, ප්‍රවාහනය පිළිබඳ බලන්න, ජනතාවගේ අනෙක් සියලු ප්‍රශ්න දිහා බලන්න අනුකමිටු හතරකින් වැඩ කරගෙන යනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Harshana Nanayakkara, you have two more minutes.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

Thank you, Hon. Deputy Speaker.

ඒ නිසා මම ජනතාවට කියන්නේ මේකයි. ඔව්, අපි මේ අවස්ථාවේ QR Code එක ඉදිරිපත් කරලා තිබෙනවා. එහි යම් යම් ගැටලු මතු වෙලා තිබෙනවා. ඒවා ඉතා ඉක්මනින් සාමාන්‍යකරණයට පත් වෙනවා. මම මේ අවස්ථාවේ ජනතාවගෙන් ඉල්ලීමක් කරනවා. අපි විපක්ෂයේ හිටපු කාලයේ කොරෝනා වැනි ප්‍රශ්නයක් ආවාම අපි ඒ ප්‍රශ්නය විසඳන්න පුළුවන් විධියට මැදිහත් වුණා. අපි මාස්ක් හැදුවා. යම් යම් ස්ථාන විෂබීජහරණය කළා. විපක්ෂයක් වශයෙන් වැදගත් විධියට සහාය දෙමින් තමයි අපි ආණ්ඩුවේ වැරැදි තැන් විවේචනය කළේ. දැන් ඉන්න විපක්ෂය එහෙම නොවෙයි. මිනී මතින් හරි, ගිනි තියපු රටකින් හරි බලයට එන්න අවශ්‍ය බොරු කියනවා. ඒකට හරියන චැනල්කාරයෝ කිහිප දෙනෙක් පෙට්‍රල් පෝලිම්වල ඉන්න මිනිසුන්ට මයික් අල්ලලා කථා අහන්න ගිහිල්ලා, ඒ ගොල්ලන්ගේ කන් දෙක පිරෙන්න වැදුණු බවත් අපට පෙනුණා.

මා ජනතාවගෙන් එක දෙයක් ඉල්ලා සිටිනවා. ඔව්, මේ අර්බුදය තීව්‍ර වෙන්න ඉඩ තිබෙනවා. අපි කවුරුවත් දන්නේ නැහැ

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

යුද්ධය ඉවර වෙන්නේ කවදාද කියලා. නමුත් මේ ආණ්ඩුව ඉතා හොඳට, වගකීමෙන් යුතුව ඉතා ළඟින් තත්ත්වය නිරීක්ෂණය කරමින් යනවා. ඒ නිසා අපි ගන්න පුළුවන් සෑම පියවරක්ම ගන්නවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනතාවගේ ජීවිත පහසුවෙන් තියන්න. නමුත් මේ අය පෙන්වන්න හදන්නේ මොකක්ද? බාල ගල් අඟුරු ආවා; දැන් ගල් අඟුරු එන්නේ නැහැ; ඔන්න හෙට ලයිට් කපනවා. ඒක තමයි "පච පෙරේරාගේ" බලාපොරොත්තුව. "පච පෙරේරාට" ඕනෑ විධියට අපි මේ ආණ්ඩුව කරන්නේ නැහැ. ඒ වාගේම අපි රජයක් වශයෙන් ජනතාවට කැප කරන්න කියන්නේ නැහැ, අපි කැප කරන්නේ නැතිව.

ඒ නිසා මම ජනතාවගෙන් ඉල්ලා සිටිනවා, අපි එකමුතුව වැඩ කරමු කියලා. බලශක්ති අර්බුදයක් තිබෙනවා. ඒක අපි නිර්මාණය කරපු එකක් නොවෙයි. ඉස්සර වුණේ ඒක නොවෙයි නේ. ඉස්සර මේ රට මංකොල්ල කාලා බංකොලොත් කරලා හොම්බෙන් ඇරියා. තෙල් නැව් ඇවිත් වරායේ තිබෙනවා; ගන්න සල්ලි නැහැ. දැන් ගන්න සල්ලි තිබෙනවා. නමුත් supply chain එක disruptවෙලා තිබෙනවා. මේක තත්ත්ව දෙකක්. ඒ තත්ත්වය මොකක් වුණත් අපි ජනතාවට වගකියන ආණ්ඩුවක් වශයෙන් ඉතා පරිස්සමින් මේවා කළමනාකරණය කරනවා. ඒ සඳහා රජය විශ්වාස කරමින් රජයට සහාය දෙන්න කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Archchuna, why are you on your feet?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, Standing Order No. 91(h) states, I quote:

> "No Member shall make any imputation of improper motives against another Member,..."

සර්, "පච පෙරේරා" කියලා Parliament Member කෙනෙකුට නමක් දමන්න පුළුවන් නම්, අපට "පච අනුර" කියලාත් කියන්න පුළුවන්. ආපු දවසේ ඉඳන් අද වෙනකම් කියන්නේ බොරු නේ, සර්. කරුණාකරලා ඒක අයින් කරන්න කියන්න. Minister කෙනෙකුට එහෙම කථා කරන්න පුළුවන් නම්, අපටත් කියන්න තිබෙන්නේ "පච අනුර" කියලා. පච ආණ්ඩුව කියලා කියන්න තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Chamara Sampath Dasanayake. You have 15 minutes.

[අ.භා.12.15]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට පෙර කථා කරපු ඔය ඇමතිතුමා තමයි මීට අවුරුදු තුනකට කලින් පාර්ලිමේන්තුව ගිනි තියන්න එන්න කියලා පාර්ලිමේන්තුව ඉස්සරහා හන්දියට ඇවිල්ලා ජනතාවට කිව්වේ. අපි ඒවා දන්නවා. අනෙක් එක, "පච පෙරේරා" කෙනෙක් ගැන කිව්වා. "වට්ටක්කා නානායක්කාර"ලා සිටියා, "පච දිසානායක"ලා තමයි දැන් ලංකාවේ වැඩියෙන්ම ඉන්නේ. දසනායකලා නොවෙයි, දිසානායකලා. මේ වෙලාවේ ඒකත් කියන්න ඕනෑ. එම නිසා කථා කරනකොට උඩ බලාගෙන කෙළ ගහන්න එපා, ගරු අධිකරණ ඇමතිතුමා. මොකද, එතුමාත් ඔබතුමා වගේ වැදගත් මිනිහෙක්. එතුමාත් කෝට් එක අඳින්නේ, ඔබතුමාත් කෝට් එක අඳින්නේ. ඔබතුමාත් උසාවි යනවා, එතුමාත් උසාවි යනවා. එම නිසා කථා කරනකොට දෙපැත්ත ගැනම සොයා බලා කථා කරන්න, අධිකරණ ඇමතිතුමා.

අද දින සාකච්ඡා කරන්නේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිළිබඳවයි. සේවකයින් 971දෙනෙකුට විශ්‍රාම වැටුප් වැඩි කරන්නේ, ඒ වාගේම 63දෙනෙකුට තනතුරු තානාන්තර දීලා බඳවා ගන්නේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කටයුතු මේ රට තුළ නැවත වේගවත් කිරීම සඳහායි. ඒක හොඳයි. ඒ ගැන අපි සතුටු වෙනවා. ඒ වගේ දේවල් වෙන්න ඕනෑ. රාජ්‍ය නිලධාරින් සඳහා වෙන් වූ කුටියේ මේ අවස්ථාවේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරින් ඉන්නවා. ඔබතුමන්ලා මේවා අහගන්න. ගල් අඟුරු ඇමති අද උදේ මෙතැනදී කිව්වා, එතුමාට නඩු දාලා තිබෙන්නේ මීට අවුරුදු 11කට කලින් කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු 11කට කලින් වෙච්ච සිද්ධියක් නිසා ඒ ගැන කථා කරන්න එපා කියලා එතුමා කිව්වා. හැබැයි, අවුරුදු 13කට කලින් පටන් ගත් නඩුවක් නිසා තමයි මම රිමාන්ඩ් වුණේ. මාව මහෙස්ත්‍රාත් අධිකරණයට දාලා රිමාන්ඩ් කරලා, පසුව ඇප දීලා තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අපට අධි චෝදනා භාර දුන්නේ.

හැබැයි, ගල් අඟුරු ඇමති සම්බන්ධයෙන් කටයුතු සිද්ධ වුණේ කොහොමද? ගල් අඟුරු ඇමතිව අධිකරණයට දාලා, මහාධිකරණයට අධි චෝදනා දීලා ඇප දෙන එකයි කළේ. එතකොට, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව චාමර සම්පත්ට එක ක්‍රමයක්, ගල් අඟුරු ඇමතිට තව ක්‍රමයක් තමයි ක්‍රියාත්මක කළේ. අන්න ඒ නිසා, මේ කොමිෂන් සභාව හැම කෙනෙකුටම ස්වාධීන විධියට ක්‍රියාත්ම වෙනවා නම් හොඳයි. මොකද, මේ කොමිෂන් සභාවට සේවකයෝ ගන්න ඕනෑ, වැටුප් ගෙවන්න ඕනෑ, විශ්‍රාම වැටුප් ගෙවන්න ඕනෑ. ඒවා ඔක්කෝම හරි. හැබැයි, මේ කොමිෂන් සභාව ආණ්ඩුවට එක විධියකටත්, විපක්ෂයකට තව විධිකයකටත් කටයුතු කරන නිසා තමයි අපි මේ කොමිෂන් සභාව ගැන කනගාටු වෙන්නේ. මම ඒක මේ වෙලාවේ කියන්න ඕනෑ. මේ කොමිෂන් සභාව ගැන මම වැඩිපුර කථා කරන්නේ නැහැ.

ඩිජිටල් ඇමතිතුමාත් අද මේ සභාවේ සිටියා. අපි එතුමාගේ කථාව ඇහුවා. ඒ කථාව තුළින් අපට QR code එක ගැන හරියට පැහැදිලි වුණේ නැහැ; ගම්‍ය වුණේ නැහැ. QR code එකේ දැන් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. අලුතින් ගෙනාපු වාහනවලට තවම QR code එක register කර ගන්න බැහැ. විකුණපු වාහනවලටත් QR code එක register කර ගන්න බැහැ. QR code එක සම්බන්ධව ඒ වගේ ගොඩක් ප්‍රශ්න තිබෙනවා. ඒ වාගේම තවම numbers දීලා නැති වාහනත් QR code එකට register කරන්න

බැහැ. ඒ නිසා පරණ database එක මකලා, QR code එක සඳහා අලුත් database එකක් හැදුවා නම් සුපුරුදු විධියට හැමෝට QR code එක නැවත active කරගෙන තෙල් ටික ගහන්න පුළුවන් කියන එකයි අපි කියන්නේ. ඔබතුමන්ලාට ඕක කර ගන්න බැරි නම්, කංචනට ඇවිල්ලා මාසයක් විතර වැඩ කරලා ඕක කරලා දෙන්න කියන්න. ඒ මනුස්සයා ඕක කරලා දෙයි. කංචන ඇවිල්ලා පඩි ගන්නේ නැතුව ඕක කරලා දෙයි. ඔහුට කරන්න පුළුවන්. අන්න ඒකත් මම මේ වෙලාවේ කියන්න ඕනෑ.

ඊළඟට, ගෑස් ප්‍රශ්නය බලන්න. දැන් ආණ්ඩුව බලනවා, ගෑස් සහ ඉන්ධන දෙකම යුද්ධය පිටින් දමන්න. ගෑස් සහ ඉන්ධන ප්‍රශ්න දෙකම යුද්ධය පිටින් දමන්න එපා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගෑස් හිඟයක් එනවා කියලා දෙසැම්බර් මාසයේ 18වැනිදා මම මේ පාර්ලිමේන්තුවේදී කිව්වා. ඒක හැන්සාඩ්ගත වෙලා තිබෙනවා. දෙසැම්බර් මාසයේ 18වැනිදා තමයි ගෑස් හිඟයක් එනවා කියලා මම කිව්වේ. හරියටම පෙබරවාරි මාසයේ ගෑස් හිඟය ආවා. ගෑස් ප්‍රශ්නය මේ යුද්ධයට ගාවගන්න බැහැ. ඕමාන් සමාගමෙන් ටෙන්ඩරය ගලවලා ස්විට්සර්ලන්තයේ Geogas සමාගමට ලබා දුන් නිසා තමයි ගෑස් හිඟයක් ඇති වුණේ. එහෙම නැතුව මේ යුද්ධය නිසා ගෑස් හිඟයක් ඇති වුණේ නැහැ. යුද්ධය නිසා තෙල් නැතිවෙලා තිබෙනවා. නැව්වලට එන්න බැහැ. අපි ඒක පිළිගන්නවා. ඒ ගැන අපි ආණ්ඩුවට දොස් කියන්නේ නැහැ. හැබැයි, ආණ්ඩුව දැන් රුසියාවෙන් තෙල් ඉල්ලන්නේ මොකද?

පසුගිය කාලයේ අපේ මුහුදට නැව් දෙකක් තල්ලු කරලා තිබුණා. එක් ඉරාන නැවකට ගහලා Navy එකේ මිනිස්සු මැරුවා. ඒ සිද්ධියෙන් ඉන්දියාව ඇඟ බේරාගත්තා. හැබැයි, ඉන්දියාව දැන් මොකක්ද කියන්නේ? හරි නම් ඉන්දියාව අපේ ආණ්ඩුවට තෙල් ටික දෙන්න ඕනෑ. අපේ ආණ්ඩුව තමයි ඒ ප්‍රශ්නයෙන් ඉන්දියාව බේරා ගත්තේ. ඉන්දියාවට සහයෝගය දුන්නේ අපේ රට; අපේ ආණ්ඩුව. මේ ආණ්ඩුව තමයි ඉන්දියාව බේරා ගත්තේ. මම ගියසැරේ පාර්ලිමේන්තුවේදී කිව්වා, අද ඉන්දියාව කරට අත දමාගෙන ඉන්නවා වාගේම, ඊට පස්සේ ඒ ගොල්ලෝ අපට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

විධියත් බලාගන්න කියලා. ඒ නිසා අපට තෙල් ටිකක් දෙන්න කියලා ඉන්දියාවටත් කියන්න කියලා මම කියනවා.

ගෑස් ප්‍රශ්නයට වග කියන්න ඕනෑ, මේ ආණ්ඩුව. මොකද, මේ ගෑස් ප්‍රශ්නය ගැන හිතන්නේ නැතුව, නැව් 5ක් තිබුණු සමාගම අයින් කරලා නැව් 2ක් තිබෙන එකකට දීපු නිසා තමයි තවම නැව් 2කින් ගෑස් අදින්නේ. නැත්නම් මේ ගෑස් ප්‍රශ්නය එන්නේ නැහැ. තෙල් ප්‍රශ්නය අපි පිළිගන්නවා. තෙල් නැහැ. ගන්න විධියක් නැහැ, නැව් එන්න විධියක් නැහැ. අපි ඒක පිළිගන්නවා. අපි විපක්ෂය හැටියට හැම ප්‍රශ්නයකදීම කොරහේ කිඹුල්ලු දකින්නේ නැහැ. ඒ ගැනත් මම මේ වෙලාවේ කියන්න ඕනෑ. මේවා ගැන කථා කරන කොට, ඒ එක්කම තව ප්‍රශ්න වැලක් තිබෙනවා.

හමුදාවේ නිලධාරින් පිරිසක් කථා කරලා මට යම් කාරණයක් කිව්වා. හමුදාවේ නිලධාරින් 1,000ක් pension papers භාර දීලා මාස 6ක් වෙනවා ලු. තවම ඒ අයට විශ්‍රාම වැටුප් හදලා නැහැ. ඒ වාගේම අපේ කාලයේ - *[බාධා කිරීම්]* ஐயா, கொஞ்சம் சும்மா இருங்க! கொஞ்சம் பேச விடுங்க! මගේ කථාවට බාධා කරන්න එපා. கொஞ்சம் இருங்க! මම මේ වෙලාවේ කියන්නේ මෙකයි. මේ ආණ්ඩුවේ හොයන්න බැරි ගොඩක් ප්‍රශ්න තිබෙනවා. ගෑස් ප්‍රශ්නය, තෙල් ප්‍රශ්නය ආවේ මෑතකදී. ඊට වඩා ප්‍රශ්න තිබෙනවා.

අපේ ආණ්ඩුව පැවැති කාලයේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතුවලට වැඩි පොලියක් දුන්නා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක්ද? ඔබතුමාට වයස අවුරුදු 70ට වැඩිද? 70ට වැඩි නම්, ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක්. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතුවලට සියයට 15ක පොලියක් දුන්නා, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ. ඒක සියයට 10ට බැස්සා. දැන් ජ්‍යෙෂ්ඨ පුරවැසි කථා ඔක්කෝම ඉවරයි. ඒ මිනිස්සු pension එකෙන් ලක්ෂ 10ක, ලක්ෂ 20ක විතර ස්ථාවර තැන්පතුවක් දමාගෙන ඒකට ලැබුණු පොලියෙන් තමයි ජීවත් වුණේ. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට දීපු ඒ පොලී මුදල සම්පූර්ණයෙන්ම කපා හැර තිබෙනවා.

ඊයේ පෙරේදා පොලීසියේ ආබාධිත නිලධාරින් මාරු කළා. ඒ මිනිස්සු ආබාධිතයි. ඒ අය parade එකකටවත් ගන්න බැහැ. ඒගොල්ලන් පැත්තක තියන්න ඕනෑ. නමුත් ඒ මිනිස්සු මාරු කරනවා. WPCලා මාරු කරනවා. මේ වාගේ ගොඩක් දේවල් වෙනවා. මේවා ගැන හොයන්න. මේවා ගැන පොඩ්ඩක් බලන්න, පොලිස් ඇමතිතුමා. නොන්ඩි ගහන මිනිස්සු මාරු කරලා වැඩක් නැහැ. මේ පාර්ලිමේන්තුවේ සිටින WPCලා මාරු කරනවා. අපේ පාර්ලිමේන්තුවේ ඉස්සරහ ඉන්න පොලිස් කාන්තාවක් මන්නාරමට මාරු කරලා. කරන්න පුළුවන් දේවලුත් තිබෙනවා. අපි කියන්නේ මෙකයි. අපේ නියෝජ්‍ය ඇමතිතුමා, අපි මේ කියන දේවල් ගැන "මෙහෙම දෙයක් වෙනවාද" කියා ඔයගොල්ලන් සොයා බලා කටයුතු කරන්න.

ඊළඟ කාරණය මෙකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඊයේ පෙරේදා SLTB පත්වීම් 600ක් දුන්නා. ඒ පත්වීම් ප්‍රදානය කළේ ජනාධිපතිතුමාගේ අතින්. නියෝජ්‍ය ඇමතිතුමනි; පොඩි ඇමතිතුමනි, මේක අහගන්න. හැබැයි, ඒ සමහර ෆයිල්වල කොළ නැහැ; පත්වීම් ලිපි නැහැ. තවම පත්වීම් දීලා නැහැ. ජනාධිපතිතුමා අන්දලා. ගෙන්වලා, පත්වීම් 600ක් දුන්නා. මේ ගැනත් හොයා බලන්න. මම මේ කියන්නේ බොරුවක් නම්, "චාමර සම්පත්, ඔයා කියා තිබෙන්නේ බොරුවක්" කියලා කියන්න. චාමර සම්පත් පාර්ලිමේන්තුවේ බොරුවක් කියනවා නම් ඒකට ප්‍රතිචාරය දක්වන්න. ඔන්න ඕක, එක ප්‍රශ්නයක්. පත්වීම් ටික දීලා, නමුත් ඒක බොරුවක්. තවම ඒ මිනිස්සු ගෙවල්වල. ඒ වාගේ ප්‍රශ්න ගොඩක් මගේ ළඟට එනවා. ඉතින්, මේ පාර්ලිමේන්තුවේදී මම ඒවා ගැන කථා කරනවා. මොකද, කථා කළේ නැත්නම් මේවා ලොකු ප්‍රශ්න වෙනවා නේ.

ඊළඟට, සිවිල් ආරක්ෂකයින්ටත් ප්‍රශ්නයක් තිබෙනවා. සිවිල් ආරක්ෂකයින් කියන්නේ හරිම අමාරුවෙන් ජීවත් වෙන මිනිස්සු. ඒ ගොල්ලන්ට කෑම සඳහා යම් දීමනාවක් දුන්නා. ඒගොල්ලන් එහෙට-මෙහෙට මාරු කරනවා. ඒ මිනිස්සුන්ටත් පොලිස් නිලධාරින්ට වාගේම පොඩි දීමනාවක් කෑම සඳහා දුන්නා. දැන් ඒකත් කපලා. පව් නේ. පොලීසිය භාර නියෝජ්‍ය ඇමතිතුමනි, සිවිල් ආරක්ෂකයින් පව්! අහිංසකයි අනේ! ඔබතුමාට නම් උසාවි ගිය දවසට ගෙඩිය පිටින් එහෙම්ම දානවා නේ. උසාවි යන කට්ටියට. ඒ මිනිස්සුන්ට ගෙඩිය පිටින් දමන්න කවුරුවත් නැහැ. පොලිස්පතිතුමාගේ චක්‍ර ලේඛනයක් අනුව ඒ අයට කෑම සඳහා දීපු දීමනාව කපා දමලා. අන්න ඒ ගැනත් පොඩ්ඩක් බලන්න. ඒ ගැන බලන එක හොඳ දෙයක්.

අධිකරණ ඇමතිතුමා, ඊළඟට මේ කාරණයත් බලන්න. අධිකරණ ඇමතිතුමා, පොඩ්ඩක් අහගන්න කෝ. ඔය අධිකරණ ඇමතිට කථා කරන්න කෝ. එතුමා පිටුපසට හැරිලා ඉන්නේ. අධිකරණ ඇමතිතුමා, - අර බලන්න, එතුමා ඉන්න විධිය. කැතයි නේ. රටේ අධිකරණ ඇමතිතුමා නේ. මට පිටුපස හරවාගෙන ඉන්නේ. අධිකරණ ඇමතිතුමා, පොඩ්ඩක් මුහුණ පෙන්වන්න කෝ. *[බාධා කිරීම්]* බලන්න කෝ, අධිකරණ ඇමතිතුමා. ඔබතුමා

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

රටේ වගකිව යුතු ඇමති කෙනෙක් නේද? සාමදාන විනිශ්චයකාරවරුන් සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා. සාමදාන විනිශ්චයකාරවරුන්ට දැන් මෙඩිකල් දෙන්න ලු. මේවා මාර වැඩ නේ. සාමදාන විනිශ්චයකාරවරුන්ට මෙඩිකල් දෙන්න ලු. වෛද්‍ය පරීක්ෂණයකට යන්න ඕනෑ ලු. ඒ මිනිස්සු මැරෙන මොහොතේ හරි සීල් එක ගහනවා. අධිකරණ ඇමති අලුත් චක්‍රලේඛනයක් ගහලා. අර අහිංසක සාම විනිසුරුවරුන්ට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තමයි ඔය ලැහැස්ති වෙන්නේ. ඒකට තමයි ලැහැස්ති වෙන්නේ කියලා අපි දන්නවා. නැති ලෙඩ දමා ගන්න එපා. ඔය ඔක්කෝම ඔයගොල්ලන්ට ගොඩ ගහපු ඡන්ද. අපිට ගැහුවේ කීයද? මට 19,000යි; විදාරත්නට 209,000යි. මේවා ඔක්කෝම ගොඩ ගැහුවේ ඔයගොල්ලන්ට තමයි. ඔය තිබෙන ඡන්ද ගොඩ නැති කර ගන්න එපා.

ඔන්න, ඒ අස්සේ සාම විනිසුරුවරුන්ටත් වැඩේ දීලා. මට ලැබෙන තොරතුරු කියන්නත් එපායැ. දැන් මාර වැඩක් වෙලා තිබෙනවා, සමහර තැන්වල. වෙන්නේ නැති ඒවා වෙනකොට ඒවා කියන්න ඕනෑ නේ. මිහින්තලේ පැත්තේ ඊයේ-පෙරේදා මාර වැඩක් වුණා. අනුරාධපුරයේ මන්ත්‍රී කෙනෙක් ඉන්නවා නම් මේක අහගන්න. මිහින්තලේ ජාතික පාසලේ ගුරුවරු 100ක් ඉන්නවා. එම පාසලේ එක ගුරුවරයෙක් මැරිලා. ඔහු මාලිමාව නියෝජනය කරන ගුරුවරයෙක්. ඉස්කෝලේ තියන්න ඔහුගේ මරණය ඉස්කෝලෙට ගෙනියනවා. ආයෙත් ඉස්කෝලෙන් මරණය ගේනවා, ගෙදරට. ආයෙත් ඒක ගෙනියනවා, අනුරාධපුරයේ විජයපුර තිබෙන ආදාහනාගාරයට. මොකක්ද මේ විහිළුව? මේක නිසා ළමයින්ට දවස් දෙකක් ඉගෙනගන්න නැහැ. පාසලේ කොඩි දාලා, අරවා දාලා, මේවා දාලා තිබුණා. ඒ, අනුරාධපුරයේ මිහින්තලේ ජාතික පාසලේ. ඊට පස්සේ ඔක්කෝම ගුරුවරුන් කියයි නේ, මරණේ ඉස්කෝලෙට ගෙනියන්න කියලා. එතකොට මේක යකාගෙ වැඩක් වෙනවා නේ. මාර වැඩ අප්පා වෙන්නේ. අගමැතිතුමියට මේක ගැන සොයා බලන්න කියලා කියන්න ඕනෑ.

උදේට අපට point of Order එකකටවත් අවස්ථාව දෙන්නේ නැහැ නේ. ඊට පස්සේ මොකක්ද කියන්නේ? ඊට පස්සේ කියනවා, චාමරලා ඉගෙන ගෙන නැහැ නේ, මොළේ නැහැ නේ කියලා. ඔන්න ඕවා තමයි අපට කියන්නේ. ඇවිදින පුස්තකාල වාගේ 159දෙනෙක් මේ පාර්ලිමේන්තුවට එවලා තිබෙනවා කිව්වේ ඔයගොල්ලන්නේ. ඒ අයට "කදිරගාමර්ලා 159ක්" කියලා කිව්වේත් ඔයගොල්ලන් නේ. අපි වල් පැළ නේ. ඔයගොල්ලන් කදිරගාමර්ලා නේ. ඒ නිසා ඒ දේවල් ගැන හොයලා බලන්න.

ඊළඟ එක, පස්සර ප්‍රාදේශීය සභාවේ සභාපතිගේ සිද්ධිය. මම ඕනෑ නම් ඒකේ photo එකත් පෙන්වන්නම්. ඒ මනුස්සයා බෝඩ් එකක් ගහලා තිබෙනවා, සෙරෙප්පු, සපත්තු ගලවලා නිල කාමරේට එන්න කියලා. වරිපනම් ගෙවන්න එන, ආදායම් බදු ගෙවන්න එන, වෙළෙඳ බලපත්‍රය ගන්න එන මිනිහාට සපත්තු, සෙරෙප්පු ගලවලා එන්නලු. ගිහිල්ලා බලන්න. දැන් පස්සර ප්‍රාදේශීය සභාවේ දොරේ ගහලා තිබෙනවා, "සෙරෙප්පු, සපත්තු ගලවලා එන්න" කියලා. ඉස්සර පස්සර ප්‍රදේශයේ ගෙවල්වලට ඒ සභාපති ගියේ සෙරෙප්පු, සපත්තු ගලවලා. දැන් ඔහුගේ ළඟට සෙරෙප්පු, සපත්තු ගලවලා යන්න ඕනෑ. මේවා යකාගේ වැඩ නේ, දෙයියනේ! මේවා යකාගේ වැඩ. අපි මේවා ගැන පාර්ලිමේන්තුවේ කියන්නේ නැතුව වෙන කොතැනද කියන්නේ? අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේවා ගැන මතක් කරනවා.

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
Sir, I rise to a point of Order.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මගේ වෙලාව ගන්න එපා, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා විතරයි ආබාධිත අය නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, what is your point of Order?

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා කථා කරද්දී ආබාධිත පොලිස් නිලධාරින්ට "ආබාධිතකාරයා" කියන වචනය සහ ආබාධිත බව හඟවන වචන පාවිච්චි කළා. *[බාධා කිරීම්]* මම හිතනවා, ඒක අපට කරපු අපහාසයක් කියලා. ඒ නිසා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලනවා, - *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chamara Sampath, you may continue.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ආබාධිත කෙනෙක්. අපි ඔබතුමාට ගරු කරනවා. මගෙන් එහෙම වැරැද්දක් වුණා නම් ඔබතුමා වෙනුවෙන් මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඔබතුමා පාර්ලිමේන්තුවේදී හරි කථා කරලා ඒක නවත්වන්නකෝ, මම කියන එක වැරදි නම්. මොකද, මේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව. ඔබතුමා විතරයි අද ආබාධිත අය වෙනුවෙන් මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ. එහෙම දෙයක් කියවුණා නම් ඒ අය වෙනුවෙන් මම කනගාටුව ප්‍රකාශ කරනවා. ඔබතුමා ඒ ගැන කියන්න, ඒක හොඳයි. බොහොම හොඳයි, ඔබතුමා ඒ ප්‍රශ්නය මතු කිරීම. මම ඒ ගැනත් සතුටු වනවා.

ඊළඟ කාරණය මෙයයි. බස්නාහිර පළාතේ බුද්ධි අංශයේ 140ක්, 150ක් විතර දැන් මාරු කර තිබෙනවා, පොලීසිය භාර ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. බස්නාහිර පළාතේ පොලිස් බුද්ධි අංශවල ඉන්න අය එහාට මෙහාට මාරු කරනවා. අපට පොඩ්ඩක් මේවා හඳාගන්න වෙයි. ඒ මොකද දන්නවාද? අලි අස්සේ බලි කියලා අරහෙට ගහනකොට මෙහෙටත් කවුරුහරි ගහන්න ආවොත් මොකද කරන්නේ? දැන් බලන්න, මැද පෙරදිග යුද්ධය අස්සේ මෙහෙට හෙමිහිට බඩු එනවා. ඒ මොනවාද? කුඩු නැව් පිටින් එනවා. මෙහෙන් ඒවා අල්ලනවා. අපි ඒකට ආණ්ඩුවට ස්තුතිවන්ත වනවා. ඒක හොඳයි. එහෙන් බෝට්ටුවලින් බඩු එනවා. දැක්කාද? ඒවා ආවේ යුද්ධය අස්සේ. නැව් පුපුරණකොට යුද්ධය අස්සේ මෙහෙට කුඩු ගේනවා, මෙහෙන් ඒ කුඩු අල්ලනවා. අන්න ඒවා හොඳ දේවල්. හොඳ දේට අපි හොඳයි කියනවා. අපි මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩුවට විරුද්ධව, ආණ්ඩුව අපහසුතාවට පත් වන වැරදි දෙයක් කියලා නැහැ. අපි කියලා තිබෙන්නේ හැම දෙයක්ම හදාගන්න කියලා.

අපි දෙසැම්බර් මාසයේ ගෑස් ගැන කියපු වෙලාවේ ඒ ප්‍රශ්නය විසඳාගත්තා නම් ජනවාරි මාසයේ ඉඳලා ගෑස් හිඟයක් එන්නේ නැහැ. අපි මේවා කිව්වේ නැහැ නේ. ඔයගොල්ලන් නේ කිව්වේ. අපේ ජනාධිපතිතුමා ඒ කාලයේ ඇහුවා, රනිල් වික්‍රමසිංහ කියන්නේ, "සවුදියේ තෙල් මුස්තාපා" කෙනෙක්ද කියලා. රනිල් pension නේ. රනිල් පැත්තකට වෙලා ඉන්නවා; ඒ මුස්තාපා පැත්තකට වෙලා ඉන්නවා නේ. අපට ප්‍රශ්නයක් නැහැ, ඔයගොල්ලන් කොහෙන් හරි තෙල් ගෙනැත් දෙන්න. මොකද, ඔයගොල්ලන්ගේ ආණ්ඩුව. ඔයගොල්ලන්ට සම්බන්ධතා තිබෙනවා නම් අහහරු ලෝකයෙන් හරි කමක් නැහැ, අපට තෙල් ගෙනැල්ලා දෙන්න.

දැන් අපේ රටේ ප්‍රශ්න ගොඩක් තිබෙනවා නේ. මම මෙහේ ආවාම මාදිවෙල නිල නිවාසයේ උයාගෙන කන්නේ. මට ගෑස් සිලින්ඩරයක් නැතුව යාළුවෙකුගේ ගෙදර ගිහිල්ලා ගෑස් සිලින්ඩරයක් ඉල්ලා ගත්තා. අපට ප්‍රශ්න තිබෙනවා; අපට ප්‍රශ්න නැහැ කියලා සතුටු වෙන්න එපා. අපි ප්‍රශ්නයට උත්තරය හොයමු. ප්‍රශ්නයට උත්තරය හෙව්වාම, ආණ්ඩුවක් හැටියට ආණ්ඩුවේ අඩුපාඩු හොයාගෙන ඉස්සරහට ගියාම තමයි මේ වාගේ කාරණා ගොඩක් අපට දැනගන්න ලැබෙන්නේ. එතකොට ඔබතුමන්ලාට වැඩේ කරන්න ලෙහෙසියි. එහෙම නැතුව ගල් පිළිම වාගේ ඉන්න 159 අයින් කරලා අපි ඔය පැත්තේ වාඩිවෙන්නද? නැහැ. අපි වාඩිවෙන්නේ නැහැ. සමහරු අපෙන් අහනවා, මේ ආණ්ඩුවට මොකද වෙන්නේ කියලා. මම කිව්වා, පිස්සුද යකෝ, ආණ්ඩු පක්ෂයේ 159ක් ඉන්නවා නේ කියලා. හැබැයි, ඒක ප්‍රායෝගිකව කියන්න බැහැ. අපි ප්‍රායෝගිකව මේ මහ පොළොවේ දේශපාලනය කරන්න දන්නා මිනිසුන් හැටියට ඒක කියන්නේත් නැහැ. කිව්වොත්, අපට ඔළුවේ අමාරුවක් තිබෙනවාද අහවි. එහෙම නොවෙයි. මිනිසුන් පාරට බහින එක අඩු කර ගන්න අවශ්‍යයි, පෙට්‍රල් ෂෙඩ් ගානේ පෝලිමේ ඉන්න එක අඩු කර ගන්න අවශ්‍යයි. එහෙම නැතුව පෙට්‍රල් ෂෙඩ් එකක් ළඟට ඔබතුමන්ලා දෙදෙනෙක් දාලා මාධ්‍යකාරයන්ට බණිනවා. මාධ්‍යකාරයන්ට බැණලා වැඩක් නැහැ.

දැන් අපේ අධිකරණ ඇමතිතුමා කිව්වා, මිනිස්සු හැම දාම TV එකේ බලන ප්‍රවෘත්ති ගැන. ඒ ප්‍රවෘත්ති තමයි මිනිස්සු බලන්නේ. අපි කියන දේවල් නොවෙයි අහන්නේ. රාත්‍රි 7.00ට ඒ ප්‍රවෘත්ති තමයි මිනිස්සු බලන්නේ. හවස 6.55ට ඒ ප්‍රවෘත්ති තමයි මිනිස්සු බලන්නේ. අන්න ඒවා ගැන පොඩ්ඩක් හොඳට හොයලා බලන්න. අපට තෙල් ටැංකි නැහැ කියලා නිකම් ඉන්න බැහැ. අපි දන්නවා, ජනාධිපතිතුමාට තෙල් ළිං නැහැ කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chamara Sampath Dasanayake, your time is up.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ජනාධිපතිතුමාට කොහේද තඹුත්තේගම, ආඬියාගල තෙල් තිබුණේ? එතුමාට හේන්, කුඹුරු නම් තිබෙනවා. අපි දන්නවා, ජනාධිපතිතුමාට තෙල් ළිං නැහැ කියලා. හැබැයි, දැන් එහෙම කියන්න බැහැ නේ. බැඳගත්තා නම් බෙරේ ගහන්න ඕනෑ. පුතාලා, බැඳගත්තා නම් දැන් බෙරේ ගහන්න. දැන් පුතාලාට තමයි අවස්ථාව ඇවිල්ලා තිබෙන්නේ. දැන් තෙල්, ගෑස්, කෑම, බීම ඔය සියල්ල ඔබතුමන්ලා දෙන්න ඕනෑ. ඔබතුමන්ලා බලය ගත්තේ බෙරේ ගහනවා කියලා නේ. දැන් ගහන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බෙරේ ගහනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ආ, ගහනවාද? හොඳයි. එහෙම නම් ගහන්න.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙනුවෙන් ගෙනාපු මේ යෝජනාවට අපි විරුද්ධ වෙන්නේ නැහැ. මම හිරේ දාන්න කටයුතු කළා කියලාවත් කොමිෂන් සභාව වෙනුවෙන් ගෙනාපු මේ යෝජනාවට මම විරුද්ධ වෙන්නේ නැහැ. *[බාධා කිරීම්]* ඔය කෑ ගැහුවාට මගේ කට අඩ්ඩවා යන්න ඔබතුමන්ලාට කොහෙත්ම බැහැ. Mike එක off කරලා කථා කරමුද? ඔබතුමන්ලා කථා කරන සද්දෙ එළියට එන්නේ නැහැ, මගේ සද්දෙ එනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙනුවෙන් ගෙනාපු මේ යෝජනාවට අපි විරුද්ධ නැහැ. හැබැයි, මට එක විධියක් සහ "ගල්අඟුරුට" තව විධියක් ලෙස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට කටයුතු කරන්න බැහැ. ඒක එකක් වෙන්න ඕනෑ.

සියලුදෙනාට ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු යූ.පී. අබේවික්‍රම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දිනයේදී දූෂණ විරෝධී පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි තීරණය කිරීම අනුමත කිරීම සම්බන්ධයෙන් වන විවාදයේදී බොහෝ මන්ත්‍රීවරුන් මේ කටයුත්ත අගය කරලා අදහස් දක්වමින් කථා කරනවා අපි දැක්කා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තියට අපි අත්සන් කළේ 2004 වාගේ කාලයක. එතැන් පටන් අවුරුදු 19කට වැඩි කාලයක් මේ වනකොට ගත වෙලා තිබෙනවා. 1994 අවුරුද්දේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිහිටුවා මේ වනකොට අවුරුදු 29කට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. කොහොම වුණත්, මේ නීතිරීති අපේ රටේ ක්‍රියාත්මක වුණාට ඒ නීති බලාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන ව්‍යුහයන් සකස් කිරීම සඳහා වූ සංස්කෘතියක් පැවතුණේ නැහැ. විශේෂයෙන්ම මේ රට පාලනය කරපු පාලකයන් මේ නීතිරීති පොතට, නැත්නම් නමට සීමා කරමින්, ඔවුන්ට රිසි සේ කටයුතු කිරීම නිසා මේ ආයතනවලට, නැත්නම් මේ පරිපාලන ව්‍යුහයන්වලට, මේ නීතිරීතිවලට ඇත්තටම වැදගත්කමක් තිබුණේ නැහැ. මේ රටට අවශ්‍ය කරන ප්‍රඥප්ති, නීති, රෙගුලාසි යුගයෙන් යුගය, කාලයෙන් කාලය පනවා තිබුණත් ඒවා ක්‍රියාත්මක කරන්න ඒ හිටපු පාලකයන් අවශ්‍ය මඟ පෙන්වීම, අවශ්‍ය කරන ව්‍යුහයන් සහ පරිපාලන තත්ත්වයන් නිර්මාණය කළේ නැහැ.

මේ රටේ වාසනාවට 2024 සැප්තැම්බර් 21වැනි දා පරිවර්තනීය යුගයක්, නව ලක්ෂ්‍යයක්, පාලනයේ නව සන්ධිස්ථානයක් ලකුණු කරමින් තමයි අපේ රජය බලයට පත් වුණේ. ජාතික ජන බලවේගය හැටියට අප ඉදිරිපත් කළ අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළින් මේ රටේ දූෂණය, නාස්තිය, වංචාව, හොරකම සහ අල්ලස තුරන් කරන බවට මේ රටේ ජනතාවට පොරොන්දු වුණා. අපේ රජය බලයට පත් වුණාට පසුව ඒ අනුව කටයුතු කරමින්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ශක්තිමත් කිරීම සඳහා සේවකයන් බඳවා ගැනීමට තිබුණු බාධා ඉවත් කරලා, අවශ්‍ය කරන කාර්ය මණ්ඩල බඳවා ගැනීමට සහ ඔවුන් දිරිගැන්වීමට අවශ්‍ය කරන වැටුප් හා දීමනා ලබා දීම සඳහා ඕනෑ කරන නීතිරීති සම්මත කිරීමට කටයුතු කරන මේ අවස්ථාව අපේ රටේ ඉතා වැදගත් අවස්ථාවක් හැටියට මම සලකනවා.

විශේෂයෙන්ම මේ ආයතනයට 971ක වාගේ කාර්ය මණ්ඩලයක් අවශ්‍ය කරන්නේ ඇයි කියලා මම කියන්න ඕනෑ. මේක දැනට ඉතාම ස්වාධීනව කටයුතු කරන ආයතනයක්. අපේ ආණ්ඩුව බලයට පත් වෙලා පසුගිය වසරක කාලය තුළ තමයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවක් මේ රටේ තිබෙනවා, මේ තරම් සක්‍රියව කටයුතු කරන්න පුළුවන් නීතියක් මේ රටේ පනවා තිබෙනවාය කියලා මේ රටේ ජනතාවට දැනගන්න ලැබෙන්නේ. විශේෂයෙන්ම පසුගිය කාලයේ පත් කරනු ලැබූ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළු කණ්ඩායමට තමන්ට බලාත්මක කරලා තිබුණු නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන කාර්ය මණ්ඩල, ඒ සඳහා අවශ්‍ය කරන පහසුකම් නොතිබීම නිසා ඒවා අක්‍රිය තත්ත්වයක පැවතුණා. විශේෂයෙන්ම නඩු ගොනු 4,000ක වාගේ ප්‍රමාණයක් විමර්ශනය කිරීම සඳහා ඉතා කුඩා කාර්ය මණ්ඩලයක්, කුඩා විමර්ශකයන් ප්‍රමාණයක් තමයි ඔවුන් සතුව තිබියේ. ඒ සඳහා විවිධ හේතු බලපෑවා. විශේෂයෙන්ම 2022දී රට තුළ ඇති වුණු මූල්‍යමය සහ පරිපාලනමය බිඳ වැටීමත් එක්ක රාජ්‍ය සේවයට බඳවා ගැනීම් නවත්වා තිබුණා. වැටුප් වැඩි කිරීමට රජය සතුව මුදල් තිබුණේ නැහැ. නමුත්, අපි බලයට පත් වෙලා අවුරුදු එකහමාරක් ඇතුළත ආර්ථිකය ස්ථාවරභාවයට පත් කරලා, රජයේ පරිපාලන ව්‍යුහයන් යථා තත්ත්වයට පත් කරලා, මේ රට යථා තත්ත්වයට පත් කරමින් ඉන්න මොහොතක තමයි අද දිනයේදී දූෂණ විරෝධී පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි තීරණය කිරීම සඳහා වූ විවාදය පවත්වන්නේ. අද අපි මෙය අනුමත කිරීමත් සමඟ දැනටමත් ඉතා සක්‍රියව ක්‍රියාත්මක වන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිළිබඳව මේ රටේ ජනතාවට විශ්වාස කරන්න පුළුවන් ස්වාධීනත්වයක් ලබා දෙනවා. මෙතෙක් මේ ආයතන පිළිබඳව රටේ ජනතාව තුළ තිබුණු අවිශ්වාසය දුරු කරන්න රජයක් හැටියට අපි සමත් වෙලා තිබෙනවා. නීතියේ පාලනය ස්ථාපිත කරන්න අපි සමත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ බලශක්ති ඇමතිතුමා සම්බන්ධයෙන් කලින් චෝදනා මතු කළා. ඒගොල්ලන් පවත්වා ගෙන ආපු දූෂණ හා වංචා සහිත සංස්කෘතිය තුළට අපේ ආණ්ඩුවත් ඇදා ගනිමින්, අපිත් ඒ ආකාරයෙන්ම කටයුතු කරන බව පෙන්වීම සඳහා තමයි ඔවුන් විශාල වශයෙන් උත්සාහ දරන්නේ. ඒ පාලකයන් කටයුතු කරපු විධියටම අපිත් ක්‍රියාත්මක වෙනවා, දූෂණයන්ට සහ වංචාවන්ට අපිත් සම්බන්ධයි කියලා ජනතාව තුළ මතයක් තහවුරු කිරීම තමයි ඔවුන්ගේ උපාය මාර්ගය සහ අපේක්ෂාව වෙලා තිබෙන්නේ. නමුත්, අපේ ආණ්ඩුව යටතේ ජනාධිපතිවරයා, අමාත්‍ය මණ්ඩලය සහ මන්ත්‍රීවරු ඇතුළු දේශපාලනඥයන් කිසි කෙනෙකුට එරෙහිව එවැනි චෝදනා තිබෙන බව ඔප්පු කරන්න ඔවුන් අසමත් වෙලා තිබෙනවා.

බලශක්ති අමාත්‍යවරයා රජයේ සේවකයෙක්ව සිටි කාලයේදී - මීට අවුරුදු 10කට, 11කට කලින් - එතුමා අතින් සිදු වූ අතපසුවීමක් සම්බන්ධයෙන් වූ චෝදනාවකට අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව චෝදනා ගොනු වීම තුළින්ම පෙන්නුම් කරන්නේ අපි රජයක් හැටියට මේ ආයතනවල ස්වාධීනත්වයට සහ ක්‍රියාකාරිත්වයට කොයි තරම් නිදහසක් ලබා දීලා තිබෙනවාද කියන එකයි. අපි ඒ කාලයේ මේ ආයතනවලට බලපෑම් කළා, ඇමතිවරු, මන්ත්‍රීවරු, දේශපාලනඥයන් කරපු දූෂණ, වංචා හා අපරාධවලින් ඔවුන් බේරා ගත්තා ආදී වශයෙන් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රසිද්ධ ප්‍රකාශ ඉදිරිපත් කරමින් පාපොච්චාරණය කළ ආකාරය මට මතකයි. අපේ දේශපාලන ව්‍යාපාරයට, නැත්නම් අපේ ආණ්ඩුවට එහෙම චෝදනා කරන්න බැරි තත්ත්වයක් තිබියදීත් ඔවුන් උත්සාහ කරනවා, අපි හොරු තමයි, ඒ වුණාට ඒගොල්ලනුත් හොරු කියලා වාගේ මතයක් ජනතාව අතරට ගෙනියන්න. එවැනි අදහසක් ජනතාව අතරට ගෙන යන්න තමයි ඔවුන් උත්සාහ කරන්නේ. නමුත්, ඒක සාර්ථක වෙන්නේ නැහැ. ඉතිහාසය පුරාම අපේ මේ දේශපාලන ව්‍යාපාරයේ කැප කිරීම් කරපු, වැඩ කරපු හැම කෙනෙක්ම පෙන්වා තිබෙනවා, මේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් සහ දේපළ ආරක්ෂා කරන්න ඕනෑය කියන එක. මේ රටේ ජනතාව වෙනුවෙන්ම නිර්මාණය වුණු දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි මේ රටේ ජනතාවගේ දේපළ සාංඝික දේපළ වාගේ ආරක්ෂා කරන දේශපාලන ව්‍යාපාරයක්. ඒ නිසා මේ වාගේ දූෂණ, වංචා, අපරාධවලට සම්බන්ධ වුණු තැනැත්තන් ඉතිහාසයේ කවර තත්ත්වයන් යටතේ නිදහස් වෙලා හිටියත්, ඔවුන් බේරිලා හිටියත් මේ ආණ්ඩුව යටතේ - අපේ පාලනය යටතේ - ඔවුන්ට ගැලවීමක් නැහැ කියන එක දැන් ඔප්පු වෙමින් පවතිනවා. ඒ නිසා ඔවුන් විවිධ උත්සාහයන් දරමින්, විවිධ චෝදනා ඉදිරිපත් කරමින් මේ තත්ත්වයන් සාමාන්‍ය තත්ත්වයක් බවට පරිවර්තනය කරන්න උත්සාහ කළාට මේ රටේ ජනතාව ඔවුන් කියන බොරු

පිළිගන්නේ නැහැ කියලා අපි විශ්වාස කරනවා. අපේ ආණ්ඩුවත් සමඟ එකතු වෙලා ඉදිරි කාලය තුළදී මේ රට යථා තත්ත්වයට පත් කරන්න ඔබතුමන්ලා කටයුතු කරන්න.

දැන් මේ මතු වෙලා තිබෙන යුද තත්ත්වය අපිට පාලනය කළ නොහැකියි. මැද පෙරදිග මතු වෙලා තිබෙන යුද්මය වාතාවරණය ලෝකයේ සියලු දෙනාටම මුහුණ දෙන්න සිදු වෙලා තිබෙන තත්ත්වයක්. එය අපිට විතරක් ආවේණික තත්ත්වයක් නොවෙයි. අපි මේ වනකොට අපේ රට ස්ථාවර කරලා තිබෙනවා. ජාත්‍යන්තර වශයෙන් ඇති වෙලා තිබෙන යුද තත්ත්වය යම්තාක් දුරකට පහව යන තත්ත්වය යටතේ අපිට මේ රට ඉතාම හොඳ, ස්ථාවර රටක් බවට පරිවර්තනය කිරීමේ දිශාවට ගෙනියන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.09]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු අගමැතිතුමියගෙන් අපිට අහන්න ලැබුණා, වලනය වෙනවා ලු, හොඳින් නිරීක්ෂණය කරගෙන ඉන්නවා ලු, කළමනාකරණය කරනවා ලු, පිට යුද්ධයක් නිසා පාලනය කරන්න බැරි ලු කියන කථා.

ඇත්තවශයෙන්ම කිව්වොත්, අපේ රට මහා භයංකාර අභියෝග රැසකට මුහුණ දෙන මේ මොහොතේ අඩුම ගණනේ ජනාධිපතිවරයා හෝ අගමැතිවරිය පාර්ලිමේන්තුවට, රටේ ජනතාවට මේ ඇති වී තිබෙන අර්බුදයට මුහුණ දෙන ආකාරය පිළිබඳව ප්‍රකාශයක් කරන්න තිබුණා. නමුත්, ඒ දේ ඉෂ්ට වුණේ නැහැ. දැන් අපට කියනවා, "මේවා එකපාරටම ඇති වන යුද ගිනි. කොහොමද මේවාට සූදානම් වෙන්නේ?" කියලා. මම මතක් කරලා දෙන්න කැමැතියි, ඇමෙරිකාවත්, ඊශ්‍රායලයත් එකට එකතු වෙලා ඉරානයට ගැහුවේ 2025 ජූනි මාසයේ බව. ඒ කියන්නේ, ගිය අවුරුද්දේ. ඉතින්, සූදානම් වෙන්න තිබුණා නේ. ක්‍රමෝපායික සැලසුම් - strategic plans - හදන්න තිබුණා. මේ රජයට කිසිම scenario planning එකක් නැහැ. ඒක බොහොම පැහැදිලියි, "දිට්වා" සුළි කුණාටුව අවස්ථාවේ ක්‍රියා කළ ආකාරයෙන්. අද ක්‍රියාත්මක කරන්නේ, මර නින්දේ ඉඳලා මහා භයානක හීනයක් දැකලා එක පාරටම නැගිටලා ගන්න තීන්දු. දැන් ගත්තා නේ තීන්දුවක්, හෙට පාර්ලිමේන්තුව රැස් නොකරන්න. රට මෙච්චර බරපතළ තත්ත්වයකට මුහුණ දෙන මොහොතක එවැනි තීන්දුවක් ගත්තා. අනෙක් ආයතන පිළිබඳව අපට ගැටලුවක් නැහැ. මේ සාකච්ඡාව නතර කරන්න, මේ අදහස් ඉදිරිපත් කිරීම හා අදහස් හුවමාරුව නතර කරන්න ගත්ත තීන්දුව තමයි, හෙට පාර්ලිමේන්තුව වහනවා කියන එක.

මීට පෙර පාර්ලිමේන්තු සැසිවාරයේදී අපි පැහැදිලිව කිව්වා, හෝමුස් සමුද්‍ර සන්ධිය - Strait of Hormuz - වැසීම තුළ අපේ රටට අභියෝග එල්ල වනවා කියලා. කරුණාකර මේකට පිළියම් යොදන්න; මොකක් හෝ වැඩසටහනක් පටන්ගන්න; සැලසුම් හදන්න; සාකච්ඡා කරන්න; විකල්ප ක්‍රමවේද හදන්න කියලා කිව්වා. දැන් මම මේ වාර්තාවෙන් කියන්නේ, විජිත ඇමතිතුමා දුන් උත්තරය. "හෝමුස් සමුද්‍ර සන්ධිය හරහා ඇති වන බාධාව ගැන කිව්වොත්, ඇත්තටම හෝමුස් සමුද්‍ර සන්ධිය වැසීම අපේ තෙල් ආනයනයට බාධාවක් නොවෙයි" කිව්වා. ඔන්න, රජය හිතන තාලය. "මොකද, දැනටමත් ඒ හරහා අපේ තෙල් ආනයනය කිරීම් වෙන්නේ නැහැ. තෙල් නිෂ්පාදනය හා ප්‍රවාහනයේදී ඒ කලාපයට යම් බාධාවක් වෙන්න පුළුවන්. නමුත් ඒ හරහා නොවෙයි, අපේ ලංකාවට තෙල් ගෙන්වන්නේ" කියා එතුමා කිව්වා. මේ, විදේශ ඇමතිතුමා කියන්නේ. එතුමා නැවතත් වරක් කියනවා, "හෝමුස් සමුද්‍ර සන්ධිය වැසීම කියන එක බාධාවක් වෙන්නේ නැහැ. දැනටත් එහෙම නැතුව තමයි අපි තෙල් ගෙන්වන්නේ" කියලා. දැනුත් කියනවාද, හෝමුස් සමුද්‍ර සන්ධිය වැසී යාම අපේ රටට බලපෑමක් නොවෙයි කියලා?

අපි ඒ පාර්ලිමේන්තු සතියේම කිව්වා, ඇමෙරිකා එක්සත් ජනපදය රුසියාවට දමා තිබෙන සම්බාධක - තෙල් පිළිබඳ සම්බාධක - දින 30කට ඉවත් කරනවාය කියලා. අපි කිව්වා, ඉක්මනින්ම රුසියාව එක්ක සාකච්ඡා කරලා අපේ රටට අවශ්‍ය කරන තෙල් ටික ලබා ගන්න කියලා; Forward purchase agreementsවලට - ඉදිරි ගිවිසුම්වලට- යන්න කියලා. ඒවා තඹ සතයකට ගණන් ගත්තේ නැහැ. මෙන්න, සතියක් විතර ගියායින් පස්සේ අපි දකිනවා, විදේශ අමාත්‍යවරයා රුසියානු තානාපතිවරයාව හමු වෙනවා. ඇයි, මේ හොඳ යෝජනා භාර ගන්නට බැරි? ඇයි, මේ ඇත්ත කථා කරනකොට ඒවා නොසලකා හරින්නේ? ඒකට හේතුව තමයි මේ රජයේ තිබෙන උද්ධච්චකම. හොඳට මතක තබාගන්න, උද්ධච්ච රාජ්‍ය පාලනයකට වැඩි ආයුෂ නැහැ.

දැන් බලන්න, අද විදුලිබල ඇමතිවරයාගෙන් අපි ප්‍රශ්නයක් ඇහුවා. එතුමා මොකක්ද කිව්වේ? "මේ උද්ගත වෙලා තිබෙන්නේ බාහිර ප්‍රශ්නයක්. මේ බාහිර ප්‍රශ්නය ලෝකයේ හැම රටකටම පාහේ බලපානවා. ඒ නිසා අපේ රටේ විදුලි සුරක්ෂිතභාවයට, බලශක්ති සුරක්ෂිතභාවයට ප්‍රශ්න එල්ල වෙනවා වාගේම අනෙක් රටවලටත් එහෙම එල්ල වෙනවා" කිව්වා. ඔන්න, එතුමා දුන් උත්තරය. මම අහන්න කැමැතියි එතුමාගෙන්, නොරොච්චෝලේ බලාගාරයට ගල් අඟුරු ඇණවුම් කළේ ඩොනල්ඩ් ට්‍රම්ප් ද, ඒවා ඇණවුම් කළේ බෙන්ජමින් නෙතන්යාහු ද, ඉරානයේ හිටපු රාජ්‍ය නායක කමේනි ද කියලා.

මම කියන්නම්, බාල ගල් අඟුරු ගෙන්වීම සම්බන්ධයෙන් 13වෙනි දා සිට තිබෙන වාර්තාව. පසුගිය 13වෙනි දා මෙගාවොට් 130ක් අඩුයි; 14වෙනි දා මෙගාවොට් 135ක් අඩුයි. 15වෙනි දා මෙගාවොට් 132ක් අඩුයි. 16වෙනි දා මෙගාවොට් 148ක් අඩුයි. මේ මෙගාවොට් ප්‍රමාණය නැවත උත්පාදනය කරන්නට නම්, ඒ හිඟය පුරවන්නට නම්, අනිවාර්යයෙන්ම ඩීසල් බලාගාර භාවිතයේ යොදවන්න සිද්ධ වෙනවා. ඒ ඩීසල් බලාගාරවලට ඉන්ධන යොදවන කොට අපේ රටේ පාරිභෝගිකයන්ට, කර්මාන්තකරුවන්ට, ව්‍යවසායකයන්ට, රටේ ජනතාවට අවශ්‍ය තෙල් හිඟය තවත් උග්‍ර වෙනවා. මතක තියා ගන්න, අපි මේ පෙන්වන්න හදන්නේ බාල ගල් අඟුරු ගෙන්වීම තුළ ඇති වෙන බරපතළ ප්‍රශ්නය ගැන.

බලන්න, PUCSL වාර්තාව. මේ PUCSL වාර්තාවේ බොහොම පැහැදිලිව කියනවා, ගල් අඟුරු බලාගාරයේ මේ අඩු ජනනය නිසා අප්‍රේල්, ජූනි, ජූලි කියන මාස තුනේ peak time එකේ, ඒ කියන්නේ විදුලිය අවශ්‍යතාව උච්චතම අවස්ථාවේ විදුලි කප්පාදුවකට යන්න සිද්ධ වෙන බව. ඒ මොකද, ගල් අඟුරු බලාගාරයේ පළමු ඒකකයයි, දෙවැනි ඒකකයයි වෙන වෙනම දින 25කට වහනවා, නඩත්තුවට. Kerawalapitiya West Coast Power Plant එකත් වහනවා, යම් කාලයකට. කැලණිතිස්ස

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

බලාගාර දෙකක් වහනවා, යම් කාලයකට. එතකොට මේ විදුලිය කප්පාදුව සිද්ධ වෙන්නේ මැද පෙරදිග යුද්ධය නිසා නොවෙයි. බාල ගල් අඟුරු යෙදවීම තුළයි කියන එක අද රටෙන්ම වසන් කරන විධියට තමයි විදුලිබල ඇමතිවරයා උත්තර දුන්නේ. මහා ලොකුවට කියනවා, ඔව්, මේ යුද්ධය පටන් ගත්තේ අද ඊයේ නොවෙයි ලු. ඉරානය සහ ඉරාකය අතර යුද්ධය තිබුණා ලු. මම එතුමාට මතක් කරන්න කැමැතියි, මේ රටේ යුද්ධ දෙකක්, -උතුරේ ත්‍රස්තවාදය සහ දකුණේ භීෂණය- යනකොට කුවේට් රට ආක්‍රමණය කළා, ඉරාකය. ඒ, පළමුවෙනි ගල්ෆ් යුද්ධය එදා ක්‍රියාත්මක වුණේ. අපේ රටට මහා අභියෝග තුනකට එකවර මුහුණ දෙන්න සිද්ධ වුණා. නමුත් ඒ අවස්ථාවේ ඒ තත්ත්වය හොඳට කළමනාකරණය කළා. 1990දී තෙල්වල හිඟයක් ඇති වුණේ නැහැ. සුබසාධනයේ අඩුවක් වුණේ නැහැ. නිල ඇඳුම් දුන්නා, දිවා ආහාර දුන්නා, ජනසවිය දුන්නා. ඇඟලුම් කම්හලුත් 200ක් ආරම්භ කළා. ඒ ඔක්කෝම වුණා. උතුරේ ත්‍රස්තවාදය, දකුණේ භීෂණය, කුවේට්-ඉරාක යුද්ධය - පළමු ගල්ෆ් යුද්ධය - මේ ඔක්කෝම තිබුණා. නමුත් එදා තිබුණු කළමනාකරණය අද පෙනෙන්නවත් තියෙනවාද කියන එක මම අහන්න කැමැතියි. අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද විදුලිබල ඇමතිවරයාට, තෙල් සංස්ථාව භාර ඇමතිවරයාට QR කේතය, QR code එකවත් හරියට නිකුත් කර ගන්නට බැහැ. තිබුණු වාහන විකුණපු අය කොහොමද ඒ QR code එක ගන්නේ? අද පාරිභෝගික ජනතාව අසරණ වෙලා ඉන්නවා. දස දහස් ගණනකට, ලක්ෂ ගණනකට QR කේතය නැහැ. ඒක ගැන ප්‍රශ්නය ඇහුවාම ඒවාට උත්තරත් නැහැ. ඒවාට උත්තර දෙන්නෙත් නැහැ. ඒවා පිළිබඳව ප්‍රශ්න අහන්න දෙන්නෙත් නැහැ, මූලාසනයේ කථානායකතුමා. ඔන්න! මේ වාගේ අවදානම් තත්ත්වයකදී මේ පාර්ලිමේන්තුව ක්‍රියාත්මක වෙන ආකාරය.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මොහොතකට හිතන්න, බස් රථයකට සතියකට ඉන්ධන ලීටර් 60ක් ඇතිද? මෝටර් සයිකලයකට ලීටර් 5යි; වෑන් රථයකට ලීටර් 40යි; මෝටර් රථයකට ලීටර් 15යි; මෝටර් ලොරිවලට ලීටර් 200යි; ඉඩම් වාහනවලට ලීටර් 25යි; මෝටර් ත්‍රිරෝද රථයකට ලීටර් 15යි; විශේෂ කාර්ය වාහන සඳහා ලීටර් 40යි. එහෙම නේ, දෙන්නේ.

ඒ වාගේම මම අහන්න කැමැතියි, මේකෙන් අපේ රටේ ගොවි ජනතාවට අත්පත් වෙන ඉරණම මොකක්ද කියන එක. අද QR කේතය හරියාකාරව, ප්‍රමාණාත්මකව නිකුත් නොකිරීම තුළ ධීවර ජනතාවට, ස්වයං රැකියාලාභීන්ට, වෘත්තීයවේදීන්ට, ව්‍යවසායකයින්ට, කර්මාන්තකරුවන්ට, අත්‍යවශ්‍ය සේවාවල යෙදී ඉන්න අයට, අපනයනකරුවන්ට, වාහන හිමිකරුවන්ට - මුළු සමාජයටම - බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඇත්තටම මොකක්ද කළ යුත්තේ? කළ යුත්තේ ජනාධිපතිවරණ සමයේ, මහ මැතිවරණ සමයේ ඔබ සියලුදෙනා රටට දුන්නු පොරොන්දු ඉෂ්ට කිරීමයි. වරායේ ගොඩ බාන මිලට තෙල් ටික දෙනවා කිව්වා. ඉතින් අපි කියනවා, ඒ කියපු ආකාරයට තෙල් මත අය කරන එකතු කළ අගය මත බද්ද, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද, නිෂ්පාදන බද්ද, රේගු ආනයන බද්ද, විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ආදිය දැන් ඉවත් කරන්න කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමියත් මේ පාර්ලිමේන්තුවට ප්‍රවේශ වුණේ ඔය පොරොන්දු දීලා ලබා ගත් වරම තුළින්. මේ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් 159 දෙනාම පාර්ලිමේන්තුවට ආවේ වරායට ගොඩ බාන මිලට මේ රටේ පාරිභෝගිකයාට ඉන්ධන ලබා දෙනවා කියලායි. ඒ නිසා ඔබතුමිය ඇතුළු මේ 159දෙනාම ඒ ලබා ගත්තු ජන වරම උල්ලංඝනය කරන්න එපා; කෙලෙසන්න එපා. අවසාන වශයෙන් මා කියන්න කැමැතියි, ඔබතුමන්ලා එදා ජනතාවත් එක්ක ඇති කර ගත්තු සමාජ ගිවිසුම ක්‍රියාත්මක කරන්න කියලා.

හෙට දිනයේ පාර්ලිමේන්තුව වසා දැමීම තුළ, රටේ ජනතාව මුහුණ දෙන ප්‍රශ්න ගැන කථා කරන්න තිබෙන අවස්ථාව අහිමි කරලා, ඒ ජනතා හඬ නිහඬ කරන්නටයි ඔබතුමන්ලා උත්සාහ කරන්නේ. අපි පැහැදිලිව කියනවා, අපේ රටේ ලක්ෂ 220ක් වූ ජනතාව වෙනුවෙන් ජනතාවගේ පැත්තෙන් ගන්නා නිසි විසඳුම්වලට අපි අත ඔසවන්න ලෑස්ති බව. හැබැයි, බාල ගල් අඟුරු යොදලා මේ රටේ බලශක්ති ක්ෂේත්‍රය අනාරක්ෂිතභාවයට පත් කිරීමට විරුද්ධව අප ජනතාවත් සමඟ පාරට බහිනවා කියන එකත් මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ප්‍රියන්ත විජේරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.22]

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අල්ලස, දූෂණය කියන්නේ රටක රාජ්‍ය සේවයේ පැවැත්මට, ගුණාත්මකභාවයට එල්ල කරන්න පුළුවන් ප්‍රබල තර්ජනයක්. ඒ වාගේම, මේ තර්ජනය මුදල් අවභාවිතයට පමණක් සීමා වෙන්නේ නැහැ. ඒක සමස්ත පද්ධතියේම අඩපණ වීමට හේතුවක් බවට පත් වෙනවා. අල්ලස, දූෂණය නිසා රාජ්‍ය සේවයට සිදු වන ප්‍රධාන බලපෑම් කිහිපයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඉන් ප්‍රධාන කාරණය තමයි, රටක රාජ්‍ය සේවය සම්බන්ධයෙන් වන මහජන විශ්වාසය බිඳ වැටීම. රාජ්‍ය ආයතනයකට ගිහිල්ලා තමන්ගේ යම් කාර්යයක් ඉෂ්ට කර ගන්න අවශ්‍ය වන විට ඒ වෙනුවෙන් අල්ලස් දෙන්න සිද්ධ වෙනවා නම් මිනිස්සු ඒ රටේ රාජ්‍ය සේවය සම්බන්ධයෙන් විශ්වාස කරන්නේ නැති වෙනවා. ඒක පසුගිය ආණ්ඩුවලට අත් විඳින්න සිද්ධ වුණා. ඒ කාලයේ අල්ලස, දූෂණය ඉහවහා ගියා. රාජ්‍ය සේවය තුළින් යම් ක්‍රියාවක් කර ගන්න ගියාට පසුව අල්ලස් නොදී ඉන්න බැරි වුණා. ඒ නිසා රාජ්‍ය සේවය සම්බන්ධයෙන් ජනතාවගේ විශ්වාසය බිඳ වැටෙනවාත් සමඟම රජය සහ ජනතාව අතර තිබෙන පරතරය පුළුල් වුණා. මේකත් පසුගිය රජයවලට අහිතකර බලපෑමක් එල්ල කළා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අල්ලස හා දූෂණය නිසා සිද්ධ වන තවත් බලපෑමක් තමයි, රාජ්‍ය සේවයේ ගුණාත්මකභාවය පිරිහීම සහ කාර්යක්ෂමතාව පිරිහීම. රාජ්‍ය සේවයේ වැඩ කරන්නේ අල්ලස් ගනිමින් නම්, ඒ රාජ්‍ය සේවයේ ගුණාත්මකභාවය පිරිහෙනවා. යම් කාර්යයක් ඉෂ්ට කරද්දී ඒකට අදාළ ප්‍රමුඛතාව දෙන්න ඕනෑ. හැබැයි, ඒ ප්‍රමුඛතාව ඉක්මවා ගිහිල්ලා අල්ලස, දූෂණය ඉස්සරහට එන නිසා අල්ලස් දෙන්න පුළුවන් අයගේ කාර්යය ඉක්මන් වෙනවා; අල්ලස් දෙන්න බැරි අයගේ කාර්යය පස්සට යනවා. මේකෙන් රාජ්‍ය සේවයේ ගුණාත්මකභාවය පිරිහෙනවා වාගේම ප්‍රතිලාභීන් ද අසාධාරණයට ලක් වෙනවා. සල්ලි දෙන්න පුළුවන් නම් ඉක්මනින් වැඩ කර ගන්න පුළුවන් වෙනවා; සල්ලි දෙන්න බැරි නම් වැඩේ කර ගන්න බැරි වෙනවා. ඒ වාගේම, රාජ්‍ය සේවය තුළ සිටින දක්ෂයින් අධෛර්යට පත් වෙන්නත් මේ කියන අල්ලස, දූෂණය කියන කාරණය බලපෑමක් ඇති කරනවා. විශේෂයෙන්ම රාජ්‍ය සේවය තුළ උසස්වීම් ලැබෙන්නේ දූෂිත ක්‍රමවලට නම්, වරප්‍රසාද ලැබෙන්නේ දූෂිත ක්‍රමවේද හරහා නම්, දේශපාලන මැදිහත්වීම්

හරහා නම්, දක්ෂ, කාර්යක්ෂම නිලධාරින් අධෛර්යයට පත් වෙනවා. ඒ විතරක් නොවෙයි, ඔවුන් උදාසීනභාවයට පත් වෙන්නත් අල්ලස, දූෂණය බලපානවා.

ඒ වාගේම අල්ලස සහ දූෂණය හේතුවෙන් ප්‍රධාන වශයෙන් බලපෑමක් කරන අංශයක් තමයි ආර්ථිකය. අල්ලස සහ දූෂණය හේතුවෙන් ආර්ථික හානියක් සිදු වෙනවා. රාජ්‍ය සේවයේ යම් ව්‍යාපෘතියක් සඳහා යොදවන මුදල්වලින් කොටසක් දූෂණය නිසා අවභාවිතයට ලක් වෙනවා නම්, අදාළ ව්‍යාපෘතියට යොදවන්න පුළුවන් මුළු මුදලම යොදවා ගන්න බැරි වෙනවා. මේ නිසා අදාළ ව්‍යාපෘතියේ ප්‍රමිතිය පරිහානියට ලක් වෙනවා. විශේෂයෙන්ම විදේශ ආයෝජකයන් යම් රටක ආයෝජනයක් කරද්දී සලකා බලන ප්‍රධාන කාරණයක් තමයි ඒ රට තුළ අල්ලස, දූෂණය සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය. පසුගිය කාලයේ අපේ රටත් ඒ තත්ත්වයට මුහුණ දුන්නා. ඒ නිසා ආපු විදේශ ආයෝජකයන් පවා හැරිලා ගියා, එන්න හිටපු අයත් එන්නේ නැතිව නතර වුණා.

ඊළඟට සිදු වන ප්‍රධානම හානිය තමයි නීතියේ ආධිපත්‍යය බිඳ වැටීම. අල්ලස, දූෂණය ක්‍රියාත්මක වන රටක නීතියේ ආධිපත්‍යය බිඳ වැටෙනවා. සල්ලි තිබෙනවා නම් ඕනෑ දෙයක් කර ගන්න පුළුවන් කියන වැරදි මතය සමාජගත වීම තුළ මිනිස්සු නීතියේ ආධිපත්‍යය පිළිබඳව විශ්වාස කරන්නේ නැති වෙනවා. විශේෂයෙන්ම නීතිය ක්‍රියාත්මක කරන ආයතන, යුක්තිය පසිඳලන ආයතන තුළ අල්ලස, දූෂණය ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් විධියට නීතියේ ආධිපත්‍යය බිඳ වැටෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ අනුව අල්ලස, දූෂණය කියලා කියන්නේ ශරීරය තුළ වැඩෙමින් අදාළ ශරීරය මරා දමන පිළිකාවක් වාගේ දෙයක්.

යම් රටකින් අල්ලස, දූෂණය නැති කරන්න නම් ප්‍රධාන ක්‍රම දෙකක් අනුගමනය කරන්න පුළුවන්. එකක් තමයි, ඒ රටේ අල්ලස, දූෂණයට එරෙහිව තිබෙන නීති පද්ධතිය ශක්තිමත් කරන එක. දෙවැනි කාරණය තමයි, තාක්ෂණය භාවිත කරන එක. වර්තමාන ආණ්ඩුව යටතේ තාක්ෂණය භාවිත කිරීමේ උපක්‍රමයක් විධියට, ආරම්භයක් විධියට මේ රටේ ඩිජිටල්කරණ වැඩසටහන ආරම්භ වෙලා තිබෙනවා. තව වසර තුනක් යනකොට එය සම්පූර්ණ වෙයි. ඒ හරහා තාක්ෂණය භාවිත කරමින් අල්ලස හෝ දූෂණය පිටු දැකීම සඳහා අපේ රට හැඩ ගැස්සෙන බව අපි විශ්වාස කරනවා.

මෙහිදී කළ යුතු ප්‍රධාන කාර්යයක් තමයි අල්ලසට, දූෂණයට විරුද්ධව රටේ නීති පද්ධතිය ශක්තිමත් කරන එක. අන්න ඒ කියන කොටසෙන් එකක් තමයි අද දවසේ මේ සිද්ධ වෙන්නේ. අල්ලස, දූෂණය පිටු දැකීම සඳහා අපේ රටේ තිබෙන ප්‍රධාන ආයතනය තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව. මේ කොමිෂන් සභාව ශක්තිමත් කිරීම සඳහා 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත ගෙනෙනවා. අමාත්‍යවරයා විසින් එය ක්‍රියාත්මක වන දිනය විධියට 2023 සැප්තැම්බර් මාසයේ 15වන දා නම් කරනු ලබනවා. නමුත්, මේ ආයතනය ශක්තිමත්ව ක්‍රියාත්මක වීම සඳහා අදාළ නිලධාරින් පත් කර ගන්න, ඔවුන්ගේ වැටුප්, වේතන ගෙවන ආකාරය සම්බන්ධයෙන් නිශ්චිත කර ගන්න ක්‍රියාමාර්ග ගන්නේ නැහැ. ඇත්තටම ආයතනයක් විධියට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිහිටුවා තිබුණාට, එය ශක්තිමත්ව ක්‍රියාත්මක කරන යන්ත්‍රණය පැවැති රජයන් සකස් කරලා තිබුණේ නැහැ. අන්න ඒ අඩුපාඩුව සපුරා ගැනීමක් අද පාර්ලිමේන්තුව විසින් සිද්ධ කරනු ලබනවා. ඒ අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සිට කාර්යාල කාර්ය සහායක දක්වා වන නිලධාරින් 971දෙනෙකු පත් කර ගන්න අනුමැතිය ලබා දීමක් අද දින සිද්ධ වෙනවා. ඒ වාගේම ඔවුන්ගේ වැටුප්, වේතන තීරණය කරන්න අදාළ අනුමැතිය ලබා දීමත් පාර්ලිමේන්තුව විසින් සිදු කරනු ලබනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එක්සත් ජාතීන්ගේ විශේෂඥයින් ලොව පුරා කරපු සමීක්ෂණ වාර්තාවලට අනුව යම් රටක අල්ලස හෝ දූෂණය තුරන් කිරීමට නම් ඒ රටේ අය වැයෙන් අඩුම ගාණේ සියයට 0.1ක් හෝ අල්ලස, දූෂණය පිටු දැකීම සඳහා වන ආයතනවලට ලබා දිය යුතු වෙනවා.

මේ ඉලක්කය ජාතික ජන බලවේගය ආණ්ඩුව සපුරාලමින් සිටිනවා. 2025 දී සමස්ත අය වැයේ ප්‍රතිශතයක් විධියට සියයට 0.0155ක් වෙන් කරලා තිබෙනවා. 2026දී ඒක වැඩි කරලා සියයට 0.234ක් වෙන් කරලා තිබෙනවා. ඒ අනුව ඉලක්කයට යමින් සිටිනවා.

දූෂණය පිටු දකින ප්‍රධාන රටක් වන හොංකොං රාජ්‍යයේ විශේෂඥ විමර්ශන නිලධාරින් 1,000ක් පමණ ඉඳලා තිබෙනවා. මිලියන 22ක ජනතාවක් ඉන්න අපේ රටේ විමර්ශන නිලධාරින් 160 ගණනක් පමණයි ඉඳලා තිබෙන්නේ. හොංකොං රාජ්‍යයේ සමස්ත ජන සංඛ්‍යාව මිලියන 6යි. මිලියන 6ක් ඉන්න රටක විශේෂඥ විමර්ශන නිලධාරින් 1,000ක් ඉන්නකොට අපේ රටේ විමර්ශන නිලධාරින් 160යි ඉඳලා තිබෙන්නේ. එය, 377 දක්වා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය අද පාර්ලිමේන්තුවෙන් ලැබෙනවා. ඒ වාගේම දූෂණ විරෝධී කළමනාකරණ සේවා නිලධාරින් 113ක් පත් කරන්නත් අවසර ලැබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින සම්මත කර ගැනීමට බලාපොරොත්තු වන යෝජනාව තුළින් අපේ රටේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තවදුරටත් ශක්තිමත් කරන්න අපට හැකියාව ලැබෙන බව සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. M.K.M. ASLAM took the Chair.*

[අ.භා. 1.32]

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විශ්වාස කරනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම තවදුරටත් ශක්තිමත් විය යුතුයි කියලා. 2023දී අපි - මගේ ඡන්දය ඇතුළුව - ගෙනාපු පනත් කෙටුම්පතින් තමයි දැනට තිබෙන බලතල පවා ලබා දී තිබෙන්නේ. අද වත්කම් බැරකම් ප්‍රකාශ ප්‍රසිද්ධ කිරීමේ ක්‍රියාවලියට අවශ්‍ය Act එක pass කළේත් පසුගිය ආණ්ඩුවෙන් කියන එකත් මතක් කරන්න කැමැතියි. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම, මාලිමාවේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම නොවිය යුතුයි. මොකද, ඒක ආණ්ඩුවේ පරීක්ෂණ නොවෙන්නත්, විපක්ෂයට චෝදනාවක් ආවාම ඒ පරීක්ෂණ කරන තැනක් නොවෙන්නත්, තමන්ගේ බලතල පාවිච්චි කරලා සාක්ෂිවලට බලපෑම් කරන තැනක් නොවෙන්නත් ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කන්ටේනර් වංචාව පිළිබඳව පැමිණිලි කරලා තිබෙනවා. හැබැයි, අද වෙනතුරු ඒ ගැන කිසිම විභාගයක් වෙනවා අපට පෙනෙන්නේ නැහැ. ඒ වාගේම අපි ගල් අඟුරු වංචාව ගැනත් පැමිණිලි කරලා තිබෙනවා. මෙච්චර ප්‍රශ්නයක් වෙලාත් තවම investigations පටන්ගෙන නැහැ. සහල් වංචාව ගැන, ලූනු වංචාව ගැන, ලුණු වංචාව ගැන පැමිණිලි කරලා තිබෙනවා. ඒ සියල්ල ගැන පැමිණිලි කරලා තිබෙනවා. නමුත් ඒ කිසිම දෙයක් ගැන විභාග වෙන බවක් පෙනෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු කථානායකතුමාගේ පුටුවේ ඔබතුමා ඉන්නේ. ගරු කථානායකතුමාටත් විරුද්ධව මාස එකහමාරකට කලින් පැමිණිල්ලක් කරලා තිබෙනවා, ඔය මූලාසනයට පහළින් හිටපු පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්තුමා. බොහොම පාරිශුද්ධ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමක් තිබෙනවා නම්, පටන් ගන්න තිබුණේ එතැනින්. රටේ තුන්වැනි පුරවැසියා වන කථානායකතුමාට විරුද්ධව ඉදිරිපත් කරපු පැමිණිල්ල පිළිබඳව තමයි විභාග කරන්න තිබුණේ. හැබැයි, අද වෙලා තිබෙන්නේ අනෙක් පැත්ත. කථානායකතුමාගේ ලේකම්වරයෙක් හිටපු නියෝජ්‍ය මහ ලේකම්තුමාට විරුද්ධව කරපු පැමිණිල්ල විභාග කරනවා මිස, කථානායතුමාට විරුද්ධව කරපු පැමිණිල්ල විභාග කරන්නේ නැහැ.

ගල් අඟුරු වංචාව ගැන කරුණු හෙළිවෙනකොට මොකක්ද කළේ? ඒ පිළිබඳව පරීක්ෂණ කරන්නේ නැතිව එක පාරටම මහාධිකරණයේ නඩු පවරනවා, විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයාට පොහොර සම්බන්ධ ප්‍රශ්නයකට. ඒ නඩුව පිළිබඳවත් අපට ගැටලුවක් තිබෙනවා. මොකද, ඒ නඩුව පවරලා තිබෙන්නේත් නිදොස්කොට නිදහස් වෙන්නයි. විත්තියේ නීතිඥයන්ට වාසිවෙන විධියට තමයි ඒ නඩුව පවරලා තිබෙන්නේ. මොකද, පැමිණිලිකරුගෙන් කටඋත්තර ලබාගෙන තිබෙන්නේ, මේක indict කළාට පස්සේ. මෙතැන නීතිඥවරු ගොඩක් ඉන්නවා. මහාධිකරණයේ නඩුවක් පවරන්න ඕනෑ නම්, මේ පරීක්ෂණය ඉවරලා කරලා තමයි indict කරන්න ඕනෑ. හැබැයි, මොකක්ද කළේ? පැමිණිලිකරුගෙන් ප්‍රකාශයක් අරගෙන තිබුණේත් ඊට දවස් දෙකකට පසුවයි. විත්තියේ නීතිඥවරයාට ලස්සනට නඩුව ඉවර කරන්න ඕනෑ විධියට වපසරිය හදලා තමයි ඒ නඩුව දැම්මේත්. මොකද, ඒක දැම්මාම අර ගල් අඟුරු වංචාව වහන්න පුළුවන් කියලා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අවදානමක ඉන්නේ. මම දන්නවා, ලෝකයේ අර්බුදයක් තිබෙනවා, තෙල් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා කියලා. හැබැයි, මේක ගැන අපි කලින් කිව්වා. මේ යුද්ධය පටන් ගන්න කලින්, ඇමෙරිකාවෙන් නැව් පිටත් වෙනකොට තමයි මම මේ ගැන පාර්ලිමේන්තුවේදී කිව්වේ. ඇමෙරිකාවෙන් නැව් පිටත් වෙනකොට කිව්වා, මේකට සූදානම් වෙන්න කියලා. ඊට පස්සේ කිව්වා, "අපට ප්‍රශ්නයක් නැහැ. හෝමුස් හරහා නොවෙයි අපට තෙල් එන්නේ, ඉරානයෙන් නොවෙයි අපට තෙල් එන්නේ, අපට තෙල් එන්නේ සිංගප්පූරුවෙනුයි, ඉන්දියාවෙනුයි" කියලා. ප්‍රශ්නය මේකයි. හැබැයි, මෙතුමන්ලා දැනගෙන හිටියේ නැහැ සිංගප්පූරුවට තෙල් එන්නේ කොහෙන්ද කියලා. මෙතුමන්ලා දැනගෙන හිටියේ නැහැ ඉන්දියාවට තෙල් එන්නේ කොහෙන්ද කියලා. ඉන්දියාවේ production එක සියයට 15යි. ඉතිරි ටික එන්නේ එළියෙන්. අනෙක් කාරණය, සිංගප්පූරුවේ ඉන්නේ tradersලා. ඒගොල්ලෝ තෙල් ටික ගන්නේ මැද පෙරදිගින්. එහෙම නැතුව සිංගප්පූරුවෙන් ගන්නේ නැහැ. මේගොල්ලන් මේ කිසිම දෙයක් අධ්‍යයනය කළේ නැහැ. අද තමයි ටෙන්ඩරය දාලා තිබෙන්නේ. මේ යුද්ධය ආරම්භ වුණේ පසුගිය මාසයේ 28වැනි දා. අද 17වැනි දා. දැන් දවස් 20කට ආසන්නයි, මේ ආණ්ඩුව තවමත් ටෙන්ඩර් එකක් දාලා නැහැ. ඒ වෙනුවට කිව්වේ, "අපි ටෙන්ඩර් ටික දාලා තිබෙනවා. අගෝස්තු වෙනකම් තෙල් තිබෙනවා" කියලායි. අගෝස්තු වෙනකම් තෙල් තිබෙනවා කියලා මීට සතියකට කලින් කියපු ආණ්ඩුව දැන් වෙන එකක් කියනවා. අගෝස්තු වෙනකම් ටෙන්ඩර් ටික ඔක්කොම හදලා තිබෙනවා කිව්වා. අගෝස්තු වෙනකම් නැව් ටික එනවා, කිසිම ප්‍රශ්නයක් නැහැයි කිව්වා. මේ පාර්ලිමේන්තුවේදීම තමයි කිව්වේ.

හැබැයි, ඇත්ත තත්ත්වය ගත්තොත්, RM Parks සමාගමේ නැවක් තමයි දැන් ඔය ඇවිල්ලා තිබෙන්නේ. ඒක ඇමෙරිකානු සමාගමක්; එපා කියපු සමාගමක්. ඒකෙන් රැගෙනවිත් තිබෙනවා, ඩීසල් මෙට්‍රික් ටොන් 18,000ක්, පෙට්‍රල් මෙට්‍රික් ටොන් 17,000ක් සහ සුපර් ඩීසල් මෙට්‍රික් ටොන් 2,800ක්. ඊළඟට එනවා Sinopec සමාගමේ ඉන්ධන නැවක්. ඒක එන්නේ, 17වැනි දා. ඒ කියන්නේ, අද. මෙට්‍රික් ටොන් 40,000ක් රැගෙන එනවා. මේක combined cargo එකක්; වර්ග දෙකම තිබෙන එකක්. ඊට පස්සේ එනවා, LIOC සමාගමේ ඉන්ධන නැවක්. ඒකෙනුත් රැගෙන එනවා මෙට්‍රික් ටොන් 40,000ක්. ඒකෙත් තිබෙනවා, combined cargo. ඊට අමතරව - දැනට තිබෙන විධියට - CPC එකට එක නැවයි එන්න තිබෙන්නේ. ඒක එන්නෙත් 28වැනි දා. ඒකත් ඩීසල් cargo එකක්. මේ හැරෙන්න අප්‍රේල් මාසය සඳහා එක නැවක්වත් මේ වෙනකොට seize කරගෙන නැහැ. අප්‍රේල් මාසය සඳහා ඩීසල්, පෙට්‍රල් - මේ කිසිම දෙයක් - මේ ආණ්ඩුව seize කරගෙන නැහැ. දැන් හැම එකටම ලෝක අර්බුදය කියනවා. හැබැයි ලෝක අර්බුදය තිබෙද්දී තමයි RM Parks සමාගම ලංකාවට තෙල් ගේන්නේ. දැන් නවසීලන්තය දිහා බලන්න කියනවා; ඕස්ට්‍රේලියාව දිහා බලන්න කියනවා. ගිහිල්ලා, කොළොන්නාව දිහා බලන්න. කොළොන්නාවට RM Parks එකෙන් තෙල් ගේන්නේ මේ අර්බුදය තිබෙද්දී; Sinopec එකෙන් තෙල් ගේන්නේ මේ අර්බුදය තිබෙද්දී; LIOC එකෙන් තෙල් ගේන්නේ මේ අර්බුදය තිබෙද්දී. මේ අර්බුදය අස්සේ තමයි ඒ සමාගම් තුන තෙල් ගේන්නේ. ඔයගොල්ලන්ට ඒක බැරි නම් අඩු ගාණේ ඒ සමාගම් එක්ක සාකච්ඡා කරන්න. එහෙම නැති වුණොත්, අප්‍රේල් 12වන දා වෙනකොට ඩීසල් නැති වෙනවා.

ඊළඟ ප්‍රශ්නය මේකයි. දැන් බලන්නකෝ, මේ නැව් ටිකේ වැඩියෙන්ම ඇවිල්ලා තිබෙන්නේ පෙට්‍රල්. ඩීසලුත් එනවා. හැබැයි ප්‍රශ්නය මොකක්ද? පෙට්‍රල් ටික පරිභෝජනයට ගන්නවා. ඩීසල් ටික විදුලි උත්පාදනයට ගන්නවා. දැන් බාල ගල් අඟුරු නැහැ

කියන අයට මම මේ කාරණය කියනවා. මම හිතන විධියට, ඔබතුමන්ලාගේ පැලවත්ත කාර්යාලය ඉස්සරහ තමයි තිබෙන්නේ, විදුලිබල මණ්ඩලයේ System Control Centre එක. ඒකේ 14, 15, 16 දිනවලට අදාළ සියලු වාර්තා ටික මම **සභාගත*** කරනවා.

බාල ගල් අඟුරු හින්දා නොරොච්චෝලේ මෙගාවොට් 150ක් අඩුවෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් මේ System Control Centre එකට ඕනෑ විධියට විදුලිය ගන්න බැහැ. ඒගොල්ලන් මේකේ pick කරන්න ඕනෑ මිල අඩුම එකේ ඉඳන්. පටන් ගන්න ඕනෑ hydropowerවලින්. ඊට පස්සේ solar, wind, biomass; ඊට පස්සේ තමයි ගල් අඟුරු. මදි වුණොත් තමයි furnace oilවලට යන්න තිබෙන්නේ. ඒකත් මදි වුණොත් තමයි නැප්තාවලට යන්න තිබෙන්නේ. ඒකත් මදි වුණොත් තමයි ඩීසල්වලට යන්න තිබෙන්නේ. මේ තත්ත්වය අනුව සාමාන්‍යයෙන් නොරොච්චෝලේ බලාගාරයෙන් නියමිත මෙගාවොට් ධාරිතාවෙන් විදුලිය නිෂ්පාදනය කළා නම් අද දවසේ එක තෙල් ලීටරයක්වත් අවශ්‍ය වෙන්නේ නැහැ, විදුලිය නිෂ්පාදනය සඳහා. හැබැයි, මොකක්ද වෙලා තිබෙන්නේ? අද ඒ මෙගාවොට් 150ක් නිෂ්පාදනය කරන්න වෙලා තිබෙන්නේ කොහොමද? ඩීසල් ලීටර් ලක්ෂ 35ක් සතියකට යනවා. ඩීසල් ලීටර් ලක්ෂ 140ක් මාසයකට යනවා. මෙන්න, විදුලිබල මණ්ඩලයේ System Control Centre එකේ reports ටික. ගිහිල්ලා බලන්න. තව සතියක්, දෙකක් යනකොට විදුලි කප්පාදුවකට යන්න වෙනවා. මොකක්ද ප්‍රශ්නය? ප්‍රශ්නය, වෙන කිසි දෙයක් නොවෙයි. මේ තිබෙන ජලයෙන්, solarවලින්, windවලින්, biomass ඇතුළු coalවලින්, හරි නම් ඩීසල් ලීටරයක්වත් නැතිව පැය 24ම විදුලිය දෙන්න තිබුණා. හැබැයි, බාල ගල් අඟුරු නිසා අනිවාර්යයෙන් මේ ආණ්ඩුව රට විදුලි කප්පාදුවකට අරගෙන යනවා. ඒකේ ආරම්භයට තමයි ඔය ඇමතිතුමා පොඩ්ඩක් මුට්ටිය දැම්මේ. එක පැත්තකින් තෙල් පිළිබඳ ප්‍රශ්නයක් එනවා. අනෙක් පැත්තෙන්, මේ ආණ්ඩුව නිර්මාණය කරපු බාල ගල් අඟුරු නිසා අනිවාර්යයෙන් විදුලි කප්පාදුවකට යන්න වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.41]

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද දවසේ 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 26(2) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි තීරණය කිරීම සම්බන්ධව පැවැත්වෙන විවාදයේදී කරුණු දක්වන්නට අවස්ථාව ලැබී තිබෙනවා.

ඇත්තටම, මේ කාරණය සම්බන්ධයෙන් අපි පූර්ණ වශයෙන් එකඟතාව පළ කරනවා. හේතුව තමයි, මේ රටේ සංවර්ධනයට දැවැන්ත බාධාවක් වෙලා තිබුණු අල්ලස, දූෂණය, නාස්තිය, හොරකම, වංචාව මේ ආදී සකලවිධ අපරාධයන් පිළිබඳව හොයන්න, ඒකට අදාළ නීත්‍යනුකූල ක්‍රියාමාර්ගවලට යොමු කරගන්න, ඒ වාගේම මේ රට අල්ලස්, දූෂණ ක්‍රියාවලියෙන් තොරව නිසියාකාර පාලනයකට ගෙන යන්න වැදගත් වන ආයතනික ව්‍යුහයක්, මේක. ඒ ආයතනික ව්‍යුහය සම්බන්ධව මේ ගන්නා ක්‍රියාමාර්ගය එම පද්ධතියේ උන්නතිය වෙනුවෙන් යෙදවෙනවා කියලා අපි හිතනවා. ඒ නිසා අපි ඒක අනුමත කර ගනිමින් තමයි සාකච්ඡා කරන්නේ.

අද දවසේ සාකච්ඡාව ඇතුළේ පවා විශේෂයෙන්ම විපක්ෂයේ කණ්ඩායම් උත්සාහ කරමින් ඉන්නවා, මේ පාර්ලිමේන්තු අවකාශය භාවිත කරලා දැවැන්ත බොරු ප්‍රමාණයක් සමාජය ඇතුළේ තහවුරු කරන්න. කලින් අවස්ථාවක් ගත්තාම, ගෑස් කොම්පැනියට අදාළ ටෙන්ඩර් එක වෙනස් වුණු නිසා තමයි ගෑස් හිඟ වුණේ කියලා මාතෘකාවක් ඇද්දා. ඒ කියන්නේ, ගෑස් හිඟයක් ඇවිල්ලා තිබෙනවා. ඒකට හේතුව, මෙතෙක් කාලයක් එකම ගෑස් කොම්පැනියක් තමයි අවුරුදු ගණනාවක් මේ ටෙන්ඩර් එක අරගෙන තිබුණේ. නමුත්, පසුගිය වාරයේ නියමිත ටෙන්ඩර් පටිපාටිය අනුව කටයුතු කළාම වෙනත් කොම්පැනියකට මේ ටෙන්ඩර් එක ගියා. ඒ වෙලාවේ ඉඳලා කියන්න උත්සාහ කරමින් ඉන්නවා; අනාවැකි විධියටත් කිව්වා ගෑස් හිඟයක් ඇති වෙනවා කියලා. ඒ වාගේම දැනුත් කියන්න උත්සාහ කරමින් ඉන්නවා, ගෑස් හිඟය ඇති වුණේ මේක නිසා කියලා. නමුත්, ඇත්තම කාරණය මොකක්ද? මේකේ intention එක මොකක්ද කියලා බලන්න ඕනෑ; මේ හදන බොරුවේ intention එක මොකක්ද කියලා හරියටම තේරුම් ගන්න ඕනෑ.

මාර්තු මාසය සඳහා average එකක් විධියට සාමාන්‍යයෙන් ගෑස් මෙට්‍රික්ටොන් 33,000ක් විතර අවශ්‍ය වනවා. මේ වනකොටත් ගෑස් මෙට්‍රික්ටොන් 38,000ක් අපේ රාජ්‍යය සතුව තිබෙනවා. මාර්තු 01වැනි දා වනකොටත් ඒ ඇණවුම් කර තිබෙන ප්‍රමාණය ගෙනැල්ලා මාලේ ආසන්නයේ තිබෙන floating storage එකක තියාගෙන, එතැන ඉඳලා තමයි ලංකාවට ගෙනෙන්නේ. ඒකට හේතුව මේකයි. ලංකාවේ ලිට්රෝ එක සතුව තිබෙන ගබඩා පහසුකම් ප්‍රමාණය ගත්තාම, මෙට්‍රික්ටොන් 8,000ක විතර පහසුකමක් විතරයි තිබෙන්නේ. ඒවා හදලා නැති එක වෙනම බලන්න ඕනෑ. මෙතෙක් කාලයක් පාලනය කරපු මහත්වරු එහෙම හදලා නැහැ. මෙට්‍රික්ටොන් 33,000ක් නොවෙයි, මෙට්‍රික්ටොන් 38,000ක් තිබෙනවා. වැඩියෙනුත් එක්ක තිබෙනවා. ඒක ගෙනෙන්න ඕනෑ. ඒ ගෙනෙන එක distribute කර ගන්න අදාළ වේගයක් තිබෙනවා. ඒ වේගයට වඩා වැඩි ගැටලුවක් මතු වුණා. අදාළ පෞද්ගලික අංශයේ සමාගම ගෑස් ගෙන්වූයේ නැහැ. එතකොට ගෑස් නොගෙන ඒම නිසා වෙච්ච ගැටලුවක් මෙතැන තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, අපි මේ තත්ත්වය හරියට තේරුම් ගන්න ඕනෑ. අර කොම්පැනි එක මාරු වෙච්ච ගමන් කලින්ම කියනවා, ගෑස් හිඟයක් එනවා කියලා. අවුරුදු 9ක් විතර එක දිගට ගෑස් ගෙනාපු කොම්පැනියක් ඒක. ඒ කොම්පැනිය ගෑස් ගෙනාවේ නැති වනකොට, නියමිත ටෙන්ඩර් පටිපාටිය අනුව ගිහිල්ලා යම් සමාගමක් ටෙන්ඩර් එක ජයග්‍රහණය කළාම ඒ සමාගම තමයි ගෑස් ගෙනෙන්නේ. එතකොට ඒ නිවැරදි පටිපාටියට එරෙහි මතයක් හදන්න උත්සාහ කරනවා. අපි ඇත්තටම බලන්න ඕනෑ, අනාවැකියක් ලෙස එහෙම දැනගෙන හිටියා නම් අර පෞද්ගලික සමාගම ගෑස් නොගෙන ආවේ මොන අනුදැනුමක් ඇතිවද කියලා. ඒක තමයි තිබෙන තත්ත්වය.

ඒ වාගේම අද මතු කළ කාරණය ඇතුළේ තව විශේෂ කාරණයක් තිබෙනවා. කලින් සමාගම ගෑස් ගෙන්වූයේ ඕමාන් රාජ්‍යය හරහා ගෑස් ගන්න සමාගමකින්. හැබැයි, මේ කොම්පැනිය දැනට සියයට 81ක් ගන්නේ ඇමෙරිකාවෙන්. ඒ නිසා ගෑස් ගෙනෙන ගමන් මාර්ගයවත් මේ යුද්මය කලාපය ආසන්නයෙන් එන්නේ නැහැ. ඒ නිසා තමයි අපට දැනට මෙහෙම තත්ත්වයක්

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා]

තිබෙන්නේ. මේ කිව්වා වාගේම ඉන්දියාව ගෑස් ගෙන්වන්නේ ඕමාන් රාජ්‍ය පදනම් කර ගත්ත සමාගමකින්. ඉන්දියාවේ restaurantsවලට ගෑස් සැපයීම සියයට 20ක් දක්වා කපා හැර තිබෙනවා. අපිත් එහෙම ගෙනාවා නම් අද හිඟයකට ලක්වීමට නියමිතව තිබුණා. මොකක් හෝ වාසනාවකට මේ මොහොතේ මේක වෙනස් වෙලා තිබෙනවා. ඒක නිසා අපට අදටත් ගෑස් සැපයුම තිබෙනවා, ඒක නිශ්චිතයි. පසුගිය දවස්වල පෞද්ගලික සමාගම ගෑස් නොගෙන්වීම නිසා ඇති වුණු රික්තකය පිරවීමට දරන මහන්සිය ඇතුළේ යම් අඩුවක් තිබුණා. දැන් ඒක කළමනාකරණය වෙමින් තිබෙනවා. විශේෂයෙන් මේ කණ්ඩායම කියන්න උත්සාහ කරනවා, "ගෑස් හිඟයක් තිබෙනවා, ගෑස් නැහැ, නැහැ" කියලා. තවත් මන්ත්‍රීවරයෙක් කථා කරමින් කිව්වා, අප්‍රේල් මාසය සඳහා ඉන්ධන මොකුත් නැහැ කියලා. ඒ විධියට ඉන්ධන නැහැ, මොකුත් නැහැ කියලා මහජනතාව තුළ මතයක් හදන්න හදනවා.

පෙබරවාරි 28වෙනි දා ඉරානයට පහරදීම් ආරම්භ වෙනවාත් එක්කම තමයි ලංකාවේ තෙල් පෝලිම් පටන් ගත්තේ. ලෝකයේ කිසිම රටක නැති පෝලිමක් මෙහේ පටන් ගත්තා. ඒ නිසා මතු වෙච්ච ගැටලු ප්‍රමාණයක් තිබුණා. ඒ වාගේම ඉදිරියේදී මතුවීමට නියමිත ගැටලු ප්‍රමාණයක් තිබෙනවා. ඒ සියල්ල සැලකිල්ලට අරගෙන මේ වෙනකොට QR code එක දීලා තිබෙනවා. හැම කෙනෙකුටම තේරෙනවා, තාක්ෂණික මෙවලමක් ක්‍රියාත්මක වෙන්න ගත වෙන කාලය ගැන. ඒ තත්ත්වයත් කළමනාකරණය කරලා තමයි ඒක දීලා තිබෙන්නේ. අද උදෑසන මේ සභාව ඇතුළේදීම හෙළිදරවු වුණා, මේ වෙනකොට මිලියන 5 ඉක්මවපු ප්‍රමාණයක් register කරගෙන තිබෙනවා, තව යම් ප්‍රමාණයක් register කර ගැනීමට තිබෙනවා කියලා. සමහර වෙලාවට ආදරයට කියලා තමයි ඒ බොරු කියන්නේ. සමාජයට දැනෙන්න සලස්වනවා, අපි මේ ආදරයට මේවා කියන්නේ කියලා. ආදරයට කියනවා කියලා, දාර බොරුවක් කියලා දානවා. ඇත්තටම එහෙම විපක්ෂයක් අවශ්‍ය නැහැ.

තව අවස්ථාවක කිව්වා, වරායට ගොඩ බාන ගණනට තෙල් දෙනවා කියලා කිව්වා ලු. මේ සභාව ඇතුළේ එවැනි බොරු ඇද බානවා. කියන සිංහල තේරුම් ගන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. මොකක් හෝ කියන මාතෘකාවක්, කියන වචනයක්, වාක්‍යයක් අවබෝධ කර ගැනීමට සමත් බුද්ධිමය අවකාශයක් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට තිබෙන්නට ඕනෑ. එහෙම අවබෝධයක් තිබුණා නම් ඒ වාගේ ප්‍රකාශ කරන්න විධියක් නැහැ; වරායේ ගොඩ බාන ගාණට තෙල් දෙනවා කිව්වා කියලා. ඒ වාගේම තේරුම් ගන්න ඕනෑ තව දෙයක් තිබෙනවා. බිලියන ගණනක විශාල ණයක් ගොඩ ගහලා, ගොඩ ගහලා තිබිලා ඒකත් එක්ක තමයි අපට මේ රජය බාර ගන්න වුණේ. ඒ ණය මුදල ගෙවන්න තමයි දැනට අය කරන මුදල හරි අය කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
මම අවසන් කරනවා.

එහෙම නැතිව ආසාවට බදු ගන්නේ නැහැ. රටේ ජනතාවට තෙල් සැපයීමේ ක්‍රියාවලිය දිගටම පවත්වාගෙන යන්න ඕනෑ. එම ක්‍රියාවලිය පවත්වාගෙන යන ගමන් දැවැන්ත ණයක් ගෙවන්නත් ඕනෑ. ට්‍රිලියනයකට ආසන්න ණය ප්‍රමාණයක් ගොඩ ගහලා තිබුණා. IMF එකත් එක්ක ගහපු ගිවිසුම් ඇතුළේ ඒ සියල්ලම තිබෙනවා. ඒකට අදාළව තමයි ණය ගෙවීමේ ක්‍රියාවලියකට යොමු වෙන්න අපට සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ සඳහා තමයි ඒ මුදල අය කරන්නේ. හැබැයි මේ සභාවට ඇවිල්ලා ඒ කිසිවක් සිද්ධ වුණේ නැහැ වාගේ කියන්න උත්සාහ කරමින් ඉන්නවා, මේ ආණ්ඩුව කියන දේ කරන්නේ නැහැ කියලා. නැහැ, ආණ්ඩුව කියන දේ හරියටම කරමින් ඉන්නවා; ආණ්ඩුව හරි අවධානයෙන් කටයුතු කරමින් ඉන්නවා. ජන සමාජයට අනවශ්‍ය බරක් පැටවෙන්නේ නැති වෙන්න, ජන සමාජයට අනවශ්‍ය පීඩනයක් එල්ල නොවෙන්න සියලු කටයුතු කළමනාකරණය කරමින් ඉන්නවා.

ඔය මහත්වරු කියන්නට කලින්, වෙන්න පුළුවන් දේ ගැන අපි සාකච්ඡා කරලා තිබෙනවා; සාකච්ඡා කරමින් ඉන්නවා. අපේ සාකච්ඡාවල ප්‍රතිඵල විධියට තමයි තීන්දු තීරණ ගන්නේ. එහෙම නැතිව ඔය කණ්ඩායම් වාගේ තනි තනිව තීරණ අරගෙන නැහැ. මේ කිසිම තීරණයක් තනිව නොවෙයි ගත්තේ. අපි ඒ සියල්ල වෙනුවෙන්, ඇත්ත කාරණා වෙනුවෙන් පෙනී සිටිනවා. ඒ වාගේම අපි අවධාරණය කරන්න කැමැතියි, අපේ ආණ්ඩුවේ කිසිම මන්ත්‍රීවරයෙක්, ඇමතිවරයෙක් කිසි විටෙක පෞද්ගලික ලාභ අපේක්ෂාවක් වෙනුවෙන් කිසිම තීරණයක් ගන්නේ නැති බව. අපි ඒක පෙන්වා දීලා තිබෙනවා. වංචා කරලා, හොරකම් කරලා, එතුමන්ලා බලයෙන් පහ වුණා. ජන සමාජය එකතු වෙලා ඔවුන් බලයෙන් පහ කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
මා අවසන් කරනවා. හේතුව වුණේ වංචාව, හොරකම, නාස්තිය සහ දූෂණය. මේ වෙන තාක්ෂණික අඩු පාඩු පවා වංචාව කියන මාතෘකාව ඇතුළට ගන්න දැන් උපරිම උත්සාහ කරනවා. ඒක ඇත්තටම නොදන්නාකමක්වත් වෙන කිසිවක්වත් නොවෙයි - තක්කඩිකම. එහෙම තමයි මේ සභාව ඇතුළේ හැසිරෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද දවසේ අවධාරණය කරන්න ඕනෑ මොකක්ද? මේ රටේ ජන සමාජයට දැවැන්ත ප්‍රශ්නයක් තිබෙනවා, ලෝකයේ ප්‍රශ්නයක් තිබෙනවා, ඒක අපේ ජන සමාජයට බලපා තිබෙනවා. විපක්ෂය සහ විපක්ෂයත් එක්ක ගනුදෙනු කරන සහ මාධ්‍ය මෙහෙයවන සියලුදෙනා තේරුම් ගන්න ඕනෑ දේ තමයි සමාජයට දැන් එල්ල වෙලා තිබෙන පීඩනයෙන් ජන සමාජය නිදහස් කර ගන්න මැදිහත් වෙනවා මිසක්, ජන සමාජය තව තවත් ආකුල ව්‍යාකුල කරන්න නොවෙයි මැදිහත් විය යුත්තේ කියන එක. ඒ කාරණයත් අවධාරණය කරමින් මා නතර වෙනවා. බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.51]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සම්බන්ධයෙන් සංශෝධන කිහිපයක් ඉදිරිපත් කරන මේ අවස්ථාවේ ඒ සම්බන්ධව අදහස් ඉදිරිපත් කරන්න ලැබීම ගැන මා සතුටු වෙනවා.

දැන් මේ සභාව තුළ දිගින් දිගටම කථා වෙන්නේ, මේ රටට ගෙනාපු ගල් අඟුරු පිළිබඳ ප්‍රශ්නය. ඒ සම්බන්ධයෙන් පක්ෂ විපක්ෂ දෙපාර්ශ්වයම කථා කළා. ඒ සම්බන්ධව දිගින් දිගටම කථා කළත් රජයට බැරි වුණා, ඒක නිවැරැදි කරන්න. අද උදෑසන පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව තිබුණු අවස්ථාවේදී මම ඒ ආපු නිලධාරින්ගෙන් ඇහුවා, මේ ගෙනාපු ගල් අඟුරු නිසා පරිසරයට වෙන හානිය මොකක්ද කියලා. මේ ගෙනැල්ලා තිබෙන ගල් අඟුරුවලින් පරිසරයට විශාල හානියක් වෙනවා කියන එක ඒ නිලධාරින් පිළිගත්තා. එතකොට එක පැත්තකින් එම නිලධාරින් පිළිගන්නවා, මේ ගෙනාපු ගල් අඟුරු, බාල ගල් අඟුරු, මෙතැන ගැටලුවක් තිබෙනවා, රජයට විශාල මුදලක් පාඩු වෙලා තිබෙනවා, රටට විශාල මුදලක් පාඩු වෙලා තිබෙනවා කියන එක. ඒ වාගේම ආපු තෙල් නැවෙන් සියයට 85ක් විදුලිය උත්පාදනය කරන්න වෙන් වෙනවා නම්, එතැනත් ප්‍රශ්නයක් තිබෙනවා.

දැන් නැව් 9ක් ඇවිල්ලා තිබෙනවා. තව නැව් 11ක් එන්න තිබෙනවා ලු. එතකොට ඒ එන්න තිබෙන නැව් 11හි තිබෙන ගල් අඟුරු සම්බන්ධයෙනුත් තිබෙන්නේ මේ තත්ත්වය නම්, ටර්බයින්වලට ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්. ඒ ටර්බයින්වලට ප්‍රශ්නයක් ඇති වුණොත්, අපට ඉන්ධනවලින් තමයි විදුලිය උත්පාදනය කරන්න වෙන්නේ. එතකොට අනිවාර්යයෙන්ම පාරිභෝගිකයාට, මේ රටේ පුරවැසියාට විදුලියට වැඩි මිලක් ගෙවන්න වෙනවා. අපි දිගින් දිගටම විෂය භාර ඇමතිතුමාගෙන් මේ ප්‍රශ්නය ඇහුවාම එතුමා දෙන උත්තරය වන්නේ, එය එතුමාට අදාළ නැහැ කියන එක. එතකොට අපි මේ ප්‍රශ්නය අහන්නේ කාගෙන්ද?

හෙට පාර්ලිමේන්තුව රැස්වෙන්නේ නැහැ. රටක ප්‍රශ්නයක් ඇති වුණොත්, රටේ තිබෙන දේවල් ගැන කථා කරන්නේ මේ පාර්ලිමේන්තුව ඇතුළේ. අපට මතකයි, අරගළය තිබුණු කාලයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හොය-හොයා ගැහුවා. හැබැයි, ඒත් පාර්ලිමේන්තුව වැහුවේ නැහැ. එදා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පාරේ යන්න දුන්නේ නැහැ. එදා ඉන්ධන තිබුණේත් නැහැ, විදුලිය තිබුණේත් නැහැ, විශාල අර්බුදයක් තිබුණා. හැබැයි, අපි මේ පාර්ලිමේන්තුව වැහුවේ නැහැ. පාර්ලිමේන්තුව වහලා මේ ප්‍රශ්න විසඳන්න බැහැ. පාර්ලිමේන්තුව පවත්වා මන්ත්‍රීවරුන් 225දෙනාම එකතු වෙලා සාකච්ඡා කරන්න ඕනෑ, මේ රටේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නයට අපි මුහුණ දෙන්න ඕනෑ කොහොමද කියන එක. පාර්ලිමේන්තුව වහලා යම් මුදලක් ඉතුරු වුණා කියලා ඒක පාරිභෝගිකයාට යන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෙට පාර්ලිමේන්තුව වහනවා. ඒකට කමක්නැහැ. හැබැයි, අපි මේ ගැන සාකච්ඡා කරන්න ඕනෑ. ලෝකයේ යුද්ධයක් තිබෙනවා. ලෝකයේ යුද්ධයක් තිබුණාට, අපි මේ ලංකාවේ ජීවත් වෙලා ඉන්න වටපිටාව, වපසරිය, පරිසරය හදාගන්නේ කොහොමද කියන එක අපි සාකච්ඡා කරලා කරන්න ඕනෑ දෙයක්. ඔබතුමන්ලා බලයට ආවේ, මේ වැටුණු රට ගොඩගන්න පුළුවන් කියලා නේ. එතකොට මේ වාගේ දේවල් සඳහා මුහුණ දෙන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙනුත් ඔබතුමන්ලාට විසඳුමක් තිබෙන්න ඕනෑ. ඒකට තමයි විපක්ෂය ඉන්නේ. විපක්ෂය යම් යම් අවස්ථාවල මේ ගැන පැහැදිලි කරලා දෙන්න හදනකොට, ඒ දේවල් පෙන්වා දෙනකොට ඔබතුමන්ලා අපට ඇඟිල්ල දික් කරලා කියනවා, හැමදාම විපක්ෂය කළේ මේ දේ තමයි කියලා. හැබැයි, ඔබතුමන්ලාගේයි අපේයි වෙනස මොකක්ද? අපි තෙල් පෝලිම්වල ඉන්න මිනිස්සුන්ට කැමරාව අල්ලා අහන්නේ නැහැ නේ, "කරුණාකරලා කියන්න, ඇයි මේ පෝලිමේ ඉන්නේ?" කියලා. අපි කවදාවත් එහෙම කරන්නේ නැහැ. අපි විපක්ෂයක් විධියට කියන්නේ, මේ තෙල් පෝලිම්වල ඉන්න ඕනෑ නැහැ කියලායි. රටේ ජනතාව හොඳට ජීවත් වෙන්න ඕනෑය කියන ඒ ආශාව, බලාපොරොත්තුව, පැතුම අපටත් තිබෙනවා. ඔබතුමන්ලාට වාගේම අපටත් ඒ ආශාව තිබෙනවා. හැබැයි, මේ පාර්ලිමේන්තුව වැසීම තුළින් රට විශාල අර්බුදයකට යන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි යෝජනා කරනවා, මේ පාර්ලිමේන්තුව වහලා ප්‍රශ්න විසඳන්න බැහැ, මැති-ඇමතිවරු, රටේ ජනාධිපතිතුමා, අගමැතිතුමිය, අපේ විපක්ෂ නායකතුමා සහ පක්ෂ නායකවරු යන මේ සියලුදෙනා එකතු වෙලා මේ ප්‍රශ්නයට මුහුණ දෙන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් සාකච්ඡා කරමු කියලා.

දැන් අල්ලස් හා දූෂණය ගැන කථා කරනවා. මේ රටේ දූෂණය නැති කරන්න ඕනෑ, මේ රටේ අල්ලස් ගන්න එක නැති කරන්න ඕනෑය කියලා තමයි, ඔබතුමන්ලා බලයට ආවේ. ඔබතුමන්ලා බලයට පත් වෙලා අවුරුද්දකුත් මාස හතරක් වෙනවා. හැබැයි, මේ රටේ ප්‍රශ්න විසඳලා තිබෙනවාද, දූෂණය නැති වෙලා තිබෙනවාද, වංචාව නැති වෙලා තිබෙනවාද, මේ බාල ගල් අඟුරුවලින්ම රුපියල් බිලියන 8.4ක් පාඩු වෙලා තිබෙනවා. රජයේ කිසිම කෙනෙකුට මේක නිවැරදි කරන්න බැරි වුණා. මම මේ පෙන්වා දෙන්න යන්නේ මෙතැන ප්‍රශ්නයක් වෙලා තිබෙනවා නම්, ඒ විෂය භාර ඇමතිතුමාගේ අතින් වරදක් වෙලා තිබෙනවා නම් හරි, නැත්නම් හරි කවුරු හරි රජයේ බලධාරියෙක්, අඩුම ගණනේ ජනාධිපතිතුමා හරි මේක නිවැරදි කරන්න ඕනෑය කියන එකයි. අද වෙනතුරු ජනාධිපතිතුමා මේ ගැන වචනයක් කථා කරලා නැහැ. ඉතින්, රටේ ජනතාවත් මේ දිහා බලාගෙන ඉන්නවා. විපක්ෂයත් හැමදාම කියනවා, "බාල ගල් අඟුරු, බාල ගල් අඟුරු" කියලා. මේ නිසා රුපියල් බිලියන 8.4ක් පාඩු වෙලා තිබෙනවා. ඉතින්, මේක නිවැරදි කරන්න. වැරදි නම් අපට කියන්න, බොරු කියන්න එපා කියලා.

දැන් මහජන උපයෝගිතා කොමිෂන් සභාව කියනවා, මේ තත්ත්වය තිබුණොත් හතරවැනි මාසය, පස්වැනි මාසය, හයවැනි මාසය වෙනකොට අනිවාර්යයෙන් විදුලිය කප්පාදුවක් වෙනවා කියලා. අඩුම ගණනේ විෂය භාර ඇමතිතුමා මේකවත් නිවැරදි කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක බරපතළ ප්‍රශ්නයක්. අපි මේ අහන ප්‍රශ්නවලට කරුණාකරලා උත්තර දෙන්න කියන එක තමයි අපි කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගල්ඔය ගම්මානයේ අක්කර 80ක මේ වෙනකොට ගොවීන් 43 දෙනෙක් වී වගා කරලා තිබෙනවා. මේ වෙනකොට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මේ අයට නඩු පවරලා මේ වගාව කරන්න එපා කියලා තිබෙනවා. මේක ලියාපදිංචි වෙච්ච ගොවි සංවිධානයක්. 2002 වසරේදී තමයි මේ ගොවි සංවිධානය ලියාපදිංචි වෙලා තිබෙන්නේ. ලියාපදිංචි වෙච්ච අංකයත් මා සතුව තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී ඒ තොරතුරු ඇතුළත් ලේඛනය මම **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු කිංස් නෙල්සන් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2012දී රුපියල් මිලියන 27ක් වෙන් කරලා තිබෙනවා, ඒ ගමේ තිබෙන ඇළ වේලි හදන්න. ඒ වාගේම 2025දී රුපියල් ලක්ෂ 450ක් වෙන් කරලා තිබෙනවා, ඒ ගමේ තිබෙන වැව ප්‍රතිසංස්කරණයට. එලෙස විශාල මුදලක් වෙන් කරලා තිබුණත්, මේ වනකොට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගොවීන්ට කියා තිබෙනවා, මේ කුඹුරුවලට යන්න එපා කියලා. මේ, 2018දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගල් දාලා මායිම් පෙන්නපු කුඹුරු. 2018දී මායිම් ගල් දාලා කුඹුරු ප්‍රමාණය පෙන්වලා දැන් ඇවිත් කියනවා, මේවායේ වගා කරන්න එපා කියලා. ඉතින්, මෙන්න මේවා දිහා තමයි බලන්න වෙන්නේ. විශේෂයෙන් ගොවි ජනතාව වෙනුවෙන් කථා කරපු පක්ෂයක් විධියට ඔබතුමන්ලා මේවා සම්බන්ධව පොඩ්ඩක් හොයලා බලන්න. මෙන්න මේවා තමයි ඇත්තටම ප්‍රශ්න. මෙතැන කුඹුරු අක්කර 80ක ගොවි පවුල් 43ක් ඉන්නවා. මේ ගොවි පවුල් 43ම අද අසරණභාවයට පත් වෙලා තිබෙනවා. 2018දී මායිම් ගල් දාලා කුඹුරු ටික පෙන්වලා ඒ සියලු දෙයම කළාට පස්සේ තමයි මෙහෙම කියන්නේ. මේ ප්‍රදේශයට විශාල මුදලකුත් වෙන් වෙලා තිබෙනවා. 2012දී රුපියල් මිලියන 27ක් වෙන් කරලා තිබෙනවා, ඒ ගමේ තිබෙන ඇළ වේලි ටික හදන්න. ඒ වාගේම 2025දී රුපියල් ලක්ෂ 450ක් වෙන් කරලා තිබෙනවා, ඒ ගමේ තිබෙන වැව ප්‍රතිසංස්කරණය කරන්න. ඒ විධියට මුදල් වෙන් කරලා දැන් ඇවිල්ලා කියනවා, ගොවිතැන් කරන්න එපා කියලා. ඒ නිසා මේ සම්බන්ධයෙන් විශේෂයෙන් අවධානය යොමු කරන්න කියලා මම කියනවා.

ඒ වාගේම දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොවීන් පිඹුරත්තෑව වැව ආශ්‍රිතව අක්කර 7,688ක ගොවිතැන් කටයුතු කරනවා. එම ප්‍රදේශයේ ගොවි පවුල් 3,100කුත්, ධීවර පවුල් 105කුත් ඉන්නවා. මේ වනකොට රජය විසින් ඒ වැවේ රොන් මඩ ඉවත් කිරීම එක ආයතනයකට භාර දීලා තිබෙනවා. පරිසර අමාත්‍යාංශයෙන් GPS points පෙන්නුවත්, ඒ pointsවලට අනුව නොවෙයි මේගොල්ලන් රොන් මඩ ඉවත් කරන්න කටයුතු කරන්නේ. එතැන මහා පරිමාණයෙන් වැලි ජාවාරමක් සිදු වනවා. එම නිසා මේ වනකොට ධීවරයාට ධීවර කර්මාන්තය කරගන්න බැරි වෙලා තිබෙනවා. ඒ වාගේම bund එකට හානි වෙමින් පවතිනවා. මේ සම්බන්ධවත් අවධානය යොමු කරන්න අවශ්‍යයි. මේ පිඹුරත්තෑව වැව පාරම්පරික වැවක්. ගොවි පවුල් විශාල ප්‍රමාණයක් මේ වැවෙන් පෝෂණය වෙනවා; ධීවර පවුල් විශාල ප්‍රමාණයක් පෝෂණය වෙනවා. එම නිසා මේ සම්බන්ධවත් අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද මේ රටේ සෑම කෙනෙක්ම අහන ප්‍රශ්නය තමයි, බාල ගල් අඟුරු ප්‍රශ්නය. රජයට මේකට උත්තරයක් දෙන්නම වෙනවා. නමුත් කිසිම කෙනෙක් මේකට උත්තරයක් දෙන්නේ නැහැ. මේකට විපක්ෂයට ඇඟිල්ල දිගු කරලා හරියන්නේ නැහැ. මෙතැන ගැටලුවක් තිබෙනවා. මීට අදාළව මහජන උපයෝගිතා කොමිසමෙනුත් වාර්තා ඉදිරිපත් කරලා තිබෙනවා. මේ සම්බන්ධවත් අවධානය යොමු කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா அவர்கள்! உங்களுக்கு 10 நிமிடங்கள் உண்டு.

[பி.ப. 2.00]

**ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவின் அலுவலர்கள் மற்றும் ஊழியர்களின் வேதனம் மற்றும் சேவை நிபந்தனைகளைத் தீர்மானித்தல் தொடர்பான விவாதத்தில் எனக்கும் உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றி கூறுகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது நாட்டின் பொருளாதாரத்தில் நீண்ட காலமாக ஊழல் நிறைந்திருந்ததை நாங்கள் யாவரும் அறிவோம். இலங்கையில் பல தசாப்த காலமாக புற்றுநோய் போன்று எங்கும் வியாபித்திருந்த இந்த ஊழல் கலாசாரமானது, எமது குழந்தைகளின் எதிர்காலத்தையும் எமது குடிமக்களின் கௌரவத்தையும் சூறையாடிய ஒரு முறையான - systematic - தோல்வியாகும். எமது அரசாங்கம் பதவியேற்ற பின்னர், ஊழலின் தரவரிசையிலே முன்னேற்றமடைந்து வரும் ஒரு சித்திரத்தையே எமக்குக் காட்டுகின்றன. Transparency International வெளியிட்ட 2025ஆம் ஆண்டுக்கான ஊழல் மட்டச் சுட்டெண்ணின்படி, இலங்கை இறுதியாக ஒரு மாற்றத்துக்கான அறிகுறிகளைக் காட்டத் தொடங்கியுள்ளது. தற்போதைய தரவரிசைப்படி, 181 நாடுகளில் 107ஆவது இடத்தில் எமது நாடு இருக்கின்றது. இது 2024இல் இருந்த 121ஆவது இடத்திலிருந்து 14 இடங்கள் முன்னேறிய ஒரு குறிப்பிடத்தக்க உயர்வாகும். புள்ளிவிபரப்படி, 32இலிருந்து 35ஆக எமது நாடு உயர்ந்துள்ளது. இந்த முன்னேற்றத்தை நாம் அங்கீகரிக்கும் அதேவேளை, இதில் திருப்தியடைந்து விடக்கூடாது.

இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவின் அலுவலர்கள் மற்றும் ஊழியர்கள் சுயாதீனமாக இயங்குவதற்கும், அவர்கள் தங்களுடைய வேலைகளை முறையாகச் செய்வதற்கும் ஏற்றவகையில், அவர்களுக்குரிய ஊதியத்தையும் வசதிகளையும் நாங்கள் வழங்க வேண்டும். இதனை எமது எதிர்க்கட்சி உறுப்பினர்களும் வரவேற்றுப் பேசியிருந்தார்கள். உண்மையிலே இது வரவேற்கத்தக்க விடயமாகும். ஓர் ஆழமான குழியிலிருந்து தற்பொழுது நாம் மேலே ஏறிக்கொண்டு இருக்கின்றோம். ஆனால், தரை மட்டம் இன்னும் தொலைவிலேதான் இருக்கின்றது. ஊழல் என்பது ஒரு தார்மீகத் தோல்வி மட்டுமல்ல; அது பொருளாதாரப் பேரழிவுமாகும். இது வணிகம் செய்வதற்கான செலவை அதிகரிக்கும். மேலும், அத்தியாவசிய சேவைகளிலிருந்து நிதியைத் திசைதிருப்பும் கண்ணுக்குத் தெரியாத வரியாகவும் செயற்படுகின்றது. இறுதியில் இது மக்களுடைய துன்பத்திலேதான் முடிவடையும்.

ஊழல் மற்றும் முறைகேடுகள் காரணமாக இலங்கை தனது வருடாந்த GDP -மொத்த உள்நாட்டு உற்பத்தி- வளர்ச்சியில் சுமார் 2 சதவீதத்தை இழந்துள்ளதாக பொருளாதார நிபுணர்கள்

வரலாற்று ரீதியாகக் குறிப்பிட்டுள்ளனர். பல பில்லியன் டொலர் பொருளாதாரத்தில், 2 சதவீதம் என்பது மருத்துவமனைகள், பாடசாலைகள் மற்றும் நவீன போக்குவரத்து வலையமைப்புகளை உருவாக்கக்கூடிய பில்லியன் கணக்கான ரூபாயைக் குறிக்கின்றது. 2020ஆம் ஆண்டில் இடம்பெற்ற சீனி மோசடியை கருத்திற் கொள்ளுங்கள்! இது அரசுக்கு சுமார் 15.9 பில்லியன் ரூபாய் வரி வருவாய் இழப்பை ஏற்படுத்தியது. பொதுமக்கள் வாழ்க்கைச் செலவு அதிகரிப்பால் திண்டாடியபோது, கருவூலத்திலிருந்து மறைந்த இந்தப் பணம் சிலரின் pocketsக்குள் சென்றது.

ஊழல் என்பது நேரடி வெளிநாட்டு முதலீட்டின் மிகப் பெரிய எதிரியாகும். உயர்தர முதலீட்டாளர்கள் நிலையான தன்மையையும் சட்டத்தின் ஆட்சியையுமே எதிர்பார்க்கின்றார்கள். திட்டங்களை விரைவுபடுத்த இலஞ்சம் ஒரு முன்நிபந்தனையாக மாறும்போது, நாம் சுரண்டும் முதலீட்டாளர்களை மட்டுமே ஈர்க்கின்றோம். அதேநேரத்தில், முறையான வணிகங்கள் தங்களின் மூலதனத்தை வேறு நாடுகளுக்குக் கொண்டுசெல்கின்றன. இவற்றையெல்லாம் நிறுத்துவதற்கு இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு சுயாதீனமாக இயங்க வேண்டும். அப்பொழுதுதான் எமது நாட்டுக்குத் தேவையான நல்லதோர் அரசை அமைத்து, அதன்மூலம் ஊழலை நிறுத்தக்கூடியதாக இருக்கும். எனவேதான் குறித்த தீர்மானத்துக்கு ஆதரவு தருமாறு நாங்கள் கேட்கின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தத் தீமையை ஒழிக்க நாம் வெறும் பேச்சுகளுக்கு அப்பால் செல்ல வேண்டும். 2023ஆம் ஆண்டின் ஊழல் எதிர்ப்புச் சட்டம் அதற்கான கட்டமைப்பை வழங்குகின்றது. அதை அமுல்படுத்துவதே இன்றைய முக்கிய தேவையாகும். 2025ஆம் ஆண்டில் மட்டும் இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவுக்கு 8,400க்கும் மேற்பட்ட புகார்கள் கிடைத்துள்ளன. இது பொது நிறுவனங்களின் திறமையின்மையாகும். இந்த எண்ணிக்கை பொது நம்பிக்கையின் பாரிய வீழ்ச்சியைக் கோடிட்டுக் காட்டுகின்றது. முன்னோக்கிச் செல்லும் பாதை என்பது தரவு அடிப்படையிலான சீர்திருத்தமாகும்.

கையகப்படுத்தப்பட்ட உண்மை உரிமையாளர்கள் பதிவு: 'ஷெல்' நிறுவனங்கள்மூலம் சட்டவிரோத நிதிப் புழக்கத்தைத் தடுப்பதற்கு இது அவசியமாகும். பொதுத்துறையின் டிஜிட்டல் மயமாக்கல்: மோட்டார் போக்குவரத்துத் திணைக்களம் முதல் இலங்கைச் சுங்கம் வரை அரசாங்கப் பரிவர்த்தனைகளில் தரகர்களை நீக்குவதன்மூலம் இலஞ்சம் பெறுவதற்கான வாய்ப்புகளை நாம் அகற்றுகின்றோம். தகவல் வழங்குபவர்களுக்கான பாதுகாப்பு: உண்மை பேசுபவர்கள் அதிகாரமிக்கவர்களால் ஒடுக்கப்படாமல் இருப்பதை நாம் உறுதிசெய்ய வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உலகளாவிய தரவரிசையில் நாம் 14 இடங்கள் முன்னேறியிருப்பது ஒரு நம்பிக்கைக் கீற்றாகும். ஆனால், அது நிலையான சுடராக மாற வேண்டும். ஊழலை மேல்தட்டு மக்களின் வணிக மாதிரியாகத் தொடர நாம் அனுமதிக்க முடியாது. எமது நாட்டின் தலைவர்களின் நலன்களைவிட, எமது சட்டங்கள் வலிமையானவை என்பதை நாம் உலகுக்கு நிரூபிக்க வேண்டும்.

எமது நாடு ஊழலால் எவ்வளவு தூரம் வங்குரோத்து நிலையை அடைந்தது என்பதை நாங்கள் நன்கறிவோம். அதிலிருந்து நாங்கள் மெல்ல மெல்ல மீண்டெழுந்து வந்தாலும், எமக்கு முன்னால் இன்னும் பாரிய சவால்கள் இருந்து கொண்டுதான் இருக்கின்றன. இன்று மத்திய கிழக்கில் ஏற்பட்டுள்ள போர் சூழல் காரணமாக எமது எரிபொருள் விநியோகச் சங்கிலியில் பல தடங்கல்கள் ஏற்பட்டிருக்கின்றன. இது எங்களுடைய கட்டுப்பாட்டுக்கு அப்பாற்பட்டது. எனினும், அரசாங்கம் என்ற வகையில் நாங்கள் இதற்குத் தகுந்த நடவடிக்கைகளை எடுத்து வருகின்றோம். இந்த நிலைமை போரால் ஏற்பட்டதே ஒழிய, வேறு எந்தக் காரணத்தாலும் ஏற்படவில்லை என்பதை மக்கள் விளங்கிக் கொள்ள வேண்டும். சென்ற காலங்களில் டொலர் இன்மையால்தான் எரிபொருளைப் பெற்றுக்கொள்ள முடியாமல் இருந்தது. ஆனால், இன்று அப்படியல்ல, எங்களிடம் போதியளவு டொலர் கையிருப்பில் இருக்கின்றது. எனினும், எங்களால் எரிபொருளைப் பெற முடியவில்லை. எரிபொருளை சட்டவிரோதமாக களஞ்சியப்படுத்துவதை நிறுத்தவும் சிக்கனமாகப் பாவிப்பதற்காகவும் நேரவிரயத்தைத் தடுப்பதற்காகவுமே QR முறைமையை நாங்கள் நடைமுறைப்படுத்தி இருக்கின்றோம். சில போலி ஊடகங்கள் இதைத் தவறாக சித்திரித்து, மக்களை மீண்டும் வரிசையில் - queueஇல் - நிற்பதற்கான ஏற்பாடுகளைச் செய்துகொண்டு இருக்கின்றன. தயவுசெய்து, அவற்றைக் கைவிடுமாறு அரசாங்கத்தின் சார்பில் கேட்டுக் கொள்கின்றோம்.

எமது வட மாகாணத்தில் மீன்பிடி, விவசாயம், கைத்தொழில் போன்றவற்றுக்குத் தேவையான எரிபொருளைத் தடையின்றி வழங்குவதற்கான நடவடிக்கைகளை நாங்கள் மேற்கொண்டு இருக்கின்றோம். அத்தோடு, அத்தியாவசிய சேவையாகிய வைத்தியத்துறை மற்றும் ஏனைய துறை சார்ந்தவர்களுக்குப் போதியளவு எரிபொருளை வழங்கி வருகின்றோம். அவர்களின் சேவைக்கு நாங்கள் ஒருபோதும் தடையாக இருக்க மாட்டோமெனக் கூறிக்கொள்ள விரும்புகின்றோம். தற்போது விவசாய நடவடிக்கைகள் ஆரம்பிக்கப்பட்டு இருப்பதாக எதிர்க்கட்சி உறுப்பினர்கள் குறிப்பிட்டு இருந்தார்கள். நிலத்தைப் பண்படுத்துதல், அறுவடை போன்ற வேலைகளுக்கு விசேட ஒதுக்கீட்டின்மூலம் எரிபொருளை வழங்குவோம் என்பதை இங்கு உறுதிபட கூறிக்கொள்ள விரும்புகின்றோம். தயவுசெய்து, இந்த எரிபொருள் பிரச்சினையை அரசியல் பிரச்சினையாகப் பார்க்க வேண்டாம். இது இலங்கையில் மட்டுமல்ல, உலகளாவிய ரீதியில் ஏற்பட்டுள்ள ஒரு பிரச்சினையாகும். இதற்கு நாங்கள் விரைவில் தீர்வுகண்டு, மக்களின் ஒத்துழைப்புடன் அவர்களுக்குத் தேவையான எரிபொருளை வழங்குவோம். எனவே, தேவையற்ற சட்டவிரோத களஞ்சியப்படுத்தலை நிறுத்துமாறு மக்களைக் கேட்டுக் கொள்கின்றோம்.

இறுதியாக, ஒரு விடயத்தைக் கூறி முடிக்கின்றேன். "When you focus on problems, you will have more problems. When you focus on possibilities, you will have more opportunities" என்ற கூற்றுக்கு ஏற்ப, கிடைக்கும் வாய்ப்புகளை மக்களுக்கு வழங்கி, அதன்மூலம் அவர்களின் வாழ்க்கையை மேம்படுத்தி, அவர்களை இந்தப் பிரச்சினைகளிலிருந்து பாதுகாப்போமெனக் கூறி, வாய்ப்பளித்தமைக்கு மீண்டும் நன்றி கூறி விடைபெறுகின்றேன். வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.11]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ යෝජනාව හරහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරින් අලුත් වැටුප් තලවල පිහිටුවලා, නිවැරදි විධියට අලුත් නිලධාරින් බඳවාගෙන, මේ වසරේ දූෂණ විරෝධී වැඩ පිළිවෙළ දිස්ත්‍රික්ක 9ක ක්‍රියාත්මක කරන්න අවශ්‍ය අඩිතාලම දමන්න සහයෝගය දෙන්න ලැබීම ගැන මම සතුටු වෙනවා.

විශේෂයෙන්ම පසුගිය කාල වකවානුව තුළ එම කොමිෂන් සභාවේ සභාපතිතුමා, කොමසාරිස්තුමන්ලා, විශේෂයෙන්ම අධ්‍යක්ෂ ජනරාල්තුමා මේ සම්බන්ධව විශේෂ වැඩ කොටසක් ඉටු කළා. මේ රටේ දූෂණය නැවැත්වීම සඳහා පියවර ගන්න කරන කැපවීම පිළිබඳව ඒ සියලුම නිලධාරින්ට ස්තුති කරන්නත් මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

විශේෂයෙන්ම මේ ආණ්ඩුව එනකොට දිගටම කිව්වේ, හොරු අල්ලන්න ආපු ආණ්ඩුවක් කියායි. කලින් කියන්න පටන් ගත්තා, 225දෙනාම හොරු, ඒ හොරු ඉවත් කරන්න ඕනෑය කියලා. ඒ වාගේම වල් පැළ වෙනුවට මල් පැළ ගේන්න ඕනෑ කියලා තමයි මෙගොල්ලෝ කථා කළේ. හැබැයි, අද වෙනකොට, ඒ කියන්නේ අවුරුදු එකහමාරක් ඇතුළත මේ ආණ්ඩුව තුළ හොරු විශාල සංඛ්‍යාවක් බිහිවෙලා තිබෙනවා. පළමුවැනි චෝදනාව කථානායකවරයාට විරුද්ධව ඇවිල්ලා තිබෙනවා. මේ සභාවේ ප්‍රධාන පුටුවේ සිටින කෙනාට. ඔහුට විරුද්ධව චෝදනා ගණනාවක් ඇවිල්ලා තිබෙනවා. ඒවා ඉතාම බරපතළ චෝදනා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ඒ පිළිබඳ කරුණු ඉදිරිපත් කරලා මාස එකහමාරක් වෙනවා. හැබැයි, ඒ පිළිබඳව සොයන්න අද වනතුරු වැඩ පිළිවෙළක් සකස් කරලා නැහැ. නමුත්, පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්ට විරුද්ධ චෝදනාව දැන් විභාග වෙමින් පවතිනවා කියලා තමයි අපට ආරංචි වෙලා තිබෙන්නේ.

ඊළඟට, දූෂණ විරෝධී පනතේ 3(5) සහ 125, 127 වගන්ති ගත්තොත්, තමාට එරෙහිව එල්ල වී ඇති දූෂණ චෝදනාවලට පිළිතුරු ලබා දීම සඳහා මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම ඉතාම බරපතළ කාරණාවක් බවට පත්වෙලා තිබෙනවා. මේක දැඩි වරදක්. අධ්‍යක්ෂ ජනරාල්තුමාත් අද පාර්ලිමේන්තුවේ සිටින නිසා මම කියන්න කැමැතියි, මේ කාරණය. පසුගිය පෙබරවාරි 23වන දා, ඒ වාගේම පෙබරවාරි 24වන දා "සිරස" මාධ්‍යයේ "one2one" සහ "දවස" වැඩසටහන් යටතේ සාකච්ඡා දෙකක් පැවැත්වුණා. ඒ සාකච්ඡාව අරගෙන තිබුණේ පාර්ලිමේන්තුවේදී. පාර්ලිමේන්තුවේ තිබෙන ඒවාත් අවභාවිත කරලා තමයි ඒක කරලා තිබෙන්නේ. එම නිසා මම ඔබතුමාගෙන් ඉල්ලනවා, ලොක්කාද, පොඩ්ඩාද කියලා බලන්න එපා, කරුණාකරලා ඒකට විරුද්ධව කටයුතු කරන්න කියලා. ඔබතුමා එවැනි දේවල්වලට විරුද්ධව කටයුතු කරන කෙනෙක්, අප තුළ ලොකු ගෞරවයක් තිබෙන කෙනෙක්. එම නිසා කරුණාකරලා මේ සම්බන්ධයෙන් වහාම පියවරක් ගන්න. මොකද, ඔබතුමා මෝරාද, හාල්මැස්සාද කියලා බලන්නේ නැතුව, හරියට වැඩ කරන කෙනෙක්. එම නිසා මේ සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මක වෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ විතරක් නොවෙයි, තමන් කරපු පැරණි වැරැද්ද වහගන්න කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම සඳහා කථානායකවරයා අගමැතිවරියට එය ඉදිරිපත් කරලා තිබුණා. අගමැතිතුමිය ඒක ප්‍රතික්ෂේප කරලා තිබුණා. අගමැතිතුමියත් මේකට පටලවා ගන්න තමයි වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙන්නේ. තමන් කරපු පරණ වැරැද්ද හදාගන්න, ඒක balance කර ගන්න කැබිනට් පත්‍රිකාවක් දාලා තිබෙනවා. අද ඒකත් ඉවත දාලා තිබෙනවා. චෝදනාවලට ලක්වෙලා සිටින අය වෙනුවෙන් පෙනී නොසිටීම පිළිබඳව අපි අගමැතිතුමියට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම දූෂණ සම්බන්ධයෙන් මතුවෙලා තිබෙන තවත් කාරණයක් තමයි ගල් අඟුරු වංචාව. අද ගල් අඟුරු වංචාව ගැන විශාල සාකච්ඡාවක් ඇතිවෙලා තිබෙනවා. COPE එකේ සභාපතිතුමා මම ගරු කරන කෙනෙක්. නමුත්, එතුමා මේ වංචා ආරක්ෂා කරගන්න කථා කරන එක ගැන මම කනගාටු වෙනවා. මේ වාගේ ප්‍රශ්නයක් ඇති වුණාම ඉතිහාසයේ කවදාවත් COPE එකේ සභාපතිවරයෙක් ඒ ගැන වැඩිය කථා කරන්න ගියේ නැහැ. මොකද හේතුව, ඔහු ගිහිල්ලා ඒ කමිටුවේ ඉඳගන්න ඕනෑ. දැන් එතුමා ගිහිල්ලා මේක බේරන්න කථා කරනවා. එතකොට අපි කොහොමද එතුමා ඉස්සරහට ගිහිල්ලා මේ ගැන කථා කරන්නේ? එතුමා කථා කරන්නේ ඒ කාරණය හරියි කියන්න. එතුමා කථා කරන්න ඕනෑ, අපේ විගණන වාර්තාව එක්ක මිසක්, කලින් තිබුණු කාරණාත් එක්ක නොවෙයි. එහෙම කරන්නේ එතුමාගේ නොදැනුවත්කම නිසා වෙන්න පුළුවන්. නමුත්, ඒක ඉතාම වැරැදියි.

එතුමා එදා නොරොච්චෝලේ ගිහිල්ලා සාකච්ඡා කරමින් ඉන්නකොට ඒ බලාගාරයේ පවර් එක මෙගාවොට් 252.2යි. ඒක ඉහළින් සටහන් වෙලා තිබුණා. පවර් එක මෙගාවොට් 300ක් තිබෙන්න ඕනෑ තැන තිබුණේ මෙගාවොට් 252.2යි. නමුත්, එළියට ඇවිල්ලා කියනවා, එතැන ප්‍රශ්නයක් නැහැ කියලා. මට තේරෙන්නේ නැහැ, එහෙම කථා කරන්නේ කොහොමද කියලා.

විශේෂයෙන්ම මේකේ බොහොම පැහැදිලිව තිබෙනවා, කිලෝග්‍රෑම් එකකට තිබිය යුතු කිලෝ කැලරි ප්‍රමාණය,-

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නිශාන්ත සමරවීර මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, COPE එකේ සභාපතිවරයා විධියට මට පැවරී තිබෙන විෂය පථය අනුවයි මම කටයුතු කරන්නේ. ඒ වාගේම, කිසිවක් නොදැන නොවෙයි මම කටයුතු කරන්නේ. රාජ්‍ය ව්‍යාපාර ක්ෂේත්‍රයට අයත් ඒ ආයතන 457 තුළ සිදු වෙන විගණන ක්‍රියාවලියට අදාළ යම් නිරීක්ෂණ ප්‍රමාණයක් කරන්න මට අයිතිය තිබෙනවා. ඒ වාගේම, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

කෙටියෙන් පවසා අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මොකද, එදාත් විපක්ෂයේ මන්ත්‍රීවරුන් මේ ගැන

කිව්වා. ඒ නිසා මට මේ සඳහා අවස්ථාව දෙන්න. මම පසුව හරි පැහැදිලි කිරීමක් කරන්නම්. ඒක වෙනම දෙයක්. නමුත් දිගින් දිගටම මේ වාගේ අපහාසාත්මක ප්‍රකාශ COPE එකට එරෙහිව කරන්න ඉඩ දෙන්න බැහැ. එතුමාත් COPE එකේ සාමාජිකයෙක්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හරි, හරි.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
COPE එක නොදැන කිසිවක් කරන්නේ නැහැ. COPE එකට අදාළ පෞරුෂය තබාගෙන තමයි ඒ අදාළ නිරීක්ෂණ කරන්නේ. හරිම විමර්ශනයක් කළ යුතු නිසාම තමයි ඒක කරන්නේ. වෙන කිසිවක් නිසා නොවෙයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අපි ඒක වෙනම බලා ගනිමු. මගේ කථාව මම කිව්වේ. ඒ ගෞරවය තබා ගන්න එක, ඔබතුමා කරන්න ඕනෑ කාරණයක්. ඒක අපේ කාරණයක් නොවෙයි. ඒ නිසා ඒ වැඩේ ඒ වෙලාවට කර ගනිමු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ වෙලාවේ කියන්න කැමැතියි, මේ ඉදිරිපත් කර තිබෙන මහජන උපයෝගිතා කොමිෂන් සභා වාර්තාවේ බොහොම පැහැදිලිව ප්‍රශ්න ගණනාවක් තිබෙන බව. නමුත් මම ඒ ගැන වැඩිදුර කථා කරන්න යන්නේ නැහැ.

ඊළඟට මම කියන්නේ ගෑස් සම්බන්ධ කාරණය ගැනයි. ගෑස් හිඟයක් ඇති වුණේ ලෝකයේ ඇති වුණු තත්ත්වය එක්කයි කියලා මේ ආණ්ඩුව සඳහන් කරන්න හදනවා. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. බලන්න, දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ගෑස් supply කරන company එකට බොහොම පැහැදිලිව කියා තිබෙන්නේ මොකක්ද? Vessels 4කට එන්න ඒගොල්ලන් අනුමැතිය දීලා තිබෙනවා. ඒගොල්ලන් කියා තිබෙනවා, අපි ගාව නැව් - vessels - 4ක් තිබෙනවා කියලා. හැබැයි, දැන් වැඩ කරන්නේ නැව් 2යි. ඒ නිසා තමයි මේ ගෑස් හිඟයක් ඇති වෙලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, මෙට්‍රික් ටොන් 1,500ක් ඒගොල්ලන් stock එකක් විධියට තබා ගන්න ඕනෑ. නමුත් අද එහෙම stock එකක් නැහැ. ඒ නිසා ගෑස් හිඟයක් ඇති වෙලා තිබෙනවා. මේක ලෝකයේ ඇති වුණු තත්ත්වය නිසා ඇති වුණු දෙයක් නොවෙයි. මේක තමයි අද ඇති වෙලා තිබෙන තත්ත්වය. ඒ විතරක් නොවෙයි, ඒකට ඩොලර් 30,000ක දඩයක් ගහනවා කියා පැහැදිලිව කියා තිබෙනවා. නමුත් අද වෙනතුරු ශත 5ක්වත් අය කරගෙන නැහැ. මේවා ගැන මම එකින් එක පැහැදිලි කළේ, මේ කාරණය නිසායි.

ජනවාරි 14වන දා වෙනකොට ලෝකයේ විශාල අර්බුදයක් ඇති වෙනවා කියලාත් මේ ආණ්ඩුව දැන සිටියා. ඇත්තවශයෙන්ම අපිට මෙට්‍රික් ටොන් 420,000ක් ගබඩා කරන්න පුළුවන්, දැනට තිබෙන ඒවායේ. මේගොල්ලන් මොකක්ද කිව්වේ? ගබඩා නැහැ, ගබඩා නැහැ කිය කියා හිටියා. හැබැයි, මෙට්‍රික් ටොන් 420,000ක් ගබඩා කිරීමට අපට තිබෙන ගබඩා පාවිච්චි කරන්න පුළුවන්. ඒ වාගේම සමාගම් තුළ තිබෙන ඉන්ධන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 40,000ක්. ඒ අනුව මෙට්‍රික් ටොන් 460,000ක් ලංකාවේ ගබඩා කරගන්න පුළුවන්. හැබැයි, දැන් මොකද වෙලා තිබෙන්නේ? දැන් ඇවිල්ලා කියන්නේ මොකක්ද? 2026 මාර්තු 16වන දා වනවිට තෙල් සංස්ථාවේ පැවැති තොග ධාරිතාව ඩීසල් මෙට්‍රික් ටොන් 20,300යි, පෙට්‍රල් මෙට්‍රික් ටොන් 61,100යි. එතකොට මෙට්‍රික් ටොන් 460,000ක් ගබඩා කරගන්න පුළුවන් ටැංකි තිබියදීත් ටැංකි නැහැ, ටැංකි නැහැ කිය කියා කෑ ගසමින් හිටියා. කොළොන්නාවේ අර 31වැනි ටැංකිය කපලා පැත්තකට කර තිබෙනවා. මේ විධියට මේ සියල්ලම තමන් විසින් කරගත් විනාශයක්. ඒ මිසක්, ටැංකි නැති ප්‍රශ්නයක් නොවෙයි මෙතැන තිබෙන්නේ. තිබෙන ටැංකිවලට පුරවා ගත්තේ නැති ප්‍රශ්නය තිබෙන්නේ. ජනවාරි මාසයේ 14වන දා මේ වාගේ තත්ත්වයක් එනකොට, මේ term tenders තිබෙන කට්ටියට කියන්න තිබුණා, "අපට තව නැව් ටිකක් ඊට කලින් ගෙන්වා ගන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න" කියලා. නමුත් මොකක්ද කළේ? ඒවා කළේ නැහැ. ඒවා කරලා ඊට පසුව QR system එක ගෙනාවා නම් ඇත්තවශයෙන්ම අද මේ වාගේ දහලන්න වුවමනාවක් නැහැ. දැන් ඇවිල්ලා කියනවා, අප්‍රේල් 23වන දා දක්වා විතරයි පෙට්‍රල්, ඩීසල් තිබෙන්නේ, එතැනින් පසුව ප්‍රශ්නයක් එන්න පුළුවන් කියලා. ඉතින් මිනිස්සු පාරවල් දිගේ. අදත් ඇවිල්ලා කෑ ගහනවා. ගෝඨාභය රාජපක්ෂගේ කාලයේ මිනිස්සු පෙළපාළි ගියත් තෙල් ටික ගෙනැල්ලා දුන්නා. අද තෙල් ටික ගෙනැල්ලා දෙන්නේත් නැහැ. ඒකයි තිබෙන ප්‍රශ්නය.

විශේෂයෙන්ම Iranian Light crude oil ගෙන්වා ගන්න බැරි වුණොත්, ගැටලුවක් වෙනවා. දැනට ඩීසල් මෙට්‍රික් ටොන් 5,500ක් දැම්මාම එන්නේ මෙට්‍රික් ටොන් 1,300යි. එතකොට මෙට්‍රික් ටොන් 3,400ක් දැම්මාම, මෙට්‍රික් ටොන් 650ත්, 750ත් අතර ප්‍රමාණයක් එන්නේ. කැලණිතිස්ස විදුලි බලාගාරය පවත්වා ගෙන යන්න දවසකට ඉන්ධන මෙට්‍රික් ටොන් 1,000ක් අවශ්‍ය වෙනවා. ඒ වාගේම අනෙක් බලාගාරවලට මෙට්‍රික් ටොන් 350ක් වාගේ අවශ්‍ය වෙනවා. දැවි තෙල් මෙට්‍රික් ටොන් 1,300ක් අවශ්‍යයි. ඒ නිසා මේ සඳහා නිශ්චිත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක නොකළොත්, අපි විශාල අර්බුදයකට තල්ලු වන බව මතක තබා ගත යුතු වෙනවා.

තෙල් සංස්ථාවේ සභාපතිතුමා 01වැනි දා කිව්වේ මොකක්ද? දින 35කට ඩීසල් තිබෙනවා කිව්වා, ඒ වාගේම දින 37කට පෙට්‍රල් තිබෙනවා කිව්වා. 02වැනි දා ඇවිල්ලා කිව්වා, දින 26කට සහ දින 32කට තමයි පෙට්‍රල් සහ ඩීසල් තිබෙන්නේ කියලා. එතුමා 01වැනි දා කියපු කථාවට වඩා වෙනස් කථාවක් තමයි 02 වැනි දා කිව්වේ. ඒ නිසා ආණ්ඩුව මේ පිළිබඳ වගකීම සම්පූර්ණයෙන්ම භාර ගන්න ඕනෑ.

අපි කිසි වෙලාවක මේ කාරණය පාවිච්චි කරලා දේශපාලනය කරන්න සූදානම් වෙන්නේ නැහැ. තමුන්නාන්සේලා මෙච්චර කාලයක් කිව්වේ මොකක්ද? තෙල් නැවක් එන එකත් රටේ ප්‍රවෘත්තියක් වෙලා තිබෙනවා කිව්වා. අපි එහෙම කියන්න යන්නේ නැහැ. හැබැයි, අපි දන්නවා, මේ අර්බුදයට අපි සියලු දෙනාම මුහුණ දිය යුතු බව. කිසි වෙලාවක මේ කාරණය පාවිච්චි කරලා දේශපාලනය කරන්න අපට බලාපොරොත්තුවක් නැහැ. හැබැයි, මේ කාල වකවානුව තුළ තමුන්නාන්සේලාට කරන්න පුළුවන් කාර්යභාරයක් තිබුණා. ඒක නොකරපු එක තමයි මෙතැන තිබෙන විශාලම අර්බුදය විධියට අප දකින්නේ.

අපේ අධ්‍යක්ෂ ජනරාල්තුමාත් රාජ්‍ය නිලධාරි මැදිරියේ ඉන්න නිසා තවත් කාරණයක් ගැන කියන්න මම කැමැතියි. 2015දී දූෂණ විරෝධී පෙරමුණ වෙත පැමිණිලි ඉදිරිපත් කර තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩි වෙලාවක් ලබා දෙන්න.

මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, ජාතික ගමනාගමන කොමිෂන් සභාවට අදාළ කාරණයක් ගැන. අපේ අගවිනිසුරු ප්‍රීති පද්මන් සූරසේන මැතිතුමා ඇතුළු පිරිසක් තමයි ඊට අදාළව කටයුතු කළේ. එහිදී චෝදනා ලබා සිටිනවා ඉෆ්තිකාර් මහතා, අධ්‍යක්ෂ, තත්ත්ව ආරක්ෂණ හා බාහිර සම්බන්ධතා දෙපාර්තමේන්තුව; කපුගේ අලෝකා චාන්දනී මහත්මිය, අධ්‍යක්ෂ, සැලසුම් දෙපාර්තමේන්තුව සහ ෂෙරීන් දිල්රුක්ෂි මහත්මිය, අධ්‍යක්ෂ, ධාවන හා සේවා අධීක්ෂණ දෙපාර්තමේන්තුව. මේ අය සම්බන්ධව චෝදනා විශාල සංඛ්‍යාවක් තිබෙනවා. මේ අයට දඬුවම් කරන්න කියලා මේ පොතේ තිබෙනවා. නමුත් අද වනතුරු කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. මම විශේෂයෙන්ම ඉල්ලනවා, ඒ සම්බන්ධවත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න කියලා. ඒ බවත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්දන තෙන්නකෝන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.22]

**ගරු චන්දන තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දූෂණ විරෝධී පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි තීරණය කිරීම; අනුමත කිරීම පිළිබඳ මේ සුවිශේෂී විවාදයට සම්බන්ධවීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ අපි ආණ්ඩුව විධියට දූෂණයට විරුද්ධව, අල්ලසට විරුද්ධව ක්‍රියාමාර්ග ගණනාවක් ගනිමින් සිටිනවා. නමුත් අපි දන්නවා, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත මේ පාර්ලිමේන්තුවේ සම්මත කළත්, පසුගිය ආණ්ඩු දූෂණයට එරෙහි ක්‍රියාමාර්ග, සටන ශක්තිමත් කළේ නැති බව. ඒකට හේතුව, ඔවුන්ගේ මුළු ඉතිහාසයම, ඔවුන්ගේ මුළු පක්ෂ දේශපාලනයම දූෂණයෙන්, වංචාවෙන් පිරිලා, ඒ හැමෝටම චෝදනා එල්ල වෙලා තිබීමයි. ඒ නිසා ඒගොල්ලෝ හැම වෙලාවේම බැලුවේ නීතිය ක්‍රියාත්මක කරන, නීතිය පසිඳලන පරීක්ෂණ ආයතන ඇතුළු සියලු ක්ෂේත්‍ර අඩපණ කරන්නයි; ඒවා ක්‍රියාත්මක වීම වළක්වන්නට අදාළ ක්‍රියාමාර්ග ගන්නයි. ඔවුන් කළේ ඒකයි. හැබැයි, වර්තමාන ආණ්ඩුවේ අපේ දේශපාලන අභිලාෂය තමයි, මේ ආයතන හැකිකාත් ඉක්මනින් ශක්තිමත් කරලා මේ වංචනිකයන්ට, දූෂිතයන්ට එරෙහිව දඬුවම් දීලා මේ රට නැවත දූෂණයෙන් තොර රටක් බවට පත් කරන එක. එයයි අපේ අරමුණ වෙලා තිබෙන්නේ.

අද දවස තුළ අපි මේ පනත යටතේ කොන්දේසි ගණනාවක් සම්පූර්ණ කරන්න කටයුතු කරනවා. දූෂණයේ ස්වභාවය අද වෙනස් වෙලා තිබෙනවා. දූෂණ, අපරාධ පෙර පැවතුණාට වඩා සංකීර්ණ වෙලා තිබෙනවා. ඒ නිසා මේ පරීක්ෂණ ආයතනවලට අවශ්‍යයි, විවිධ විශේෂඥ දැනුම තිබෙන පිරිස්. ඒ දැනුම තිබෙන පිරිස් මේ ක්ෂේත්‍රයට එකතු කර ගන්න නම් ඊට අදාළ වැටුප් තලවල පිහිටුවන්න අවශ්‍යයි. ගණකාධිකරණය සම්බන්ධව දැනුම තිබෙන, විගණනය පිළිබඳව අවබෝධය තිබෙන, බැංකුකරණය පිළිබඳව අවබෝධය තිබෙන, ඉංජිනේරු විද්‍යාව පිළිබඳව, පරිගණක ක්ෂේත්‍රය පිළිබඳව අත්දැකීම් තිබෙන නිපුණ තැනැත්තන් මේ ක්ෂේත්‍රයට ගේන්න නම් ඊට අදාළ වැටුප් තලවල පිහිටුවීම අවශ්‍යයි. ඒ නිසා අද දවසේ අපි ඊට අදාළ ක්‍රියාමාර්ග මේ හරහා යෝජනා කර තිබෙනවා. ඒ වාගේම, මේ ක්‍රියාවලියේ යෙදෙන්නන් සඳහා යෝජිත දූෂණ විරෝධී අවදානම් දීමනාව ලබා දීමට, කාර්ය සාධන දීමනාව ලබා දීමට අපි අද දවසේ කටයුතු කර තිබෙනවා. අපි විශ්වාස කරනවා, එමඟින් මේ ක්‍රියාවලිය වඩවඩාත් ශක්තිමත් වෙයි කියලා. අනෙක් පැත්තෙන්, මේ කොමිසමේ කාර්යභාරයන් වඩාත් ශක්තිමත් කිරීමට අවශ්‍ය 971දෙනෙකු බඳවා ගැනීම් කරන්න අවශ්‍ය අනුමැතියත් අපි අද දවසේ මේ ගරු සභාවේදී ලබා දෙනවා. මේ කොමිෂන් සභාවේ කාර්යයන් මෙතෙක් කාලයක් කොළඹට කේන්ද්‍ර වෙලායි තිබුණේ. එය දිස්ත්‍රික්ක මට්ටමට විමධ්‍යගත කරන්න අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා අනුමැතිය ලබා දෙන්නත් අද දවසේ අපි බලාපොරොත්තු වෙනවා.

අපි දන්නවා, නිදහසින් පසුව ලංකාවේ දූෂණය, අල්ලස, පගාව ඉහ වහා ගිහින් තිබෙන බව. බොරලු පාරෙන්, බෝක්කුවෙන්, පාලමෙන් පටන් ගත්තු ඒ දූෂණය, වංචාව ඉස්සරහට ඇවිල්ලා සීනි බදු වංචාව, සුදු ලූනු වංචාව, මහ බැංකු වංචාව, රාජ්‍ය දේපළ කුණු කොල්ලයට විකුණන වංචාව දක්වා පුළුල් වෙලා ඉතාම සංකීර්ණ තැනකට ඇවිත් තිබෙනවා.

ඒත් එක්කම තමයි රට පුරාත්, ලෝකය පුරාත්, දූෂණ විරෝධී අරගළයක්, රැල්ලක් මතු වුණේ. එහි ප්‍රතිඵලයක් විධියට තමයි දූෂණ විරෝධී පනත අපේ රටේ පාර්ලිමේන්තුවේදී සම්මත වුණේ. පනත සම්මත වුණත්, ඒ පනත ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රතිපාදන එදා පැවැති ආණ්ඩුව -අද විපක්ෂයේ සිටින අය- විසින් සකස් කර දී තිබුණේ නැහැ. එම නිසා අපි විශ්වාස කරනවා, රටක නීති, අණ පනත් කොතරම් ප්‍රමාණයක් තිබුණත් ඒවාට බලය ලැබෙන්නේ, හයිය ලැබෙන්නේ දේශපාලන බලය හොබවන නායකයන්ගේ කැමැත්ත, අභිලාෂය මතයි කියලා. ඒ අයගේ කැමැත්ත, අභිලාෂය ඒවාට බලපානවා. නීති කොහොමටත් තිබෙන්න පුළුවන්. හැබැයි, පසුගිය ආණ්ඩු හොරකම්, වංචාවල එල්බගෙනයි හිටියේ. ඒගොල්ලන් හැමෝටම චෝදනා තිබෙනවා. එම නිසා ඒගොල්ලන් හැම වෙලාවේම බැලුවේ නීතිය ක්‍රියාත්මක කරන ආයතන අකර්මණ්‍ය කරන්නයි. අපේ වර්තමාන ආණ්ඩුවේ ජන මතය වුණේ, අපි ජනතාවට දුන්නු පොරොන්දුව වුණේ, නීතිය, නීතියේ අධිපත්‍යය හා නීතියේ විධානය හරියාකාරව මේ රටේ ස්ථාපිත කරන එකයි. එම නිසා ගරු ජනාධිපතිතුමාගේ ඉඳන් කැබිනට් මණ්ඩලය ඇතුළු අපේ මුළු රජයේම අභිලාෂය වන්නේ, නීතිය හරියාකාරව ක්‍රියාත්මක වන රටක් හැදීමයි. ඒ වෙනුවෙන් අපි පෙනී සිටිනවා. ඒ නිසාම අපි විශ්වාස කරනවා, දූෂණයට, වංචාවට එරෙහිව ක්‍රියාත්මක වන්න ඊට අදාළ සියලු ආයතනවල ප්‍රධානීන්ට සහ එම කාර්ය මණ්ඩලවලට අමුතු ජීවයක්, ශක්තියක්, පණක්, කොන්දක් ලැබී තිබෙනවා කියලා. අන්න ඒ කොන්ද ලබා දුන්නේ මේ ආණ්ඩුවේ තිබෙන දේශපාලන කැපවීම හා දේශපාලන හයියයි කියන එක මම මේ ගරු සභාවට සඳහන් කරන්න කැමැතියි.

පසුගිය කාලයේ දූෂණ සංජානන දර්ශකයේ - CPI - 121වන ස්ථානයේ සිටි අපි දැන් ඉහළට ඇවිත් තිබෙනවා. එම දර්ශකයට අනුව රටවල් 14ක් පහු කරලා අපි නිකම්ම ඉහළට ආවා නොවෙයි. එම දර්ශකය අතින් අපේ රට ඉදිරියට ඒමෙන් පෙන්නුම් කරන්නේ, පවතින රජයේ දේශපාලන කැපවීමයි; එම

දේශපාලන කැපවීම නිසා නීතිය පසිඳලන සහ එම පරීක්ෂණ ආයතනවල ක්‍රියාකාරී වීමේ ප්‍රගතියයි; එය ජාත්‍යන්තරව පිළිගත්තු බවයි. එම දර්ශකය අතින් අපේ රට ඉදිරියට ඒමෙන් අපට හඳුනා ගන්න තිබෙන්නේ එයයි. ජාතික ජන බලවේගය රජය පත් වෙලා වසරක් වාගේ කෙටි කාලයක් ඇතුළත දූෂණයට එරෙහිව සටනක් කරගෙන ගියා; දූෂණයට එරෙහිව ක්‍රියාත්මක වන ආයතන ශක්තිමත් කරන්න විශේෂ ක්‍රියාමාර්ග ගණනාවක් ගත්තා. ඇත්ත වශයෙන්ම එහි ප්‍රතිඵලය අද දේශීය වශයෙනුත්, ජාත්‍යන්තර වශයෙනුත් දකින්න පුළුවන්. ඒ වාගේම ඉදිරි වසර කිහිපය තුළ දූෂණය පිටු දකින්න අදාළ කරන තවතවත් ක්‍රියාමාර්ග ශක්තිමත් කරන්න ආණ්ඩුව විධියට අප කටයුතු කරනවා කියන කාරණයත් මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

පසුගිය ආණ්ඩු ගත්තොත්, වංචා, දූෂණ හා අක්‍රමිකතා, බලය අයුතු ලෙස භාවිත කිරීම් රාජ්‍ය පාලනයේ සාමාන්‍ය ප්‍රවණතාවක් බවට පත් වෙලායි තිබුණේ. එදා දූෂණය ගැන ගමේ කථා වුණේ, "හොරා කෑවත් කමක් නැහැ; පාර හදනවා නේ. හොරු වුණත් කමක් නැහැ; වැඩ කරනවා නේ" කියලායි. ඔන්න ඔය තැනට පත් වෙලායි තිබුණේ. වැඩක් කර ගන්න ආයතනයකට ගිහිල්ලා පගාවක් දෙන එක, නිලධාරියෙකුට සන්තෝසමක් දෙන එක රටේ සාමාන්‍ය සංස්කෘතිය බවට පත් වෙලායි තිබුණේ. එම නිසා නීතිය මඟින් විතරක් මේ රටේ දූෂණය, අල්ලස හා වංචාව නවත්වන්න බැහැ. ඒකට අදාළ සංස්කෘතියක් හදන්න ඕනෑ. රටක් විධියට ඒ සම්බන්ධයෙන් සැම දෙනාම පෙළ ගස්වන්න ඕනෑ. ඒ නිසා තමයි අපි 2025 - 2029 ක්‍රියාකාරී සැලැස්මක් හදලා තිබෙන්නේ; මේ රටේ දූෂණය, අල්ලස නැවැත්වීමට අදාළ සැලැස්මක් හදලා තිබෙන්නේ. දූෂණය, වංචාව නවත්වනවා කියන්නේ, එක පැත්තකින් එය සංවර්ධනයේ මාවත, සංවර්ධනයේ දොරටුව කියා හඳුන්වන්න පුළුවන්. දූෂණය තිබෙනවා නම්, අල්ලස් ගැනීම් තිබෙනවා නම්, අකාර්යක්ෂමතාව තිබෙනවා නම්, ඒක ආර්ථික වර්ධනයට බාධාවක්. අනෙක් පැත්තෙන්, එය ආයෝජන අධෛර්යවත් කරන සාධකයක් ද වනවා. එම නිසා අපි දූෂණය මර්දනය කරනවා කියන්නේම මේ රට සංවර්ධනය කරනවා, මේ රට යහපත් දිශාවකට ගෙන යනවා කියන එකයි. එය පොහොසත් රටේ ලස්සන ජීවිත හැදීම සඳහා වන වැඩසටහනේම කොටසක්. එම වැඩසටහන ශක්තිමත් වන දිශාවට තමයි අපි වැඩ සැලසුම් කරලා තිබෙන්නේ.

මීට පෙර විපක්ෂය නියෝජනය කරමින් කථා කළ මන්ත්‍රීවරු විවිධ කථා කිව්වා. විශේෂයෙන් ඩී.වී. චානක මන්ත්‍රීතුමා බොරු බිල්ලෙක් මවන්න හැදුවා. අප්‍රේල් 12වන දා වන කල් විතරයි ඩීසල් තිබෙන්නේ, විදුලිය කපන්න වෙනවා යනාදි කථා කියලා එතුමා මහා හයියෙන් සද්දෙ දාලා, ආණ්ඩුවට උපදෙස් දීලා ගියා.

එතුමන්ලාට අමතකයි, එතුමන්ලාගේ පාලන කාලය තුළ තමයි යූරියා ටික නැතිව, පොහොර නැතිව, තෙල් ටික නැතිව, ගෑස් ටික නැතිව, බෙහෙත් ටික නැතිව ජනතාව මහ පාරේ මැරෙන තැනට මේ රට ගෙනාවේ කියන එක. ඒ එතුමන්ලාගේ ආණ්ඩු. එතුමන්ලාට බැරි වුණා ලෝකයේ තෙල් තිබියදී, ලෝකයේ සාමය තිබියදී, ලෝකයේ සියලු දේවල් තිබියදී රටේ ආර්ථිකය හදන්න. එතුමන්ලාගේ දුර්වලතාව නිසා තමයි තෙල් ටික ගෙනෙන්න සල්ලි එන්නේ නැති තැනට රට වැටුණේ. එතුමන්ලා රට බංකොලොත් කරලා ඇවිල්ලා අපේ ආණ්ඩුවට කියනවා, මේක අපේ ආණ්ඩුවේ වරදක් කියලා. මේක රටේ වරදක් නොවෙයි. ලෝකයේ යුද්මය තත්ත්වයක් ඇවිල්ලා තිබෙනවා. ඒක අපි කාටවත් පාලනය කරන්න බැරි තත්ත්වයක්. හැබැයි, රජය නිසි වෙලාවට නිසි තීන්දු අරගෙන ඒ සියල්ල කළමනාකරණය කරමින් ඉදිරියට යනවා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් කිව්වා, ආණ්ඩුව වගකීම භාර ගන්න ඕනෑ කියලා. අපි ජනතාවට කියනවා, ආණ්ඩුව මේ රටේ වගකීම භාර ගන්නවා, අපේ උපරිම හැකියාවෙන් මේ රට වෙනුවෙන් ආණ්ඩුව මැදිහත් වෙනවා කියලා. මේ සියලු ප්‍රශ්න, ගැටලු කළමනාකරණය කරලා අපේ රට යහපත් දිශාවට ගමන් කරවීම සඳහා ආණ්ඩුව මැදිහත් වෙනවා කියන පොරොන්දුව ලබා දෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු සරෝජා සාවිත්‍රී පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. M.K.M. ASLAM left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[අ.භා. 2.32]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොරකමට අපි විරුද්ධයි; අල්ලස, දූෂණයට අපි විරුද්ධයි. ඉතාම සතුටු වෙනවා, අද මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ යම් ක්‍රියාකාරිත්වයක් තිබීම පිළිබඳව. ඒ ගැන කිසිම ගැටලුවක් නැහැ. ඒ ස්වාධීනත්වය තිබෙන්න ඕනෑ; ඒ අපක්ෂපාතිත්වය තිබෙන්න ඕනෑ. අල්ලස් පනත ඉදිරිපත් කළාම අපි ඊට සම්පූර්ණ සහයෝගය ලබා දුන්නා. ඒ ගැන කිසිම ගැටලුවක් නැහැ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම තවත් ශක්තිමත් වෙලා, තවත් ස්වාධීනව වැඩ කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. අපේ ප්‍රාර්ථනාවත් ඒක. පසුගිය කාල සීමාවේ දී -එදා යහ පාලන යුගයේදී, අපේ කාලයේදී- යම් යම් නඩු දැම්මා. ඒවාට යම් යම් තීන්දු දැන් දීලා තිබෙනවා. ඒ පිළිබඳව අපිට සතුටුයි.

හැබැයි, දැන් අපිට තිබෙන ගැටලුව තමයි හොරකම් කරන්න නොදී හොරු අල්ලන්න ආපු මේ ආණ්ඩුව මේ ස්වාධීනත්වය වෙනුවට හොරු ආරක්ෂා කරනවා දකින එක. අන්න, අපට තිබෙන ගැටලුව. මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් අපි ඉල්ලීමක් කරනවා, විපක්ෂයේ යම් යම් හොරු ඉන්නවා නම් අල්ලන්න කියලා. කාර්යක්ෂම වෙලා ඒවා අල්ලන්න. ඒ ගැන කිසිම ගැටලුවක් නැහැ. ඒ පරණ හොරු අල්ලනවා වාගේම, මේ අලුත් හොරු ටිකත් අල්ලන්න ඕනෑ.

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

අලුත් හොරු ප්‍රමාණයක් ඉන්නවා නේ. දැන් මේ ගල් අඟුරු සිදු වීම ගන්න. මේ ගල් අඟුරු සිදුවීමට අදාළ පැමිණිල්ල දාලා දැන් ගොඩක් කල්. දැන් මේ පැමිණිල්ල පිළිබඳව අල්ලස් කොමිසම මොනවාද ක්‍රියාත්මක කරලා තිබෙන්නේ? දැන් ඉන්න ඇමතිවරයාට ඊට ගොඩක් කලින් තිබුණු ප්‍රශ්නයකට අධි චෝදනා භාර දීලා තිබෙනවා. හැබැයි, අපි බලනවා ඒකට අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා මොනවාද කරන්නේ කියලා. එහෙම ගැටලුවක් තිබෙන මනුස්සයෙකුට ඇමතිකමක් දීලා තිබෙනවා. දැන් එයාට නඩු දාලාත් තිබෙනවා. සාමාන්‍ය රජයේ සේවකයෙක් නම් වැඩ තහනම් කරනවා. අඩුම ගණනේ තමුන් ඉල්ලා අස් වෙලා මේ පරීක්ෂණ කටයුතු පිළිබඳව ස්වාධීනව කටයුතු කරන අවස්ථාවක් ලබා දෙන්න කියන්න ඕනෑ නේ. හැබැයි, එහෙම දෙයක් නම් සිදු වෙන්නේ නැහැ. මේ ගල් අඟුරු සිදුවීමෙන් වෙලා තිබෙන හොරකම නිසා අද එක පැත්තකින් රටේ ජනතාවට විදුලි බිල වැඩි වෙනවා. අනෙක් පැත්තෙන්, අඩු විදුලිය ප්‍රමාණයක් ලැබීම නිසා ඩීසල් බලාගාරවලින් විදුලිය ගන්න වෙනවා. දැන් QR code එක දානවා. අද මම පාර්ලිමේන්තුවට එන්න ඉස්සර වෙලා පෙට්‍රල් ෂෙඩ් එකට ගිහිල්ලා QR code එක පෙන්වලා පෙට්‍රල් ගහන්න හැදුවාට QR code එක වැඩ කළේ නැහැ. ඒ පෙට්‍රල් ෂෙඩ් එකේ අයිතිකාරයෝ කියනවා, "අනේ, මහත්තයෝ, QR code දාන එකත් නතර කරලා. ඒ QR code එක වැඩ කරන්නේ නැහැ" කියලා. තමුන්නාන්සේලාට අර තිබුණු QR code එකත් කරගන්න බැරි වෙලා තිබෙනවා. බැරි වෙලා හරි අලුත්ම crisis එකක් ආවා නම්, තමුන්නාන්සේලා dictionary එකක් බලාගෙන තවම QR code එක මොකක්ද කියලා හොයනවා. තිබුණු QR code එක තවම ක්‍රියාත්මක කරගන්න බැරි වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අද ඇති වෙලා තිබෙන අර්බුදය ඉරානය-ඊශ්‍රායල ප්‍රශ්නයට මුවා වෙලා වහගන්න හදන්න එපා.

විපක්ෂ නායකතුමා පසුගිය සතියේ මේ පිළිබඳව පාර්ලිමේන්තුවේදී ඇහුවාම විජිත හේරත් ඇමතිතුමා මොකක්ද කිව්වේ? "කිසිම ගැටලුවක් නැහැ. කිසිම ප්‍රශ්නයක් නැහැ. මෙන්න මෙදාට නැවක් එනවා. ඊළඟ සතියේ තව නැවක් එනවා. ඊට පස්සේ තව නැවක් එනවා. හෝමුස් සමුද්‍ර සන්ධියේ කිසිම ගැටලුවක් නැහැ. ඒවා අපට බලපාන්නේ නැහැ" කිව්වා. නමුත් මෙන්න, සතියක් යනකොට QR code එකක් ගෙනාවා. ඊට කලින් මොකක්ද කිව්වේ? මිල ගණන් වැඩි කරන්න කිසි අවශ්‍යතාවක් නැහැ කියලා කිව්වා. මිල සූත්‍රය අහෝසි කරන්න ආපු කණ්ඩායම එක මාසයේ දෙපාරක් මිල වැඩි කළා, ජීවිතයේ කවදාවත් කරපු නැති ආකාරයට. මේ ගොල්ලන් ඊට කලින් සතියේ කිව්වේ, නැහැ මිල වැඩි කරන්න අවශ්‍යතාවක් නැහැ කියලා.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම අපි ශක්තිමත්ව ඉදිරියට ගෙනයන්න ඕනෑ. අපි ඉල්ලීමක් කරනවා. කථානායකතුමාට විරුද්ධව නියෝජ්‍ය මහලේකම්තුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට සියලු සාක්ෂි ඇතුව පැමිණිල්ලක් කරලා තිබෙනවා. කෝ, අපි දැක්කේ නැහැ නේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම කථානායකතුමාගෙන් යම් කටඋත්තරයක් ගන්න එන්න කියලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. කථානායකතුමාගේ ලේකම්තුමා පිළිබඳව අපි පැමිණිල්ලක් කළා, මේ පරීක්ෂණවලට යම් බාධාවක් කරලා තිබෙනවා කියලා. ඒක කථානායකතුමාගේ උපදෙස් පරිදිද, නැද්ද කියන්න අපි දන්නේ නැහැ. ඒ පිළිබඳව කිසිම කටඋත්තරයක් ගැනෙන්නේ නැහැ නේ. දැන් ඔබතුමන්ලාට හොඳ අවස්ථාවක් තිබෙනවා. අපි සතුටුයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම ක්‍රියාකාරිව වැඩ කිරීම පිළිබඳව. හොරු අල්ලන්න ඕනෑ. මේ රටේ හොරකම් වෙලා තිබෙනවා. ඒ හොරකම් අල්ලන්න ඕනෑ.

පරණ හොරු අල්ලනවා වාගේම, අලුත් හොරු ටිකත් අල්ලන්න ඕනෑ. එහෙම නැත්නම් මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම ගැන තිබෙන විශ්වාසය පලුදු වෙනවා. ඒ පිළිබඳව කථාබහක් තිබෙනවා, "අනේ, පරණ පැමිණිලිවලට විතරයි නේද එච්චර ක්‍රියාකාරීව කටයුතු කරන්නේ? අලුතින් දාලා තිබෙන පැමිණිලි පිළිබඳව අවධානය යොමු කරනවා අඩුයි නේද?" කියලා. අපි අනිවාර්යයෙන්ම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න ඕනෑ. ඒකට අවශ්‍ය සම්පූර්ණ ශක්තිය අපි ලබා දෙන්න ඕනෑ. ඒක ස්වාධීන ආයතනයක් හැටියට කටයුතු කරන එක අත්‍යවශ්‍යයි. ඒකට කාටවත් බලපෑම් කරන්න ඉඩදෙන්න අවශ්‍යතාවක් නැහැ. හැබැයි, මේ ස්වාධීනත්වය අපේ රටේ සියලු දෙනාට - ආණ්ඩු පක්ෂය වේවා, විපක්ෂය වේවා, සියලුදෙනාට - දැනෙන්න ඕනෑ; පෙනෙන්න ඕනෑ. අන්න, ඒ සඳහා ඔබගේ අවධානය විශේෂයෙන් යොමු කරන්න.

මේ ගල් අඟුරු සිදුවීමත් එක්ක අද මුළු රටම විනාශ වෙලා තිබෙනවා. මේගොල්ලන් කියපු එකක්වත් විශ්වාස කරන්නේ නැහැ. Ceylon Petroleum Corporation එකේ සභාපතිතුමා කියන එකක්වත් විශ්වාස කරන්නේ නැහැ. ඇමතිවරයා කියන එකක්වත් විශ්වාස කරන්නේ නැහැ. ජනාධිපතිවරයා කියන එකක්වත් විශ්වාස කරන්නේ නැහැ. ජනාධිපතිතුමා ඒ දවස්වල කිව්වේ කොහොමද? බදු අඩු කරන්න කියලා කිව්වා. බදු අඩු කරලා ජනතාවට සහන ලබා දෙන්න කියලා කිව්වා. තමුන්නාන්සේලාට මතක ඇති, තමුන්නාන්සේලා වේදිකාවක් වේදිකාවක් ගාණේ කියපු දේවල්. බදු අඩු කරලා ජනතාවට සහනයක් ලබා දෙන්න, දැන් ඔබතුමන්ලාට අවස්ථාවක් ලැබී තිබෙනවා. රටේ ජනාධිපතිවරයාට ඒ සඳහා අවස්ථාවක් ලැබී තිබෙනවා. විපක්ෂයේ සිටියදී කිව්වේ එක දෙයක්. අද ජනාධිපති හැටියට ආණ්ඩුවේ ඉඳගෙන බදු ටික අඩු කරලා ජනතාවට සහනයක් ලබා දෙන්නේ නැත්තේ ඇයි? ඒක කරන්න පුළුවන් විපක්ෂයේ සිටියදී විතරද? දැන් ඔබතුමන්ලාට අවස්ථාව තිබෙනවා. එතුමා දැන් මේ රටේ ජනාධිපති. කරුණාකර ඒ කටයුත්ත කර ජනතාවට සහනයක් ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.40]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරින්ගේ වැටුප්වලට අදාළ සංශෝධනයක් ගෙනෙන මේ වෙලාවේ, අල්ලස් කොමිසම පිළිබඳව ප්‍රකාශ කරන්නත්, ඒ වාගේම පොදුවේ විපක්ෂය ගෙන එන ලද තර්කවලට පිළිතුරක් ලබා දීමටත් මම මේ වෙලාව යොදා ගන්නවා. මම කැමැතියි, අපේම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අපි මොනවාද කිව්වේ කියලා කියන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පූර්විකාවේ තිබෙන්නේ මොකක්ද? "ජාතික ජන බලවේගයේ පාලනයක් යනු අවුරුදු 76ක කාලයක් තුළ ක්‍රම ක්‍රමයෙන් කුණු වී ඕජස් ගලන අන්ත දූෂිත දේශපාලන සංස්කෘතිය අවසන් කිරීම හා යහපත් දේශපාලන සංස්කෘතියක් ඇති කිරීමය. අප පාලනයක් යටතේ දූෂිත ප්‍රභූ පාලක කල්ලි විසින් ජනතා දේපළ කෝටි ප්‍රකෝටි ගණනින් කොල්ල කෑ ධනය නැවත ජනතාව වෙත අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ වනු ඇත. ඒ සඳහා අවශ්‍ය නීති සම්පාදනය කරමින් හා දූෂණ විරෝධී කොමිෂන් සභාවට, පොලිසියට හා නීතිපති දෙපාර්තමේන්තුවට අවැසි මහ පෙන්වීම කරමින් ඒවාට ස්වාධීන ආයතන ලෙස ක්‍රියාත්මක වීමේ සම්පූර්ණ ඉඩකඩ අප විසින් සපයනු ඇත." මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න අපේ මැතිවරණ පොරොන්දු. මේ මැතිවරණ පොරොන්දුවට අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවත්, නීතිපති දෙපාර්තමේන්තුවත් ඉතාම ස්වාධීන ආයතන ලෙස පවත්වාගෙන යන්න අපට අවශ්‍යයි. මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අප ආණ්ඩුව වෙත පැවරෙන්නේ කුමන තත්ත්වයක් යටතේද? ඇත්ත වශයෙන්ම මේ කියන වත්මන් පනත කලින් ආණ්ඩුවේ සම්මත වුණාට ඒකට හපන්න දත් තිබුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ මහත්වරු අවුරුද්දක් යනකල් ඒවාට අදාළ guidelines හැදුවේ නැහැ; අවුරුද්දක් යනකල් හැදුවේ නැහැ, guidelines. අවුරුද්දක් යනකල් guidelines හදන්නේ නැතිව ඉඳලා, අපේ ආණ්ඩුව ආවාට පසුව තමයි මේවාට අදාළ guidelines හදලා, හපන්න දත් ටික දුන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකේ පඹයා හදලා නිකම් වෙලේ ගහලා තිබුණේ. මෙහෙම action එකක් තිබුණේ නැහැ.

මම හේතු සාධක සහිතව කියන්නම්, අපේ මේ ව්‍යායාමය සාර්ථකයි කියලා කියන්න කාරණාවක්. අපි ජන වරම අනුව කටයුතු කරලාද නැද්ද කියලා කියන්නේ කොහොමද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? Transparency International ආයතනය ලෝකයේ රටවල් 180කින් පරීක්ෂණයක් කරනවා. ඒ කියන්නේ, දූෂණ තත්ත්ව දර්ශකයක් පිළිබඳව විමර්ශන වාර්තාවක් ඔවුන් ගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි 2012 අවුරුද්දේ ඉඳලා අන්ත අඩියට වැටිලා තිබුණේ. 2012 ඉඳලා අපේ දත්ත දර්ශකය අඩු වෙමින් ආවා. එහෙම ඇවිල්ලා 2024දී අපිව බිත්තියටම හේත්තු වුණා. අපි හිටියේ ලකුණු 32ත්, 35ත් අතර. ස්ථානීය අගය ගත්තොත් රටවල් 180කින්, 121වැනි තැනට අපි වැටුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම පහත් අගයකට අපි වැටුණා. මේ ගරු සභාවට කියන්න සතුටුයි, 2025 වෙනකොට අපි එම රටවල් 180 අතරින් 107වැනි තැනට ඇවිල්ලා තිබෙන බව. 121වැනි තැන හිටපු අපි 2025 වර්ෂය වෙනකොට 107වැනි තැනට ඇවිල්ලා තිබෙනවා. එහෙම ආවේ කොහොමද? අන්න, අපි ප්‍රායෝගිකව ජන වරමට ගරු කරලා, ජන වරම ඇතුළේ කටයුතු කිරීම නිසා තමයි අපට 107වැනි තැනට එන්න පුළුවන් වුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම්, ඔන්න අපි භාවිතාවෙන් ඒ වැඩේ කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන තව අවස්ථාවක් තිබෙනවා. ආයතනයට ස්වාධීනව මේ වැඩේ කරගෙන යන්න අපි අවස්ථාව දෙනවා වාගේම, ආයතනය ඇතුළේ ක්‍රියාකාරිත්වයත් ඔවුන්ට පහසු වන ආකාරයෙන් සකස් කරන්න කටයුතු කරමින් සිටිනවා. මම දන්නා තරමින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ staff එකේ ඉන්නේ 973දෙනායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සතුටින් මේ කාරණයත් කියන්න කැමැතියි. ඒ තමයි, මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ක්‍රියාත්මක වුණේ කොළඹ; කොළඹ දිස්ත්‍රික්කයේ විතරයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ක්‍රියාත්මක වුණේ. නමුත්, වත්මන් රජය තීන්දුවක් ගෙන තිබෙනවා, ලංකාවේ දිස්ත්‍රික්ක 25 පුරා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කාර්යාල 24ක් හදන්න. ඒ සඳහා අය වැයෙන් - Budget එකෙන් - සල්ලි පාස් වෙලා තිබෙනවා. මෙතෙක් කොළඹින් පමණක් නඩු පැවරූ අවස්ථාව, වත්මන් ආණ්ඩුවේ පාලනය යටතේ පිට දිස්ත්‍රික්කවලටත් ගිහිල්ලා පිට දිස්ත්‍රික්කවල දූෂණ ක්‍රියා සම්බන්ධයෙන් මැදිහත් වෙලා, මේ කොමිෂන් සභාවේ බලය අනුව ඒ ඒ දිස්ත්‍රික්කවලදී නඩු පැවරීමේ අවස්ථාව ඇවිල්ලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අන්න ඒක තමයි අපේ ජයග්‍රහණය. අපි මේ පෙළට එන්නේ.

දැන් මේගොල්ලන් කියන්නේ මොකක්ද? මේ අය කිසිම සම්බන්ධයක් නැති සමහර උදාහරණ ටිකක් ගැන කියනවා. හරියට මහින්දාගමනයයි, බනිස් කර්මාන්තයයි අතර සම්බන්ධයක් නැහැ වාගේ තමයි මේ උදාහරණ ගේන්නේ. මේ අය ඉදිරිපත් කරන උදාහරණවල කිසිම සම්බන්ධයක් නැහැ. හැබැයි, මුළු ලෝකයේම තෙල් නැති වුණත් ලංකාවේ තෙල් තිබෙන්න ඕනෑ. මුළු ලෝකයේම විදුලිය නැති වුණත් ලංකාවේ විදුලිය තිබෙන්න ඕනෑ. ඇයි? ලංකාවට යුද්ධය බලපාන්නේ නැහැ කියලා, මේ අය මොකක්ද කියන්නේ? යුද්ධය මොනවා වුණත් කමක් නැහැ, විපක්ෂයට ඕනෑ තෙල්. යුද්ධය මොනවා වුණත් කමක් නැහැ, විපක්ෂයට ඕනෑ විදුලිය. මේක තමයි කථාව. *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අන්න දැක්කා ද අර්චුනා මන්ත්‍රීතුමා කියන කථාව? දැක්කා ද කියන කථාව? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එක දෙයක් කියන්නම්. අපි මේ වැඩේ පටන් අරගෙන තිබෙනවා. දැන් කවුරු හරි කියනවා ද, කපිල චන්ද්‍රසේන අත්අඩංගුවට ගත්ත එක වැරදියි කියලා? දැන් කවුරු හරි කියනවා ද, රාජිත සේනාරත්න අත්අඩංගුවට ගත්ත එක වැරදියි කියලා? කවුරු හරි කියනවා ද, චාමර සම්පත් අත්අඩංගුවට ගත්ත එක වැරදියි කියලා? කවුරු හරි කියනවා ද, එස්.එම්. චන්ද්‍රසේන ඇතුළු මේ හොර නඩය අත්අඩංගුවට ගත්ත එක වැරදියි කියලා? මේ හොර නඩය අපේ ආණ්ඩුවක් යටතේ අත්අඩංගුවට ගන්නවා කියලා තමයි අපි මැතිවරණ පොරොන්දුවල කිව්වේ. ඒ විධියටම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ඊට අදාළ ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ගමන ආවේ නිකම් නොවෙයි. අපි මේ වැඩේට අත තියනකොට දැක්කා, ඇත්ත වශයෙන්ම විවිධ තර්ක විතර්ක ඇතුළේ තමයි මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව කටයුතු කරමින් හිටියේ කියන එක. හරියට මොකක් වාගේද දන්නවා ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා අධිනීතිඥ කොල්වින් ආර්. ද සිල්වා උදාහරණයකට අර ගොයම් කොළේ පාවිච්චි කරමින් නීතිය නමපු හැටි අපි කවුරුත් දන්නා කථාවක්. මම හිතන විධියට, නීතිය නැමීමේ පළමු උදාහරණය තමයි ඒ ගොයම් කොළේ කථාව. මේවා එක පැත්තකින් වවන හරඹ. තවත් පැත්තකින් තක්කඩිකම්. මේවා අර්ථකථන ක්‍රීඩා කියලා කිව්වාට වරදක් නැහැ. ඒ කොල්වින් පරපුර අද වන විට නවීන තාක්ෂණයෙන් සන්නද්ධ, නවීන ක්‍රම සහ විධිවලින් සන්නද්ධ වඩා සංකීර්ණතාවන්ගෙන් යුක්ත පරපුරක් බවට පත්ව තිබෙනවා. එදා තිබුණු කාසි සහ නෝට්ටු වෙනුවට අද තිබෙන්නේ Bitcoin. එදා තිබුණු රේඩියෝවයි, පත්තරෙයි වෙනුවට අද තිබෙන සන්නිවේදන උපකරණ කොයි තරම් විවිධාකාර ද, කොයි තරම් දියුණු ද කියන්න අපි බොහෝ දෙනා දන්නෙත් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එදා බර්ටෝල් බ්‍රෙෂ්ට් කිව්වේ මොකක්ද? "අද කුකුල්ලු, ඊයේ බිත්තර" කිව්වා. හැබැයි මේ ගරු සභාවේම සමහරු කියනවා, ඊයේ කිරි දරුවා අද කැඩෙට් නිලධාරියා ලු. අන්න එහෙම තමයි මේකේ පරිවර්තන ආවේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලෝකය වෙනස් වෙලා තිබෙන්නේ. හැබැයි, Bitcoinවලින් ගනුදෙනු කරනවා වාගේම පරණම උපක්‍රම භාවිත කරමින් රිංගලා

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

යන්නත්, කෝටි ප්‍රකෝටි හොර නඩයේ කුමාරවරු පසුබට වෙන්නේත් නැහැ. හරියට ආච්චිගේ මැණික් මල්ල වාගේ උපක්‍රම තුළින්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කරමින් ඉන්න ව්‍යායාමයේ හරි පැහැදිලි තත්ත්වයක් තිබෙනවා. ඒ ව්‍යායාමය ඇතුළේ අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමත්, අනෙකුත් ආයතනත් ස්වාධීන කරමින් යන ගමනක තමයි මේ ඉන්නේ.

දැන්, විපක්ෂය නඟන පදනම් විරහිත චෝදනා බලන්න. ඒ කියන්නේ, මැතිවරණ පොරොන්දු ඇතුළේ අපි කියපු කරුණු කාරණා ප්‍රමාණයක් මේ අය කියාගෙන යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් ඔවුන්ට මේ "දිට්වා" සුළි කුණාටුව, එහෙම නැත්නම් ලෝකයේ ඇති වී තිබෙන මේ යුද්මය වාතාවරණය පිළිබඳව කිසිදු නිනව්වක් නැහැ. ඔවුන් තුළ කිසිදු ආකාරයක ඊට අදාළ කථාවකුත් නැහැ. විශේෂයෙන් විපක්ෂ නායකවරයා අප වෙත එල්ල කරන චෝදනාව මොකක්ද? එතුමා කියන්නේ, එදා අහවල් අහවල් ප්‍රකාශ අප විසින් ප්‍රකාශයට පත් කරන්නට යෙදුණා; හැබැයි ඒ ප්‍රකාශ මොනවා වුණත්, අද අපට විදුලිය අවශ්‍යයි, අද අපට බලශක්තිය අවශ්‍යයි කියලායි. ඒ වාගේ ඒවා තමයි එතුමා කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එකක් කියනවා, අපේ අමාත්‍යවරයාට චෝදනාවක් එල්ල කරනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ නඩුවක් තිබෙනවා කියලා. අපි විපක්ෂයේ මහත්වරුන්ට කියන්න කැමැතියි, ඔයගොල්ලන්ගේ දෙන්නෙක් ඉන්නවා, අපේ එක්කෙනෙක් ඉන්නවා කියලා. ඒක ඇත්ත. හැබැයි එක දෙයක් තිබෙනවා, පොදු සාධකය විධියට. මොකක්ද? *[බාධා කිරීමක්]*

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
දෙන්නා කවුද?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඇයි, රවී කරුණානායක මන්ත්‍රීතුමායි, චාමර සම්පත් මන්ත්‍රීතුමායි ඉන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒකාබද්ධ විපක්ෂය.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
එතකොට ඔයගොල්ලන් ඒකාබද්ධ විපක්ෂයේ නැද්ද? එතකොට ඒකාබද්ධ නැහැ නේද? හැබැයි, අපි එකක් කියන්නම්. අපේ අමාත්‍යවරයා රජයේ සේවකයෙක් ලෙස හිටපු වකවානුවක එල්ල වූ පදනම් විරහිත චෝදනාවක් තිබෙනවා. හැබැයි, ඔයගොල්ලන් කළ චෝදනාව මොකක්ද? මහත්වරුනේ මතක තියාගන්න, අපේ කෙනා වුණත්, අපි ආරක්ෂා කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වත්මන් ආණ්ඩුව යටතේයි අද එතුමාට මේ චෝදනාව එල්ල වෙන්නේ. *[බාධා කිරීම්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ අමාත්‍යවරයාට නඩු පැවරිලා තිබෙන්නේ වත්මන් ආණ්ඩුව යටතේ කියන එක මම කියනවා. වත්මන් ආණ්ඩුව යටතේ අපි අපේ කෙනා ආරක්ෂා කරලා නැහැ. එම කටයුත්ත නීතියට පවරා තිබෙනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම නඩු දමන්න කටයුතු කරමින් ඉන්නවා. නඩුව දාන්න. නඩුවට අපි මුහුණ දෙනවා. එච්චරයි. එතකොට ඒක තමයි තියෙන වෙනස. ඔයගොල්ලන්ගේ ආණ්ඩුවක් තිබුණා නම්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වත් ගෙදර යවලා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමත් වහලා හරි මේක නවත්වනවා. අපි ඒවාට බලපෑම් කරන්නේ නැහැ. ආයතන ස්වාධීන කිරීම ඇතුළේ අපි ගමනක් ගිහිල්ලා තිබෙනවා.

ඒ වාගේම නිතරම කියනවා, ගෑස් ගැන කථාව. ගල් අඟුරු ගැනත් කථා කියනවා. *[බාධා කිරීම්]* මේ සම්බන්ධව ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අපි හඳුන්වා දීලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇතුළේ තමයි අපි එම කටයුතු කරලා තිබෙන්නේ. මහත්වරුනේ, ඒක නිසා අපේ පැත්තට ඇඟිල්ල දිගු කළොත්, ඔයගොල්ලන්ගේ පැත්තට ඇඟිලි හතරක් දිගු වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම තිබෙනවා, නීතිපති දෙපාර්තමේන්තුව තිබෙනවා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තිබෙනවා, එම ආයතන අද ස්වාධීනව කටයුතු කරනවා. ඒවාට පැමිණිලි කරන්න. ඒවා ඇතුළේ අපේ නිවැරදිභාවය අපි ඔප්පු කරන්නම්. ඒක නිසා මේ පවතින ක්‍රියාවලිය ඇතුළේ දූෂිත හොර නඩයට නම් කවදාවත් සමාවක් හම්බ වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද දවසේ අපි සම්මත කර ගන්නා මේ යෝජනාව හරහා 973ක කාර්ය මණ්ඩලයක් - staff එකක් - අපි සමන්විත කරනවා, දිස්ත්‍රික්ක 24ක කාර්යාල 24ක් පිහිටුවලා.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ශක්තිමත් කිරීම ඇතුළේ, අතීත වැරදිවලට මේ ඉස්සරහා පේළියේ ඉන්න කී දෙනෙක් ඇතුළේ ඉඳීද කියලා අපි නම් දන්නේ නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.54]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අපේ චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා, මට මේ අවස්ථාව ලබා දීම ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නියෝජ්‍ය ඇමතිතුමා කථා කරද්දී කිව්වා, ඒගොල්ලන්ගේ කාලයේ තමයි මේ නඩු දැම්මේ කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලාට තිබෙන ප්‍රශ්නය මේකයි. මොන ආණ්ඩුවකින් හරි හොඳක් කළා නම් ඒ හොඳ කියන්නේ නැහැ. යහ පාලන ආණ්ඩුව තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පනත ශක්තිමත් කරලා පඩි ඔක්කෝම වැඩි කළේ. ඒ, 2015-2019 කාලයේ. ඊළඟට, 2023දී රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපතිවරයා විධියට ඉන්නකොට එතුමාත් සංශෝධන ගෙනැල්ලා නැවත වතාවක් මේ පනත ශක්තිමත් කළා. එහෙම ශක්තිමත් කරපු පනත තමයි ඔබතුමන්ලා තව ටිකක් අය වැඩියෙන් වැඩ කරන්න ඕනෑ, තව නිලධාරීන් බඳවාගන්න ඕනෑය කියලා, ඔවුන්ගේ පඩියත් වැඩි

කරන්න අද මේ සංශෝධන ගෙනැල්ලා තිබෙන්නේ. කලින් කරපු දේවල් අමතක කරලා කථා කරන්න එපා. කුහකකම තමයි මෙතැන තිබෙන ප්‍රශ්නය. හොඳක් දැක්කා නම්, කවුරු හොඳක් කළත් ඒක හොඳයි කියලා කියන්න. ඒක පුරුදු වෙන්න. රාජ්‍ය පාලනය කරනකොට ඒක අවශ්‍යයි.

ජනාධිපතිතුමා ටිකක් වෙනස් වුණා. එතුමා නිදහස් දිනයේදී කිව්වා, අවුරුදු 76කදී සිද්ධ වුණු ඔක්කෝම දේවල් අනවශ්‍ය දේවල් නොවෙයි, හොඳ දේවලුත් වෙලා තිබෙනවා කියලා. ජනාධිපතිතුමා නිදහස් දිනයේදී ඒක පිළිගත්තා. හොඳ දේවල් වුණා නම් අන්න ඒ වාගේ නිහතමානීව පිළිගන්න. ඒවා පිළිඅරගෙන කථා කරන්න. මොකුත්ම වුණේ නැහැ කියලා කථා කරන්න එපා. 2015-2019 යහ පාලන ආණ්ඩු කාලයේ තමයි එස්.එම්. චන්ද්‍රසේනගේ නඩුව ඇතුළු ඔක්කෝම නඩු දැම්මේ. ඔබතුමන්ලා බලයට ඇවිල්ලා නඩු දැම්මේ නැහැ. එස්.එම්. චන්ද්‍රසේන, මහින්දානන්ද ඇතුළු ඒ ඔක්කෝගේම නඩු වැටුණේ යහ පාලන ආණ්ඩු කාලයේදීයි. එහෙම නැතිව ඔබතුමන්ලා ඇවිල්ලා දමපු නඩුවක් නැහැ.

ඔබතුමන්ලාගේ ඇමතිතුමාට නඩුවක් වැටුණා. කොහොමද, ඒ නඩුව දැම්මේ? අල්ලස් කොමිසමට හැමදාම සාක්ෂිකාරයෝ, සැකකාරයෝ ගෙනෙනවා. ඔවුන් ගෙනෙනකොට මාධ්‍යත් ගෙනෙනවා. ඒ සැකකාරයින්ට අධි චෝදනා පත්‍ර ඉදිරිපත් කරනකොට අල්ලස් කොමිසමට එන්න කියලා ඔවුන්ව අත්අඩංගුවට අරගෙන මාංචු දාලා තමයි උසාවියට ගෙනියන්නේ. හැබැයි ඔබතුමන්ලාගේ ඇමතිතුමාව මාංචු දාලා ගෙනිච්චාද? ඒක මට කියන්න. එතුමාට මාංචු දාලා ගෙනිච්චාද? නැහැ. අල්ලස් කොමිසම එතුමාව කැඳෙව්වේවත් නැහැ. කැඳවන්නේ නැතිව මහාධිකරණයේ නඩුව පැවරුවා. එහෙම කොහොමද වෙන්නේ? ජනාධිපතිතුමා කියනවා නේ, හැම එක්කෙනාම ඉන්නේ නීතියට යටින් කියලා. එතකොට ඔයගොල්ලන්ගේ බලශක්ති ඇමතිතුමා විතරක් නීතියට උඩින් ඉන්නේ කොහොමද? අල්ලස් කොමිසමට එන අනෙක් සැකකාරයෝ, සාක්ෂිකාරයෝ ඔක්කෝම ඉන්නේ නීතියට යටින්. නමුත්, ඔබතුමන්ලාගේ කුමාර ජයකොඩි ඇමතිතුමා විතරක් නීතියට උඩින් ඉන්නවා. එතුමාව ගෙනාවේ නැහැ, අල්ලස් කොමිසමට. එතුමාට මාංචු දැම්මේත් නැහැ. එතුමා දන්නේත් නැහැ, උසාවියට ගිහිල්ලා නඩුව දැම්මා කියලා. එම නිසා තමයි අපි අල්ලස් කොමිසමට කියන්නේ දෙවිධියකට වැඩ කරන්න එපා කියලා. ඒ කියන්නේ මාලිමාවේ අයට අල්ලස් කොමිසමට වෙනම VIP entrance එකක් තිබෙනවා. අනෙක් අයට එහෙම entrance එකක් නැහැ. ඒගොල්ලන් මාධ්‍ය ඉස්සරහට යන්න ඕනෑ. ඒගොල්ලන්ව මාංචු දාලා ගෙනියන්න ඕනෑ. අල්ලස් කොමිසම අනෙක් අයට ඒ ඔක්කෝම කරනවා. නමුත්, මාලිමාවේ අයට එහෙම කරන්නේ නැහැ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
වෙලාව, -

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
වෙලාව ඕනෑ නැහැ. ඔබතුමා ඒකට උත්තර දුන්නේ නැහැ නේ. අපේ කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා මේ පිළිබඳව කලින් ප්‍රශ්න කළා. නමුත්, උත්තර දුන්නේ නැහැ. *[බාධා කිරීමක්]*

ඊළඟට, containers 323 සම්බන්ධවත් චෝදනාවක් තිබෙනවා. කෝ, අල්ලස් කොමිසම ඒ ගැන පරීක්ෂණ පවත්වනවාද? දැන් පැමිණිලි කීයක් ලැබී තිබෙනවාද? *[බාධා කිරීමක්]* ඊළඟට තිබෙනවා, මන්නාරමේ සුළං විදුලි බලාගාරය ගැන.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
කමිටුවක් තිබෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒ කමිටුව පැත්තකින් තියන්නකෝ. කමිටුව වැඩක් නැහැ නේ. *[බාධා කිරීමක්]* මන්නාරමේ සුළං විදුලි බලාගාරයේ ටෙන්ඩර් එක ලැබුණු company එකට එය නොදී, ජනාධිපතිතුමා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා එතුමාගේ හිතවතෙක් වන ධම්මික පෙරේරාට එය දුන්නා. අල්ලස් කොමිසමේ පැමිණිල්ල තිබෙනවා. විභාග කළාද? විභාග කළේ නැහැ. ලුණු ආනයනයේදී ඇති වුණු වංචා පිළිබඳව විභාග කළාද? විභාග කළේ නැහැ. හාල් ගෙනෙනකොට ඒ ටෙන්ඩර් මගඩියේදී ඇති වෙච්ච වංචා සම්බන්ධයෙන් විභාග කළාද? විභාග කළේ නැහැ.

ඊළඟට, දැන් අලුතෙන්ම තිබෙනවා ගල් අඟුරු ප්‍රශ්නය. අධිකරණ ඇමතිතුමා උදේ කථා කරනකොට අපේ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාට කිව්වා, අල්ලස් කොමිසමේ පැමිණිල්ලක් දාන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට අධිකරණ ඇමතිතුමා කියන්නත් ලජ්ජයි. එතුමා දන්නේ නැහැ, සමගි ජන බලවේගයේ දූෂණ විරෝධී කමිටුව හැටියට අපි පෙබරවාරි මාසයේ 26වැනි දා පැමිණිල්ල දාලා තිබෙන්නේ කියලා. මම විතරක් නොවෙයි. 50කට වැඩිය පැමිණිලි කරලා තිබෙනවා. අල්ලස් කොමිසම තවම නිශ්ශබ්දයි. මහජන උපයෝගිතා කොමිෂන් සභාව දැන් මොකක්ද කියන්නේ? ඔවුන් කියනවා, මේ වනකොට රුපියල් මිලියන 8,497ක් පාඩුයි කියලා. දැන් මේ පාඩුව මකන්න ඕනෑ. මේ පාඩුව හින්දා අපේ විදුලි බල නිෂ්පාදනයේ අඩුවක් සිදු වෙලා තිබෙනවා. ඒ අඩුව මකන්න දවසකට ඩීසල් ලීටර් ලක්ෂ 35ක් ඕනෑ. මාසයකට ඩීසල් ලීටර් ලක්ෂ 140ක් ඕනෑ, දැන් මේ පාඩුව මකන්න. එතකොට මොකද වෙන්නේ? ලෝකයේ රටවල යුද්ධයක් ඇති වෙලා තිබෙන අවස්ථාවක අපි දන්නවා, හැම රටකටම මේ ප්‍රශ්නය බලපා තිබෙන බව. මිනිස්සු පෝලිම්වල ඉන්නවා. එහෙම පෝලිමේ ඉන්න මිනිස්සුන්ට ගෙනෙන ඩීසල් ටික තමුන්නාන්සේලා කරපු මේ වංචාව නිසා දැන් විදුලි බලාගාරවලට දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. රුපියල් කෝටි ගණනක - රුපියල් මිලියන 8,497ක - පාඩුවක් කරලා තිබෙනවා. පෝලිම්වල ඉන්න පාසල් ළමුන් රැගෙන යන වෑන් රථවලට සහ බස් රථවලට, මගීන් ප්‍රවාහනය කරන වාහනවලට, ගොවීන්ගේ ට්‍රැක්ටර්වලට පාවිච්චි කරන්න ගෙනෙන ඩීසල් ටික, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කරපු ඒ වංචාව නිසා දැන් විදුලි බලාගාරවලට ලබා දෙන්න සිදු වෙලා තිබෙනවා. මේවා කරන්නේ කවුද? තමුන්නාන්සේලා ඒවා ගැන මුකුත් කථා කරන්නේ නැහැ. තමුන්නාන්සේලා ඒ සම්බන්ධයෙන් නිශ්ශබ්දව ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ එක්කම තව වැදගත් දෙයක් මට කියන්න තිබෙනවා. මහජන උපයෝගිතා කොමිසමේ වාර්තාව අනුව මේ අවුරුද්දේ අප්‍රේල්, ජූනි සහ ජූලි මාසවල විදුලි කප්පාදුවක් සිදු වෙන්න පුළුවන් කියලා අනතුරු අඟවලා තිබෙනවා. ඒ අනතුරු ඇඟවීම ඔවුන් සිදු කරන්නේ මේ බාල ගල් අඟුරු ගෙනැල්ලා ඇති වුණු ප්‍රශ්නය නිසා කියන එක මතක තබා ගන්න. ඒකට රජය වග කියන්න ඕනෑ. බාල ගල් අඟුරු ගෙන්වපු ඇමතිතුමාට අද වෙනකොට අධිචෝදනා පත්‍ර ඉදිරිපත් වෙලා තිබෙනවා. නමුත් තවම ආණ්ඩුවට බැරි වෙලා තිබෙනවා, එතුමාව ඇමති ධුරයෙන් ඉවත් කරන්න. ඒ කාලයේ විනිවිදභාවය, පාරදෘශ්‍යභාවය සහ නීතියේ ආධිපත්‍යය ගැන තමයි කථා කළේ. හැබැයි, දැන් තමන්ගේ පිලේ ඇමති කෙනෙකුට චෝදනාවක් එල්ල වුණාම ඒක සුද්ද කරන්න හැම කෙනාම එනවා.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම ක්‍රිකට් ගැනත් කථා කරන්න ඕනෑ. අපි 1996දී ක්‍රිකට් එක්දින ලෝක කුසලානය දිනාගෙන අද දවසට අවුරුදු 30ක් වෙනවා. 1996 අවුරුද්දේ ඉඳන් 2014 අවුරුද්ද වෙනකම් පවත්වපු ක්‍රිකට් එක්දින ලෝක කුසලාන තරග 7කම අපි semi-finals ඇවිල්ලා තිබෙනවා. නමුත්, අපි 2014 අවුරුද්දේ ඉඳලා අද වනතුරු ICC එක විසින් සංවිධානය කරපු කිසිම තරගයක semi-finalsවත් ඇවිල්ලා නැහැ. මට කියන්න ඕනෑ මොකක්ද දන්නවාද? ජනාධිපතිතුමා විපක්ෂයේ ඉන්නකොට ෂම්මි සිල්වාව පට්ට ගැහුවා. ජයන්ත ධර්මදාසව පට්ට ගැහුවා. මේ ෂම්මිගේ ක්‍රිකට් නොවෙයි, මේ ධර්මදාසගේ ක්‍රිකට් නොවෙයි, මේ ශ්‍රී ලංකා ක්‍රිකට් කියලා අනුර කුමාර දිසානායක මැතිතුමා කිව්වා. දැන් මොකද වෙලා තිබෙන්නේ? දැන් යාපනයට ගිහිල්ලා ෂම්මි එක්ක මුල්ගල් තබනවා; ෂම්මි එක්ක එකට වාඩි වෙලා මැච් බලනවා; ෂම්මි එක්ක එකට වාඩි වෙලා ඉන්නවා. විපක්ෂයේ ඉන්නකොට ෂම්මි දූෂිතයි; විපක්ෂයේ ඉන්නකොට ෂම්මි හොඳ නැහැ; විපක්ෂයේ ඉන්නකොට ක්‍රිකට් පරිපාලනය දූෂිතයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

නමුත්, ආණ්ඩුවේ ඉන්නකොට ජනාධිපතිතුමාගේ ළඟින් ෂම්මි වාඩි වුණාම දැන් ෂම්මි හොඳයි. ජනාධිපතිතුමා දැන් කිසිම හිරිකිතයක් නැතුව ෂම්මි එක්ක එකට මැච් බලනවා; ෂම්මි එක්ක එකතු වෙලා මුල්ගල් තබනවා. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. ඒක තමයි අපි මුල ඉඳලාම කිව්වේ. පසුගිය ආණ්ඩු කාලයේ රාජපක්ෂලා එක්ක හිටපු දූෂිතයින් ඔක්කෝම අද වෙනකොට ජනාධිපතිතුමා එක්ක එකතු වෙලා ඉන්නවා, ජනාධිපතිතුමාගේ වටේ ඒක රාශි වෙලා ඉන්නවා කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් හඳුන්නෙත්ති අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.02]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද දින සිදු කරනු ලබන්නේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ පරීක්ෂණ විධිමත් විධියට කරගෙන යාමට අවශ්‍ය කරන පහසුකම් සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමයි. හැබැයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ පරීක්ෂණ පිළිබඳව, එම කොමිෂන් සභාවේ නිලධාරින්ගේ හැකියාව සහ නොහැකියාව පිළිබඳව තමයි වැඩිපුරම සාකච්ඡා වෙන්නේ. එහෙම නැතුව මේ වෙනුවෙන් තිබෙන පහසුකම් මදිද, ඒ පහසුකම් තව වැඩි කරන්න ඕනෑද කියන සාකච්ඡාවක් නොවෙයි අද දිනයේදී සිදු වෙන්නේ. කොහොම වුණත්, කවුරු හරි මන්ත්‍රීවරයෙකුට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් දැනට කරගෙන යනු ලබන පරීක්ෂණ සම්බන්ධයෙන් යම් කිසි අපැහැදිලිතාවක් තිබෙනවා නම් ඒ ගැන පැමිණිලි කරන්නත් නිදහස තිබෙනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් ඒ ගැන ප්‍රශ්න කරන්න, ලිඛිතව කරුණු විමසන්න වාගේම පැමිණිලි කරන්නත් ඕනෑම කෙනෙකුට අයිතියක් තිබෙනවා, ස්වාධීන ආයතනයක් හැටියට. ආණ්ඩු පක්ෂයේ කියලාවත්, විරුද්ධ පක්ෂයේ කියලාවත් එහෙම අයිතියක් නැත්තේ නැහැ. මොකද, අපි දන්න ඉතිහාසයක් තිබෙනවා. ඒ ඉතිහාසයට අනුව, මාධ්‍යවේදීන්ට, මේ වාගේ ප්‍රශ්න කරන අයට ප්‍රශ්න කරන්න බැරි තත්ත්වයක් තිබුණා. ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ වුණොත් කොහොමත්ම ප්‍රශ්න කරන්න බැරි වුණා.

විරුද්ධ පක්ෂයේ අයටත් තර්ජන ආපු ඉතිහාසයක් තිබුණා. දැන් එහෙම එකක් නැහැ. ඒ හින්දා ඔබට, ඔබගේ පැමිණිලි පිළිබඳව ගැටලුවක් තිබෙනවා නම්, මේ කරගෙන යන පරීක්ෂණ පිළිබඳව සෑහීමකට පත් වෙන්නේ නැත්නම්, ඒවා කෙරෙන්න ඕනෑ මෙහෙම නොවෙයි නම්, ඒ පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන්ම ප්‍රශ්න කරන්න, ලිඛිතව හෝ වාචිකව කරුණු ඉදිරිපත් කරන්න පුළුවන් ක්‍රමවේදයක් - procedure එකක් - දැන් තිබෙනවා. හැබැයි, මම ඒ ගැන නොවෙයි දැන් කථා කරන්නේ.

අද දිනයේදී වැඩිපුරම සාකච්ඡාවට ලක් වෙලා තිබෙන්නේ මැද පෙරදිග ඇති වෙලා තිබෙන යුද්මය තත්ත්වයත් එක්ක අපේ රටේ ජනතාවට ලබා දෙන පහසුකම් පිළිබඳවයි. QR code එක දීම පිළිබඳව වාගේම ඒ වෙනුවෙන් ගත්ත තීරණ පිළිබඳවයි අද දින සාකච්ඡා වෙන්නේ. ඒ පිළිබඳව මැදිහත් වෙන්න, ඒ ක්ෂේත්‍ර නියෝජනය කරන්න ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් අපි ප්‍රධාන කමිටු කිහිපයක් පත් කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලය අපට අවසර ලබා දීලා තිබෙනවා.

මේ අවස්ථාවේදී මම කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳව කථා කරන්න කැමතියි. මොකද, හුඟ දෙනෙක් විවිධ අදහස් මතු කරනවා, කර්මාන්තවලට අවශ්‍ය කරන ඉන්ධන ලබා දීම කොහොමද කෙරෙන්නේ කියන එක සම්බන්ධයෙන්. මම එක කාරණයක් සහතික වශයෙන්ම කියන්න ඕනෑ. අපනයන ක්ෂේත්‍රයට ඇතුළත් වන ඉදිකිරීම් කර්මාන්තය, නිෂ්පාදන කර්මාන්ත සහ සේවා කර්මාන්ත ඇතුළු සෑම කර්මාන්තයකටම අපි අඛණ්ඩව ඉන්ධන පහසුකම් ලබා දීමට කටයුතු කරනවා. ඒ වෙනුවෙන් අපි මේ Google form එක හැමෝටම ලබා දීලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමන්ලාගෙනුත් මම ඉල්ලීමක් කරනවා, ඔබතුමන්ලාත් මේ Google form එක ඔබේ කර්මාන්ත හිමිකරුවන්ටත් ලබා දෙන්න කියලා. අපි ඒ සියල්ල register කර ගන්නවා. ඒ අනුව දැනට ආයතන 750ක් register වෙලා තිබෙනවා, ඔවුන්ගේ අවශ්‍යතා එක්ක. අපි පැහැදිලිවම ඔවුන්ගෙන් අහනවා, අවශ්‍යතාව මොකක්ද, ඉන්ධන අවශ්‍ය වෙන්නේ මොන ක්ෂේත්‍රයටද, කර්මාන්තයේ නිෂ්පාදනය කරන ප්‍රමාණයටද, ඉන්ධන වර්ගය මොකක්ද, මඟී ප්‍රවාහනයටද, එහෙම නැත්නම් සේවක ප්‍රවාහනයටද, එහෙමත් නැත්නම් භාණ්ඩ ප්‍රවාහනයටද ඉන්ධන අවශ්‍ය වෙන්නේ කියන එක. ඒ හැම දෙයම අපි ඔවුන්ගෙන් අහනවා. ඒ නිසා කිසිම කෙනෙක් මේ පිළිබඳව සැකයක් තියා ගන්න අවශ්‍ය නැහැ. මේක කොවිඩ් වසංගතය නිසා වහපු - lock down කළ - තත්ත්වයක් නොවෙයි. අපි බලාපොරොත්තු වෙන්නේ රටේ කර්මාන්ත, ව්‍යාපාර, අපනයන වෙළෙඳාම, විදේශ වෙළෙඳාම අඛණ්ඩව පවත්වාගෙන යමින්,

ඒවාට මූලිකත්වය - priority එක - දෙමින් මේ කටයුත්ත කළමනාකරණය කර ගැනීමයි. ඒ නිසා අපි ලබා ගන්න තොරතුරු සෘජුවම බලශක්ති අමාත්‍යාංශයට සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ලබා දෙනවා. ඒ අනුව ඔවුන් කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයට, ධීවර අමාත්‍යාංශයට, සංචාරක අමාත්‍යාංශයට, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයට ලබා දෙන quota එක අපි සාධාරණ විධියට අපේ ව්‍යාපාරවලට හා කර්මාන්තකරුවන්ට බෙදා දෙනවා. ඇත්තටම, අපි මේවා බෙදා දෙන්නේ ආයතනයට.

උදාහරණයක් හැටියට ගත්තොත්, ආහාර ද්‍රව්‍ය ප්‍රවාහනය කරන ආයතන තිබෙනවා; "Food City" වාගේ retail chain එකේ ආයතන තිබෙනවා. ඒ අයගේ අවශ්‍යතා අපට දැනුම් දී තිබෙනවා. අපි ඒ අයට තමයි quota එක ලබා දෙන්නේ. ඊට පස්සේ, ඒගොල්ලන්ගේ වාහන ටිකට ඒගොල්ලන්ට තෙල් ගහගන්න පුළුවන්. ඒක අපට ප්‍රශ්නයක් නැහැ. සමහර අයගේ ආයතනවලම තිබෙනවා, ඉන්ධන සපයා ගැනීමේ මධ්‍යස්ථාන. මේ Google form එකේ සමහරු නම් කර එවනවා, CTB එකේ ඩිපෝ එක හරි ඒ ආසන්නයේ තිබෙන ඉන්ධන පිරවුම්හල් පිළිබඳව. ඒ ගැන අපි ඔවුන්ගෙන් අහනවා. එතකොට ඒගොල්ලන්ට පුළුවන්, තමන්ට ආසන්නම ඉන්ධන පිරවුම්හල මොකක්ද කියලා ඒ Google form එකේ නම් කරන්න. ඒකට අදාළ quota එක දුන්නාට පසුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවත් එක්ක අපි agreement එක අත්සන් කරනවා. ඔවුන් agreement එකක් අත්සන් කරන්න ඕනෑ. මොකද, ඔවුන් ඇණවුම් කර ලබා නොගත්තොත් ප්‍රශ්නයක් වෙනවා. ඊට පස්සේ අපි ඒ ඇණවුමට අනුව quota එක ලබා දෙනවා. Agreement එක අත්සන් කරන එක තමයි කරන්න ඕනෑ. Agreement එක අපි ලිඛිතව හදාගෙන තිබෙනවා. ඒ වෙනුවෙන් අපි මේ ලේඛනය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ට ලබා දෙනවා. අපි ඉල්ලුම් කරන ප්‍රමාණය සහ සතියකට ඔවුන් නිර්දේශ කරන ප්‍රමාණය ඔවුන් අපට ලබා දුන්නාම අප ඒක සියලුම කර්මාන්තවලට ලබා දෙනවා.

අපනයන ක්ෂේත්‍රය ගත්තත් එහෙමයි. ඇඟලුම් කර්මාන්තශාලාවලට අවශ්‍ය සේවකයින් ප්‍රවාහනය කිරීමේ කටයුත්ත ගත්තොත්, සමහරු තමන්ගේම ආයතනයෙන් සේවකයින් ප්‍රවාහනය කරනවා. සමහරු සේවකයින් ප්‍රවාහනය කරන ආයතනවලට ඒ කටයුත්ත භාර දී තිබෙනවා. අපි ඒ කාරණය නිශ්චිතව නම් කර ගන්නවා. ඒ ආයතනය සේවකයින් ප්‍රවාහනය කරවන ආයතනයක්ද, third party එකක් එක්කද ඔවුන් ඒ කටයුතු කරන්නේ, එහෙම නැත්නම් තමන්ගේම කර්මාන්තශාලාවෙන්ද - factory එකෙන්ද - සේවකයින් ප්‍රවාහනය කරන්නේ කියන කාරණය දැනගෙන අපි ඔවුන්ට quota එක ලබා දෙනවා. මේ අවස්ථාවේදී කිසිම කෙනෙක් කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳව සැකයක් ඇති කර ගන්න අවශ්‍ය නැහැ. එහෙම සැකයක් ඇති කර ගත්තා කියලා තේරුමකුත් නැහැ. සමහරු එහෙම rumour එකක් යවනවා. එහෙම rumour එකක් යැව්වා කියලා ඒකෙන් කිසිම ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැහැ. මොකද, අපි ඒ හැම දෙයක්ම update කරලායි තිබෙන්නේ කියන එක මම මූලික වශයෙන්ම කියන්න ඕනෑ.

ඊළඟට, සංචාරක ක්ෂේත්‍රය ගත්තොත්, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ ලේකම්තුමිය 17වැනි දා -අද- යවා තිබෙනවා, ලිපියක්. ඒකෙදී එක එක සංචාරක ආයතනවලට identity එකක් අපි දීලා තිබෙනවා. ඒ ලිපිය මම **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

Tourist guide කෙනෙකුට සංචාරක හැඳුනුම්පත තිබෙනවා නම්, tourist කෙනෙකු වාහනයේ ඉන්නවා නම්, priority දීලා කටයුතු කරන්න, පෝලිමේ තියන්නත් එපා කියලා අපි ඉල්ලීමක් කර තිබෙනවා. මොකද, සංචාරකයෙකු -විදේශිකයෙකු- ලංකාවට එන්නේ මෙහේ පෝලිමක රස්තියාදු වෙන්න නොවෙයි, සංචාරයේ යන්න. ඒ නිසා ඔවුන්ට priority දීලා පෝලිමෙත් තියන්නේ නැතිව ඉන්ධන ලබා දෙන්න කියලා අපි ඉල්ලීම් කර තිබෙනවා. ඒවා පොලීසිවලට දැනුම් දීලා තිබෙනවා. ඒ වාගේම සියලු ෂෙඩ් හිමියන්ට දැනුම් දීලා තිබෙනවා.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ලීටර් කීයක් ගහන්න පුළුවන්ද?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒවාටත් ඒ අවශ්‍ය quota එක දීලා තිබෙනවා. මේ සාමාන්‍ය කෝටා එක නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. සංචාරකයන්ටත් අනිවාර්යයෙන්ම ඔවුන්ගේ ගමන යන්න අවශ්‍ය කරන ඉන්ධන ලබා දෙනවා. සමහරු Airport එකෙන් ගත්තොත් ඒ අයගේ ගමනාන්තය දක්වා අවශ්‍ය කරන ඉන්ධන ටික ලබා දෙන්න ඕනෑ. ඒක අපි ලබා දෙනවා. ඒවායේ බාධාවක් කොහෙත්ම නැහැ. අත්‍යවශ්‍ය සේවාවලට ඉන්ධන ලබා දීම සම්පූර්ණ කර තිබෙනවා. ඊට අමතරව, සංචාරක කර්මාන්තයට අනිවාර්යයෙන් අපි ඉන්ධන ලබා දෙනවා. අපනයන සේවාවන් කරන, අපනයන ක්ෂේත්‍රයේ කර්මාන්තයන්හි සියලු අවශ්‍යතාවලට ඉන්ධන ලබා දෙනවා. ඒ ගැන ගැටලුවක් ඇති වෙන්න විධියක් නැහැ. ඒ සම්බන්ධ ලිපිය මම ඔබතුමන්ලාගේ අවධානය සඳහා සභාගත කළා.

හැම දින දෙකකදීම ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් කර්මාන්ත අමාත්‍යාංශයේ, ධීවර අමාත්‍යාංශයේ, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ, සංචාරක අමාත්‍යාංශයේ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ, ප්‍රවාහන, මහාමාර්ග අමාත්‍යාංශයේ ඇමතිතුමන්ලා ඇතුළු අපි ඔක්කොම ඒකාබද්ධව රැස් වෙලා, ඒ ඒ දවස්වල තිබෙන තත්ත්වයන් සමාලෝචනය කරමින් මේ කටයුත්ත කළමනාකරණය කරනවා. ඒක අපි අනිවාර්යයෙන් කරනවා. මම නැවතත් කියනවා, කර්මාන්තවලට, ව්‍යාපාරවලට අවශ්‍ය ඉන්ධන පිළිබඳ ගැටලුවක් තිබෙනවා කියලා කිසිම කෙනෙකු කිසිම ආකාරයක සැකයක්, විචිකිච්ඡාවක් ඇති කරගන්න අවශ්‍ය නැහැ කියලා. එහෙම ගැටලුවක් නැහැ. ඒ බව සහතික කරමින් මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.11]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කිව්වා, යහ පාලන ආණ්ඩුවෙන් තමයි මේ නඩු දමන්න ඔක්කොම මූලික වැඩ කටයුතු කළේ කියලා ආණ්ඩු පක්ෂයට අමතක වෙලා කියලා. මම මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාට මතක් කරන්න කැමැතියි, මෙතුමන්ලාත් ඒ වෙලාවේ හිටියේ යහ පාලන

[ගරු දිලිත් ජයවීර මහතා]

ආණ්ඩුවේ බව. අර කැලැ පොලීසිය දමාගෙන හිටියේ අගමැතිතුමාගේ පරිශ්‍රයේ. මෙතුමන්ලාත් හිටියේ එතැනමයි. ඒකයි මතක් කළ යුතුව තිබුණේ. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලාත් හිටියේ එතැනමයි. ඉතින් කමක් නැහැ.

අපේ ඇමතිතුමා දැන් කථා කළා, මතු වී ඇති අර්බුදය සම්බන්ධයෙන්. මැද පෙරදිග කලාපයේ මතු වී ඇති යුදමය තත්ත්වය නිසා අපේ රටේ දැන් මොකක්ද වෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ ප්‍රශ්නයට ජාතියක් හැටියට අපි අද මුහුණ දෙන්නේ කොහොමද කියලා සාකච්ඡා කළ යුතු අවස්ථාවක අපි මොනවා කොයි විධියට කිව්වත් මේකේ කේන්ද්‍රීය ප්‍රශ්නය ගැන මම මේ ආණ්ඩුවට මතක් කර දෙන්න කැමැතියි. මොහොතකට කලින් කථා කළ අමාත්‍යතුමා කිව්වා, කිසිදු සැකයක් තියා ගන්න එපා කියලා. ඇත්තටම ප්‍රශ්නය, සැකය තමයි. ඇත්තටම මේ ප්‍රශ්නයේදී ජනතාවට තිබෙන්නේ සැකය. ඒකට හේතු දෙකක් බලපා තිබෙනවා. එකක් තමයි, ඔබතුමන්ලාගේ අතීත ක්‍රියාකාරිත්වය; ඔබතුමන්ලා අතීතයේ කටයුතු කර ඇති ආකාරය; ඔබතුමන්ලා අතීතයේදී කරන ලද ප්‍රකාශ සියල්ල අද වනකොට බොරු වෙලා තිබෙන ආකාරය. ඔබතුමන්ලා මේ ආණ්ඩුව පවත්වාගෙන යන්නේ බොරුව කියන සංකල්පය භාවිත කරමින් කියලා ජනතාව විශ්වාස කරන නිසා ඔය කියන කිසි දෙයක් විශ්වාස කරන්නේ නැහැ. අපේ මන්ත්‍රීතුමන්ලා පොඩ්ඩක් පාරට බැහැලා පෙට්‍රල් ෂෙඩ් එකක් ගාවට ගිහිල්ලා බලන්න. ගිහිල්ලා ජනතාව කියන දේ අහගෙන ඉන්න. ජනතාව අද ප්‍රශ්න කරනවා, "ඔය කිව්වාට තෙල් තිබෙනවාද? ඇයි එහෙනම් මේ වාගේ අපට දුක් දෙන්න කටයුතු කර තිබෙන්නේ? ගෑස් තිබෙනවාද?" කියලා.

දැන් සංචාරක ව්‍යාපාරය ගැන කථා කළා. මම ඒ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයින් එක්ක සංවාදයක් කළා. ඔවුන්ට විශාල ප්‍රශ්නයක් තිබෙනවා, ඔවුන්ට ගෑස් ලැබෙයිද, ඔවුන්ට generators ක්‍රියාත්මක කරන්න තෙල් ලැබෙයිද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ක්ෂේත්‍රයම ගත්තත්, ඉතාම අවාසනාවන්ත අභියෝගයකට මුහුණ පා තිබෙනවා. ඉතින් අපි සංවාදයට ලක් කළ යුත්තේ මෙන්න මේ කාරණා. ආණ්ඩුව කටයුතු කරන ආකාරයෙන් ජනතා විශ්වාසයක් ගොඩ නැඟෙන්නේ නැහැ. ඔබතුමන්ලාට ඔයිට වැඩිය මහන්සි වෙන්නට වෙනවා, ඔබතුමන්ලා අතීතයේ කටයුතු කළ ආකාරය බලනකොට.

අපි උදාහරණයක් ගනිමු. ඔබතුමන්ලා ඇවිල්ලා කියනවා, මේ ආණ්ඩුවේ තෙල් සංචිත තියා ගන්න ටැංකි නැහැ කියලා. ඒක බොරුවක්නේ. ඕනෑ තරම් ටැංකි තිබෙනවා. අපට උපාය මාර්ගික සංචිතයක් - strategic reserve එකක් - නොතිබීමට වෙන හේතු තිබෙන්න පුළුවන්. සමහරවිට ඔබතුමන්ලා එහෙම තීරණය කරන්න ඇත්තේ මිල උච්චාවචනය වීමෙන් අපට පාඩුවක් වෙන නිසා වෙන්න පුළුවන්. නමුත්, ඇත්ත කියන්නට ඕනෑ. අපි ආණ්ඩුවට කියන්නේ ඇත්ත කියන්න. මේ වෙලාවේ කියන්න අවශ්‍යයි, අපේ රටට සාමාන්‍ය තත්ත්වයක් තුළ මාසයකට ලීටර් මිලියන 500ක් අවශ්‍යයි; දැන් අපි ගාව මෙච්චර තිබෙනවා; ඒකෙන් මෙච්චර ප්‍රමාණයක් පෙට්‍රල් තිබෙනවා, ඒකෙන් මෙච්චර ප්‍රමාණයක් ඩීසල් තිබෙනවා, මෙච්චර ප්‍රමාණයක් කෙරොසීන් තිබෙනවා කියලා. අන්න ඒ දත්ත තොරතුරු සංඛ්‍යාත්මකව ඉදිරිපත් කරලා ජනතා විශ්වාසය ගොඩ නඟා ගන්නට කටයුතු කළ යුතුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම අපි මේ අවස්ථාවේදී සාකච්ඡාවට බඳුන් කළ යුතුයි, බලශක්ති සුරක්ෂිතතාව පිළිබඳ කලින් ගත හැකිව තිබූ පියවර දැන දැනම නොගෙන සිටියේ මන්ද කියන කාරණය. මැද පෙරදිග කලාපයේ විවිධ යුද තත්ත්වයන් ඇති වීමේ ප්‍රවණතාවක් මතු වෙමින් පැවතුණා. එතකොට සාමාන්‍ය තත්ත්වයකට වඩා වෙනස් තත්ත්වයක් උද්ගත විය හැකි යැයි අපට උපකල්පනය කරන්නට තිබුණා. නමුත් අපි එහෙම උපකල්පනය කළේ නැහැ. විශේෂයෙන්ම මේ රජයට එවැනි උපකල්පන සඳහා අවශ්‍ය දැනීම නොමැතිකමත්, ඒ පිළිබඳව දැක්වූ ආකල්පයත් ඒකට හේතු වුණා කියන එකයි මගේ විශ්වාසය. විශේෂයෙන්ම පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් පිළිබඳව මේ ආණ්ඩුවේ මතය තුළින්ම තහවුරු කරනවා, ඔබතුමන්ලා කවදාවත් බලශක්ති සුරක්ෂිතභාවය පිළිබඳව උනන්දුවක් දක්වන්නේ නැහැ කියන එක.

කොහොම වුණත්, මේ ආණ්ඩුව අද රටේ ආර්ථික සුරක්ෂිතතාව පිළිබඳ -කර්මාන්තවල සුරක්ෂිතතාව පමණක් නොවෙයි, මේ රටේ සියලු මිනිසුන්ගේ ආර්ථික සුරක්ෂිතතාව පිළිබඳ- සහතිකයක් ලබා දෙන්නට ඕනෑ. ඒ සහතිකය ලබා දීමේදී කියන්නට බැහැ "මේ යුද්ධය පටන් ගත්තේ අපි නොවෙයි" කියලා. යුද්ධත් ලෝකයේ තිබෙන දේවල් තමයි, සුළි කුණාටුත් ලෝකයේ සිද්ධ වෙන දේවල් තමයි. ඒ සියලු දේවල් තමයි අවදානම කියන්නේ. ඒ අවදානම කළමනාකරණය කිරීමට තමයි රජයක් ඉන්නේ. මොහොතක් හිතන්න, ඔබතුමන්ලා මේ වෙලාවේ විපක්ෂයේ හිටියා නම් නටන නාඩගම ගැන, කොහොමද හැසිරෙන්නේ කියලා බලා ගන්න තිබුණා.

දුප්පත් මිනිස්සුන්ට, එදිනෙදා වේල හම්බ කරගෙන කන මිනිස්සුන්ට වෙන්නේ මොකක්ද කියලා කල්පනා කරන්නට ඕනෑ. ඔබතුමන්ලා ඉල්ලා සිටිනවා පෞද්ගලික අංශයත් බදාදාට වහන්න කියලා. බදාදාට වැහුවාම දෛනික වැටුප් ගන්න අයට මොකක්ද වෙන්නේ; එදිනෙදා වැටුපක් අරගෙන ජීවත් වෙන අයට මොකක්ද වෙන්නේ; කුඩා ව්‍යාපාරයක් කරගෙන යන අයට මොකක්ද වෙන්නේ? ඇත්තම කිව්වොත් ඒක අමනෝඥ ක්‍රියාවක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ මිනිස්සු වැඩ කරන එක නවත්වන්නේ නැතිව, work from home වැනි සංකල්පයක් භාවිත කරලා, වැඩ කරගෙන යන ගමන් ඉන්ධන අර්බුදයට මුහුණ දිය හැකිව තිබුණා. නමුත් එහෙම වුණේ නැහැ.

ඊළඟට, අපේ විදේශ කටයුතු ඇමතිතුමාටත් කාරණයක් කියන්න කැමැතියි. මම මේ පාර්ලිමේන්තුවේදී කිව්වා මේ ආණ්ඩුව රූකඩ ආණ්ඩුවක් බව. මේ ආණ්ඩුවට තමන්ගේම අනන්‍ය විදේශ ප්‍රතිපත්තියක් නොමැති වීම නිසා අද මුහුණ දී ඇති තත්ත්වය ඉතාම පැහැදිලියි. තමන් පත් කරපු ස්වාමීන්ගේ අවශ්‍යතාවට කටයුතු කරමින්, තමන්ගේ මූලික දේශපාලන සංකල්ප පවා පාවා දෙමින් ඔවුන් කටයුතු කරන නිසා තමයි අද මෙම ඉන්ධන අර්බුදය හමුවේ වෙනත් රටවල් ගන්නා පියවර අපට ගන්න බැරි වෙලා තිබෙන්නේ. වෙනත් රටවල් ඔවුන්ගේ විදේශ සබඳතා උපාය මාර්ගිකව පවත්වාගෙන ගිය නිසා ඔවුන්ට විකල්ප බොහොමයක් තිබෙනවා.

විශේෂයෙන්ම අපි BRICS සංවිධානය සමඟ කරපු ගනුදෙනුව පිළිබඳ දැක්වූ ඒ ඇලිමැළි, දුබල සංකල්පය නිසා මොකක්ද වුණේ? අපට ඔවුන්ගේ සහයෝගය නැති වෙලා ගියා. අපේ ජනාධිපතිතුමාට ආරාධනා කළාට එතුමා යන්නේත් නැහැ. ඉතින් කොහොමද අපි ලෝකයත් එක්ක ගනු දෙනු කරලා මේ වාගේ අර්බුදයකට මුහුණ දෙන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට විදේශගත ශ්‍රී ලාංකිකයින් ඉතාම වැදගත්. මිලියන 1.5ක් ඉක්මවා ගිය විදේශගත ශ්‍රී ලාංකිකයන් පිරිසක් ඉන්නවා ඒ කලාපයේ. ඔවුන් සම්බන්ධයෙන් අද අපි ගන්නා ක්‍රියාමාර්ග මොනවාද? අද ඔවුන් විශාල අවදානමකට ලක් වෙලා සිටිනවා. ඒ පිළිබඳව සංවාදයක් අවශ්‍යයි, ඔවුන්ට යම් කිසි සුරක්ෂිතභාවයක් අවශ්‍යයි; ඒ පිළිබඳව අපි සාකච්ඡා කළ යුතුයි.

ඒ වාගේම, ජාතික සූදානම - national preparedness - ගැනත් අපි කථා කරන්නට ඕනෑ. ඒ කියන්නේ, මේ සමස්තය කළමනාකරණය කර ගැනීම සඳහා අපේ ජාතික සූදානම තිබෙන්නේ කොතැනද කියන එක ගැන අපි කථා කරන්නට ඕනෑ. මම දිගින් දිගටම කිව්වා, "මේක ජාතික ප්‍රශ්නයක් හැටියට අරගෙන සාකච්ඡා කරන්න අපි කැමැතියි" කියලා. නමුත්, ජාතික ප්‍රශ්නයක් හැටියට අරගෙන කොහොම කථා කරන්නද? අපට ගහන්නේම මඩ, නහන්නේම අවලාද. අපට කථා කරන්න බැහැ. මම ඊයේ ප්‍රකාශයක් කළා, "අපි එකතු වෙලා මොකක් හරි කරන්න බලමු" කියලා. මං අද පාරට බැහැලා පෙට්‍රල් ෂෙඩ් එකක් ළඟට ගිය ගමන් මිනිස්සු මගේ ඇඟට ආවා, "ඕවා කථා කරන්න එපා මන්ත්‍රීතුමා. මේගොල්ලන්ට බැහැ. ඒක නිසා එකතු වෙලා මොනවාද කරන්න පුළුවන්?" කියලා. ඉතින්, ඒකයි ජනතා මතය. අපි කොච්චර අවංකව උත්සාහ කළත්, මේ රජය සම්බන්ධයෙන් ජනතා විශ්වාසය සම්පූර්ණයෙන්ම නැති වෙලා තිබෙනවා. මම ඒක කියන්නම ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අපට දැන් අවශ්‍යයි, මේ රට ගැන, අපේ මේ මව්බිම ගැන විශ්වාසයක් ඇති ජනතාවක් ගොඩ නඟන්නට. ජනතාවගේ විශ්වාසයෙන් තොරව මොකවත් කරන්න බැහැ. ජනතාවට මේ රට ගැන විශ්වාසයක් තිබෙන්නට ඕනෑ, ජනතාවට මේ ආණ්ඩුව ගැන විශ්වාසයක් තිබෙන්නට ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මට තවත් තත්පර කීපයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ජනතා විශ්වාසය ඇති වන පරිදි කටයුතු කරන්නටම ඕනෑ. ඒ නිසා ඔය උද්ධච්ච ප්‍රකාශ නවත්වලා, බොරු කියන එකත් නවත්වලා, ජනතාවට විශ්වාසයක් ඇති වන විධියට කටයුතු කරන්න. එහෙම හරියට, අවංකව මේ තත්ත්වයට මුහුණ දුන්නොත් ඒ සඳහා ඔබ දරන මහන්සියේ ප්‍රතිඵලය බලා ගන්න පුළුවන් වෙයි. *[බාධා කිරීමක්]* මෙහෙම කිව්වත් අපට ආයෙත් පහර ගහයි, "නයා, නයා" කියලා. ගරු මන්ත්‍රීතුමනි, "ඕකා නයා, පැණියා, රොටියා" කියලා ඔබතුමන්ලා පැලවත්තෙන් fake account හදලා පහර ගහගෙන ගහගෙන යනවා. *[බාධා කිරීම්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොන උපාය මාර්ගික දෙයක් යෝජනා කළත්, මොන උපාය මාර්ගික දෙයක් ගැන කථා කළත්, මොන strategy එකක් ගැන කථා කළත්, පැලවත්තට ගිහිල්ලා කියනවා, "ගහපිය මූට 'රොටියා' කියලා" යනුවෙන්. ඕක තමයි කරන්නේ, වෙන මොකුත් කරන්නේ නැහැ. ඕක තමයි ප්‍රශ්නය. ප්‍රශ්නයක් විසඳන්න බැහැ. මොකද, මඩ ගහන එක විතරයි කරන්නේ.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අද දින පැවැති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී පාර්ලිමේන්තුවේ රැස්වීම් සම්බන්ධයෙන් කරන ලද දැනුම් දීමට අදාළ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "අද දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී සිදු කරන ලද දැනුම් දීම අනුව, සභාවේ අවසරය ඇතිව අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2026 මාර්තු මස 19 වැනි බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 දක්වා කල් තැබිය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අරවින්ද සෙනරත් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.22]

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ අප සාකච්ඡා කරන්නේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ශක්තිමත් කිරීමට අදාළව ගනු ලබන තීන්දු තීරණ පිළිබඳවයි.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිළිබඳව කථා කරද්දී, විවිධ කණ්ඩායම් කලබල වෙමින්, ඒ පිළිබඳව විවිධ විවේචන කරමින්, විවිධ ප්‍රකාශ කරමින් ඉන්නවා. අපේ රටේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ශක්තිමත් වෙනවාට බිය වෙච්ච කණ්ඩායමක් මේ රටේ ඉන්නවා. මොකද, ගත වුණු දශක දෙක-තුන තුළ මේ රට නාස්ති කරලා, මේ රටේ මුදල් අවභාවිත කරලා, එළියේ ඉන්න ගොඩක් අයට වාගේම ඇතුළේ ඉන්න අයටත් නඩු පැවරෙමින් තිබෙන යුගයක්, මේක. ඒ නිසා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ශක්තිමත් වෙනවාට විරුද්ධව විපක්ෂයේ ගොඩක් අය විවිධ ප්‍රකාශ කරමින් ඉන්නවා. නමුත්, ආණ්ඩුව විධියට අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ශක්තිමත්ව ගොඩ නැඟීමට අවශ්‍ය කරන සියලු පහසුකම් සපයන්න කටයුතු කරමින් සිටිනවා. එම නිලධාරින්ගේ වැටුප් හා වේතන, අවශ්‍ය කරන පහසුකම් ආදී සියල්ල ඔවුන්ට ලබා දෙමින්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ශක්තිමත් කළ යුතුයි. මොකද, රටක් විධියට ගත්තාම අපේ රටේ ආර්ථිකය කඩාගෙන වැටුණේ හොරකම, නාස්තිය, වංචාව, දූෂණය නිසා. ඒක ලෝකයම දන්නවා. අපේ රට නිශ්චිත මොහොතක බංකොලොත් රටක් බවට පත් වුණා. එහෙම වුණේ මේ රට පාලනය කරපු පාලකයන්ගේ තිබුණු අදූරදර්ශී ක්‍රියාමාර්ග සහ මේ සාංසික

[ගරු අරවින්ද සෙනරත් මහතා]

වස්තුවක් වාගේ වෙච්ච මහා ධනය තමන්ගේ පෞද්ගලික සුඛ විහරණයට යොදා ගත්තු නිසා. ඒ සම්බන්ධයෙන් විපක්ෂයේ ගොඩක් මහත්වරු කලබල වෙලා ඉන්නවා. හැබැයි, මේ අය කලබල වුණාට අපි මේ කොමිෂන් සභාව ශක්තිමත් කිරීමට වාගේම, ස්වාධීන කිරීමටත් කටයුතු කර තිබෙනවා.

ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට මේ වාගේ ආයතන ස්වාධීන කරලා, ආණ්ඩු පක්ෂයද විපක්ෂයද කියලා නොබලා, තරාතිරම නොබලා ඕනෑම පුද්ගලයෙකුට අදාළව නීතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වටපිටාව සකස් කරමින් තිබෙනවා. ඒ සඳහා තමයි, අප අද දවසේ මේ විවාදය පවත්වමින් ඉන්නේ.

සමහරු කථා කරනවා, එකට වැඩ කරන්න; එකතු වෙලා වැඩ කරන්න. ඒ කියන මහත්වරුන් දිහා බැලුවාම අපට හිතෙනවා, ඒ මහත්වරුන් කථා කරන්නේ එකට එකතු වෙලා නයි නටවන්නද කියලා. මොකද, ඒ මහත්වරුත් එක්ක වෙනත් දෙයක් කරන්න බැහැ. ඉතිහාසයේ නයි නටවලා තමයි මෙතැනට ඇවිත් තිබෙන්නේ. එම නිසා ඒ මහත්වරුන්ට අපි උත්තර දෙන්නේ නැහැ. අපි රටක් විධියට මේ ඇති වෙලා තිබෙන අර්බුදය හොඳින් හඳුනාගෙන රටේ ජනතාවත් එක්ක -පුරවැසියන් එක්ක- සාකච්ඡා කරමින් සිටින මොහොතක්, මේක.

අද දවස පුරාම විපක්ෂය උත්සාහ කළා, මේ ජාතික ව්‍යසනය, මේ ගෝලීය ව්‍යසනය කළමනාකරණය කර ගන්න ආණ්ඩුව සමත් වුණේ නැහැ කියන කාරණය කියන්න. දශක දෙකක් තුළ ඇති වෙච්ච අර්බුදවලට පැවැති ආණ්ඩු මුහුණ දීපු තත්ත්වයන් පිළිබඳව හොඳ අවබෝධයක් මේ රටේ පුරවැසියන්ට තිබෙනවා. හැබැයි, 2025න් පසුව අපේ රට මුහුණ දීපු තත්ත්වයන් -රට අභ්‍යන්තරව සහ බාහිරව සිදු වුණු අභාග්‍ය සම්පන්න සිදුවීම් පවා- හොඳින් කළමනාකරණය කර ගන්න ආණ්ඩුවක් විධියට අපි සමත් වුණා. "දිට්වා" සුළි කුණාටුව ආවා. අපි ඒ ආපදා තත්ත්වය ඉතාම හොඳින් කළමනාකරණය කර ගත්තා. දැන් ගෝලීය යුදමය තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. එයටත් හොඳින් මුහුණ දීම සඳහා අපි සැලසුම් සකස් කරමින් තිබෙනවා. ඔබතුමන්ලා කියන ආකාරයේ අර්බුදයක් නොවෙයි මෙතැන තිබෙන්නේ. මේක ගෝලීය අර්බුදයක්.

ඛනිජ තෙල් කියන දේ රටවල් කිහිපයකට සීමා වෙලායි තිබෙන්නේ. ඒ රටවල් තමයි ලෝකයට ඉන්ධන සපයන්නේ. ඉන්ධනත් එක්ක තමයි ලෝකයේ හැම රටකම ආර්ථිකය ගැට ගැහිලා තිබෙන්නේ. එහි සැපයුමේ යම් අඩුපාඩුවක්, යම් දුර්වලවීමක් වුණොත් ඒක ලෝකයටම බලපානවා. ඒ නිසා ඔබතුමන්ලා කියන්න උත්සාහ කරන, රටක් විධියට ආණ්ඩුව අසමත් කියන එක වැරැදියි. ඒක රටේ ජනතාව නොමඟ යවන්න කියන කථාවක්. රටේ මිනිස්සු අපේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසය තබා තිබෙනවා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු උත්සාහ කරමින් ඉන්නවා, ආණ්ඩුව ජනතාවගේ විශ්වාසය ගොඩ නඟා ගත යුතුයි කියලා මතයක් හදන්න. අපි විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයට කියනවා, ජනතාවගේ විශ්වාසයට 2024දීත්, 2025දීත්, 2026දීත් අබමල් රේණුවකවත් හානියක් වෙලා නැහැ කියලා. මේ රටේ පුරවැසියෝ -ඡන්දය දුන්, ඡන්දය නුදුන් හැම කෙනාම- ජාතික ජන බලවේගය ආණ්ඩුව කෙරෙහි සියයට සියයක් විශ්වාසය තබාගෙනයි ඉන්නේ. ඒ නිසා ඒ විශ්වාසය පිළිබඳව අපට ප්‍රශ්නයක් නැහැ. මිනිස්සු සූදානම් ඒ කැප කිරීම කරන්න. අපි විපක්ෂයටත් ආරාධනාවක් කරනවා. මේ අමාරුම මොහොතේ ආණ්ඩුව විධියට අපි කැප කිරීම් කරන්න සූදානම්; සමස්ත පුරවැසියා කැප කිරීම් කරන්න සූදානම්. විපක්ෂයත් සූදානම් වෙන්න, කැප කිරීම් කරන්න. පෙට්‍රල් ෂෙඩ් ගණනේ, එහෙම නැත්නම් ගෑස් පෝලිම් ගණනේ ගිහිල්ලා voice-cuts දීලා මිනිසුන් කුලප්පු කරන එක නොවෙයි, විපක්ෂයේ දේශපාලනය. ඊට එහා ගිය විදග්ධ දේශපාලනයකට යන්න ඕනෑ. ඊට එහා ගිය ප්‍රබුද්ධ දේශපාලනයක් කරන්න අපි විපක්ෂයට ආරාධනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ අර්බුදය ව්‍යාපාරයක් කර ගන්න සූදානම් නැහැ. සමහර මහත්වරු කොරෝනා වසංගතය ව්‍යාපාරයක් කර ගත්තා; ඇන්ටිජන් එකෙන් ගසා කෑවා; කොරෝනා වසංගතයේදී යම් යම් තත්ත්ව මත, තමන්ට තිබුණු කාමර පහසුකම් ටික වැඩි මිලට දීලා හම්බ කර ගත්තා. ඒ මිනිස්සු ඇවිල්ලා අපට අද උපදෙස් දෙනවා. ඕවාට කියන්නේ "වැදි බණ" කියලා. අපි එහෙම නොවෙයි. ආණ්ඩුවක් විධියට අපි සියලු කැප කිරීම් කරමින් කටයුතු කළමනාකරණය කර ගන්න සැලසුම් සකස් කරමින් ඉන්නවා.

විශේෂයෙන් ගොවි ජනතාව මුහුණ දෙන දැවැන්ත ප්‍රශ්න ටිකක් තිබෙනවා, ඉන්ධන ප්‍රශ්නයද ඇතුළුව. අපි අද උදෑසන ගරු ඇමතිතුමාත්, පොහොර සමාගම් සහ වග කියන නිලධාරීන් එක්කත් සාකච්ඡා කළා. අපි මේ සියලු තත්ත්ව අධ්‍යයනය කරලා මීට පෙර සූදානම් කරපු සැලසුම් දැන් ක්‍රියාත්මක කරමින් තිබෙනවා. ගොවීන් වී අස්වැන්න නෙළා ගනිද්දී ඉන්ධන ගැටලුවක් ඇති වෙමින් තිබුණා. අපි ඒ සඳහා ඉතා විධිමත් සැලැස්මක් ක්‍රියාත්මක කරමින් තිබෙනවා. ඉදිරි දින කිහිපය තුළ අපි තවත් පහසුකම් වැඩි කරන්න සූදානම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යුද්ධය අතරේ ජාවාරම්කරුවන් සූදානම් වෙලා ඉන්නවා යූරියා පොහොර මිටියක මිල වැඩි කරලා කළු කඩයක් නිර්මාණය කරන්න. අද අපි පොහොර සමාගම් එක්ක කථා කරලා තීන්දුවක් ගත්තා, ලංකාවේ යූරියා හොණ්ඩරයක්, එහෙම නැත්නම් කිලෝ 50ක මිටියක් පෞද්ගලික අංශයේ පොහොර සමාගම් රුපියල් 9,500කටත්, රජයේ පොහොර සමාගම රුපියල් 9,000කටත් ලබා දෙන්න. මෙන්න මේකට තමයි කියන්නේ ආණ්ඩුවක් කියලා. හැබැයි, ඔය කයිවාරු ගහන, නයි නටවපු, එහෙම නැත්නම් ඕනෑම දෙයක් බිස්නස් එකක් කර ගත්තු මහත්වරුන්ගේ ආණ්ඩු කාලවල මෙවැනි අර්බුදයක් ආවාට පස්සේ යූරියා මිටියක මිල රුපියල් 45,000 දක්වා ඉහළ ගියා. නමුත්, අපි මේ තත්ත්වය කළමනාකරණය කරලා තිබෙනවා. ප්‍රශ්න තිබෙන්න පුළුවන්. මේක ඇතුළේ කළු කඩ ව්‍යාපාර තිබෙන්න පුළුවන්. හැබැයි, අප ඒ සියල්ල හඳුනාගෙන නිශ්චිත විසඳුමක් ලබා දෙමින් ඉන්න මොහොතක තමයි මේ කථා කරන්නේ.

විපක්ෂය කියමින් ඉන්නවා, විදෙස් සම්බන්ධතා ගැන. විදෙස් සම්බන්ධතා ශක්තිමත් වන එකක් නැහැ කියලා විපක්ෂය කිව්වා, 2024 ජනාධිපතිවරණයට පෙරත්. හැබැයි, අපේ රටේ පුරවැසියන් විශ්වාස කරන කාරණයක් තිබෙනවා. අප හැම වෙලාවේම ඒ ගැන කියන්න ඕනෑ නැතත් විපක්ෂයේ මහත්වරුන් අහන නිසා කියන්න ඕනෑ. අපි මේ වන කොට මාලිමාව ආණ්ඩුව යටතේ -ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ - ලංකා ඉතිහාසයේ වෙන කවරදාටත් වඩා ඉතාම ශක්තිමත් ලෙස විදෙස් සම්බන්ධතා ගොඩ නඟලා තිබෙනවා. රුසියාව, චීනය, වියට්නාමය, ඉන්දියාව, ජපානය, ඇමෙරිකාව ආදි සියලු රටවල් ලාංකීය දේශපාලනයත් සමඟ අත් වැල් බැඳගෙන රටේ ඉදිරි ගමනට ආශිර්වාද කරමින් ඉන්නවා. මේක තමයි ආණ්ඩුවක වගකීම. අපි හැම ක්ෂේත්‍රයක්ම අධ්‍යයනය කරමින් ඒවායේ ගැටලුවලට විසඳුම් දෙන්න කටයුතු කරමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ රට ගොඩ නඟන්න ඕනෑ. මේ රට ගොඩ නැඟීමේ වගකීම අපට තිබෙනවා. දශක ගණනාවක් දේශපාලනය කරලා අපි බලය ගත්තේ මේ වාගේ

අර්බුදයකදී මේක දාලා යන්න හරි, මේකෙන් රට ෆේල් කරන්න හරි නොවෙයි. අපි හොඳ දේශපාලන අධ්‍යයනයක් තුළ දේශපාලනය කරපු ව්‍යාපාරයක්. ලාංකීයව පැවැති අර්බුද විතරක් නොවෙයි, අපි ජාත්‍යන්තර මට්ටමේ අර්බුද පවා අධ්‍යයනය කළ දේශපාලන ව්‍යාපාරයක්. ඒ නිසා ඉතාම හොඳ, ඉතාම ශක්තිමත් තීන්දු, තීරණ අපි මේ වනවිට ගනිමින් ඉන්නවා, මේ අර්බුදයෙන් රට ගොඩ ගැනීම සඳහා. විපක්ෂය හොඳටම ඔප්පු කර තිබෙනවා, අපේ රටේ ඉතිහාසය තුළ ඔවුන් මුහුණ දුන් ඉතාම සරල ගැටලුවක්වත් විසඳා ගන්න බැරිව ෆේල් වෙලා තිබෙනවා කියලා. හැබැයි, අපේ පාලන කාලය තුළ -අවුරුද්දයි, මාස 5ක වාගේ කාලය තුළ- අපි මුහුණ දුන් ඉතාම සංකීර්ණ අර්බුද පවා ඉතාම හොඳින් කළමනාකරණය කරගන්න ආණ්ඩුවක් විධියට අපි සමත් වෙලා තිබෙනවා. ඒ වෙන මොකුත් නිසා නොවෙයි. අපි සාමූහික දේශපාලන ව්‍යාපාරයක්. අපි සාමූහිකව තීන්දු තීරණ ගන්නේ. අපි පහළම ඉන්නා නිලධාරියා දක්වා යමින්, මේ ගැටලුවලට විසඳුම් මොනවාද කියා ඔවුන් එක්ක සාකච්ඡා කරමින් දේශපාලන අධිකාරිය සමඟ, ඒ විෂයය පිළිබඳ ප්‍රාමාණික දැනුමක් තිබෙන හැම කෙනාම සමඟ අත්වැල් බැඳ ගනිමින් මේ ප්‍රශ්නවලට විසඳුම් සොයන්න කටයුතු කරනවා.

ප්‍රවාහනය, අධ්‍යාපනය, ඛනිජ තෙල්, ආරක්ෂක, මහා මාර්ග, කෘෂිකර්ම, සංචාරක කියන මේ සියලු විෂයයන් සම්බන්ධව පැය 24 පුරාම වැඩ කරන තැනට අපි මේ රට පත් කර තිබෙනවා. හැම අමාත්‍යාංශයකම අමාත්‍යවරු, ඒ ඒ විෂයයට වගකියන අනෙකුත් මන්ත්‍රීවරු, ඒ නිලධාරීන් එක්ක එකතු වෙලා සැලකිය යුතු කාලයක් සාකච්ඡා කර තිබෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශය ගත්තොත් පැය 18කට වඩා සාකච්ඡා කර මේ ගැටලු විසඳීම සඳහා සැලසුම් සකස් කරමින් ඉන්නවා. ප්‍රවාහන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය වැනි සියලු අමාත්‍යාංශ මේවා ගැන සාකච්ඡා කරමින් ඉන්නවා. මෙන්න මේකට තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි ආණ්ඩුවක් කියන්නේ. ආණ්ඩුවක් කියන්නේ අර්බුදයක් ආවාම, ඒකෙන් ජීවත් වෙන එකකට නොවෙයි. ආණ්ඩුවක් කියන්නේ අර්බුදයක් ආවාම, ඒකෙන් තමන්ගේ පරම්පරාවේ අයට හම්බ කරන්න දෙන එකක් නොවෙයි. ආණ්ඩුවක් කියන්නේ අර්බුදයක් ආවාම, ඒ අර්බුදය අතික්‍රමණය කර ජයග්‍රහණයෙන් කෙළවර කරන්න වැඩ පිළිවෙළක් හදන එකකට. ඒකට අවශ්‍ය දේශපාලන නායකත්වය සහ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම තමයි ආණ්ඩුවක වගකීම වන්නේ. අපි එය ඉටු කරමින් ඉන්නවා. ඒ නිසා "සූදානමක් නැහැ" කියලා කියන විපක්ෂයේ මහත්වරුන්ට අපි කියන්නේ, අපි සියල්ල සූදානම් කර තිබෙන බවයි. අපි සියල්ල සාකච්ඡා කරමින් තිබෙනවා. හැබැයි, ප්‍රශ්න තිබෙන්න පුළුවන්. මොකද, හොඳ system එකක් තිබුණු රටක් නොවෙයි, අපේ රට. System එකක් දැන් තමයි හදමින් තිබෙන්නේ.

QR එක පිළිබඳ විවේචන තිබෙන්න පුළුවන්. හැබැයි, මේ වෙනකොට පැයකට සාමාන්‍යයෙන් ආසන්න වශයෙන් 35,000ක්, 40,000ක් පමණ QR එක සඳහා register වෙමින් තිබෙනවා. පසුගිය ඉරිදා තමයි මේක ප්‍රකාශ කළේ. ඒකේ ගැටලු තිබෙන්න පුළුවන්. හැබැයි, ඉක්මනින්ම මේ කටයුතු සූදානම් කරලා ජනතාවට එම අවස්ථාව ලබා දෙන්න අපි කටයුතු කරමින් සිටිනවා. ඒ ඒ ආයතන එක්ක අපි මීට පෙර සාකච්ඡා කරලා තමයි මේවා සූදානම් කර ගත්තේ. ඒ නිසා අපි මේ තත්ත්වය හොඳින්ම හඳුනා ගෙන ඒකට විසඳුම් හොයන්න කටයුතු කරපු සහ ඒ සඳහා සැලසුම් හදපු ආණ්ඩුවක් විධියට තමයි අද මේ විවාදයට සම්බන්ධ වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ මහත්වරු කිහිප දෙනෙකු කියපු දේවල්වලට උත්තරයක් දෙමින්ම මම කථාව අවසන් කරන්නම්. මේක රූකඩ ආණ්ඩුවක් කිව්වා. කවුද කියන්නේ? මේ පාර්ලිමේන්තුවේ ඉන්න හොඳම රූකඩය තමයි ඒක කිව්වේ. ඥානා අක්කා කියන විධියට, එහෙම නැත්නම් "නයි දෙරණ" වාගේ එක එක මාධ්‍ය ආයතන කියන විධියට වැඩ කරපු මහත්වරු, ආණ්ඩු මෙහෙයවන්න කත් ඇදපු, වලව්වල හට්ටි හෝදපු මහත්වරු තමයි මෙතැනට ඇවිල්ලා අපට රූකඩ ආණ්ඩුවක් කියන්නේ. අපි ලාංකීය ජනතාවගේ ඡන්දයෙන් පත් වුණු ආණ්ඩුවක්. ඒ වාගේම ලාංකීය ජනතාවගේ ළැදියාව, වුවමනාව හොඳින් හඳුනා ගත් ආණ්ඩුවක්. අපි ඒ ළැදියාව, වුවමනාව ඉටු කිරීම සඳහා ජීවිතයේ කැප කළ හැකි වටිනාම දේත් කැප කරලා දේශපාලන අත්දැකීම් සහිතව ආපු දේශපාලන ව්‍යාපාරයක්. ඒ නිසා මේක රූකඩ ආණ්ඩුවක් කියලා කවුරුහරි කියනවා නම් අපට කියන්න වෙන්නේ, නැහැ මහත්තයෝ, ඔයගොල්ලන් රැවටිලා කියන එකයි. අපි ජාත්‍යන්තර වශයෙන් හොඳින් සම්බන්ධතා තිබෙන, රටට පෞරුෂයක් ගෙනෙන්න පුළුවන්, රටේ අභිමානය ලෝකය ඉස්සරහ ඔසවා තබන, ශක්තිමත් පදනමක් සහිත, දේශපාලන ප්‍රතිපත්තියක් සහිත සුජාත දූපුතුන්ගෙන් ගොඩනැඟුණු ආණ්ඩුවක්. ඒ නිසා මේ ආණ්ඩුව රූකඩයක් කියන මහත්වරුන්ට අපට කියන්න තිබෙන්නේ මේකයි. ඒ මහත්වරු තමයි රූකඩ විධියට මේ රට මෙහෙයවූයේ. අපි ඒක නතර කර තිබෙනවා. අපි ශක්තිමත්ව අපේ රට ලෝකය ඉස්සරහට ගෙන යමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[පි.ව. 3.33]

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)

மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நாடாளுமன்றத்தில் முன்வைக்கப்பட்டுள்ள இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவின் அலுவலர்கள் மற்றும் ஊழியர்களின் வேதனம் மற்றும் சேவை நிபந்தனைகள் பற்றிய முன்மொழிவுக்கு ஒப்புதல் அளிப்பது தொடர்பான எனது கருத்துகளை இந்த அவையில் எடுத்துரைக்க விழைகின்றேன்.

நாடாளுமன்ற ஒப்புதலுக்காக முன்வைக்கப்பட்டுள்ள தீர்மானம், 2023ஆம் ஆண்டின் 9ஆம் எண் கொண்ட ஊழல் எதிர்ப்புச் சட்டத்தின் 26வது மற்றும் 32வது பிரிவுகளின்கீழ் ஆணைக்குழுவுக்கு வழங்கப்பட்ட சட்ட அடிப்படையிலான அதிகாரங்களின்கீழ் உருவாக்கப்பட்டுள்ளது. 1994ஆம் ஆண்டின் 19ஆம் எண் கொண்ட இலஞ்ச ஆணைக்குழுச் சட்டத்தின் மரபுவழிக் கட்டமைப்பை நீக்கி, 2023ஆம் ஆண்டின் 9ஆம் எண் கொண்ட ஊழல் எதிர்ப்புச் சட்டத்தைத் தொடர்ந்து, ஊழல் எதிர்ப்பு அமைப்பின் செயற்பாடு மற்றும் நிதிச் சுதந்திரத்தை வலியுறுத்தும் ஒரு மாதிரிக்கு அரசு மாறியுள்ளது. ஊதியம் தொடர்பாக இப்பொழுது முன்மொழியப்பட்டுள்ள தீர்மானமானது, முற்கூறிய புதிய மாதிரியை இயக்குவதற்கான ஓர் எந்திரமாகும். ஏனெனில், இது ஊழியர் குழாமை தொழில்முறை மயமாக்கவும், பொருளாதாரப் பாதிப்புகளிலிருந்து பாதுகாக்கவும் முயல்கின்றது.

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவானது, பொதுச் சேவை ஆணைக்குழுவின் ஒரு நீட்சியாகச் செயற்பட்ட முந்தைய முறைமையைப்போல் அல்லாமல், புதிய தீர்மானம் ஆணைக்குழுவை ஒரு சட்டமுறை அமைப்பாக ஏற்றுக் கொள்கின்றது. மேலும், பொதுச் சேவை ஆணைக்குழுவின் தலையீடின்றி இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவே தனது சொந்த ஊழியர்களை பணிக்கு அமர்த்தவும் பதவி உயர்வு வழங்கவும் ஒழுக்காற்று நடவடிக்கை எடுக்கவும் அதிகாரம் வழங்குகின்றது. தனியார் துறை இலஞ்சம், வெளிநாட்டு அலுவலர்களுக்கு இலஞ்சம், அதிகாரத்தை வணிக அடிப்படையில் பயன்படுத்துதல், விளையாட்டு தொடர்பான ஊழல்கள் ஆகியவற்றை உள்ளடக்கிய ஆணைக்குழுவின் விரிவாக்கப்பட்ட ஆணையைச் செயற்படுத்துவதற்கு இந்த மாற்றம் இன்றியமையாததாகும்.

பணியாளரை நான்கு செயற்பாட்டுத் தூண்களாக வகைப்படுத்துவது புதிய தீர்மானத்தின் ஒரு முதன்மையான கூறாகும். அதாவது, சட்டச் செயலாக்கம், ஒருமைப்பாடு, சொத்துக்கள், பொறுப்புகள் மற்றும் கூட்டாண்மை விவகாரங்கள் என்பனவே அவையாகும். இந்தக் கட்டமைப்பை நிறைவேற்றுவதற்காக முன்மொழியப்பட்ட ஆளணி மொத்தம் 971ஆக விரிவுபடுத்தப்பட்டுள்ளது. எனினும், தொடக்க ஒப்புதல்கள் 649 உள்ளக ஊழியர்கள் மற்றும் 283 இரண்டாம் நிலையில் இணைக்கப்பட்ட காவற்றுறை அலுவலர்களைக் கொண்ட ஒரு முதன்மையான ஆளணியை இலக்காகக் கொண்டுள்ளது. இந்தப் பல்துறை அணுகுமுறைக்குத் தடயவியல் கணக்கியல், எண்மியத் தடயவில் மற்றும் இணக்கப்பாட்டு நிபுணர்களை ஆட்சேர்ப்புச் செய்யவேண்டி உள்ளது. இது முற்றிலும் காவற்றுறை மைய புலனாய்வு மாதிரியிலிருந்து விலகிச் செல்கின்றது. தீர்மானத்தில் அறிமுகப்படுத்தப்பட்டுள்ள ஊதிய முறைமையானது, சட்டமா அதிபர் திணைக்களத்தின் சிறப்பு ஊதியத் திட்டங்களோடு ஒத்துப்போகும் வகையில் வடிவமைக்கப்பட்டுள்ளது. இந்த ஒருங்கிணைப்பு இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு வில் இருந்து பிற சட்ட அலுவலகங்களுக்கு அல்லது தனியார் துறை நிறுவனங்களுக்கு நிபுணர்கள் செல்வதைக் குறைப்பதை நோக்கமாகக் கொண்டதாகும்.

ஊழல் எதிர்ப்புப் பணிகளில் இயல்பாகவே உள்ள தொழிற்றுறை அபாயங்கள் மற்றும் செயற்றிறன் எதிர்பார்ப்புகளை ஏற்றுக்கொள்ளும் தனித்துவமான கொடுப்பனவுகளால் ஊதியக் கட்டமைப்பு நிறைவு செய்யப்படுகின்றது. இதில் ஊழல் எதிர்ப்பு அபாயக் கொடுப்பனவு, செயற்றிறன் கொடுப்பனவு ஆகியன அடங்கும். இவை இரண்டும் புலனாய்வாளர்கள் இலஞ்சம் பெறுவதைத் தடுக்கும் காரணிகளாகச் செயற்படுகின்றன. மேலும், புதுமை மயமாக்கப்பட்ட பிரிவுகளுக்குத் தேவையான சிறப்புத் தகுதிகளை நிறைவு செய்யாத ஊழியர்களின் மாற்றத்தை நிருவகிக்கப் புதிய விதிமுறைகள் தன்னார்வ ஓய்வூதியத் திட்டத்தை அறிமுகப்படுத்துகின்றன. ஆணைக்குழுவானது, இப்பொழுது பணியாற்றும் தகுதியான அலுவலர்களை உள்வாங்குவதை உறுதி செய்யும் அதேவேளையில், எண்மிய வழக்குக் கோப்புக் கண்காணிப்பு, மத்திய மின்னணுச் சொத்து பிரகடன முறையில் பயிற்சி அளிக்கப்பட்ட புதிய தலைமுறை ஒருமைப்பாடு அலுவலர்களைக்கொண்டு பணியாளர்களைப் புத்துயிர் பெறச் செய்வதையும் உறுதி செய்கின்றது.

1994ஆம் ஆண்டின் 19ஆம் எண் கொண்ட இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வற்கான ஆணைக்குழுச் சட்டத்திலிருந்து 2023ஆம் ஆண்டின் 9ஆம் எண் கொண்ட ஊழல் எதிர்ப்புச் சட்டத்துக்கு மாறியிருப்பதானது, இலங்கையின் ஊழல் எதிர்ப்புச் செயலாக்கத்தின் சட்டம் மற்றும் நிருவாக கோட்பாட்டில் ஏற்பட்டுள்ள ஆழமான மாற்றத்தைக் குறிக்கின்றது. 1994ஆம் ஆண்டின் சட்டத்தின்கீழ் ஆணைக்குழு பெரும்பாலும் இலஞ்ச ஆணையாளர் திணைக்களத்தின் ஒரு மறு பதிப்பாகவே இருந்தது. அது கட்டமைப்பு அடிப்படையில் பொதுச் சேவை ஆணைக்குழு மற்றும் காவற்றுறையோடு பிணைக்கப்பட்டு இருந்தது.

2023ஆம் ஆண்டின் சட்டமானது, சுதந்திரமான பணியமர்த்தல் மற்றும் பதவி விலக்கல் அதிகாரங்களைக்கொண்ட ஒரு சட்டமுறை அமைப்பை நிறுவுவதன்மூலம் இந்தப் பிணைப்பை உடைக்கின்றது. 1994ஆம் ஆண்டின் சட்டத்தின்கீழ், பணிப்பாளர் நாயகம் ஆணைக்குழுவுக்கும் புலனாய்வுப் பிரிவுக்கும் இடையில் ஓர் ஒருங்கிணைப்பாளராக இருந்தார். எனினும், புதிய திருத்தமானது பணிப்பாளர் நாயகத்தை ஆணைக்குழுவின் முதன்மை நிறைவேற்று அலுவலர் மற்றும் தலைமை கணக்கீட்டு அலுவலராக மாற்றுகின்றது. இதன் பொருள் யாதெனில், பணிப்பாளர் நாயகம் இனியொரு நிருவாகியாக மட்டுமல்லாமல், புலனாய்வாளர்களுக்கும் வழக்கறிஞர் களுக்கும் தேவையான வளங்களை வழங்குவதற்கும் இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வற்கான ஆணைக்குழு நிதியத்தின் நிதி ஒருமைப் பாட்டுக்கும் பொறுப்பானவர் ஆகின்றார் என்பதுதான்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த முன்னேற்றங்களுக்கு மத்தியில் சில விமர்சனங்களும் முன்வைக்கப்படுகின்றன. 2023ஆம் ஆண்டின் ஊழல் எதிர்ப்புச் சட்டத்துக்கும் 2024ஆம் ஆண்டின் பொது நிதி மேலாண்மைச் சட்டத்துக்கும் இடையில் ஒரு முரண்பாடு எழுந்துள்ளது. திறைசேரியானது, பொது நிதி மேலாண்மைச் சட்டத்தைப் பயன்படுத்தி ஆணைக்குழுவின் நிதிச் சுதந்திரத்தைக் கட்டுப்படுத்த முயல்வதாகக் குற்றஞ்சாட்டப்படுகின்றது. தற்போது 56 சதவீதத்துக்கும் அதிகமான சிறப்புப் பணியிடங்கள் வெற்றிடமாக உள்ளன. போதிய நிதி ஒதுக்கீடு இன்மையால் இந்த வெற்றிடங்களை நிரப்ப முடியாமல் உள்ளது. 2025ஆம் ஆண்டில் 8,409 முறைப்பாடுகள் கிடைத்தபொழுதிலும், 115 புதிய வழக்குகள் மட்டுமே தாக்கல் செய்யப்பட்டுள்ளன. இது ஆணைக்குழுவின் வினைத்திறன் குறித்த கேள்விகளை எழுப்புகின்றது.

இந்த அறைகூவல்களை முறியடிக்கப் பின்வரும் நடவடிக்கைகளை அரசு எடுக்க வேண்டுமென நான் பரிந்துரை செய்கின்றேன். சட்டத் தெளிவு: ஊழல் எதிர்ப்புச் சட்டத்தின் நிதிச் சுதந்திரம் பொது நிதி மேலாண்மைச் சட்டத்தைவிட மேலானது என்பதை உறுதிப்படுத்த வேண்டும். ஆணைக்குழு நிதியம்: அபராதங்கள் மற்றும் இழப்பீட்டுத் தொகைகள் நேரடியாக இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவின் சொந்த நிதியத்துக்குச் செல்வதை உறுதிசெய்ய வேண்டும். கலப்பு ஊழியர் மாதிரி: பட்டறிவு வாய்ந்த காவற்றுறை அதிகாரிகளோடு புதிய ஒருமைப்பாட்டு அலுவலர்களை இணைத்து ஒரு கலப்புத் திறமையை உருவாக்க வேண்டும். ஊழியர் இடமாற்றம்: பட்டறிவுவாய்ந்த புலனாய்வாளர்களை அரசியல் காரணங்களுக்காக இடமாற்றம் செய்வதைத் தவிர்த்தல்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கையின் நற்பெயரைப் பாதுகாக்கும் அதிகாரிகள் பொருளாதார அடிப்படையில் பாதுகாப்பாக இருக்க வேண்டும். இந்தத் தீர்மானமானது வெறும் ஊதிய உயர்வு மட்டுமல்ல, ஊழலுக்கு எதிரான போர் அறிவிப்பும் ஆகும். எனவே, இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவானது, சமன்செய்து சீர்தூக்கும் கோல்போல் அமைந்து, ஒருபாற் கோடாது செயற்பட வேண்டுமெனக் கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු බිමල් රත්නායක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.40]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රථමයෙන්ම ඉලංගෙයි තමිල් අරසු කච්චි පක්ෂය වෙනුවෙන් කථා කරපු ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ප්‍රධාන වශයෙන්ම අද දිනයේ විවාදය පැවැත්වෙන්නේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ස්වාධීනත්වය ශක්තිමත් කිරීම පිළිබඳවයි. ඇත්තටම "විපක්ෂය" කියලා කට්ටියක් මෙතැන පුටු පුරවාගෙන ඉන්නවා. දැන් නම් කවුරුවත් නැහැ. ඔවුන් අද මේ ගැන කිසිම වචනයක් කථා කරන්නේ නැහැ. ඒ ගරු මන්ත්‍රීතුමා පැහැදිලිවම කිව්වා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට දීලා තිබෙන මූල්‍ය නිදහස, මූල්‍ය ස්වාධීනත්වය, ඒ වාගේම කාර්ය මණ්ඩලය බඳවා ගැනීම වෙනුවෙන් ලබා දී තිබෙන ස්වෛරීත්වය සහ ස්වාධීනත්වය ගැන. ඒ දේවල් අගය කරමින් තමයි එතුමා කථා කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ගත්තොත් ඉලංගෙයි තමිල් අරසු කච්චි පක්ෂයේ ඒ මන්ත්‍රීතුමා වගේ අය යම් කිසි දෙයක් කථා කළත්, නැත්නම් විවේචනයක් කළත්, body language එකෙන්ම කියැවෙනවා සාධනීයව තමයි ඒක කරන්නේ කියලා. නමුත් හැම දෙයක්ම දුෂ්ට ආකාරයෙන් බලන, රට පැත්තෙන් කිසිම දෙයක් කල්පනා කරන්නේ නැති, ඩොනල්ඩ් ට්‍රම්ප් ගහන මිසයිලයක් කැරකැවිලා ඇවිල්ලා වැදිලා හෝ තමන්ට අහිමි වුණු බලය ලැබෙයි කියලා හිතන, අනාථ වෙච්ච විපක්ෂ කණ්ඩායමක් මෙතැන ඉන්නවා. රටක විපක්ෂයක් වුණත් කවදා හෝ ආණ්ඩුවක් ගන්න හිතාගෙන ඉන්නවා නම්, වැඩ කරන්නේ කොහොමද කියන එක පිළිබඳව මෙතුමන්ලාගෙන් ආදර්ශයක් ගන්න කියලා මම ඒ අයට කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ විවාදය තුළදී මට මුලින්ම කියන්න ඕනෑකම තිබෙනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම ගැන. මම කියන්නේ එම කොමිසම අතිවිශිෂ්ට ලෙස දූෂණ විරෝධී කාර්ය භාරයක් කරනවා කියන එකයි. ලංකාවේ කීර්ති නාමය - අපේ රටේ කීර්ති නාමය - වැඩි කරන්න, නැත්නම් ගොඩනඟන්න මෑත භාගයේ තනි ආයතනයක් ලෙස වැඩිම සේවයක් කරපු ආයතන කිහිපය අතරින් ඉහළින්ම තිබෙන ආයතනයක් තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව.

ලංකාව කියන්නේ අල්ලසින් තොර, දූෂණයෙන් තොර වුණු රටක් නොවෙයි. මහා පරිමාණයෙන් අල්ලස, දූෂණය ඇති කරපු බලවත්වම පුද්ගලයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කර ගැනීමට බැරි වීම අද ජාත්‍යන්තර ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. අපි esteemed class එක දිහා බලනකොට, ඒ esteemed class එකට ලෝකයේ නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ජාත්‍යන්තරයේ අනෙක් රටවල් ගත්තොත්, පුංචි දරුවන්ව විනාශ කරන මහා නපුරු, නරුම දේශපාලන කණ්ඩායම්වලට නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. නමුත්, අද අපේ රටේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පුළුවන් වෙලා තිබෙනවා, හිටපු ජනාධිපතිවරුන්ගේ සිට ඉතාම බලවත්, ධනවත් පුද්ගලයින්ට එරෙහිව ඉතාම විධිමත් ආකාරයෙන් නීතිය ක්‍රියාත්මක කරන්න. එම නිසා, Corruption Perceptions Index එකට අනුව ලංකාව ස්ථාන 14කින් ඉහළට ගියා නම්, ඒ 14න් 10ක් විතර අයිති වෙන්න ඕනෑකම තිබෙන තැනක් තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම කියන්නේ. එම නිසා, අපේ ආණ්ඩුවක් යටතේ ඒ තැනට ළඟා වීම ගැන අපි සතුටු වෙනවා. අපේ දේශපාලන ව්‍යාපාරය දූෂණ විරෝධී දේශපාලන ව්‍යාපාරයක්. අපි මේ රටේ මහජන ධනය ශත 5ක්වත් හොරකම් කරන දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි. එම නිසා අපේ අරමුණුවලට ගැළපෙන ඉතාම ඉහළ මට්ටමේ ශක්තිමත් භාවයක් තිබෙන ආයතනයක් බවට මෙම කොමිෂන් සභාව පත් කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා.

ඒ වාගේම මෙම පනතේ අරමුණු ගැන බොහෝ මන්ත්‍රීවරු කථා කළා. අද සිදු වන දේ තමයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට නිවැරදිව අත පය ලැබෙන එක. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම පිහිටුවා තිබුණා. සැලකිය යුතු ස්වෛරීත්වයක්, ස්වාධීනත්වයක් සහිතව තමයි එම කොමිසම පිහිටුවා තිබුණේ. නමුත්, එම කොමිසමට අවශ්‍ය නිලධාරින් බඳවා ගැනීමේදී, එම නිලධාරින්ගේ වැටුප් තල තීන්දු කිරීමේදී ඒ පිළිබඳව තීන්දු ගෙන කටයුතු කරන්න එම කොමිසමට හැකියාවක් තිබුණේ නැහැ.

උදාහරණයක් වශයෙන් ගත්තොත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට විමර්ශන කටයුතු සඳහා පොලිස් දෙපාර්තමේන්තුවෙන් තමයි පොලිස් නිලධාරින් ගන්න පුළුවන්කම තිබුණේ. එම පොලිස් නිලධාරින්ව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සතුව තබාගෙන විශේෂ පුහුණුව දීලා, අවංකභාවය බලන එක ගැන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට සහතිකයක් තිබුණේ නැහැ. නමුත් දැන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවටම අවශ්‍ය කරන අත, පය ඇතුළු ඔක්කෝම ලැබිලා තිබෙනවා. මෙම දූෂණ විරෝධී පනත යටතේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි තීරණය කිරීම සම්මත වුණාම, අදින් පස්සේ අපේ රටේ දූෂණ විරෝධී ජනතා අරගළය ඉතාම ඉහළ මට්ටමකට යයි කියලා මම හිතනවා.

මම හිතන විධියට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ලංකාවේ දිස්ත්‍රික්ක 25 පුරාම ශාඛා කාර්යාල දාන්න යනවා. උතුරු පළාතට ගියාම "දකුණේ ඉන්න හොරු විතරද අල්ලන්නේ, උතුරේ ඉන්න හොරු අල්ලන්නේ නැද්ද?" කියලා දුක් ගැනවිල්ලකුත් තිබෙන බව පෙනී ගියා. ඒ අය එහෙම අහනවා. ඒ නිසා "මේ පැත්තේ තමයි තල්මස්සු වාගේ අය ඉන්නේ. උතුරේ ඉන්නේ ඊට වඩා පොඩි scale එකේ මාළු. ඒ නිසා මෙගොල්ලන්ව අල්ලලා තමයි අරගොල්ලන්ව අල්ලන්න එන්න වෙන්නේ" කියලා අපි ඒ ගොල්ලන්ට කියලා තිබෙනවා. නමුත්, දැන් මේ කොන්දේසි සම්මත වුණාම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ලොකු මාළු වාගේම උතුරේ ඉන්න දූෂිත මාළුත් අල්ලන්න පුළුවන් කියලා මම හිතනවා.

[ගරු බිමල් රත්නායක මහතා]

ඒකත් එක්ක මේ කාරණයත් මම කියන්න කැමැතියි. අද ලෝකයේ ඇති වෙලා තිබෙන තත්ත්වය සහ එයින් අපට එල්ල වෙලා තිබෙන බලපෑම පිළිබඳව තමයි අද දිනයේදී විශාල වශයෙන් සාකච්ඡා වෙන්නේ. ඒ නිසා අද වැඩිපුරම කථා කරන්නේ QR code එක ගැන. මුලින්ම අපි කියන්න ඕනෑ දේ මෙයයි. මීට කලින් QR code එකක් ආවා. ඒක ආවේ සුද්දෙ නිසා. රාජපක්ෂලා, වික්‍රමසිංහලා, ප්‍රේමදාසලා, බණ්ඩාරනායකලා එකතු වෙලා සුද්ද කරපු නිසා තමයි ඒ QR code එක ආවේ. ඒ කාලයේ ලෝකය පුරාම ඕනෑතරම් තෙල් තිබුණා; තෙල් නැව් තිබුණා. තෙල් නැව් ගෙනැල්ලා කොළඹ වරායට ඈතින් නතර කරගෙන පවා තිබුණා. හැබැයි සුද්දෙ නිසා තෙල් ගන්න සල්ලි තිබුණේ නැහැ. අද QR code එක ඇවිල්ලා තිබෙන්නේ සුද්දෙ නිසා නොවෙයි, යුද්දෙ නිසා. ඒ නිසා දූෂණ විරෝධී පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි තීරණය කිරීම ගැන කථා කරන අද දවසේ මේක අතිශය වැදගත් වෙනවා.

අද ජනතාව බිය වෙලා තෙල් එකතු කරන්නේ ඇයි? කලින් රාජපක්ෂලාගේ, වික්‍රමසිංහලාගේ සුද්දෙ නිසා තමන්ගේ ජීවිතවලට වෙච්ච කරදරය ගැන ඔවුන්ට මහා විශාල බියක් තිබෙනවා. ඒ නිසා QR code එක නැති අය විතරක් නොවෙයි, QR code එක download කරගත්ත අය පවා පෝලිමේ ඉන්නවා. "ගිනි පෙනෙල්ලෙන් බැට කාපු මිනිහා කණාමැදිරි එළියටත් බයයි" කියලා කථාවක් තිබෙනවා නේ. ඒක තමයි අද වෙලා තිබෙන්නේ. නමුත් අපි වගකීමෙන් මේක කියනවා. මේ QR code එකේ ප්‍රශ්නය ගැන අපේ එරංග වීරරත්න නියෝජ්‍ය ඇමතිතුමා උදේ ඉතා පැහැදිලිව ප්‍රකාශ කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජපක්ෂලාගේ කාලයේ QR code එක ගේනකොට එකට පුරුදු වෙන්න දින 14ක් දුන්නා. ඒක පළමුවැනි කාරණය. ඉතාම විශේෂ දේ මොකක්ද? අපි අද QR code එක ගේන්නේ සියයට 5.2කින් වර්ධනය වෙන ආර්ථිකයක් තිබෙන රටක. රාජපක්ෂලා, රනිල්ලා QR code එක ගෙනාවේ සෘණ ආර්ථිකයක් තිබෙන රටක; ආර්ථික ක්‍රියාවලියක් නැති රටක. අද අපි QR code එක ගෙනැල්ලා තිබෙන්නේ සියයට පහයි දශම ගණනකින් ආර්ථිකය වර්ධනය වෙන රටක.

මේ දවස්වල වවුනියාවේ ගොයම් කපනවා. නමුත් එක harvester එකකවත් වැඩ නතර කරලා නැහැ. මන්නාරමේ ගොයම් කපනවා. එක harvester එකකවත් වැඩ නතර කරලා නැහැ. ඔක්කෝම වැඩ කරනවා. ඒ නිසා සුද්දෙ නිසා QR code එක ආපු එකයි, ජනතාවට විරුද්ධව කටයුතු කරන ලෝක නායකයෝ දෙදෙනෙකුගේ- තුන්දෙනෙකුගේ උන්මත්තක මනස නිසා ඇති වෙලා තිබෙන යුද්ධය නිසා QR code එක ආපු එකයි සහමුලින්ම දෙකක්. ඒ වාගේම අපි මේ තත්ත්වය කළමනාකරණය කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යුද්ධය නිසා ඍජු බලපෑමක් විදියට ආපු පළමුවැනි දේ තමයි, තෙල් ප්‍රශ්නයට කලින් ආපු ඉරාන නැවේ සිද්ධිය. අපේ කලාපීය බලවතුන් ඉන්නවා, අපිට ආසන්න කලාප දෙක, තුනක බලවතුන් ඉන්නවා කියලා අපි දන්නවා. හැබැයි ඒ ඔක්කෝම කලාපීය බලවතුන්ට වඩා ඒ ඉරාන නැව් දෙකේ නාවිකයන්වත් බේරාගෙන, අන්තර්ජාතික නීතියත් රැකගෙන, ඒ වාගේම ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ යුද වැදී තිබෙන කිසිම රටකට විශේෂ හානියක් හෝ විශේෂ වාසියක් කරන්නේ නැතුව ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුව කොතරම් හොඳින් ඒක කළමනාකරණය කළාද? තෙල් කළමනාකරණයට වඩා එය ඉතාම අමාරුයි. අපි දැනුත් තෙල් කළමනාකරණය කරලා තිබෙනවා. තෙල් කළමනාකරණයට වඩා එය ඉතාම අමාරු නිසා එය කළ යුත්තේ tricky ලෙසයි. කෙසේ වුවත් දැන් අපි එය කළමනාකරණය කරලා තිබෙනවා.

මේ කළමනාකරණයේ තිබෙන ප්‍රශ්නය මොකක්ද? අනෙක, ඒක කලින් දැනගන්න පුළුවන් විදියට තිබුණු දෙයක් නොවෙයි. ඉරානයට අයත් නැවක් කියන්නේ මේ වෙලාවේ අතිශය සංකීර්ණ කාරණයක්. මොකද අපි දන්නවා, ලෝකයේ බලවතුන් වශයෙන් හඳුන්වා ගන්නා කිසි රටක් ඒකට ඉදිරිපත් වුණේ නැහැ කියලා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ග්‍රහලෝකයේ තිබෙන ඉතාම කුඩා දූපතක නායකයෙක් තමයි ඒක කරන්න තීන්දු කළේ. ග්‍රහලෝකයේ විසිරිලා, පැතිරිලා තිබුණු ලොකු රටවල් එම තීන්දුව ගත්තේ නැහැ. අපි ගත්ත ඒ තීන්දුව නිසා අද දකුණු ආසියාවේ ගොඩක් රටවල ඇගැයීමට අප ලක් වෙලා තිබෙනවා. මීට සතියකට කලින් අන්තර්ජාතික මාධ්‍යවල ලංකාව කොතරම් ඇගැයීමට ලක් කළාද? ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුව ඉරාන නාවිකයින් සම්බන්ධව ජාත්‍යන්තර නීතිය ඇතුළේ මධ්‍යස්ථව සිටිමින් මානුෂීයව කටයුතු කිරීමේ දේශපාලන වාසිය අනාගතයේ වසර සිය ගණනකට පැතිරෙනවා කියා මා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, චීනයේත් ඒ විදියේම අත්දැකීමක් තිබෙනවා. දෙවැනි ලෝක යුද්ධය කාලයේ, 1940 ගණන්වල වාගේ ජපන් නාවික හමුදාවෙන් බ්‍රිතාන්‍ය යුද සිරකරුවන් ප්‍රමාණයක් නැවක අරගෙන ගියා. චීන ධීවරයින් මොකක්ද කළේ? ඒ, සාමාන්‍ය ධීවරයින් පිරිසක්. ජපන් ආක්‍රමණිකයන්ට විරුද්ධ වෙමින් එම ධීවරයින් අර ලොකු නැවට පහර දීලා ඒ යුද සිරකරුවන් බේරාගත්තා. ඒ අයගෙන් සමහරු මැරුණා. ඒක චීනය තුළ අති විශිෂ්ට ජාත්‍යන්තරවාදී කටයුත්තක් ලෙස හුවා දැක්වෙනවා. ඒ, චීනයේ ධීවරයෝ. එදා ඒ පුංචි මිනිස්සු බ්‍රිතාන්‍ය යුද සිරකරුවන් බේරාගත්තා. අද චීනයේ මාධ්‍යවල සාකච්ඡා වන දෙයක් තිබෙනවා. මොකක්ද? අන්න ඒ වාගේ තමයි ලංකාව ඉරානයේ නාවිකයෝ බේරාගත්තේ කියලා. ඒවාට තමයි "fixed deposits" කියන්නේ.

මේ යුද්ධයේ දුමාරය තව මාසයකින්, මාස දෙකකින් හෝ මාස පහකින් හෝ ඉවර වෙයි. ඉරාන නාවිකයින්ගේ කාරණය අපට කළමනාකරණය කරන්න පුළුවන් වුණා කියන්නේ, මේ ඇති වෙමින් තිබෙන තත්ත්වය කළමනාකරණය කිරීම අමාරු දෙයක් නොවෙයි කියලා අපි හිතනවා. සමහරු අහනවා, මේකට කල් තබා සූදානම් නොවුණේ ඇයි කියලා. ගරු කුමාර ජයකොඩි ඇමතිතුමා අද එයට ඉතා පැහැදිලි උත්තරයක් දුන්නා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුහුද හත්ගව්වක් තියාගෙන අපට අමුඩ ගහන්න බැහැ. අපි හැම වෙලාවේම කිව්වොත්, "අපට තෙල් හිඟයක් ඇති වනවා, තෙල් හිඟයක් ඇති වනවා" කියලා ලංකාවේ ආර්ථිකය දියුණු වෙන්නේ නැහැ. එතකොට ආයෝජකයින්ගේ, ව්‍යාපාරිකයින්ගේ සැලසුම් අවුල් වෙනවා. අපි වගකීමෙන් කියනවා, අපට විදුලිය කැපීමේ කිසිම අවශ්‍යතාවක් දැන් නැහැ කියලා. කිසිම අවශ්‍යතාවක් නැහැ. අපි සූදානම් වීමක් කරන්නේ. විදුලිය කැපීමට කිසිම අවශ්‍යතාවක් නැහැ. මුහුද හත්ගව්වක් තියලා අපට අමුඩ ගහන්න බැහැ. එම නිසා ආණ්ඩුව මොකක්ද කළේ? යුද්ධය 27වන දායින් පසුව වර්ධනය වුණු ප්‍රමාණයත් එක්ක ආණ්ඩුව ගත්ත තීන්දු ප්‍රමාණයක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තිබෙන්නේ තව විනාඩි දෙකක කාලයක් පමණයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට තව විනාඩි තුන, හතරක් ඉල්ලා ගන්න වෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්තුමා 2026 මාර්තු 17 මාධ්‍ය නිවේදනයක් නිකුත් කර තිබෙනවා. එම මාධ්‍ය නිවේදනය මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

රජය ඒකෙන් තමයි බදාදා දිනය අනිවාර්ය රජයේ නිවාඩු දිනයක් බවට පත් කළේ. ඒ වාගේම නැවත දැනුම් දෙන තුරු සියලු රාජ්‍ය උත්සව තාවකාලිකව අත්හිටුවා තිබෙනවා. පාර්ලිමේන්තුව ඇතුළුව රජයේ සියලු සංස්ථා, මණ්ඩල, අධිකාරිවලට එම නිවාඩුව අදාළ වනවා. ඒ සඳහා අවශ්‍ය උපදෙස් අපි ලබා දෙනවා. මෙම රජයේ නිවාඩුව අධිකරණ සඳහා ද වලංගු වනවා. ඒ වාගේම රජයේ, අර්ධ රාජ්‍ය, පෞද්ගලික සහ ජාත්‍යන්තර පාසල්වලට මෙන්ම පෙර පාසල්, පිරිවෙන් සහ අධ්‍යාපන ආයතන සියල්ලටම ඒ තීරණය අදාළ වනවා. ඒ වාගේම සියලුම ආකාරයේ උපකාරක පන්ති අත්හිටුවීම සඳහා උපකාරක පන්ති මෙහෙයවන ගුරුභවතුන්ගෙන් ඉල්ලීමක් ද සිදු කරනවා. පෞද්ගලික අංශයේ සේවක, සේවිකාවන් මාර්ගගත ක්‍රමයට සේවයේ යොදවා ගැනීම සඳහා ලංකා වාණිජ මණ්ඩලය සහ ලංකා සේවා සම්මේලනයෙන් ඉල්ලීමක් කර තිබෙනවා. එසේ වුවත්, සෞඛ්‍ය සේවා, බැංකු සේවා, රක්ෂණ, විදුලිය, ජලය, වරාය, රේගුව, ගුවන් සේවා, ගුවන් තොටුපළ, ආනයන සහ අපනයන සේවා යන අංශ සඳහා මෙම නිවාඩුව අදාළ නොවන අතර අනෙකුත් සේවාවල අවශ්‍යතාව සලකා බලා කටයුතු කරන්න අමාත්‍යාංශ ලේකම්වරුන්ට බලය පවරා තිබෙනවා.

ඊළඟට, ජනාධිපතිතුමාත් මීට අදාළව කැබිනට් සන්දේශයක් ඉදිරිපත් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ කැබිනට් මණ්ඩලයේදී කමිටු තුනක් සම්මත කරනු ලැබුවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට වැඩිපුර තව විනාඩි 04ක් ලැබී තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමාට බොහොම ස්තුතියි.

එකක්, බලශක්ති කමිටුව. ගරු විජිත හේරත් ඇමතිතුමාගේ මූලිකත්වයෙන්, ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා, ගරු කුමාර ජයකොඩි ඇමතිතුමා සහ රාජ්‍ය නිලධාරින් එහි සාමාජිකයින් ලෙස පත් කර තිබෙනවා. දෙවැනි කමිටුව, රාජ්‍ය සේවය ක්‍රමානුකූලව පවත්වාගෙන යාම සඳහා වන කමිටුව. එම කමිටුවේ සභාපති ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය අගමැතිතුමිය වන අතර, ගරු (මහාචාර්ය) චන්දන අබයරත්න ඇමතිතුමා ඇතුළු සාමාජිකයින් ඒ කමිටුවට පත් කර තිබෙනවා.

ඒ වාගේම අත්‍යවශ්‍ය භාණ්ඩ බෙදා හැරීම සහ අධීක්ෂණය සඳහාත් කමිටුවක් පත් කළා. ඒ කමිටුවේ සභාපති ධුරය මා දරනවා. එහි සාමාජිකයින් ලෙස ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා, ගරු ලාල් කාන්ත ඇමතිතුමා, ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා, ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා, Deputy Minister of Tourism රුවන් රණසිංහ මහතා ඉන්නවා. අපි මේ කමිටු දැනටමත් රැස් කරලා අවසන්. අපි මේවායෙන් තීන්දු අරගෙන තිබෙනවා. අපට කියන්න තිබෙන දේ තමයි, මෙතෙක් ලංකාව ඇතුළේ තිබුණු ප්‍රශ්න එකක්වත් අවුල් වෙන්න දුන්නේ නැහැ කියන එක. අපි බලයට එනකොට බිඳ වැටුණු ආර්ථිකයක් තිබුණා. අපි මේ වන විට ආර්ථික වර්ධන වේගය සියයට 5ට ගෙනැල්ලා තිබෙනවා. ඒක පිළිගන්නේ නැත්තේ විපක්ෂය විතරයි. ඒක අන්තර්ජාතික වශයෙන් සෑම ආයතනයක්ම පිළිගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ ආර්ථිකය හිතුවාටත් වඩා හොඳට perform කරනවා කියලා ක්‍රිස්ටලිනා ජෝර්ජීවා කියන IMF එකේ MD ඇවිල්ලා කිව්වාම විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, සුදු අය සාමාන්‍යයෙන් මෝඩයි කියලා. එහෙම කථාවක් කිව්වා. අන්න ඒ වාගේ දෙකේ පන්තියේ විධියට හිතන පිරිසක් හැර, අභ්‍යන්තර වශයෙන් ආපු හැම ප්‍රශ්නයක්ම අපි ඉතා හොඳ සැලසුමක් අනුව කළමනාකරණය කරලා තිබෙනවා. නමුත්, අපට බාහිර වශයෙන් ආපු ප්‍රශ්නය තමයි, "දිට්වා" සුළි කුණාටුව. ඒක අපට වළක්වන්න බැහැ. නමුත්, අපි ඉන් පසු ඇති වූ තත්ත්වය කළමනාකරණය කරලා තිබෙනවා. මේ ප්‍රශ්න ඔක්කෝම අස්සේ "දිට්වා" සුළි කුණාටුවෙන් විනාශ වුණු දේවල් නැවත හදන එක අපි නතර කරන්නේ නැහැ. "දිට්වා" සුළි කුණාටුවෙන් විනාශ වෙච්ච ඒවා අපි හදන්න පටන් අරගෙන තිබෙනවා. ජනාධිපතිතුමා කිව්වා, ඒවා ප්‍රමාද කරන්න එපා, ඒවා කරන්න, ඒවාට අවශ්‍ය තෙල් දෙන්නම් කියලා. අපි ඒක කරනවා. "දිට්වා" සුළි කුණාටුවෙන් පසු තත්ත්වය අපි කළමනාකරණය කරලා තිබෙනවා. ඒක external shock එකක්.

Iran-Israel war එකේදිත් මේගොල්ලන් හිතාගෙන හිටියා, මොනවා හරි වෙයි කියලා. නමුත් මොකුත් වුණේ නැහැ. මේ ප්‍රශ්නයේදීත් අපට ඔබතුමන්ලාට කියන්න තිබෙන්නේ මේකයි. අපි මේකත් ඉතාම හොඳින් කළමනාකරණය කරන්න පටන් අරගෙන තිබෙනවා. ඔබතුමන්ලා සති දෙකකට වැඩිය ගත්තා, QR code එක දෙන්න. QR code එක දෙන්න බැරි හේතු කියන්න දැන් වෙලාවක් නැහැ. මේ කිසිම දත්තයක් හරියට තිබුණේ නැහැ. ලංකාවේ කොච්චර වාහන සංඛ්‍යාවක් register කරලා තිබෙනවාද කියන එක සම්බන්ධව දත්ත නැහැ. අපි ඒ සම්බන්ධව සැලසුම් සකස් කරගෙන ගියා. හොර ටෙන්ඩර්වලින් පසුගිය කාලයේ ඒ ආයතන විනාශ කරලා තිබුණේ. මේ සමහර දේවල් ඉතාම වේගයෙන් ක්‍රියාත්මක කරන්න බැරිවීමට ඒකත් එක හේතුවක් වෙලා තිබෙනවා. නමුත්, වාහන සම්බන්ධව සම්පූර්ණ තොරතුරු ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයට අපි ලබා දුන්නා. අපි ඒ කටයුත්ත ඊයේ රාත්‍රි 1ට අවසන් කළා. ඔබතුමන්ලා බලන්න, බස්වල යන්න දැන් පෝලිම් තිබෙනවාද කියලා. එවැනි පෝලිම් නැහැ. යම් යම් ගැටලු ඇති, එක්කෙනෙකුට, දෙන්නෙකුට.

ඒ නිසා අපි ජනතාවට කියන්න කැමැතියි, අපි උපරිම වශයෙන් මේ දේවල් කළමනාකරණය කරගෙන යනවා කියලා. ඒ විධියට කළමනාකරණය කරගෙන ගිහිල්ලා දැනට ඇති වෙලා තිබෙන QR code සම්බන්ධ ප්‍රශ්නය තවත් උපරිම දවසක් ඇතුළත දී නැත්නම් හෙට රාත්‍රිය වන විට මූලික වශයෙන් එහි තිබෙන ගැටලු අවසන් කරන්න අපි බලාපොරොත්තු වනවා. නමුත් අපි කවුරුත් පිළිගන්නවා, මේක සාමාන්‍ය තත්ත්වයට එන්නේ නැහැ කියන එක. විශේෂ තත්ත්වයක් තිබෙනවා. යම් ගැටලු ඇති වෙනවා. නමුත් අපි හිතනවා, ඒක අපට අවම ගැටලු මත බේරාගන්න පුළුවන් කියලා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බිමල් රත්නායක මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ ගැන කියන්න කැමැතියි. අද Parliamentary Business Committee එක පැවැත්වුණා. එහිදී අපි යෝජනා කළා, බදාදා දිනය පාර්ලිමේන්තුවටත් නිවාඩු දිනයක් කරන්න කියලා. මොකද, පාර්ලිමේන්තුවට සේවක සේවිකාවන් එන්නේත් පොදු ප්‍රවාහන සේවා හරහා. අපි රටේම පොදු ප්‍රවාහනය සීමා කරන්න හදන්නේ තෙල් ඉතිරි කර ගන්නයි. නමුත්, විපක්ෂ නායකතුමා ඇතුළු මන්ත්‍රී කණ්ඩායමක් ඇවිල්ලා පාර්ලිමේන්තුව කල් තියන එක වැරදියි, පාර්ලිමේන්තුවේ කට වහන්න හදන්නේ කියලා විශාල කථාවක් පවත්වලා ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මිලියන 22ක ජනතාවගෙන් අපට අහන්න ක්‍රමයක් තිබෙනවා නම් මම මේ ගැන අහන්න කැමැතියි. මොකද, බදාදා දිනය මහජනතාවට නිවාඩු දිනයක් කර තිබෙනවා. පාර්ලිමේන්තුව අදත් තිබෙනවා. ආයෙත් බ්‍රහස්පතින්දාත්, සිකුරාදාත් තිබෙනවා. රාමසාන් උත්සවයට නිවාඩු ලැබුණත් පාර්ලිමේන්තුව වැහෙන්නේ නැහැ. මොකද, රාමසාන් පිළිබඳව National Shoora Council එක කියන්නේ බොහෝ විට බ්‍රහස්පතින්දා රෑ. එම නිසා අපට පාර්ලිමේන්තුව කල් තැබීමේ අවශ්‍යතාවක් නැහැ. සිකුරාදා පාර්ලිමේන්තුව පවත්වනවා. ඒ ගැන දැන දැනත් ඉතාම ළදරු ආකාරයෙන් එවැනි ප්‍රකාශ කරනවා. අපි බදාදා පාර්ලිමේන්තුව පවත්වන්නේ නැතිව නතර කරන්නේ ඇයි? තෙල් ඉතිරි කර ගන්න තිබෙන මාවතක් විධියට. මෙතැන වෙනත් කිසිම දෙයක් නැහැ. නමුත්, ඊට දැඩි විරුද්ධතාවක් ප්‍රකාශ කරලා විපක්ෂය නැඟිටලා ගියා. මම දන්නේ නැහැ, කොහොමද මේගොල්ලන් ඉස්සර රට පාලනය කළේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජනාධිපතිතුමා සිකුරාදා දිනයේ පාර්ලිමේන්තුව අමතනවා කියලා දැනුම් දීලා තිබෙනවා. අද රාත්‍රී 7.30ට එතුමාගේ මාධ්‍ය සාකච්ඡාවක් ජනතාවට පැවැත්වෙනවා. ඉතින් අපි සිකුරාදා දිනයේදී බලාපොරොත්තු වනවා, විපක්ෂයේ පක්ෂ නායකයින් එදින පාර්ලිමේන්තුවේ රැඳී සිටියොත් ගරු ජනාධිපතිතුමා සමඟ සාකච්ඡාවක් පවත්වන්න පුළුවන් වෙයි කියලා. මේ පිළිබඳව යම් කිසි විධියකට ජනාධිපතිතුමාගේ මට්ටමෙන් කථා බහ කරන්න, අදහස් දක්වන්න අවශ්‍ය නම් විපක්ෂයේ පක්ෂ නායකයින්ට සිකුරාදා දිනයේදී ඒ අවස්ථාව ලබා දෙන්න අපි බලාපොරොත්තු වනවා.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මෙයයි. රටේ දේශපාලන, සමාජ, ආර්ථික ක්ෂේත්‍රය කියන සියල්ලෙහි කළමනාකරණය බිඳ වට්ටලා තිබුණේ. අපි මාස දහඅටකින් ඒ තත්ත්වය ඉතා ඉහළ මට්ටමකට ගෙනැල්ලා තිබෙනවා. මේක සහමුලින්ම බාහිර බලපෑමක්; බාහිර සිදුවීමක්. අපි ඒ තත්ත්වය කළමනාකරණය කරන්න කටයුතු කරගෙන යනවා. ඒ නිසා අපි මේ රටේ ජනතාවට මේ කාරණය කියනවා. ජනතාවට අපි ගැන විශ්වාසයක් තිබෙනවා. ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුව මෙතෙක් තිබුණු හැම දෙයක්ම හරියට කළමනාකරණය කරලා තිබෙනවා. Social mediaවලට බොරු කියන, ඒ බොරු මතම රැඳෙන පිරිස හැර සාමාන්‍ය ජනතාව ඒක දන්නවා. ඒක නිසා තමයි සමහර මාධ්‍ය ගිහිල්ලා voice-cuts ගන්නකොට මිනිස්සු බැණලා එළවන්නේ. ඒවා කවදාවත් සිදු වුණු දේවල් නොවෙයි. ජනතාවට පීඩාවක් තිබෙන බව අපි දන්නවා. ඒක විශේෂ තත්ත්වයක්. මිනිස්සු දන්නවා, ඒක අපි ඇති කරපු දෙයක් නොවෙයි කියලා. අඩු ගණනේ තෙල් ටික ගබඩා කරන්නවත් facilities හදලා තිබුණේ නැහැ කියලා ජනාධිපතිතුමා ඉලක්කම් සහිතව මේ සභාවේදී කිව්වා. ඒක නිසා අපි ඉතාම වගකීමෙන් කියන්න කැමැතියි, මෙතෙක් අපි රට හරියට කළමනාකරණය කළ ආකාරයටම මේ ප්‍රශ්නයත් අපි කළමනාකරණය කරනවා කියන එක. මේ රටේ ජනතාවට අපි සහමුලින්ම පොරොන්දු වෙනවා, මේ තත්ත්වය උපරිම වශයෙන් කළමනාකරණය කරලා, ජනතාවට ඇති වන පීඩාව අවම වන විධියට මේ කටයුතු සැලසුම් කරලා හරියාකාරව කරගෙන යනවාය කියලා. QR Code එක ලැබෙයි. ඒක දැනටත් ලැබෙමින් තිබෙනවා. ඒක නිසා අපි ජනතාවගෙන් ඉල්ලා සිටිනවා, ඒ සම්බන්ධයෙන් අනවශ්‍ය කලබලයක් ඇති කර ගන්න එපා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වවුනියාවේ සිටින අපේ හිතවතෙක් කිව්වා, කොවිඩ් වසංගතය පැවති අවස්ථාවේදී ගෙන ගිය තෙල් තවම ගෙදර තිබෙනවාය කියලා. ඒ විධියට තෙල් ගොඩ ගහ ගන්න එපා. ආණ්ඩුවට දෙන්න පුළුවන් විධිමත් ක්‍රමයට තෙල් ලබා දෙන බව කියමින් මගේ කථාව මම අවසාන කරනවා. මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.01]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැක්කා, අපේ කට්ටිය ගොඩාක් දැන් කථා කරනවා, ඉරාන-ඊශ්‍රායලය ප්‍රශ්න නිසා අපට තෙල් නැහැ කියලා. මම එක කාරණයක් කියන්න කැමැතියි. අද වෙනකල් මට තෙල් ලැබිලා නැහැ. හැබැයි, ආණ්ඩුව ලජ්ජාවට පත් කරන්න නොවෙයි මම මේ කාරණය කියන්නේ. සාමාන්‍යයෙන් උතුරේ ඉඳන් කටුනායක දක්වා කවුරු හරි සංචාරකයන් අරගෙන එනවා නම්, ඒ කට්ටියට අනුරාධපුරයේ නිදා ගන්න වෙනවා, තෙල් ලීටර් 15ම ඉවර වන නිසා. ඊට පස්සේ තව සතියක් ඉන්න වෙනවා, ඒ අය අනුරාධපුරයේ ඉඳන් කටුනායකට ගෙනෙන්න. ඊට පස්සේ තව සතියක් කටුනායක නිදා ගන්න වෙනවා. කටුනායකින් ගිහිල්ලා තව සතියක් වවුනියාවේ නිදා ගන්න වෙනවා. තව ලීටර් 15ක් ගහගෙන වවුනියාවෙන් යාපනයට යන්න ඕනෑ. ඒ විධියට උතුරේ ඉඳන් දකුණට කිලෝමීටර් 400ක් යන්න මාසයක් ගත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කලින් කථා කළේ මට තෙල් ගහ ගන්න නොවෙයි. මම ළඟ BYD Sealion 6 එකක් තිබෙනවා. මට ඒක charge කරලා දුවන්න පුළුවන්. සමහර මෝඩ මහත්වරුන්ට ඒක තේරෙන්නේ නැහැ. මම කථා කළේ සංචාරකයන් අරගෙන හයර් යන අහිංසක මිනිස්සු ගැන. එහෙම නැතුව මම ගැන කථා කළේ නැහැ. මට ඩයස්පෝරා එකෙන් ඕනෑ තරම් වාහන ගන්න පුළුවන්. මම BYD Sealion 7 හෙට අරගෙන පෙන්වන්නම්. කොටි ඩයස්පෝරාව මට ඒවා අරගෙන දෙනවා. සමහර මෝඩ අයට මම මේ කාරණය කියන්න කැමැතියි. මම ළඟ දැන් තිබෙන්නේ BYD Sealion 6 එකක්. ඒ නිසා මට ඔය බම්බු තෙල් ඕනෑ නැහැ. මම කථා කළේ ඡන්දය දෙන්න ආපු අහිංසක ත්‍රීවීලර්කරුවන් ගැන. පාරවල්වල යනකොට මිනිස්සු අපේ දිහා බලනවා. අපේ මිනිස්සු දීපු සල්ලිවලින් ගත්ත BYD එකෙන් තමයි අපි එන්නේ. අපේ මන්ත්‍රීතුමන්ලා ගොඩාක් අය කිව්වා, බස්වල යනවා, train එකේ යනවා කියලා. මට ඒ ගැන දුකයි. මම බලන්න කැමතියි, මාසයක් යනකොට එක

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

බස්වල නැත්නම් trainsවල යනවා. එහෙම වුණොත් මම පයින් යනවා, උතුරේ ඉඳන් දකුණට; මම පයින් යනවා, යාපනයේ ඉඳන්. මම ඒකයි කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අයට කියපු දේවල් මතක නැහැ. සාමාන්‍යයෙන් නිකම් බලන්න කෝ, අපට legislative body එකක්, laws හදන තැනක් තිබෙනවා. ඒක ක්‍රියාත්මක කරන්න courts තිබෙනවා. සාමාන්‍යයෙන් judge කෙනෙක් කියන්නේ, LLB, LLM කියන ඔක්කොම ටික ඉගෙන ගෙන ඉන්න පුද්ගලයෙක්. එහෙම කෙනෙකුට තමයි judge කියන්නේ. Lawyersලාගෙන් සමහරු LL.M කරමින් ඉන්නවා. හැබැයි, මේ වාගේ වංචා, දූෂණ සම්බන්ධ නඩු උසාවියට අරගෙන යන්නේ කවුද? O/L විභාගයවත් සමත් නැති court එකට එන sergeant කෙනෙක්. ඒ නිලධාරියා තමයි ඒ ඔක්කෝම ටික උසාවියට දාන්නේ. උසාවියට නඩුව ගෙනෙන ඒ නිලධාරියාට තිබෙන සුදුසුකම මොකක්ද? ඔහුට තිබෙන සුදුසුකම තමයි, O/L නැත්නම් A/L. ඒ තත්ත්වය තමයි අපේ රටේ තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවට එනකොට මමත් විශ්වාස කළා, යම්කිසි ප්‍රමාණයකට හරි මේගොල්ලන් මේවා වෙනස් කරයි කියලා. තෙල් ලීටර් 15ක් ඉල්ලුවේ මට නොවෙයි. තවම හෝදන සමහර මහත්වරුන්ට -

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියන්න තිබෙන්නේ, මට එහෙම තෙල් ඕනෑ නැහැ කියන එකයි. මම කොවිඩ් වසංගතය පැවති කාලයේදීවත් තෙල් ගැහුවේ නැහැ, hospital එකේ quartersවලට වෙලා නිකම් හිටියා. අදත් මම ගෙදර නිකම් ඉන්නේ. මට BYD එකක් තිබෙනවා. මට තෙල් ඕනෑ නැහැ. මම අහන්නේ සාමාන්‍යයෙන් ගොවීන්ට මාසයකට තෙල් ලීටර් 40ක් ඇති වෙන්නේ කොහොමද කියන එකයි. ඒවා ගැන කථා කරන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තව කාරණයක් මම කියන්න කැමතියි.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඇවිල්ලා විනාඩි 14ක් කථා කළා. ඊට පස්සේ තව විනාඩි 4කුත් දුන්නා. මේ වීඩියෝ එක බලාගෙන ඉන්න මේ රටේ මිනිස්සුන්ට විනාඩි 18ක් ලොරි ටෝක් එකක් දීලා යන්න පුළුවන් නම්, ඒක තමයි ශ්‍රී ලංකාවට "හුණ්ඩුව" කියන්නේ. ඔයගොල්ලන් දන්නවා ඇති, "හුණ්ඩුව" කියලා democratic country එකක් තිබෙනවාය කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඇවිල්ලා විනාඩි 18ක් වංචා දූෂණ ගැන, කථා කරලා යන්න පුළුවන් නම් මම ඒ ගැන කනගාටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ doctor job එකත් අත්හැරලා මේ පාර්ලිමේන්තුවට ආපු එක ගැන මම කනගාටු වෙනවා.

මම තව දෙයක් කියන්න කැමැතියි. අද වෙනකොට මම නඩු 6ක් දමා තිබෙනවා, වංචා දූෂණවලට විරුද්ධව. මට ජනාධිපතිතුමාත් එක දවසක් නැඟිටලා කිව්වා, ඔව්, එතුමා කියන එක හරි, මම නම් පාර්ලිමේන්තුවේ බොරු කියන්නේ, එළියට ගිහිල්ලා ඇත්ත කියන්නේ කියලා. එක නඩුවක් මේගොල්ලන් විමර්ශනය කළාද කියලා අහන්න කෝ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. Tellippalai Hospital එකේ රුපියල් මිලියන 30ක්, Chavakachcheri Hospital එකේ රුපියල් මිලියන 17ක් ගැන මම පැමිණිලි කළා. Documents පවා මම ගෙනැත් දුන්නා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

doctor කෙනෙක් ඇයගේ පෞද්ගලික bank accountsවල සල්ලි තියාගෙන ඇවිල්ලා. ඊට පස්සේ ඒ bank accounts පවා අරගෙන DCC meeting එකකින් ඒවා හොයාගෙන ඇවිල්ලා, වංචා, දූෂණ පිළිබඳ කමිටුවකින් පැමිණිල්ලක් දැම්මා. අද වෙනකල් එක කමිටුවක්,- දැන් මේගොල්ලන් ඩීල් එකක් ගහලා ඉවරයි. මම එකක් කියන්නද? අර containers 323 ගැන මම කථාවක් කියන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට තව විනාඩියක් තිබෙනවාය කියා මම දන්නවා.

මේගොල්ලන් හිතුවා, තව අවුරුදු 10ක්, 15ක් ඉන්න පුළුවන් කියලා. හැබැයි, මේගොල්ලන්ට හොඳටම වැඩේ තේරුණා, ඉන්න බැහැ කියලා. ඉන්න බැහැ, කොහොමත් මිනිස්සු එළවනවා නැත්නම් දුවන්න වෙනවා. ඒ නිසා පුළුවන් තරම් ගහලා පොකට් එකට දමා ගන්නවා; ඔය ගල් අඟුරු, අර containers 323, දැන් තෙල්වලට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා ගැන හිතලා බලන්න කෝ. ඔබතුමන්ලාත් ඒ පිරිස ඇතුළට නේ වැටෙන්නේ. ඒ නිසා අපට ඒ ගැන බොහොම දුකයි. ඒගොල්ලන්ට ඕනෑ නැහැ කිව්වා, pension එකක්. Pension එක ඕනෑ නැහැ කියපු එකට හේතුව මේගොල්ලන් ඇති වෙන්න ගල් අඟුරුවල,- දැන් අපේ President ඇවිල්ලා මොනවා හරි කථා කළාද, ගල් අඟුරු ගැන? ඒ නිසා මම කියන්න කැමැතියි, මේ මිනිස්සුම ඇවිල්ලා මේ වාගේ පනතක් දානවා කියන්නේ, ලෝකය මේ රට හුණ්ඩුවක් කියලා හිනා වෙන්න පුළුවන් කියන එක. අපේ රට හුණ්ඩුවක් තමයි.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.07]

**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා**
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்று நாங்கள் முக்கியமானதொரு விவாதத்தில் கலந்து கொண்டு இருக்கின்றோம். அதாவது, இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவின் கைகளைப் பலப்படுத்தும் வகையில் கொண்டுவரப்பட்டுள்ள தீர்மானமே இன்று விவாதத்துக்கு எடுத்துக்கொள்ளப்பட்டு இருக்கின்றது.

ஏன் இந்த விவாதம் தேவை? எமது நாடு என்ன நிலையில் இருக்கின்றது? கடந்த காலத்தில் எமது நாடு வங்குரோத்து நிலைக்குச் சென்றதற்கு மிக முக்கிய காரணமாக அமைந்தது ஊழல் மோசடிதான். இலங்கை போன்ற நாடுகளிலுள்ள பாரிய குறைபாடு என்னவென்றால், ஊழல் மற்றும் மோசடிகளுக்கு எதிராக நடவடிக்கை எடுப்பதற்குப் பொருத்தமான சட்ட ஒழுங்குகள் காணப்படாமைதான். இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு இருந்தாலும், அதற்குத் தேவையான வசதி வாய்ப்புகள் செய்து கொடுக்கப்படவில்லை. இன்று கொண்டு வரப்பட்டுள்ள தீர்மானத்தின்மூலம் இந்த ஆணைக்குழுவுக்குத் தேவையான உத்தியோகத்தர்கள் - 971 உத்தியோகத்தர்கள் - பெற்றுக்கொடுக்கப்படும். அத்துடன், அவர்களுடைய சம்பளப் பிரச்சினையும் தீருமென நான் நினைக்கின்றேன்.

எமது நாடு அழகான, நிறைய வளங்களைக் கொண்ட நாடாக இருந்தபோதிலும், ஒருசில வருடங்களுக்கு முன்னர் வங்குரோத்து நிலையை அடைந்ததை நாம் கண்டோம். எமது நாட்டில் இருந்த அரசியல் தலைவர்கள் பெரும் கள்வர்களாக இருந்ததுடன், அவர்கள் களவு, பொய் ஊடாகத்தான் நாட்டை ஆண்டார்கள். அவர்களுக்கு உதவி செய்யக்கூடிய சில அதிகாரிகளையும் நாங்கள் கண்டோம். இதனால் உண்மையிலேயே நாட்டை நேசிக்கக்கூடிய 90 சதவீதமான அதிகாரிகளுக்கு, தமது சேவையை நாட்டுக்கு வழங்க முடியாத சூழல் காணப்பட்டது. இன்று எமது நாட்டில் அரசாங்கமும் சரி, அரச அதிகாரிகளும் சரி, மக்களும் சரி, ஒரே குறிக்கோளோடு - நோக்கத்தோடு - செயற்படக்கூடிய ஓர் அழகான சூழல் காணப்படுகின்றது. இன்று அரச அதிகாரிகள் மிகுந்த கௌரவத்துடன் தமது சேவையை ஆற்றிக்கொண்டு இருக்கக்கூடிய சூழ்நிலையில்தான் இந்தத் தீர்மானம் கொண்டு வரப்படுகின்றது.

நாங்கள் மக்களுடைய அபிலாஷைகளை வென்றெடுக்கக் கூடிய ஓர் அரசாங்கத்தையே நிறுவியுள்ளோம். இன்று இந்த அரசாங்கத்தோடு சேர்ந்து அரச அதிகாரிகளும் மக்களும் செயற்படுகின்றார்கள். எனினும், மக்களது அபிலாஷைகளை வென்றெடுக்கக்கூடிய எதிர்க்கட்சியை நாங்கள் காணவில்லை. ஆட்சிக்கு வந்து குறுகிய காலப்பகுதிக்குள் - ஒன்றரை வருடங்களுக்குள் - NPP அரசாங்கம் பல சவால்களை எதிர்கொண்டுள்ளது. அதில் இயற்கை அழிவுகளும் உள்ளடங்குகின்றன. குறிப்பாக, 'தித்வா' பேரழிவுக்கு நாங்கள் முகங்கொடுத்தோம். அதன்போது நாங்கள் மக்களின் பக்கம் நின்று, அவர்களுக்கு ஆற்றவேண்டிய அதிகபட்சமான சேவையை ஆற்றினோம். அதனை மக்களும் ஏற்றுக்கொண்டு இருக்கிறார்கள். கஷ்டமான சூழ்நிலையில், மக்களுடன் சேர்ந்து அவர்களுடைய தேவைகளை நிறைவேற்றக்கூடிய வாய்ப்பு எமக்குக் கிடைத்தது.

ஒரு கட்டத்தில் மோசமான சூழ்நிலை காரணமாக பர்மா நாட்டு மக்கள் எங்களுடைய நாட்டுக்கு அகதிகளாக வந்தார்கள். எமது நாட்டிலுள்ள எதிர்க்கட்சியைச் சேர்ந்த அரசியல்வாதிகள் அதையும் அரசியலாக்கி, NPP அரசாங்கம் அவர்களை சரியாகப் பராமரிக்கவில்லை என்று கூறினார்கள். ஆனால், அவர்களைக் கண்ணியமாகப் பராமரித்து, அவர்களுக்குக் கொடுக்கவேண்டிய அனைத்து வசதிகளையும் நாங்கள் செய்து கொடுத்தோம். அதேபோல், இஸ்ரேல் - பலஸ்தீன் பிரச்சினையையும் அரசியலாக்கினார்கள். அதனூடாக அரசாங்கத் தரப்புக்கு எதிரான வாதங்களைக் கொண்டுவர முயற்சித்தார்கள். எனினும், அந்த முயற்சி தோல்வியடைந்தது. இன்று மிகவும் மனிதநேயம் கொண்ட ஆட்சியாக NPP அரசாங்கத்தின் ஆட்சியை மக்கள் ஏற்றுக்கொண்டுள்ளார்கள். எமது நாடு சிறியதொரு நாடாக இருந்தாலும், தனது இறையாண்மையைப் பாதுகாத்துக் கொண்டு, சர்வதேச சட்டதிட்டங்களுக்கு அமைவாக, மனித நேயத்துடன் செயற்பட்டு, தாக்குதலுக்கு உள்ளான ஈரான் நாட்டு கப்பலில் இருந்த கடற்படையினரைக் காப்பாற்றி, அவர்களுக்கு மனிதாபிமான உதவிகளைச் செய்தது.

மத்திய கிழக்குப் பிராந்தியத்தில் போர் நடைபெற்றாலும், அதன் பாதிப்பை இலங்கை உட்பட உலகிலுள்ள அனைத்து நாடுகளும் உணர்ந்திருக்கின்றன. NPP அரசாங்கமானது, நாட்டை வங்குரோத்து நிலையிலிருந்து மீட்டுவருகின்ற வேளையில் இந்த யுத்த சூழ்நிலைக்கும் முகங்கொடுத்து, நாட்டு மக்களுடைய தேவைகளை மிகக் கவனமாக நிறைவேற்றி வருகின்றது. நாங்கள் சேர்ந்து செயற்படக்கூடிய பல சந்தர்ப்பங்கள் இருந்தன. அப்பொழுது, மக்களும் அரச அதிகாரிகளும் எங்களோடு சேர்ந்து செயற்பட்டார்கள். எனினும், மக்களால் தெரிவு செய்யப்பட்ட ஒரு குழுவினரின் நோக்கம் மாத்திரம் வேறாக இருந்தது. எவ்வாறு தப்பிப் பிழைப்பது? தமது அரசியல் இருப்பை எவ்வாறு தக்கவைத்துக்கொள்வது? என்ற பிரச்சினை மாத்திரம்தான் அவர்களுக்கு இருந்தது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த 18 மாத காலப் பகுதிக்குள் நாங்கள் பல்வேறுபட்ட பிரச்சினைகளுக்கு முகங்கொடுத்தோம். இது உண்மை யிலேயே சவாலாக இருந்தாலும், அனைத்து சவால்களிலும் NPP அரசாங்கம் வெற்றி பெற்றுள்ளது. எங்களுடைய நோக்கம் தூய்மையாக உள்ளது. அதன் அடிப்படையிலேயே நாங்கள் எங்களுடைய செயற்பாடுகளை முன்னெடுக்கின்றோம்.

ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කියනවා, ඉරාන නෞකාවේ සෙබළුන්ව බේරා ගන්න මානුෂීය උදව් කරනකොට ආණ්ඩුව ලංකාවේ මුදල් නාස්ති කරනවා, විනාශ කරනවා, අපරාධයක් කරනවා කියලා. ලංකාවේ මුදල් අපරාදේ නාස්ති කරනවා කියලා එක පැත්තකින් කියනවා. අනෙක් පැත්තෙන් ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඉතාම සංවේදීව, Iranian Ambassador එක්ක ඉඳගෙන කියනවා, ඒ නාවික සෙබළුන්ට උදව් කරන්න ඕනෑ කියලා. මෙතැනදී අපට ප්‍රශ්නයක් මතු වෙනවා. ඒ තමයි, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ මතය ද, සජබයේ මතය කියන එක. සජිත් ප්‍රේමදාස ගරු විපක්ෂ නායකතුමාගේ මතයත් ඒකද කියලා අපි අහනවා. එහෙමත් නැත්නම් ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාගේ මතය ද සජබයේ මතය කියලා අපිට ලොකු සැකයක් තිබෙනවා. ඒ නිසා අපේ ගරු විපක්ෂ නායකතුමා අපට ප්‍රකාශ කරන්න ඕනෑ, එතුමා මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් එක්ක හිට ගන්නවා ද, නැත්නම් සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා එක්ක හිට ගන්නවා ද කියලා. තවත් මන්ත්‍රීවරු පිරිසක් වෙනත් රටවලට ගිහිල්ලා මෙන්න මේ වාගේ කථා කියලා අපේ ලංකාව කොටවන්න හදනවා. අපි කවුරුත් මේ දේවල් තේරුම් ගන්න ඕනෑ.

අපි මේ රටේ පරිවර්තනයක් හරහා බලයට ආපු පිරිසක්. අපි පළමු දවසේ සිටම ආණ්ඩුවක් හැටියට නිවැරදි තීන්දු, තීරණ ගනිමින් මෙතෙක් කාලයක් තිබුණු යම් යම් ප්‍රතිපත්ති වෙනස් කළා. මේ වෙනකොට අපි මැතිවරණ පොරොන්දු 30කින්, පොරොන්දු 20ක් ඉෂ්ට කර තිබෙනවා. ඒ වාගේම, අපි වුණු තව පොරොන්දුවක් සම්බන්ධයෙන් තමයි අද දවසේදී මේ කථා කරන්නේ. මේක අපේ රටට විශේෂයි. මේ දූෂණය, වංචාව අපි නැති කරන්න ඕනෑ. මහ බැංකු හොරකම කරපු කෙනා අද ඇවිල්ලා කියනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප් අහෝසි කරන්න ඕනෑ කියලා. ඒ වාගේම අමු අමුවේ සීනි බදු වංචාව සිදු කරපු අය අද දූෂණයට, වංචාවට එරෙහිව කථා කරනවා. අද පාර්ලිමේන්තුව තුළ ඒ අය නිකම් විකාරයක් වෙලා. හරියට අපි විපක්ෂයේ, ඒ කට්ටිය ආණ්ඩු පක්ෂයේ වාගේ අපෙන් ප්‍රශ්න කරනවා. අද අපේ රටේ ජනතාවට ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ගැන ඉතාම විශ්වාසයි. අපි මේ රටේ ඒ ජනතාවගේ අභිලාෂයන් දිනාගෙන තමයි නතර වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ස්තුතියි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මගේ නම කිහිප වතාවක්ම සඳහන් කළා. ඒ නිසා මට පොඩි වෙලාවක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කෙටියෙන් පැහැදිලි කිරීම කරන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,- *[බාධා කිරීමක්]* ඔබතුමා දන්නවා ඒක. ඔබතුමා දැන් වෙනස් වෙලා ඉන්නේ. ඔබතුමා දැන් ඇමෙරිකාවත් එක්ක ඉන්නේ. ඒකයි තිබෙන ප්‍රශ්නය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යුද්ධය ඇති වුණාම විපක්ෂ නායකතුමා මේ යුද්ධය හෙළා දැකලා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කළා; "අපි මේ යුද්ධයට විරුද්ධයි, මෙවැනි යුද්ධයක් ඇති කරමින් මේ ආකාරයට පහර දීම ගැන විරුද්ධයි" කියන ප්‍රකාශය එතුමා සිදු කළා. ඒක තමයි සමඟි ජන බලවේගයේ මතය. ඒ මතයේ තමයි අපිත් ඉන්නේ. මේ යුද්ධයේදී කළ පහරදීම් නිසා ඉරානයේ කුඩා දරුවන් 165දෙනෙක් විතර එක සැරේ මිය ගියා. නමුත්, එතුමන්ලාගේ ආණ්ඩුවේ කිසිම කෙනෙක් ඒක හෙළා දැක්කේ නැහැ. ඉරානයේ උත්තරීතර නායකයාව ඝාතනය කළා. ඒ, රටක රාජ්‍ය නායකයෙක්. අද වෙනකම් ඒක හෙළා දැක්කේ නැහැ. අද වෙනකම් විදේශ අමාත්‍යාංශයේ website එකකවත් ඒක හෙළා දැකලා නැහැ. ඒ නිසා එතුමා ගිහිල්ලා එතුමාගේ ජනාධිපතිතුමාගෙන් අහන්න ඕනෑ, මොකක්ද එතුමන්ලාගේ ස්ථාවරය කියලා. මේක හෙළා දකිනවා ද, නැද්ද? ඒ ස්ථාවරය කියන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.16]

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි තීරණය කිරීම සඳහා වූ යෝජනාව ගැන අපි අද පාර්ලිමේන්තුවේ විවාද කරනවා. මෙවැනි භාරදූර කර්තව්‍යයක් ඉෂ්ට කරන ඒ සේවකයින්ට පාරිතෝෂික, එහෙමත් නැත්නම් වැටුප්, විශ්‍රාම වැටුප් ලබා දීම සම්බන්ධයෙන් අපට විරුද්ධ වෙන්න හැකියාවක් නැහැ. ඒවා ලබා දෙන්න ඕනෑ. ඒ දේවල් තව තවත් ලබා දෙන්න ඕනෑ. ඒක ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ කියන එකත් මම කියනවා. මොකද, එය ඉතාම භාරදූර කර්තව්‍යයක් කරන තැනක්. හැබැයි, කොමසාරිස්වරුන්ගේ සහ අධ්‍යක්ෂ ජනරාල්තුමන්ගේ වැටුප මේ පාර්ලිමේන්තුවෙන් හදලා දෙන්න ඕනෑ. එතුමා කියනවා, ඒකට තවම මුදල් අමාත්‍යාංශයවත්, ආණ්ඩුවවත් අත තියලාවත් නැහැ කියලා. ඒවාත් වැඩි කරලා, ඒවාත් අභියාචනාධිකරණයේ සභාපතිතුමාගේ සහ අනෙකුත් විනිශ්චයකාරතුමන්ලාගේ වැටුප් සමඟ සමාන කරලා දෙන්න. ඒක අපට ප්‍රශ්නයක් නැහැ. ඒවා වැඩිපුර ලබා දෙන්න ඕනෑ. විශ්‍රාම වැටුපත් දෙන්න. ඒවා කපා දමන්න එපා; ඒ මිනිසුන්ට ඒ දේවල් ලබා දෙන්න. අනේ! අපිට මේ දේවල් කළාට කමක් නැහැ. ඒ අයට ඒ හැමදේම ලබා දෙන්න. නැත්නම් මේක කරන්න හම්බ වෙන්නේ නැහැ කියන මතයේ අපි ඉන්නවා. හැබැයි, මේ ඔක්කෝම ලබා දීලා ආණ්ඩුව රකින්න වාගේ වැඩ කරනවා ද, විපක්ෂයට ගහන්න වැඩ කරනවා ද කියන ප්‍රශ්නය තමයි අපට තිබෙන්නේ.

සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා කියනවා මම දැක්කා, අපේ කාලයේදී පඹයා වෙලේ හිටවලා තිබ්බා තිබ්බාමයි, වෙන වැඩක් කළේ නැහැ කියලා. පඹයා හිටවලා තියපු කාලයේ තමයි එතුමන්ලාත් අරලියගහ මන්දිරයේ ඔෆිස් හදාගෙන හිටියේ. ඒ කාලයේ දාපු නඩුවලින් භාගයක් තමයි ඔය කිව්වේ. වැඩි හරියක් කිව්වේ ඒ දේවල්. ඒවා මතක නැහැ වාගේ, මැරිලා ඉපැදිලා වාගේ දැන් කථා කරනවා. පඹයා වෙනයි; දැන් අද බිල්ලෙක් මවලා තිබෙන්නේ. අද විපක්ෂයේ මන්ත්‍රීවරු සියලු දෙනාටම බිල්ලෙක් මවලා තිබෙනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව කියලා. හැබැයි, වැඩ කෙරෙන්නේ ඔය විදියටද කියලා අපි අහනවා. අද කන්ටේනර් 323 සිද්ධියේ ඉඳලා මේ බලශක්ති අමාත්‍යවරයාට අදාළ කාරණය දක්වාම මොකක්ද කෙරෙන්නේ? දැන් සාමාන්‍යයෙන් වැඩ කෙරෙන්නේ කොහොමද කියලා බලා ගන්න මම තවත් උදාහරණයක් කියන්නම්. මේ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්තුමා පැමිණිල්ලක් කළා. දැන් මාස දෙකකට කිට්ටු වෙන්න එනවා. ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් කරලා තිබෙනවාද? මොකක්ද අරගෙන තිබෙන ක්‍රියාමාර්ගය, එතුමාගේ වැඩ තහනම් කිරීම සම්බන්ධයෙන් සහ එතුමා කරපු පැමිණිල්ල සම්බන්ධයෙන්? Statement එකක් අරගෙන තිබෙනවාද? ඒ නිසයි අප මේ ගැන අහන්නේ. හැබැයි, එතුමාට විරුද්ධව කථානායකතුමා දාපු පැමිණිල්ල නම් විමර්ශනය කරනවා කියලා අපට ආරංචියක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි, නියෝජ්‍ය මහ ලේකම්තුමා දාපු පැමිණිල්ල සම්බන්ධයෙන් සාක්ෂියට බලපෑම් කරනවා කියලා කථානායකතුමාගේ ලේකම්තුමා සම්බන්ධයෙන් දාපු පැමිණිල්ලට මොකද වුණේ? ඒකටත් මොකුත් වෙලා නැහැ.

මේ කොමිෂන් සභාවේ නිලධාරින්ගේ වැටුප් වැඩි කරන එක ගැන අපට ප්‍රශ්නයක් නැහැ. වැඩ කරන මිනිස්සු නම්, මේ වාගේ දෙගුණයක් දෙන්න. හැබැයි, ඒකෙන් මොකක්ද කෙරෙන්නේ? ඒකෙන් ආණ්ඩුවේ වුවමනා ඉෂ්ට කරනවා නම්, අපට ඒ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. විපක්ෂය බය

[ගරු නිහිඳු චිත්‍රාල් ප්‍රනාන්දු මහතා]

කරන්න විතරක් නම් එය තිබෙන්නේ, ඒ සම්බන්ධයෙන් අපට ප්‍රශ්නයක් තිබෙනවා කියන එක මම කියන්න කැමැතියි. ඒ නිසා එය ස්වාධීනද, අපක්ෂපාතීද යන්න සම්බන්ධයෙන් අපට ගැටලු තිබෙනවා. මොකද, අර කන්ටේනර් 323 සිදුවීම සම්බන්ධයෙන් ගත්තොත්, මම එක පැමිණිලිකාරයෙක්. ඒ සම්බන්ධයෙන් අද වනකල් කට උත්තර අරගෙන නැහැ. අප ඒ ගැන කථා කළාම අපව බය කරන්න හෙට phone එකෙන් call එකක් දීලා නිකම් කථා කරලා කියයි, එන්න කියලා. ඔය වාගේ තමයි වැඩ කෙරෙන්නේ. මම ඒ කාරණයත් මතක් කරන්න කැමැතියි.

දැන්, ඊළඟ කාරණය. මේ ආණ්ඩුවේ බලශක්ති අමාත්‍යවරයා පිළිබඳව මම දිගින් දිගටම කියන්න අවශ්‍ය නැහැ. අද දවසේම එතුමා වාගේ ප්‍රහාරවලට ලක් වුණා. මම දන්නේ නැහැ, එතුමා තවමත් එම තනතුරේ තියාගෙන ඉන්න හේතුව මොකක්ද කියලා. අදත් එතුමා නොයෙකුත් කථා අහ ගත්තා. එතුමා බොහොම අපහසුතාවෙන් ඉන්න බවත් අපි දැක්කා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අර හදිසි මිල දී ගැනීම සම්බන්ධයෙන් අද වනකොට කථා වෙනවා. හදිසි මිල දී ගැනීම හා සම්බන්ධ ටෙන්ඩර් එකට bid කළාම, කලින් දූෂණයට සම්බන්ධ වෙච්ච Trident Chemphar සමාගමත් ඒකට bid කරලා ගණනක් සඳහන් කරලා එවා තිබුණු බව අපි දැක්කා. ඒ තමයි, ඩොලර් 121. ඒ ඩොලර් 121ට පසුව තිබෙන ගණන තමයි ඩොලර් 142. Tender එක open කළාට පස්සේ Trident Chemphar සමාගම නැවත ලියුමක් එවනවා, "නැහැ, නැහැ, අපට calculate කරද්දී වැරදුණා. අපේ ගණන ඩොලර් 141යි" කියලා. මම වැරදි නම් නිවැරදි කරන්න. දැන් මොකක්ද මේ සිද්ධ වෙන්නේ? මුල ඉඳලාම අපි කරුණු පැහැදිලි කළා. මට මේ විනාඩි 7 මදි මේ ගැන එකින් එකට කියන්න. හැබැයි, අයථා ගනුදෙනුවක් ඒ සමාගම සමඟ තිබෙනවා කියලා කියද්දීත්, නැවත උත්සාහ කරනවා නේද, ඒ සමාගමටම දෙන්න. දැන් ඒ යෝජනාව Cabinet එකේ තිබෙනවා කියලා අපට ආරංචියි. මම දන්නවා, එය දැන් Cabinet එකේ තිබෙන බව. *[බාධා කිරීමක්]* හරි, හරි. ඒක වෙනත් කෙනෙකුට දුන්නාද? *[බාධා කිරීමක්]* කාටද දුන්නේ? *[බාධා කිරීමක්]* ඩොලර් 142 කෙනාටද? ෂුවර්ද? *[බාධා කිරීමක්]* එහෙම නම් ප්‍රශ්නයක් නැහැ. අද වනකොට SOC එකේදී, - *[බාධා කිරීමක්]* නැහැ, එපා, එපා. ඔබතුමා,- *[බාධා කිරීමක්]* SOC එකේදී ලංකා ගල් අඟුරු සමාගමේ අය අද උදේ මට දීපු උත්තරයයි මම කිව්වේ. ඒ ගැන එතුමන්ලා දන්නේ නැද්ද? *[බාධා කිරීමක්]* එහෙම නම් මට කරන්න දෙයක් නැහැ. ඒ අය අද උදේ මට දීපු උත්තරයයි මම කිව්වේ. නමුත් වැදගත්, ගරු කටයුතු අමාත්‍යවරයෙකු විධියට ඔබතුමා දැන් කියන ඔය කාරණය මම පිළිගන්නම්. මට ඒකේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මේ වනකල් වෙලා තිබෙන දේ සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් තිබෙනවා.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට මේවා නිරාකරණය කරන්න පුළුවන්. විදේශ රසායනාගාර දෙකකින් හරි කියපු එක පිළිගන්නවා නම්, අද විදුලි බලය නිපදවන ප්‍රමාණය අඩුයි කියලා පිළිගන්නවා නම්, මට තේරෙන්නේ නැහැ මෙතැන කොහේද ප්‍රශ්නය තිබෙන්නේ කියලා. ඒක cancel කරල දමන්න. නීතිපතිතුමා ගාව ඔය කාරණය තියන්නේ නැතුව, ඉක්මනට මොකක් හරි උපදෙසක් අරගෙන ඒක cancel කරලා දාලා ඔබතුමන්ලා වැඩ කරගෙන යන්න. ඒක තමයි අපට කියන්න තිබෙන්නේ. මොකද, අද උදේ ඒ නිලධාරින් කියපු දේවල් මම කිව්වේ.

මේ මාර්තු 05වන දා නොරොච්චෝලේ බලාගාරයේ තුන්වන unit එකෙන් දුම් රොටු පිට වූ එක සම්බන්ධයෙන් අපි ප්‍රශ්න කළාම, අද විදුලිබල මණ්ඩලය බොහොම පැහැදිලිව පිළිගත්තා, ඒක සිද්ධ වුණේ බාල ගල් අඟුරු නිසා කියලා. එහෙම නම්, කවුද ඒවාට වග කියන්නේ? කවුද ඒ සෞඛ්‍ය ගැටලුවලට වග කියන්නේ? අද වනකොට එම ගල් අඟුරුවලින් නිපදවන විදුලිබලය ප්‍රමාණයේ මෙගා වොට් 148ක විතර අඩුවක් තිබෙනවා. මා හිතන්නේ, ඒ ප්‍රමාණය සම්පූර්ණ කරන්න සතියකට ඩීසල් ලීටර් ලක්ෂ 35ක් අවශ්‍යයි. එතකොට මාසයකට ඩීසල් ලීටර් ලක්ෂ 140ක් අවශ්‍යයි. ඒ අද පෝලිම්වල දුක් විඳින මිනිසුන්ට ලැබෙන්න තිබෙන ඩීසල් ටික. අද QR Code හදාගෙන, ඒකත් අනාගෙන මේ දහ අට සන්නියම නටන්නේ ඒ කරපු වංචාව නිසා මාසයකට ඩීසල් ලීටර් ලක්ෂ 140ක් අපරාදේ පුච්චලායි. ආණ්ඩුව මේවා පිළිගන්නේ නැද්ද? අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මේවා සම්බන්ධයෙන් අහක බලාගෙන ඉන්නවාද? කවුද ඒ සෞඛ්‍ය ගැටලුවලට වග කියන්නේ? නොරොච්චෝලේ බලාගාරයේ සිට කිලෝමීටර් 5ක් ඇතුළත තිබෙනවා නොරොච්චෝලේ පනියඩිය, නාරක්කල්ලිය ආදි ප්‍රදේශ. ඒ, මගේ දිස්ත්‍රික්කයේ. ඒවායෙහි මිනිස්සු 5,000ක් විතර ඉන්නවා. එම බලාගාරයේ ඉඳන් කිලෝ මීටර් 10ක් තුළ වෙසෙන විශාල පිරිසක් මේ සෞඛ්‍ය ගැටලුවට නිරාවරණය වෙලා ඉන්නවා. අද වනකල් ඒ සම්බන්ධයෙන් මොකුත් කියලා තිබෙනවාද? ඒ සම්බන්ධව වග කියන්නේ කවුද? අර අප කියපු මූල්‍ය අලාභයට ඒකත් එකතු වෙනවාද? මිනිසුන්ගේ සෞඛ්‍ය සම්බන්ධයෙන් සිදු වන අලාභයක් ගැන අපට ගණන් කියන්න පුළුවන්ද? එය මගේ දිස්ත්‍රික්කයේ ගැටලුවක් වන නිසා මම විශේෂයෙන් කියනවා, කරුණාකර ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් මේ ලෝකයේ තිබෙන ක්‍රමවේදය තමයි, අර්බුදයක් තිබෙනවා නම් ඒ රටේ උත්තරීතර ස්ථානය වන පාර්ලිමේන්තුව කැඳවන එක. දැන් අප දකින්නේ ඒකේ අනෙක් පැත්ත. ඉන්ධන අර්බුදයක් තිබෙන නිසා පාර්ලිමේන්තුවේ A/C එකට යන වියදම ඉතුරු කර ගන්න කියලා පාර්ලිමේන්තුවට නිවාඩු දෙනවා. මම නම් දැකලා නැහැ, මීට කලින් මේ විධියට හැසිරෙනවා. ජනතාව අපට ඡන්දය දීලා පාර්ලිමේන්තුවට එවලා තිබෙන්නේ පාර්ලිමේන්තු රැස්වීම් දවස්වලටත් වල දුක් විඳින මිනිසුසුමම පිළිගන්නම්, ගිහිල්ලා විවාද කරන්න තමයි, අපේ අදහස් දක්වන්න තමයි, මේ සාකච්ඡාවෙන් හරි ඵලයක් උඩට ගන්න තමයි. ආණ්ඩුවේ 159දෙනාට ඡන්දය දීපු ජනතාව ඒ අයගේ ගම්වත් අඳුරන්නේ නැති නිසා ඒ අය පාර්ලිමේන්තුවට ආවාද නැද්ද කියන එක වැදගත් නැතිව ඇති. මම මේ කාරණය කියන්න හේතුව මේකයි. මගේ දිස්ත්‍රික්කයේ මගේ ආසන දෙකේම තිබෙන ප්‍රාදේශීය සංවර්ධන කමිටු දෙකේ රැස්වීම් යොදා ගන්නේ පාර්ලිමේන්තු රැස්වීම් දවසටයි. මොන ක්‍රමයක්ද ඒ? හෙට දවසේ දාගෙන තිබෙනවා, මහවැව සහ නාත්තන්ඩිය ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීම් දෙක. හෙට දවසේ නිවාඩු දුන්නු නිසා ඒ කමිටු රැස්වීම් දෙක පවත්වන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඡන්දය අරගෙන තිබෙන්නේ පාර්ලිමේන්තු එන්න. ඒ ගැන කිසිම වටිනාකමක් නැති මිනිස්සු පාර්ලිමේන්තුවේ රැස්වීම් දවස්වලට ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීම් යොදාගෙන, ඒ දවස්වලට පාර්ලිමේන්තුව වසා දමලා ගෙදරට වෙලා බුදියගන්නවා නම් ඇති වන තත්ත්වය මොකක්ද කියලා මම දන්නේ නැහැ. මම විශේෂයෙන් කියනවා, නැවත මතක් කරනවා, පාර්ලිමේන්තුවේ රැස්වීම් දවස්වලට ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීම් යොදා ගන්න එපා කියලා. මොකද, අපි පාර්ලිමේන්තුවට එන්න අවශ්‍යයි. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලාට මේක අදාළ නැති වෙන්න පුළුවන්. මම අපේ ගරු ඇමතිතුමාටත් ඒ ගැන කිව්වා. ගරු ඇමතිතුමා දැන් මෙහි ඉන්නවා. *[බාධා කිරීමක්]* මම ඒක දන්නවා. මම එතුමාට මේ ගැන දවසක් කිව්වත් එක්ක. ඒ කැත වැඩේ කරන්න එපා. අපි ඇවිල්ලා කරදර කරන්නේ නැහැ නේ, ගරු ඇමතිතුමා. අපෙනුත් මොකක් හරි සුබවාදී දෙයක්, යම්කිසි හොඳ දෙයක් ගන්න තිබෙනවා නම් ගන්න. අපි ඇවිල්ලා කෑ කෝ ගහලා ඔබතුමන්ලාගේ වැඩේ කඩාකප්පල් කරන්නේ නැහැ. එම නිසා

කරුණාකර මේවා හොඳට හිතට ගන්න. මම දන්නවා, සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවේ මේවා ගැන කථා කළාම ඒ කථා කරන ඒවා එළියට යන එක ගැන මේ ආණ්ඩුවට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා කියලා. ඒක තමයි මේ දවස් ටිකේ එක දවසක් හරි පාර්ලිමේන්තුවටත් නිවාඩු දීලා එදාට පාර්ලිමේන්තුව වසා දමන්න හදන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම සඳහන් කරනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සම්බන්ධයෙන් වැඩ කටයුතු කරද්දී අප කියපු ඒවාත් පොඩ්ඩක් අහලා ඒ යෝජනාත් සැලකිල්ලට ගන්න කියලා. පාර්ලිමේන්තුවේ හඬ ඉස්සරහට, එළියට යන්න ඉඩ දෙන්න කියලාත් මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.25]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ ඒ අපේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු කරුණක් ගැන අදහසක් ඉදිරිපත් කරලාම මේ කථාව පටන් ගත්තොත් හොඳයි කියලා මම හිතුවා. විශේෂයෙන් එතුමා කිව්වා, පාර්ලිමේන්තු දිනවල ප්‍රාදේශීය සංවර්ධන කමිටු කැඳවීම සම්බන්ධව. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු එක හරි. එහෙම එකක් වෙනවා නම්, රාජ්‍ය පරිපාලන ඇමතිතුමාගේ අවධානය ඒ කෙරෙහි යොමු කරවා විශේෂයෙන් පාර්ලිමේන්තු දිනවල ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීම් කැඳවීම වෙනස් කරන්න ඕනෑ කියන තීරණයේ තමයි අපත් ඉන්නේ. මොකද, ඔබතුමන්ලා සියලුදෙනා එයට සහභාගි වෙන්න ඕනෑ. එම නිසා ගරු රාජ්‍ය පරිපාලන ඇමතිතුමා ඒ කාරණයට අදාළව ඉදිරියේදී කටයුතු කරයි. අත්‍යවශ්‍ය කාරණයක් යෙදිලා එකී කමිටු රැස්වීම් හදිසියේ යොදා ගන්න වුණොත් ඔබතුමන්ලාගේත් අවබෝධය මත ඊට අදාළව කටයුතු කරන්න පුළුවන්. එහෙම නැත්නම් පාර්ලිමේන්තු සැසිවාර පැවැත්වෙන සති දෙකේ ප්‍රාදේශීය සංවර්ධන කමිටු හෝ දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම් යොදා නොගැනීම උචිත බවයි අපගේත් අදහස.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ විවාදය පවත්වන්නේ දූෂණ විරෝධී පනත යටතේ ක්‍රියාත්මක ආයතනය වන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරින් හා සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමත්, ඒ සඳහා කටයුතු කිරීමත් සම්බන්ධවයි. හැබැයි, අද විවාදය කෙරෙමින් තිබෙන්නේ පවතින ලෝක තත්ත්වය පිළිබඳවයි. මොකද, මේ පවතින තත්ත්වය මඟ හැරලා අපට යන්න බැහැ. ඒක තමයි ඇත්ත. ඒක අපි කවුරුත් දන්නවා.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව එහි කාර්යභාරයන් ඉටු කිරීමේදී මුහුණ දෙන දුෂ්කරතා, සේවක අඩුපාඩු, ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම කියන සියල්ල ආණ්ඩුව හැටියට අපි හඳුනාගෙන පසුගිය කාලය පුරාවට ඒවාට අවශ්‍ය මැදිහත්වීම් කළා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඉඩ කඩ ප්‍රමාණවත් නැති නිසා අපි ඉඩ පහසුකම් ලබා දුන්නා. පැවැති ආණ්ඩුවේ ඇමතිවරුන් භාර දුන් නිල නිවාස අපේ ඇමතිවරුන් භාර ගත්තේ නැති නිසා අපට අවස්ථාව හම්බ වුණා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවටත් ඒවායෙන් ගෙවල් දෙකක් වෙන් කරලා දෙන්න. ඒ වාගේම අපි දැන් අධිකරණ දෙකක් පටන් අරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහි ඉතා විශාල නිලධාරි හිඟයක් තිබුණා. එම කොමිසමට නිලධාරින් බඳවා ගැනීම වාගේම ඒ රාජකාරි කරන නිලධාරින්ට අවදානම් දීමනා ලබා දීමත් කළ යුතුයි. මොකද, ඒ නිලධාරින් සිදු කරගෙන යන පරීක්ෂණවලදී ඔවුන් විවිධ පීඩාවලට ලක් වන අවස්ථා තිබෙනවා. එම නිසා ඒ සියලුදෙනාගේ අවදානම් දීමනාව රුපියල් 10,000 සිට ඉහළට වැඩි කරලා තිබෙනවා.

අද පවත්වන මේ විවාදය පිළිබඳව විපක්ෂයටත් වාදයක් නැහැ. හේතුව තමයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අදාළව මේ කියන වෙනස්කම් විය යුතුයි කියලා අපි හැමෝම විශ්වාස කරනවා. ඒ වෙනස්කම් වෙන්න ඕනෑ. ඒ නිලධාරින්ට තමන්ගේ කාර්යභාරය ඉටු කරගෙන යන්න අවශ්‍ය පහසුකම් ලබා දීම, දීමනා ලබා දීම රජයේ වගකීම හැටියට සලකා අපි ඒ වගකීම ඉටු කරමින් ඉන්නවා.

ඒ වාගේම, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පසුගිය කාලයේ ක්‍රියාත්මක වෙච්ච ආකාරය ගත්තත්, මීට පෙර තිබුණු තත්ත්වය ගත්තත් මේ අවස්ථාවේදී ඒ පිළිබඳව අදහසක් දෙකක් ඉදිරිපත් කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට මම ඉස්සර වෙලාම පැමිණිල්ලක් දමන්න ගියේ 2010දී. ඒ කාලවල කරපු පැමිණිලිවලට අදාළව අදටත් පරීක්ෂණ සිදු නොවුණු ඒවා තිබෙනවා. හැබැයි, අප දාපු සමහර පරණ පැමිණිලි පරීක්ෂාවට ලක් වෙලා වැරදිකරුවන් වෙලා සමහර අය දැන් ඉන්නේ ඇතුළේ. ඒ, අපේ ආණ්ඩුවක් යටතේයි. ඒ නිසා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පණ දෙන්න, ඒක සක්‍රිය කරන්න, ස්වාධීන කොමිෂන් සභාවක් ලෙස ක්‍රියාත්මක වෙන්න අවශ්‍ය කරන සියලු පහසුකම් අපේ රජය යටතේ සම්පූර්ණ කර තිබෙනවා. ඒ වාගේම, waiting list එකේත් තවත් ගොඩක් අය ඉන්නවා; ගොඩක් කාරණා තිබෙනවා. ඒවා අදාළ පරිදි පෝලිමේ ගන්න කොට, අදාළ අයට ගිහිල්ලා කථාව කියන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදය ඇතුළේ අපට වැදගත් වන්නේ, රටක් හැටියට අප මේ මොහොතේ මුහුණ දීලා තිබෙන තත්ත්වයයි. ඊශ්‍රායලය, ඇමෙරිකාව එක් පැත්තක ඉඳගෙන ඉරානයට පහර දීම සිදු කරනවා. ඒක මැද පෙරදිග කලාපයේ සිදු වුණත්, මැද පෙරදිග කලාපය හරහා හමන මේ යුද්ධයේ උණුසුම දැන් අපේ ගිරුවාපත්තුවට, හොරොව්පතානට, කහටගස්දිගිලියට, කැබිතිගොල්ලෑවට විතරක් නොවෙයි, කච්චතිවු දක්වා, මන්ඩතිව් දක්වා, යාපනයේ කෙළවරටම දැනිලායි තිබෙන්නේ. ඒ උණුසුම රට කෙළවරටම දැනුණාට පසුව රට හැටියට තිබෙන තත්ත්වය කළමනාකරණය කරන්න, ඒ තත්ත්වයට මුහුණ දෙන්න අපේ ගරු අනුර දිසානායක ජනාධිපතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය, මේ පාර්ලිමේන්තුව, අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු ආයතන ප්‍රධානීන් දිවා රෑ නැතිව වැඩ කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ සඳහා වන විසඳුම් හොයන්න ඕනෑ. සමහර ඒවාට විසඳුම් විපක්ෂයේ

[ගරු වසන්ත සමරසිංහ මහතා]

මෙතුමන්ලා කියනවා තමයි. නමුත්, ඒ සමහර ඒවා කරන්න ලෙහෙසි නැහැ. මොකද, අපි ගන්නා තීන්දු තීරණ හැම එකක්ම තවත් කෙනෙකුට බලපාන විධියක් තිබෙනවා; තවත් කෙනෙකුට දැනෙන විධියක් තිබෙනවා.

ඒ නිසා ඒ දැනෙන, බලපාන විධි සියල්ලත් එක්ක තමයි අපට තීන්දු තීරණ ගන්න වෙන්නේ. අපි හෙට පාර්ලිමේන්තුවට නිවාඩු දෙන්නේ, රටක් හැටියට. රටක් හැටියට හෙට නිවාඩු දෙන්න ඕනෑ කියලා තීරණය කරද්දී, පාර්ලිමේන්තුව පවත්වන්න ඕනෑ කියලා විපක්ෂය කියනවා. අපට තේරෙන්නේ නැහැ, පාර්ලිමේන්තුව එක දවසක් වැහුවා කියලා මේගොල්ලන්ට මොකක් හරි පාඩුවක් සිදුවෙනවාද? රටක් හැටියට පාසල් ටික වහලා, රාජ්‍ය ආයතන ටික වහලා -අත්‍යවශ්‍ය සේවා හැර- අපි සතුව තිබෙන තෙල් තොගය සියයට 30ක් ඉතුරු කරගන්නයි මේ උත්සාහ කරන්නේ. සියයට 30ක් ඉතුරු කර ගත්තොත් අපට තව දවස් 15ක් යන්න පුළුවන්. දෛනික පරිභෝජනය වැඩිවෙලා තිබෙන්නේ. දෛනිකව වැඩිවෙච්ච පරිභෝජනය අඩු කරන්න, ඩීසල් පාවිච්චිය අඩු කරගෙන, පෙට්‍රල් පාවිච්චිය අඩු කරගෙන අපේ රටේ ජනතාවට යම් ප්‍රමාණයකට හෝ අවස්ථාවක් හදන්න තමයි අපේ මේ උත්සාහය. ඒක කරන්න හදනකොට විපක්ෂය කියනවා, "එහෙම කරන්න බැහැ, අපට ප්‍රශ්න කථා කරන්න තිබෙන්නේ පාර්ලිමේන්තුව, ඒ නිසා බදාදා පාර්ලිමේන්තුව තියන්න ඕනෑ" කියලා. රජයේ කාර්යාලවලට වැඩිපුරම මිනිස්සු එන්නේ බදාදා. ජනතාව වැඩිපුර ගමන් කරන එක නවත්වන්න තමයි බදාදා නිවාඩු දෙන්නේ. එතකොට සඳුදා සහ අඟහරුවාදා වැඩ. බදාදා නිවාඩු. ආපහු බ්‍රහස්පතින්දා සහ සිකුරාදා වැඩ. ආපහු සෙනසුරාදා සහ ඉරිදා දවස් දෙකම නිවාඩු. ඒකට ජනතාව යම්කිසි ප්‍රමාණයකට හුරුවෙනවා. අපි දන්නේ නැහැ, තව සති දෙකක් තුනක් යනකොට ලෝකයේ තත්ත්වය කොයි අතට හැරෙයිද කියලා. අපි දන්නේ නැහැ, සජිත් ප්‍රේමදාස මහත්මයාගේ උපදෙස් ඇමෙරිකා එක්සත් ජනපදය කොහොම පිළිගෙන තිබෙනවා ද කියලා. එතුමා හැමදාම මෙතැන ඉඳගෙන උපදෙස් දෙනවා. අදත් උපදෙස් ටිකක් දුන්නා. ඒවා අහලා ඒ අනුව වැඩ කරනවාද දන්නේ නැහැ. අපි ප්‍රශ්නය මතුවෙලා තිබෙන තැන තමයි ගන්න ඕනෑ. හෝමුස් සමුද්‍ර සන්ධිය, ඒ බොක්ක හරහා එන නැව් ටික ආවේ නැත්නම් ලෝකයේ රටවලට තෙල් සැපයුමේ දී සියයට 20ක බාධාවක් ඇතිවෙනවා. ඒ විතරක් නොවෙයි. ඒ බාධාවත් එක්ක තෙල් සංචිත පවතින අනෙකුත් රටවල් ඒ අයගේ තෙල් සංචිත නිදහස් කිරීම සීමා කරනවා. එහෙම සීමා කරන නිසා තමයි තෙල් ප්‍රශ්නය මතුවෙලා තිබෙන්නේ, තෙල් මිල ඉහළ ගිහිල්ලා තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සමහර ඒවා සියයට සියයක්ම ඉහළ ගිහිල්ලා තිබෙනවා.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
හෝමුස් සමුද්‍ර සන්ධිය වැහුවත් අවුලක් නැහැ කියලා ඔබතුමන්ලා කිව්වා නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
නැහැ, කවුද කිව්වේ? *[බාධා කිරීමක්]* හරි, හෝමුස් සමුද්‍ර සන්ධිය වැහුවත් තවම අපට අවුලක් වුණේ නැහැ නේ, ගරු මන්ත්‍රීතුමා. හැබැයි, තිබෙන ප්‍රශ්නය මොකක්ද? මම කිව්වේ ඒකයි. හෝමුස් සමුද්‍ර සන්ධිය වැහුවාම සියයට 20ක බාධාවක් ඇති වෙනවා. හැබැයි, ලෝකයේ අනෙකුත් තෙල් සැපයුම්කරුවන්, තෙල්වල භාරකාරිත්වය තිබෙන රටවල් ඒ අයගේ තෙල් සංචිත නිදහස් කිරීම සීමා කරනවා, ගරු මන්ත්‍රීතුමනි. මේ යුද්ධය විසින් දවසකට විනාශ කරන තෙල් බැරල් ප්‍රමාණය කොච්චරද කියලා බලන්න. මේකෙන් අලුත් තත්ත්වයක් ඇති වෙනවා. ඇමෙරිකාවයි ඊශ්‍රායලයයි හිතුවා, ඉරානයට ගැහුවාම ඉරානය හකුළාගෙන, වහගෙන ඉඳියි කියලා. ඒ නිසා සති දෙකෙන් යුද්ධය ඉවර කරන්න හිටපු ට්‍රම්ප්, දැන් කට්ටිය හොයාගෙන යනවා සහාය ගන්න. දැන්, ඇමෙරිකාවටත් දැනිලා තිබෙනවා යම් ප්‍රශ්නයක් තිබෙනවා කියලා. යුද්ධය අවසන් වීමේ සීමාවක් පේන්නේ නැහැ. ඒ නිසා රුසියාවේ ජනාධිපතිතුමා ඉල්ලනවා, එක්සත් ජාතීන්ගේ සංවිධානය දේශපාලන සංවිධානයක් නොකරන්න කියලා. ස්වෛරී රාජ්‍යවල අයිතියට එරෙහිව දේශපාලන සංවිධානයක් විධියට ඒක පාවිච්චි කරන්න දෙන්න එපා කියලා ඉල්ලනවා.

මේ යුද තත්ත්වය දවස ගණනේ උණුසුම් වෙනවා. එතකොට ඒක අපේ ප්‍රවාහන පද්ධතියට බලපානවා. නැව් ගමනාගමනයට බලපානවා. රක්ෂණ සමාගම්වල රක්ෂණ ගාස්තු ඉහළ දමනවා. රක්ෂණ ගාස්තු ඉහළ යනකොට කොළඹට එන පරිප්පු කිලෝවක, සීනි කිලෝවක, හාල්මැස්සන්ගේ, අල, ලූනුවල මිල ඉහළ යනවා. එක පැත්තකින් එය කළමනාකරණය කිරීම සඳහා රජයක් හැටියට අපට තීන්දු තීරණ ගන්න සිද්ධ වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ බලශක්තිය තමයි ලෝකයටම වැදගත් වෙමින් තිබෙන්නේ. ඒ බලශක්ති ප්‍රභව මිලදී ගැනීමේදී, පාවිච්චි කිරීමේදී අයිතිකරුවන් තීන්දු තීරණ ගන්නවා වාගේම, අපටත් රජයක් හැටියට තීන්දු තීරණ ගන්න වෙනවා. ඒ නිසා අපි ඊයේ කැබිනට් මණ්ඩල තීරණයක් ගත්තා. ඒ අනුව පවතින ප්‍රසම්පාදන ක්‍රමවලට පිටින් ඛනිජ තෙල් සංස්ථාවට තෙල්, ගෑස් සහ ගල් අඟුරු මිලදී ගැනීමට අවශ්‍ය වුණොත්, ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ අවසරය අරගෙන මිලදී ගැනීමට පුළුවන්. කැබිනට් මණ්ඩලය ඒ අනුමැතිය ලබා දුන්නා. ඒ නිසා අපට ඊයේත් තෙල් නැවක් මිලදී ගන්න පුළුවන් වුණා. ඒ විධියට අපි දවස ගාණේ මේ තත්ත්වය ගැන පසුවිපරම් කරනවා. මේ පිළිබඳව ඇති වෙන අලුත් තත්ත්වය මත තීන්දු තීරණ ගන්නවා. මේ තීන්දු තීරණ ගන්නකොට දවසක් පාර්ලිමේන්තුව වහන්න වෙනවා කිව්වාම, විපක්ෂ නායකතුමා ඇතුළු කණ්ඩායම මහා ගෝරනාඩුවක් ඇති කරන්න හදනවා.

ඉතින් අපට කියන්න තිබෙන්නේ, රටේ ජනතාව මේ මොහොතේ මහජන නියෝජිතයන්ගේ හැසිරීමත් බලනවා කියන එකයි. ආණ්ඩුවේ විතරක් නොවෙයි, විපක්ෂයේත් හැසිරීම බලනවා. මොකද, පාර්ලිමේන්තුවක් හැටියට රටේ ප්‍රශ්න ගැන කථා කරනවා වාගේම රට මුහුණ දී තිබෙන පොදු ප්‍රශ්න ගැනත් කථා කරනවා. මේක ආණ්ඩුවේ ප්‍රශ්නයක් නොවෙයි. මේක ලෝක තත්ත්වයක්. ඒ ලෝක තත්ත්වයට ගැළපෙන ලෙස අපි තීන්දු තීරණ ගනිද්දී විපක්ෂය කොහොමද හැසිරෙන්නේ? ඒගොල්ලන්ට පාර්ලිමේන්තුවට එන්න ඕනෑ ලු. දැන් ඉන්නේත් තුන්දෙනායි. මම කිව්වේ ඒක නේ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. හරි. අපි අදත් එකඟයි මේක නවත්වන්න. බොහෝ දේවල් කථා කරන්න පාර්ලිමේන්තුවට එන්න ඕනෑය කිව්වා. මට හිතෙන විධියට, විපක්ෂ නායකතුමාගේ කට්ටිය මේක නවත්වන්න කියලා උපදෙස් දෙන්න ගිහිල්ලා තිබෙනවා. මොකද, එක සාකච්ඡාවකදී කිව්වා, තව මාසයකින් යුද්ධය නවතිනවා කියලා. මම ඒකයි කියන්නේ. මාසයකින් යුද්ධය නවතිනවා කියලා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා. මට හිතෙන විධියට, ඒ යුධ උපදේශකයෙක් වෙන්න ඇති. දැන් ප්‍රශ්නය තිබෙන්නේ ඒක මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් අපි කල්පනා කරන්නේ මෙන්න මේ දේවල් ගැන. දැන් අනුරාධපුරයේ ගොවියෝ ගොයම් කපනවා. දවසකට අක්කරයක් කපන්න හූතයා මැසිමට යනවා, තෙල් ලීටර් 10ත්, 15ත් අතර ප්‍රමාණයක්. අනෙක් පැත්තෙන් අපි යල කන්නයේ වැඩ පටන් ගත්තා, මාර්තු මාසයේ. ආහාර නිෂ්පාදනය පිළිබඳව අපි දැඩි අවධානය යොමු කරලා තිබෙනවා. ජනාධිපතිතුමා විශේෂයෙන්ම කිව්වා දැනට තෙල් තිබෙන්නේ

මාසයකට නම්, මාස දෙකහමාරකට තෙල් තිබෙනවා, ඔයගොල්ලන් වැඩ කරන්න කියලා. රෝහල් පද්ධතිය ඇතුළු අත්‍යවශ්‍ය සේවාවලට කිව්වා. තෙල් සංස්ථාවටත් කිව්වා. ඒ නිසා අත්‍යවශ්‍ය ක්ෂේත්‍ර පිළිබඳව අවධානය යොමු කරමින් අපි වැඩ කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි 5ක් වැඩිපුර ලැබෙනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නිසා අපි කෘෂිකාර්මික ක්ෂේත්‍රයට, කර්මාන්ත ක්ෂේත්‍රයට, ප්‍රවාහන ක්ෂේත්‍රයට, ධීවර කර්මාන්තයට, සංචාරක ව්‍යාපාරයට *[බාධා කිරීමක්]* ඒක කියපු කෙනාගෙන් අහන්න ඕනෑ. ඒක දීලා තිබෙන්නේ අක්කරයකට, ගරු මන්ත්‍රීතුමා. අක්කරයක් කපන්න තෙල් ලීටර් 10යි, 12යි උපරිම වශයෙන් යන්නේ. *[බාධා කිරීමක්]* මම මේ කියන්නේ ඒකයි. මාත් අනුරාධපුරයේ. ඒකයි මේ කියන්නේ. මගේත් කුඹුර කපලා ඉවර කළා. ඔබතුමාට ඒකයි මේ කියන්නේ. අක්කරයක් කපන්න තෙල් ලීටර් 10යි, 12යි යන්නේ. අපි ලීටර් 15ක් දුන්නා. අක්කරයකට ලීටර් 15ක් වුණාම හෙක්ටයාරයකට ලීටර් තිස්හතහමාරක් දෙනවා. ඒක වැඩියි. ලීටර් 5ක් විතර ඉතිරි වෙනවා කියලායි මම කියන්නේ. හැබැයි, ඒ වාහනය තැන් තැන්වලට අරගෙන යන්නත් ඕනෑ නේ ගරු මන්ත්‍රීතුමා. ඒ භූතයා මැසධිම අරගෙන යන වාහනය යන්නත් ඕනෑ නේ තැන් තැන්වලට. ඒකත් ගොවියාගේ වගකීමක්. ඊට පස්සේ හාන්න පටන් ගන්නවා. ඒකට අක්කරයකට ලීටර් 20යි. කුඹුරක හී 3ක් හාන්න තිබෙනවා. ඒකට ලීටර් 50ක් දෙනවා. අක්කර දෙකහමාරට ලීටර් 50ක් දෙනවා. එතකොට හාන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමා. ඒක දන්නේ නැතුව වෙන්න ඇති, කියන්න ඇත්තේ. ඔබතුමාගේ අවධානයටයි මම ඒක කිව්වේ. මේ විධියට ගොවියාට විතරක් නොවෙයි, සෑම ක්ෂේත්‍රයකටම එහෙමයි.

ගරු මන්ත්‍රීතුමා, වාහන ක්ෂේත්‍රයේදී භාණ්ඩ ප්‍රවාහනය ගත්තොත්, වෙළඳපොළට භාණ්ඩ ගියේ නැත්නම් තිබෙන ඒවායේ මිල ගණන් ඉහළ දමනවා. ඒ නිසා වරායෙන් බාන බඩු ටික අරගෙන රට පුරා බෙදා හරින්න යද්දී, රට පුරා තිබෙන වෙළඳ සැල්වලට අඩුවක් නැතුව භාණ්ඩ තිබෙන්න නම්, ඒ බෙදා හැරීමේ ජාලවලට අවශ්‍ය තෙල් ටික අපි දෙන්න ඕනෑ. Prime moversවලට කන්ටේනර් ටික එළියට අරගෙන නිදහස් කරන්න වාගේම, අපනයනය කරන භාණ්ඩ කන්ටේනර් ටිකට දමලා වරායට ගෙනියන්නත් ඩීසල් ටිකක් වැඩිපුර යනවා. ඒ වාගේම වරායෙන් බාන අල, ලූනු, සීනි, පරිප්පු ටික වාගේම අනෙකුත් භාණ්ඩ ටික රට පුරා තිබෙන වෙළඳ සැල්වලට බෙදා හරින්නත් තෙල් ඕනෑ. වෙළඳ සැල් ජාල තිබෙනවා. ඒ අයට අවශ්‍ය පහසුකම් දුන්නා. ඒ විතරක් නොවෙයි, ගමේ ඉන්න තණකොළ කපන කෙනාටත්, chainsawවලින් ගස්වල අතු කපන මිනිස්සුන්ටත්, ධීවර කර්මාන්තයේ යෙදෙන කුඩා බෝට්ටුකරුවන්ටත් - එක්කෙනෙක් නැරෙන්න හැම කෙනාටම- අවශ්‍ය පහසුකම් සපයන්නේ කොහොමද කියන එක සොයා බලන්න පත් කරපු කමිටුව ජනාධිපතිතුමා අදත් කැඳවලා, ප්‍රවාහන සහ සැපයුම් මාර්ගවලට තිබෙන බාධා මොනවාද කියලා සොයා බලන්න කිව්වා. ඒ විතරක් නොවෙයි, මේ ගැන විශේෂ අවධානයක් අපි යොමු කරලායි තිබෙන්නේ. මොකද, මේ යුද්ධය අපට පාලනය කරන්න පුළුවන් මට්ටමක නොවෙයි තිබෙන්නේ.

අපේ පාලනයෙන් තොර පරිබාහිර බලපෑම් මත අපටත් අසීරු තත්ත්වයකට මුහුණ දෙන්න වෙලා තිබෙන්නේ. හැබැයි, පසුගිය කාලයේ වුණේ එහෙම නොවෙයි. පසුගිය කාලයේ භාණ්ඩාගාරය හිස් කරලා කට්ටිය කාලා මාරුවෙලායි හිටියේ. ඒ නිසා රටේ මිනිස්සුන්ට කන්න නැති වුණා. දැන් භාණ්ඩාගාරයට සල්ලි තිබෙනවා; රටට සල්ලි තිබෙනවා. හැබැයි, සැපයුම් මාර්ගවල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා සපයා ගැනීමේ ප්‍රශ්නයක් දැන් තිබෙන්නේ. ඒ නිසා මේ වෙනකොට රට පුරා තිබෙන සියලු ක්ෂේත්‍ර පිළිබඳව අපි සොයා බලනවා. දැන් එක මන්ත්‍රීතුමෙක් කිව්වා, තෙල් ගන්න මහ බුදිය බුදියා යන්න ඕනෑ කියලා. මට හිතෙන විධියට, බුදියාගන්න තැනක් හොයලා දුන්නා නම් හරි. එහෙම තමයි ඒ ප්‍රශ්නයට උත්තර හොයන්න තිබෙන්නේ. එතකොට ලේසියි.

ඊයේත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා ඇතුළු නිලධාරින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිලධාරින් සමඟ එකතු වෙලා විශේෂ App එකක් මේ QR Code එකට සම්බන්ධ කළා. QR Code එකට ඒ App එක සම්බන්ධ කළාට පස්සේ,- කටුනායකින් වාහනයට නඟින විදේශිකයන්, සංචාරකයන් - යනවා නුවරට. එතැනින් යන්නේ ඇල්ලට. එහෙම නැත්නම් යාපනයට. එහෙම නැත්නම් කතරගමට. නැත්නම් හික්කඩුවට. ඔහු ආපහු කටුනායකට රැගෙන එනකම් අදාළ වාහනයේ යන සංචාරකයාට තෙල් ලබා ගැනීමේ පහසුව හදන්න අවශ්‍ය සැලැස්ම හදලායි තිබෙන්නේ. ඒ නිසා කොහේවත් මහ බුදිය-බුදියා ඉන්න ඕනෑ නැහැ. නොදන්නාකමට කියනවා වෙන්න පුළුවන්. ඒකට අදාළ සැලසුමක් හදන්න ඕනෑ. එක පාරට "හෝස්" ගාලා දෙන්න බැහැ. එහෙම දෙන්න ගිහිල්ලා පසුගිය දවස්වල තෙල් පරිභෝජනය වැඩි වෙලා තිබෙන්නේ කොහොමද කියලා විදුලිබල ඇමතිතුමා කිව්වා. තෙල් පරිභෝජනය වැඩි වීම කියන කාරණය සැලකිල්ලට ගන්න වෙන්නේ, මෙන්න මේ නිසා. තෙල් හිඟයක් ඒවි යැයි සැක කරමින් ජනතාව කලබල වීම මත මිලදී ගැනීමකට - panic buyingවලට - යනවා කියලා කියනවා.

ගරු මන්ත්‍රීතුමනි, අපි දවසකට ගෑස් සැපයුවේ මෙට්‍රික්ටොන් 1,200යි. නමුත්, දැන් අපට මෙට්‍රික්ටොන් 1,800 දක්වා සපයන්න සිද්ධ වෙලා තිබෙනවා. දවසකට සපයපු ගෑස් ප්‍රමාණය එහෙම වැඩි කරන්න වුණේ ඇයි? ගෑස් ප්‍රමාණය වැඩි කරන්න වුණේ, මිනිස්සු ගෙදර තිබෙන ගෑස් සිලින්ඩර ඔක්කොම පුරවා ගත් නිසායි. ඒකට මිනිස්සුන්ට බැණලා හරියන්නේ නැහැ. නමුත්, ඒක තමයි තත්ත්වය. එදා ජනාධිපතිතුමාත් ඇවිල්ලා කිව්වා, රටේ ගෑස් ටැංකි තිබෙන්නේ දවස් 8කට ගෑස් ගබඩා කරන්න. දැන් අහන්න එපා, අවුරුද්දක් ගතවෙලා ගෑස් ටැංකියක් හදා ගන්න බැරි වුණාද කියලා. අවුරුදු 78ක් තිස්සේම හදලා තිබෙන්නේ දවස් 6කට ගෑස් තියා ගන්න ටැංකියක්. ඒකයි තිබෙන ප්‍රශ්නය. එතකොට ඇති වන තත්ත්වය නිසා තමයි ගෑස් සැපයුම් සම්බන්ධයෙන් මේ අවුරුද්දේ මුල අපි ටෙන්ඩර් එක දුන්නේ. ටෙන්ඩර් එක දුන් අය ගෑස් ගෙනෙනවා. එම ගෑස් සැපයුම මෙට්‍රික්ටොන්වලින් ගත්තොත්, මේ මාසයෙත් අපේ ඉල්ලුම මෙට්‍රික්ටොන් 32,000යි. මෙට්‍රික්ටොන් 38,000ක් අරගෙන එන්න අවශ්‍ය කරන සැලසුම හදලා තිබෙනවා. ඒ සැලසුම ගත්තාම, මේ වනකොට ලිට්‍රෝ එකට අපි ගෑස් මෙට්‍රික්ටොන් 24,500ක් ගෙනැල්ලා තිබෙනවා. මාර්තු 21වන දා නැවක් එනවා, 23වන දා නැවක් එනවා, 25වන දා නැවක් එනවා. එතකොට මෙට්‍රික්ටොන් 38,000ක් වෙනවා.

ඒ විතරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලබන මාසයටත් අවශ්‍ය කරන ගෑස් අපට තිබෙන්න ඕනෑ. එතකොට දැන් එක ship එකක්, මෙට්‍රික්ටොන් 38,000ක mother vessel එකක් පිටත් වෙලා තිබෙනවා, මාලදිවයින කරා එන්න. ඒ විතරක් නොවෙයි. ලබන මාසයේ 21වන දා එන්න තිබෙන නැවක්, mother vessel එකක්, නැත්නම් මෙට්‍රික්ටොන් 33,000ක

[ගරු වසන්ත සමරසිංහ මහතා]

නැවක් ආර්ජන්ටිනාවෙන් අද පිටත් වුණා කියලා දවල් ජනාධිපති ලේකම් කාර්යාලයේ තිබුණු රැස්වීමේදී අපේ සභාපතිතුමා කිව්වා. ඒ නිසා ගෑස් සැපයුම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නැහැ. ජනතාවටත් කියන්න ඕනෑ, ගෑස් මිලදී ගැනීමේදී කලබල වෙන්න එපා කියලා. ගෑස් තිබෙනවා. ගෑස් එනවා. හැබැයි, ලාෆ් ගෑස් සමාගම ගෑස් සැපයීමේ ගැටලුවක් මතු කරගෙන තිබෙනවා. ඒ ගැටලුවට අදාළව ඒගොල්ලන්ට දෙන්න පුළුවන් සහන ආණ්ඩුව දෙන්නම් කියලා තිබෙද්දීත්, ඔවුන්ට අඛණ්ඩ මිලදී ගැනීම සඳහා සැලැස්මක් නැතිවීමට උත්තරයක් ලෙස තමයි අපට ගෑස් සිලින්ඩර සහ ගෑස් වැඩිපුර වෙළෙඳ පොළට නිදහස් කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දේවල් කියන ගමන් මේ කාරණයත් මම විශේෂයෙන් කියන්න ඕනෑ. ගල් අඟුරු ටෙන්ඩරය ගැන කිව්වා. ඔව්, ගරු මන්ත්‍රීතුමා. මේ ගිවිසුම අනුවම තිබෙනවා, ගල් අඟුරු භාවිතයේදී යම් අඩුවක් වනවා නම්, - දහනයේදී නිෂ්පාදනය වන විදුලි බලයේ ප්‍රමාණය අඩුවක් වනවා නම්- සියයට 10ක් දක්වා අයකර ගන්න ඉඩ තිබෙනවා. නැව් දෙකක් ෆේල් වනවා නම් cancel කරන්න පුළුවන්. හැබැයි, තිබෙන තත්වයන් ඇතුළේ තමයි අර ඔබතුමා කිව්වා වාගේ මේ සමාගමම දාලා දෙවෙනි පාරත් එවනවා, 'අර මිලට බැහැ, මේ මිලට' කියලා. එහෙම ටෙන්ඩර් පිළිගන්නේ නැහැ නේ, ගරු මන්ත්‍රීතුමා. ඒ නිසා ටෙන්ඩරයට අදාළව ටෙන්ඩරයේ මිල ඉදිරිපත් කරපු අයගේ මිල ගණන්, ලෝක වෙළෙඳ පොළේ ගල් අඟුරුවල මිලත්, premium එකත්, ඒ සපයන්නාගේ වියදමත් එකතු කළාට පස්සේ එන මිල තමයි 42ක් වෙලා තිබෙන්නේ. දෙවෙනියාට හිටපු කෙනාට ටෙන්ඩර් එක පිරිනමන්න තීරණය කළා. මොකද, අපට මේ මිලදී ගැනීම් කරන්න වෙනවා. අඩුවකින් තොරව විදුලිය නිෂ්පාදනය සඳහා ගල් අඟුරු ගෙනෙන්න වෙනවා. ඒක අපි කරලා තිබෙනවා. දැන් මේ ගල් අඟුරු ගැන කිය කියා යනවා. ඒක නිසා තමයි ඒ ගිවිසුමේ තිබෙන්නේ යම් විධියකින් ගල් අඟුරු දහනයේදී, -

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මෙතුමාට අවස්ථාව දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, කියන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ඔය කියන විධියට, අඩුවට දීපු කෙනාව අයින් කරලා දෙවැනියට දීපු කෙනාට නේ, ඔබතුමන්ලා දීලා තිබෙන්නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔව්.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
එතකොට cancel වෙලාත් නැහැ, blacklist වෙලාත් නැහැ නේ. කොහොමද අයින් කරන්නේ? ඇයි ඒ? අපරාදේ නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා දන්නේ නැහැ නේ. ඔබතුමා කියන අර දෙදෙනාගෙන් දෙවැනියා නොවෙයි. අලුතින් දාලා තිබෙනවා. අලුතින් 6දෙනෙකු ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒකේ දෙවැනියා ගැන කියන්නේ. අරයා නොවෙයි.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ඇයි පළමුවැනියා නැද්ද?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
පළමුවැනියා අයින් කළේ, දමපු මිලට ලබා දීම ඔහු ප්‍රතික්ෂේප කරනවා නේ. එතකොට ඔහු ටෙන්ඩර් කොන්දේසි කඩ කරලා කටයුතු කළාට පස්සේ එයාට දෙන්න බැහැ නේ.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ඒ මිලත් දෙන්නේ ඩොලරයක් අඩුවෙන් නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමා, ටෙන්ඩර් කොන්දේසිවල,- *[බාධා කිරීමක්]* අනෙක් එක්කෙනාත් කිව්වොත් "මට අඩු කරන්න දෙන්න" කියලා?

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
අඩු කරලා නොවෙයි, වැඩි කරලා දෙන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
නැහැ, ඒක තමයි කියන්නේ. ඔහු ටෙන්ඩර් කොන්දේසි උල්ලංඝනය කරලා ආපහු පස්සේ කියන්න බැහැ නේ. අපිට ඔය වාගේම ප්‍රශ්නයක් ගෑස් සම්බන්ධයෙනුත් ආවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු ඇමතිතුමා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මට විනාඩියක් දෙන්න.

ඒ නිසා එක එක වෙලාවට හිතෙන විධියට ටෙන්ඩර් දමන්න බැහැ. ටෙන්ඩර් එක දමන්න ඕනෑ, ටෙන්ඩර් කොන්දේසිවලට අනුව. නැත්නම් ටෙන්ඩර් එක දාපු දෙවැනියා අපට නඩු දානවා. රජයක් හැටියට වගකීමෙන් ඒ ගැන බලලා තමයි අපි වැඩ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න, ගරු ඇමතිතුමා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මේ කාරණයත් කියලා මම අවසන් කරන්නම්.

දැන් මේ සභාවේදී බිමල් රත්නායක ඇමතිතුමාගේ නම කියන්නේ නැතිව කිව්වා, "බොරු කිව්වා, පව කිව්වා" කියලා. එහෙම නම් නඩු දාන්න පුළුවන් නේ. කන්ටේනර් 323ක් ගැන බොරු කථාවක් කිය කියා තවමත් ඇවිදිනවා. ඒක ගැන ඇති තරම් මේ සභාවේ පැහැදිලි කළා නේ. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා කමිටුවක් දැම්මා නේ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ගරු මන්ත්‍රීතුමා විපක්ෂයේ ඔබතුමන්ලා කමිටුවක් දැම්මා නේ. පුළුවන් නම් විපක්ෂය දාපු කමිටුවෙන් සොයලා බිමල් රත්නායක ඇමතිතුමාව වැරදිකාරයා කරන්න. විපක්ෂය කමිටුවක් දාලා තිබෙනවා. පුළුවන් නම් ඒ කමිටුවෙන් සොයලා එතුමාව වැරදිකාරයා කරන්න. බැහැ නේ? *[බාධා කිරීමක්]* බොරු කියන්න එපා. අදාළ මැති ඇමතිවරු නැති වෙලාවේ එක එක කථා කියන්න එපා. පාර්ලිමේන්තුවේ වරප්‍රසාද පාවිච්චි කර කර, හිතුණු හිතුණු අතට හිතුණු හිතුණු බොරු කියනවා. පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරලා බොරු කියන එක විපක්ෂයේ විලාසිතාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රටේ තිබෙන තත්ත්වය අනුව මේ රටේ කිසිදු නිෂ්පාදන කර්මාන්තයක් -ආහාර නිෂ්පාදන කර්මාන්තයක්- අඩපණ නොකර, අත්‍යවශ්‍ය සේවා පවත්වා ගනිමින්, ලෝක යුද්මය තත්ත්වය අපේ රටට දැනෙන්නේ කොහොමද කියලා දවස ගාණේ පසු විපරම් කරමින් මේ ආණ්ඩුව රටේ ජනතාවගේ ජන ජීවිතය පවත්වාගෙන යාමට අවශ්‍ය තීන්දු තීරණ ගනිමින් සිටිනවා. ඒ වාගේම පසුගිය ආණ්ඩු බලයන් පාවිච්චි කරලා දේශපාලනඥයන් වාගේම නිලධාරිනුත් කරන ලද හොරකම්, වංචා, දූෂණ සොයන්න මැදිහත් වෙන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරින්ට අවශ්‍ය පාරිශ්‍රමික ලබා දෙමින් මේ රට වැටිලා තිබෙන තැනින් ගොඩ අරගෙන ඉදිරියට යන ගමන අඛණ්ඩව කරගෙන යන්න ආණ්ඩුව කටයුතු කරනවා. විපක්ෂයට ඒ සඳහා අත්වැල් බැඳ ගන්න කියන ආරාධනය කරමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.46]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දූෂණ විරෝධී පනත යටතේ පත් කළ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් තමයි අද දින සාකච්ඡා කරන්නේ. ප්‍රතිපත්තියක් විධියට විපක්ෂයේ සහ ආණ්ඩු පක්ෂයේ කවුරුත් ඒකට විරුද්ධ නොවුණත් එතැන විශාල අඩුපාඩුවක්, එහෙම නැත්නම් ප්‍රශ්නයක් තිබෙනවා. සමහර විට අදහස් දැක්වූ මන්ත්‍රීවරු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ගැන කථා කළොත්, ඒකට විරුද්ධ වුණොත්, ඒගොල්ලන්ට ඇඟිලි දික්වෙයි කියලා ඒ අඩුපාඩු ගැන නොකියා හිටියාද දන්නේ නැහැ. අපේ නියෝජ්‍ය ඇමතිතුමා; නීතිඥ මහත්මයාත් මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. ඉතින් ඒ ගැන කියන එක හොඳයි.

CIABOC Director Generalට, Court of Appeal Presidentගේ ස්ථානය තමයි දීලා තිබෙන්නේ. අදාළ පනතේ 19 (C) යටතේ අවුරුදු 15ක අත්දැකීම් තිබෙන, අපරාධ නඩු මෙහෙයවීම සම්බන්ධයෙන් අත්දැකීම් තිබෙන පුද්ගලයකුට ඒ තනතුරට එන්න පුළුවන්. ආවාට පස්සේ අවුරුදු 5ක් ඒ තනතුරේ ඉන්න පුළුවන්. එතකොට සේවා කාලය අවුරුදු 20ක් වෙනකොට, - එතැනින් ඉවත් වෙන අවස්ථාවේදී - ඒ පුද්ගලයාට අභියාචනාධිකරණයේ සභාපතිතුමාගේ වැටුප් තලය ලබා ගන්න අයිතියක් ලැබෙනවා. ප්‍රශ්නය ඒක නොවෙයි. අවුරුදු 20ක් නීතිපති දෙපාර්තමේන්තුවේ හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව යටතේ නඩුකාරවරයෙක් හැටියට හිටියාට අභියාචනාධිකරණයේ සභාපතිගේ ස්ථානයට එන්න බැහැ. රංග දිසානායක මහත්මයාට Court of Appeal Presidentගේ ස්ථානය දෙන ප්‍රශ්නයක් ගැන නොවෙයි මම මේ කථා කරන්නේ. නමුත් මෙතැනින් ලබා දෙන පණිවුඩය වැරැදියි. එම තනතුරේ සිටින පුද්ගලයාට වඩා ජ්‍යෙෂ්ඨ, අභියාචනාධිකරණයේ විනිසුරුවරුන්ට සහ ඔහුට වඩා ජ්‍යෙෂ්ඨ, මහාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට මෙතැනින් වැරදි පණිවුඩයක් යනවා. යම්කිසි විධියකින් එම තනතුරේ සිටි පුද්ගලයා නැවත එන අවස්ථාවේදී, නැවතත් අධිකරණ සේවා කොමිසමට ඔහුව ලබා ගන්නා අවස්ථාවක ඔහු අභියාචනාධිකරණයේ සභාපතිට සමාන තත්ත්වයට එනවා කියන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරතුමකු හා සමාන තත්ත්වයක් කියන එකයි. නීතිපති දෙපාර්තමේන්තුවෙන් අවුරුදු 20ක පළපුරුද්දක් ලබා ගත්තත් කවදාවත් ඒ තැනට යන්න බැහැ. මොකද ඒ තත්ත්වයට එන්න නම් නීතිපති දෙපාර්තමේන්තුවේ අවුරුදු ගණනක් ඉන්න ඕනෑ. Judge කෙනෙකු වෙන්නත් නීතිපති දෙපාර්තමේන්තුවේ අවුරුදු 5ක් ඉන්න ඕනෑ. ඉතින් අධිකරණ ක්ෂේත්‍රයේ අයට කවදාවත් ඒ වාගේ සුළු කාලයක් ඇතුළත ඒ ස්ථානය ගන්න බැහැ. ඒක ගැන පොඩ්ඩක් සැලකිලිමත් වුණොත් හොඳයි. ඒ හැරෙන්නට අපට මේ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
*නීති විරෝධීද?*

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
*නීති විරෝධියි කියලා නොවෙයි මම කියන්නේ.* There is an anomaly in placing those salary scales, for which we are not implicating you. It was done as far back as 2023. "To ensure the structure, the CIABOC Chairman, Commissioners and

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

Director General remain comparable to the President of the Court of Appeal." ඒක වැරදියි. There is an anomaly; there will be an issue. The Judges of the Court of Appeal, who are senior to the Director General of the Commission, must be wondering whether, when he comes, he would become the President of the Court of Appeal. So, please look into it. I have nothing personal against it. - *[Interruption.]* Yes, that has to be done. අභියාචනාධිකරණයේ විනිශ්චයකාරතුමාගේ පඩියට සමාන නම් හරි. ඒ ගැන ඔබතුමන්ලාට Management Services Department එකෙන් අහගන්න වෙනවා. Thank you. அடுத்து, மாண்புமிகு சனாதிபதி அவர்கள் கடந்த 3ஆம் திகதி இங்கு வந்து, உலகத்தில் நடக்கின்ற யுத்தம் பற்றி பேசும்போது, அமெரிக்காவும் மொஸாடும் சேர்ந்து ஈரானுக்கு அடித்தது பற்றி எந்தவொரு விடயத்தையும் சொல்லவில்லை. නමුත්, මම අද ස්තුතිවන්ත වන්න ඕනෑ, වසන්ත සමරසිංහ ඇමතිතුමාට. පළමුවරට ආණ්ඩුවේ ඇමතිවරයෙකු නැඟිටලා ඇමෙරිකාව සහ ඊශ්‍රායලය එකතු වෙලා ඉරානයට ගහපු නිසා යුද්ධය සිදු වුණා කියලා කියපු එකට මම ස්තුතිවන්ත වනවා. *[බාධා කිරීමක්]* පළමුවරට කිව්වේ. වෙනත් කවුරුවත් කිව්වේ නැහැ. ප්‍රතිපත්ති වෙනස් වුණා. හොඳයි. මම හිතනවා, ජනාධිපතිතුමා සිකුරාදා ඇවිල්ලා ඒක කියයි කියලා. ஏனெனில், இதில் முக்கியமான விடயமொன்று இருக்கின்றது. *[බාධා කිරීමක්]* කිව්වේ නැහැ. හැන්සාඩ් එක අරගෙන බලන්න. *[බාධා කිරීමක්]* එතුමා කොහේවත් කිව්වේ නැහැ. *[බාධා කිරීමක්]* உள்ளால் support மொஸாட்டுக்கு.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, நான் முக்கியமானதொரு விடயத்தைச் சொல்ல விழைகின்றேன். மாண்புமிகு சனாதிபதி அவர்களோ, வெளிநாட்டலுவல்களுக்குப் பொறுப்பான அமைச்சர் அவர்களோ, இந்த யுத்தமானது அமெரிக்காவும் மொஸாட்டும் சேர்ந்து சட்டவிரோதமாக ஈரானைத் தாக்கியதால் ஏற்பட்டது என்ற விடயம் தொடர்பில் ஒரு வசனமேனும் சொல்லவில்லை. இதன்போது ஈரானின் சட்டபூர்வ தலைவரைக் கொன்றார்கள். இந்த சூழ்நிலையிலே, நாளை நடைபெறவுள்ள இப்தார் வைபவத்துக்கு சனாதிபதி அவர்கள் எங்களுக்கு அழைப்பிதழ் கொடுத்திருக்கிறார். எங்களுடைய எதிர்ப்பைத் தெரிவிக்கும் வகையில், இந்த இப்தார் வைபவத்தைப் பகிஷ்கரிக்க வேண்டுமென நான் எதிர்க்கட்சியைச் சேர்ந்த முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களைக் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் வசந்த சமரசிங்ஹ அவர்களுக்கு நன்றி சொல்ல வேண்டும். ஏனெனில், அவர் குறைந்தபட்சம் இந்த யுத்தம் இப்படித்தான் நடந்ததெனச் சொல்லியிருந்தார். ஆனால், எனக்கு முன்னர் பேசிய முஸ்லிம் பாராளுமன்ற உறுப்பினராக இருக்கட்டும், வெளிநாட்டலுவல்களுக்குப் பொறுப்பான அமைச்சராக இருக்கட்டும், இங்கிருக்கின்ற ஆளும் கட்சிப் பாராளுமன்ற உறுப்பினர்களாக இருக்கட்டும்! இவர்கள் எவரும் இதுவரை, மொஸாட்டின் தேவைக்காக அமெரிக்க நடத்துகின்ற யுத்தத்தைக் கண்டித்து ஒரு வார்த்தை கூறவில்லை. அதுமாத்திரமல்ல, அதனால் கொல்லப்பட்ட ஈரான் நாட்டின் தலைவரின் மறைவுக்குத் தங்களது அனுதாபத்தைக்கூட தெரிவிக்கவில்லை.

අපි අනුකම්පාව ගැන පාර්ලිමේන්තුවේදී කියන්නේ නැහැ. අපි embassy එකට ගිහිල්ලා ලියන්නම් කිව්වා. ඇයි? Parliament එකේ ඒක කිව්වාම ප්‍රශ්නයක්ද? ඒ කියන්නේ, යටින් support එකක් දෙනවා, Mossad එකට. හැබැයි, දැන් ඔය ඔක්කෝම ඉවර වෙනවා. මොකද, இந்த யுத்தத்தில் ஈரான் 3,000 டொலர் பெறுமதியான ஒரு drone missileஐ ஏவும்பொழுது, அதைச் செயலிழக்கச் செய்வதற்கு 3-4 மில்லியன் டொலர் பெறுமதியுடைய Iron Domeஐ பயன்படுத்துகிறார்கள். எனவே, 3,000 டொலர் பெறுமதியான சாதாரண drone missile இஸ்ரேலில் விழுந்தாலும் நஷ்டம்; அந்த drone missileஐ Iron Dome ஊடாக அழித்தாலும் 3-4 மில்லியன் டொலர் இஸ்ரேலுக்கு நஷ்டம்! ஒரு தமிழ் படத்தில் ரஜனிகாந் சொல்வார், "ஒரு தரம் அடித்தால் நூறு தரம் அடித்த மாதிரி" என்று. அதுபோல்தான் ஈரான் அடித்தாலும். அதை மறந்துவிட வேண்டாம். ஈரானைப் பொறுத்தவரையில், இந்த யுத்தமானது வேண்டுமென்றே மொஸாடினால் திணிக்கப்பட்ட யுத்தமாகும்.

අපරාදේ, ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනතාව මේකට කැමැති නැහැ. Mossad එකේ ලණු ගිලලා ට්‍රම්ප් මහත්මයා ගෙන යන මේ යුද්ධයෙන් අපට මොකුත් වෙන්නේ නැහැ කියලා හිතාගෙන තමයි අපිත් හිටියේ. අවසාන වශයෙන් මම කියන්න ඕනෑ, ජනාධිපතිතුමාත් එහෙම තමයි කථා කළේ කියලා. දැනුයි ලෝකයට තේරිලා තිබෙන්නේ, "නැහැ, එහෙම නොවෙයි, ඒ ගහන හැම ගැහිල්ලකින්ම මේ ලෝකයේ සිටින සියලුදෙනාටම වේදනාවක් දැනෙනවා" කියලා. දැන් ඒක පිළිඅරගෙන තිබෙන නිසා අපි ඔක්කෝම එකතු වෙලා ප්‍රාර්ථනා කරමු, මේ යුද්ධය නවත්වන්න ලැබේවා කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

Order, please! අද දින විවාදයේ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

[අ.භා. 4.55]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විවාදයට බඳුන් කරන්නේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි තීරණය කිරීම සඳහා වන යෝජනාව පිළිබඳවයි. ඇත්තටම මේ කරුණු කාරණා ප්‍රධාන වශයෙන්ම අපේ ජන වරමත් එක්ක සම්බන්ධ වනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ප්‍රධානම කාර්යභාරය වන්නේ, අල්ලසෙන්, දූෂණයෙන් තොරව රාජ්‍යය පවත්වා ගෙන යන්න අවශ්‍ය ශක්තිය ලබා දෙන එකත්, ඒ වාගේම තමන්ට ලැබුණු බලය පාවිච්චි කරලා අල්ලස හෝ දූෂණය සිද්ධ කරලා තිබෙනවා නම්, ඒ අයට නිසියාකාරව දඬුවම් ලබා දීම මඟින් යහ පාලනයක් ස්ථාපිත කිරීමේ, යහපත් ආණ්ඩුකරණයක් ස්ථාපිත කර ගැනීමේ කාර්යයයි.

අපි කවුරුත් දන්නවා, ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට ලැබුණු ජන වරම වංචාවට, දූෂණයට විරෝධී ජන වරමක් බව. ඒ වාගේම වංචාව, දූෂණය පිළිබඳව විශාල කථා ගණනාවක් දේශපාලන ක්ෂේත්‍රයේ පැතිරුණා. ඒ වාගේම තිබුණු ආණ්ඩුව බිඳ වැටෙන්නත් බලපෑවේ ඒකයි. සමහර ආණ්ඩු පැවති කාලපරිච්ඡේදය පුරාම තිබුණේ වංචාව, දූෂණය. ඒ නිසාම අපට වගකීමක් පැවරුණා, ඒ වංචා, දූෂණ කරපු අය පිළිබඳව නිසියාකාරයෙන් පරීක්ෂණ කරලා නිසියාකාරයෙන් දඬුවම් ලබා දෙන්න.

දූෂණය කියන්නේ මොකක්ද? දූෂණය ප්‍රධාන වශයෙන් සම්බන්ධ වන්නේ බලයත් එක්ක. එය දේශපාලන බලය වෙන්න පුළුවන්, ආර්ථික බලය වෙන්න පුළුවන්, ව්‍යාපාරික බලය වෙන්න පුළුවන්, ඒ ලැබුණු බලය භාවිත කරලා පෞද්ගලික ප්‍රතිලාභ ලබා ගැනීමට උත්සාහ කිරීම තමයි දූෂණය කියන්නේ. එතකොට දූෂණය වංචාවක් ස්වරූපයෙන් වෙන්න පුළුවන්; විවිධ වූ ලිපිලේඛන වෙනස් කිරීම් හරහා වෙන්න පුළුවන්; තමන් භාරයේ තිබෙන වත්කම් සහ තමන්ට ලැබෙන වත්කම් දේශපාලන බලය යොදාගෙන පෞද්ගලික පරිහරණයට පවරා ගැනීම හරහා වෙන්න පුළුවන්. මේ වාගේ කතන්දර ගණනාවක් ලංකා ඉතිහාසයේ තිබෙනවා.

ඉතින් දූෂණය කියන කාරණය යහපත් රාජ්‍යයක් නිර්මාණය කිරීමට ලොකු ගැටලුවක් ඇති කරනවා. දූෂණය නිසා ආර්ථික වශයෙනුත් ඒ රටට ඉදිරියට යන්න බැහැ. දූෂණය පවතිනවා නම්, ඒ රටේ ආර්ථික වර්ධනයක් ඇති වන්නේත් නැහැ. දූෂණය පවතිනවා නම්, හැම තිස්සේම සමාජ අසමානතාවත් ඇති වනවා. අතීතයේ ආණ්ඩු කරපු අය පිළිබඳව විවිධ දූෂණ චෝදනා එල්ල වෙලා තිබෙනවා. මෙන්න මේ කියන කාරණා දෙක අරගෙන බැලුවොත්, දශක ගණනාවක් විවිධ වූ කරුණු යටතේ ආණ්ඩු කරගෙන ආවත්, ඇත්තටම ප්‍රමාණාත්මක ආර්ථික වර්ධනයක්, තිරසාර ආර්ථික වර්ධනයක්, මහජනතාව බද්ධ කර ගත් ආර්ථික වර්ධනයක් අත්පත් කර ගන්න බැරි වුණේ අන්න ඒ හේතු නිසාමයි. එතැන දූෂණය තිබුණු නිසායි. මේ කෙටි කාලය ඇතුළත -2025 වර්ෂය ඇතුළත- අපට පුළුවන් වුණා, තිරසර විධියට ආර්ථිකය ස්ථාවර කරලා හොඳ ආර්ථික වර්ධනයක් අත්පත් කරගන්න. ඒ ආර්ථික වර්ධනය ඉදිරියට අරගෙන යෑමත්, ආර්ථික වර්ධනය සියයට 7 ඉක්මවන දිශාවට ගෙන යෑමත් එකට ගැට ගැහිලා තිබෙනවා.

ඒ වාගේම දූෂණය විසින් සමාජ විෂමතා නිර්මාණය කරනවා, සමාජය අතර අසමානතා නිර්මාණය කරනවා. අපේ සමාජය ඇතුළේ ගම් දනව්වල ඉතා විශාල විධියට සමාජ අසමානතාව පැතිරිලා තිබෙනවා. මේ මොහොත වනකොටත් රටේ ජනගහනයෙන් සියයට 60ක්, 70ක් විතර අස්වැසුම වැඩසටහන යටතේ ආණ්ඩුව ලබා දෙන යම් මුදලක් මත යැපෙන තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ අතීතයේ ආණ්ඩු කරපු විධිය නිසායි. මම මේ කරුණු ඉදිරිපත් කළේ වංචාව, දූෂණය පිටුදකින්න ඕනෑය කියන කාරණය අපේ ජන වරමත් එක්ක ගැට ගැහිලා තිබෙන නිසායි. ඒ සඳහා මැදිහත්වීම තමයි අපි මේ කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දූෂණයේ තිබෙන ඊළඟ සංකීර්ණතාව මේකයි. දූෂණය තනි කාරණයක් නොවෙයි, ඒක වළල්ලක් විධියටයි ක්‍රියාත්මක වන්නේ. සමහර වෙලාවට අපරාධවලදීත් එහෙමයි. වළල්ලක් විධියට එය ක්‍රියාත්මක වනකොට ඒක මැඩ පැවැත්වීමේ ක්‍රියාමාර්ගත් ඉතාම ශක්තිමත්ව ගන්න ඕනෑ. සමහර දූෂණ පිළිබඳ චෝදනා -මහ බැංකුව හා සම්බන්ධ චෝදනා, පොහොර ගෙන්වීම පිළිබඳ චෝදනා, කිරි හරක් ගෙන්වීම පිළිබඳ චෝදනා- හරියට විශ්ලේෂණය කරලා බලනකොට දැනට තනි පුද්ගලයෙක් හෝ දෙදෙනෙක් උසාවියෙන් දඬුවම් ලබා හිරේ විලංගුවේ වැටිලා තිබෙන්න පුළුවන්. සමහර වෙලාවට ඒවාට සම්බන්ධ වෙච්ච, තවමත් හඳුනා නොගත් කණ්ඩායම් ජාලගත වෙලා network එකක් විධියට ඉන්නවා වෙන්නත් පුළුවන්. Network corruption එකක් තමයි බොහෝදුරට මෙතැන තිබෙන්නේ. එවැනි තත්ත්වයක් මර්දනය කරමින් යහපත් ආණ්ඩුකරණයක් කිරීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වාගේ ආයතනයක් ඉතාම වැදගත් වනවා. එවැනි ආයතනයක් අපි සවිබලගන්වන්නේ කොහොමද? එවැනි ආයතනයක් සවිබලගැන්වීම සඳහා ඒ ආයතනයට අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන්න ඕනෑ, ආයතන ව්‍යුහය සකස් කරන්න ඕනෑ. ඒ වාගේම නීති, අණ පනත් හරහා අවශ්‍ය නීතිමය රාමුව හදන්නත් ඕනෑ. මේ වනකොටත් අපේ ආණ්ඩුව යටතේ අල්ලස්, දූෂණ, අක්‍රමිකතා මර්දනය කිරීමට අවශ්‍ය නීති, පනත් කෙටුම්පත් ගණනාවක් සම්මත කරලා තිබෙනවා. ඉදිරියේදී තව පනත් කෙටුම්පත් ගණනාවක් එන්නත් නියමිතව තිබෙනවා. ඒ අනුව නීතිමය පැත්ත නිසියාකාරයෙන් සම්පාදනය වනවා.

ඒ වාගේම ආයතන ව්‍යුහය, යටිතල පහසුකම් ලබා දීම, මේ සඳහා තාක්ෂණය කැඳවීම අවශ්‍ය වනවා. අතීතයේ වංචාවක්, දූෂණයක් කරනවාට වඩා වර්තමානයේ සිදු කරන වංචා, දූෂණවල ස්වභාවය වෙනස් වෙලා තිබෙනවා. එම වංචා, දූෂණ හුදෙක් මුදල් ගනුදෙනුවකට, ලියවිල්ලක් එහාට මෙහාට කිරීමකට එහා ගිහින් තාක්ෂණයත් එක්ක සම්බන්ධ වෙලා තිබෙනවා. ඒ නිසා දූෂණ පිළිබඳව විමර්ශනය කිරීමට, අදාළ පුද්ගලයන්ට දඬුවම් දීමට, දූෂණ සිදුවීම වළක්වා ගැනීමට පරීක්ෂණ කළ හැකි සුවිශේෂී හැකියාවෙන් යුතු නිලධාරීන් විශාල ප්‍රමාණයක් අපට අවශ්‍ය කරනවා. ඒ නිලධාරීන් හුදෙක් නීතිමය කාරණයකට වඩා එහාට යනවා. එවැනි අයගේ සේවය ලබා ගැනීම සඳහා අපේ සාමාන්‍ය වැටුප් ව්‍යුහය, රාජ්‍ය සේවය පවත්වාගෙන යන කාර්යක්ෂම වැටුප් ව්‍යුහය ප්‍රමාණවත් නොවන්න ඉඩ තිබෙනවා. අන්න ඒ කරුණු කාරණා සැලකිල්ලට භාජන කරමින් තමයි අපි සුවිශේෂී ආකාරයකට ඔවුන්ගේ දීමනා, වැටුප් තල වෙනස් කිරීම සඳහා වූ තීන්දුවක් ගන්නේ.

ඒ අනුව මෙහි ප්‍රධාන වශයෙන් ජ්‍යෙෂ්ඨ තනතුරු දාලා තිබෙනවා. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ ජනරාල්, සහකාර අධ්‍යක්ෂ ජනරාල් කියලා ඉහළ කළමනාකරණ ක්ෂේත්‍රය තුළ තනතුරු තිබෙනවා.

විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුත් සඳහන් කළ පරිදි ඔවුන්ගේ වැටුප් තල සකස් කිරීමේදී මෙය නීති ක්ෂේත්‍රය හා සම්බන්ධ වන නිසා නීතිපති දෙපාර්තමේන්තුවේත්, Legal Draftsman's Department එකේත් පුද්ගලයන්ගේ වැටුප් හා සමාන මට්ටමකට ගෙන ඒමේ තිබෙන ගැටලු හා දුෂ්කරතා සැලකිල්ලට භාජන කරලා ඒ සඳහා අපි විශේෂ වූ දීමනාවක් යෝජනා කරලා තිබෙනවා. ඒක තමයි, දූෂණ විරෝධී අවදානම් දීමනාව. එම නිසා 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත ක්‍රියාත්මක කරනකොටම කළ යුතුව තිබූ සංශෝධන ටික කර ගන්න බැරි වුණා; ඒ සංශෝධන කරලා තිබුණේ නැහැ. දැන් අපට පුළුවන්කම ලැබී තිබෙනවා, එම සංශෝධන ගෙනැල්ලා, කලින් නිර්දේශ වෙලා තිබුණු දූෂණ විරෝධී අවදානම් දීමනාව සියයට 115කට වඩා වැඩි ප්‍රමාණයකින් වැඩි කරන්න. ඒ ආකාරයෙන් තමයි දූෂණ අවදානම දැරීම වෙනුවෙන්, ඔවුන් කරන ඒ කාර්යය වෙනුවෙන් ඒ ක්ෂේත්‍රයට ගෙවීමක් කරන්නේ. ඒ වාගේම ඔවුන්ගේ සුවිශේෂී හැකියාව වෙනුවෙනුත් විශේෂ ගෙවීමක් කරන්නට ඕනෑ. ඊට අමතරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරීන්, මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන් සමඟ සාකච්ඡා කරමින්, ඔවුන්ට ඒ වැඩ කටයුත්ත කරන්න අවශ්‍ය ශක්තිය ලබා ගන්න හැකි පරිදි අපි කටයුතු කර තිබෙනවා.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

විශේෂයෙන්ම අපි දන්නවා, සේවකයින් කොපමණ ප්‍රමාණයක් අවශ්‍යද කියන කාරණයේදීත්, සේවක සංඛ්‍යාව අනුමත කර ගැනීමේදී සහ ඔවුන්ගේ සේවා කොන්දේසි පිළිබඳ කටයුතුවලදීත් බොහෝ රාජ්‍ය ආයතන ගැටලුවලට මුහුණ දෙන බව. නමුත්, මෙම කාරණයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවත් මැදිහත් වෙලා සාකච්ඡා වට ගණනාවක් පවත්වා එම කොමිසමේ ඉල්ලීම ඉදිරිපත් කරමින් 971දෙනෙකු සේවයට යොදා ගැනීමට ඉතා කඩිනමින් අනුමැතිය ලබා දී තිබෙනවා වාගේම වැටුප් ව්‍යුහ වෙනස් කරලා තිබෙනවා. මේ කාර්යයේදී කාර්යාල කාර්ය සහායකගේ මට්ටමට පවා ඉහළ වැටුප් තල අපි යෝජනා කරලා තිබෙනවා.

ඒ වාගේම අද උදේ තවත් අදහසක් ඉදිරිපත් වුණා, මෙම කොමිෂන් සභාවේ සාමාජිකයින්, අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු නිලධාරි ව්‍යුහයේ -ධුරාවලියේ- ඉහළින්ම සිටින අයගේ වැටුප් තල, නීතිපති දෙපාර්තමේන්තුවේත්, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේත් නිලධාරින්ගේ වැටුපට තවමත් සමාන වෙන්නේ නැහැ කියලා. අපි ඒ සඳහා කරුණු ඉදිරිපත් කිරීමෙන් පසු දැන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යාංශය නිර්දේශ ඉදිරිපත් කරලා තිබෙනවා, ඔවුන්ගේ වැටුප් මට්ටමත් ඒ හා සමාන තත්ත්වයට ගෙන ඒමට. දැන් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සහ නිර්දේශ ඉදිරිපත් කරලා තිබෙනවා. ඉදිරියේදී එම නිර්දේශ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කිරීමට නියමිතයි. ඒ අනුව ඔවුන්ට තම සේවය ගෞරවාන්විතව, ස්වාධීනව කරගෙන යන්න අවශ්‍ය කරන වැටුප් ව්‍යුහයත් මේක තුළ සකස් කරලා තිබෙනවා. ඒ වාගේම, ඔවුන්ට අවශ්‍ය කරන දක්ෂතා සහිත අය බඳවා ගැනීමට ඉඩකඩ ලැබෙන ආකාරයේ වැටුප් ව්‍යුහයක් මේ මඟින් අපි යෝජනා කරලා තිබෙනවා. මේ වැටුප් ව්‍යුහය ඉදිරියේදී තවත් ප්‍රවර්ධනය කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

අපි දන්නවා, විශේෂයෙන්ම තාක්ෂණික ක්ෂේත්‍රය සම්බන්ධව සිදු වන දූෂණවල ස්වරූපය ඉතාම සංකීර්ණයි කියන එක. එම නිසා ඒ සඳහා ව්‍යවහාරික විගණනයක් - forensic audit - කිරීම, තාක්ෂණය යොදා ගෙන අදාළ පරීක්ෂණ කිරීම, ඒ සඳහා නීති කටයුතුවලට මැදිහත් වීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතු වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
කාලය අවසන්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ අනුව, අපේ ජන වරම බලගැන්වීම සඳහා අපි අද ඉදිරිපත් කර තිබෙන වැටුප් සංශෝධනය තුළින් ඉතාම සාධනීය පියවරක් තමයි අරගෙන තිබෙන්නේ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වැඩ කටයුතු කරගෙන යනකොට අනෙකුත් කාර්යයන්වලට සාපේක්ෂව එහි සේවකයන් රඳවා ගැනීමටත්, බඳවා ගැනීමටත්, මානව සම්පත දියුණු කිරීමටත් අවශ්‍ය උත්තේජනය මේ සංශෝධන හරහා ලබා දීලා තිබෙනවා.

ඒ වාගේම අද පාර්ලිමේන්තුවේදී පවත්වන සාකච්ඡාව තුළදී විශේෂයෙන්ම කරුණු ඉදිරිපත් වුණා, අද වනකොට ලෝක පරිමාණයෙන් ඇති වෙලා තිබෙන මේ අර්බුදකාරී තත්ත්වයේදී ආණ්ඩුව විධියට අපි මැදිහත් වුණේ නැහැ, සැලසුම් කළේ නැහැ කියලා. අපි හරියට අරගෙන බැලුවාම, අද වනකොට ඇති වෙලා තිබෙන තත්ත්වය ආණ්ඩුව තුළ තිබෙන කළමනාකරණයේ ප්‍රශ්නයක්වත්, රට අභ්‍යන්තරයේ ප්‍රශ්නයක්වත් නොවෙයි. එය බාහිර සාධකයක් නිසා ඇති වුණු තත්ත්වයක්. අපට අවශ්‍ය වුණේ 2025දී අත්පත් කර ගත් ස්ථාවරත්වය, ඒ කියන්නේ ඉතාම දුෂ්කර කොන්දේසි යටතේ අත්පත් කර ගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවත්, ගොඩනහා ගත් විදේශීය සංචිත ප්‍රමාණයත් අරගෙන මේ ආර්ථික වර්ධනය ඉදිරියට ගෙන යැමට බලපෑමක් නොවන පරිදි මෙම බාහිර සාධකයට මුහුණ දෙන්නයි. එම නිසා අවම බලපෑමක් සිදු වන පරිදි මේ තත්ත්වය මොහොතින් මොහොත කළමනාකරණය කරමින් තමයි අපි තීන්දු ගත්තේ. ඒ තීන්දු අදත් ගන්නවා, හෙටත් ගන්නවා. ඒ අනුව අපි උචිත විධියට කටයුතු සිදු කරනවා. මොකද, රට තුළ තිබෙන තෙල් සම්පත; ලබා ගෙන ඇති තෙල් සම්පත පරිපාලනය කර ගැනීමට අපට අවශ්‍යයි. මේ තත්ත්වය ආණ්ඩුව නිසි පරිදි කළමනාකරණය කරනවා. ඒ වාගේම ඉතාම සාමූහිකව කටයුතු කරන ලෙස මහජනතාවටත් යෝජනා කරනවා.

පැහැදිලිවම අපිට තෙල් ආනයනය කර ගන්න සිද්ධ වෙනවා. දැන් එයට බාධක පැන නැඟී තිබෙනවා. අපිට ඩොලර් පිළිබඳව කිසි ප්‍රශ්නයක් නැහැ. සැපයුම පිළිබඳ ප්‍රශ්නයක් තමයි තිබෙන්නේ. ඒ සැපයුම කළමනාකරණය කර ගන්නකොට, තෙල් පරිභෝජනයේදී අරපිරිමැස්මෙන් පාවිච්චි කරන්න ඔබටත් පුළුවන් නම් හොඳයි කියා අපි විශ්වාස කරනවා. ඒ නිසා අපි මේ කළමනාකරණ කාර්යය කිසිම ගැටලුවකින් තොරව සිදු කරන බව සඳහන් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

## සංවර්ධන නිලධාරින්ගේ වැටුප් ගැටලු විසඳීම
## அபிவிருத்தி உத்தியோகத்தர்களின் சம்பளப் பிரச்சினைகளுக்குத் தீர்வு காணல்
## RESOLUTION OF SALARY ISSUES OF DEVELOPMENT OFFICERS

[අ.භා. 5.08]

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ලක්ෂ 14කට ආසන්න රාජ්‍ය සේවකයින් ප්‍රමාණයක් රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අතර ඒ අතුරින් 125,000කට ආසන්න ප්‍රමාණයක් ආශ්‍රිත සේවාවන් නියෝජනය කරන සංවර්ධන නිලධාරින් ඇතුළු උපාධිධාරී නිලධාරින් වේ. 1994 සිට 2021 දක්වා රාජ්‍ය සේවයට බඳවා ගෙන ඇති උපාධිධාරින් 06/2006 වැටුප් චක්‍රලේඛය අනුව MN - 4 වැටුප් තලයට අයත් වුවත්, දශක කිහිපයක් පුරා පැවැති ආණ්ඩු විසින් එම නිලධාරින්ට හිමි විය යුතු මූලික අයිතිවාසිකම් පවා ලබා දීමට කටයුතු කර නොමැත.

මෙම නිලධාරින් සංවර්ධන නිලධාරි තනතුරට, MN - 4 වැටුප් තලය යටතේ III ශ්‍රේණියට බඳවා ගන්නා අතර වසර 20ක - 25ක සේවා කාලයක් අවසන්ව විශ්‍රාම යන මොහොත දක්වාම රාජ්‍ය සේවයට බැඳුණු තනතුර හා වැටුප් තලයේම පමණි. මුළු සේවා කාලය පුරා සේවයට බැඳුණු තනතුරත්, බැඳුණු වැටුප් තලයේම සේවයකොට අවසානයේ විශ්‍රාම ගැනීමට සිදු වන අතර එවන් තත්ත්වයට පත්ව ඇත්තේ සංවර්ධන නිලධාරින් ඇතුළු උපාධිධාරින් පමණි.

2016 වසරේ පැවති ආණ්ඩුව රාජ්‍ය සේවක විශ්‍රාම වැටුප් අහිමි කිරීමත් සමඟ 2016 වසරේ සිට රාජ්‍ය සේවයට එක් වුණු 75,000කට ආසන්න පිරිසකට පූර්ණ විශ්‍රාම වැටුප් හිමිකම අහිමි වුවත්, වත්මන් රජය එම හිමිකම නැවත ලබා දීම විශාල ජයග්‍රහණයක් මෙන්ම එම නිලධාරින්ට අස්වැසිල්ලකි.

සංවර්ධන නිලධාරින්ගේ වැටුප් තලය සහ උසස් වීම් සමඟ බැඳුණු ගැටලු හේතුවෙන් එම නිලධාරින් දැඩි වෘත්තීය අතෘප්තියකට සහ පීඩාවකට පත්ව ඇත.

මෙම කරුණු සැලකිල්ලට ගෙන සංවර්ධන නිලධාරින්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීමට සහ උසස්වීම් ඇතුළු අනෙකුත් වෘත්තීය ගැටලු කඩිනමින් විසඳීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව තුළින් අපි විශේෂයෙන්ම මේ කාරණාව ඉදිරිපත් කරන්න හේතුව මෙයයි. අද වනවිට රාජ්‍ය සේවය තුළ සේවකයින් විශාල ප්‍රමාණයක් සිටිනවා. එම රාජ්‍ය සේවකයින් දශක ගණනාවක් තිස්සේ මුහුණ දුන් යම් යම් වෘත්තීයමය ගැටලු, ප්‍රශ්න වත්මන් ආණ්ඩුව විසින් මේ වනවිට ක්‍රමානුකූලව විසඳමින් සිටිනවා. ගරු ජනාධිපතිතුමා ඇතුළු විෂය භාර අමාත්‍යවරුන් ඒ අයට යම් යම් විසඳුම් ලබා දෙමින් පවතින වටපිටාවක් තමයි මේ මොහොත වනවිට තිබෙන්නේ.

විශේෂයෙන්ම සමස්ත රාජ්‍ය සේවාව තුළත්, පළාත් රාජ්‍ය සේවාව තුළත් අසාධාරණයකට සහ වෘත්තීයමය පීඩාවකට ලක් වුණු කණ්ඩායම් තමයි 1994, 1999, 2005, 2008, 2016, 2018, 2019, 2020 සහ 2021 කියන වසරවල වරින් වර රාජ්‍ය සේවයට බඳවා ගත් උපාධිධාරින්. අද රාජ්‍ය සේවාව තුළත්, පළාත් රාජ්‍ය සේවාව තුළත් ඒ අය බරපතළ විධියට වෘත්තීයමය ගැටලු ගණනාවකට මුහුණ දී සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සඳහා පුංචි උදාහරණයක් දක්වන්න පුළුවන්. 1994 වසරේ බඳවා ගත් උපාධිධාරින්ගෙන් සියයට 80ක් පමණ අද වනවිට විශ්‍රාම ගිහින්. හැබැයි, 1994 වසරේ බඳවා ගත් ඒ උපාධිධාරින් විශ්‍රාම යන්නේත් එදා බඳවා ගත් III ශ්‍රේණියට අදාළ වැටුප් තලයට පමණක් හිමිකම් කියමින්මයි. මේ රටේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය අවසන් කර උපාධිධාරියෙක් විධියට -බාහිර හෝ අභ්‍යන්තර උපාධියක් සහිතව- එළියට එන අය රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ වැඩ පිළිවෙළ තුළ එවකට තිබුණු පරිපාලනමය අවිධිමත්භාවය නිසාත්, බරපතළ විෂමතා සහ ගැටලු නිසාත් ඒ උපාධිධාරින් රාජ්‍ය සේවාව තුළ බරපතළ අසාධාරණයකට සහ වෘත්තීයමය වශයෙන් අතෘප්තිමත්භාවයකට පත් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ කාරණය ගැන මේ ගරු පාර්ලිමේන්තුවේ අවධානය විශේෂයෙන්ම යොමු කළ යුතුව තිබෙනවා.

අපි දන්නවා, ඉතිහාසය තුළ සමස්ත රාජ්‍ය සේවකයන්ට විවිධ විෂමතා නිර්මාණය වෙලා තිබුණු බව. නමුත් වත්මන් ආණ්ඩුව වැඩ කරන ජනතාව සම්බන්ධ සංවේදී ආණ්ඩුවක් විධියට අද වනවිට එම ගැටලු ක්‍රමානුකූලව විසඳමින් පවතිනවා. හැබැයි, ඒ අතරේ මේ සංවර්ධන නිලධාරින් ඇතුළු ආශ්‍රිත සේවාවලට අදාළ උපාධිධාරින් ගත්තොත්, ඔවුන්ට අද උසස්වීම් පටිපාටියක් නැහැ. රාජ්‍ය සේවයේ 06/2006 වැටුප් චක්‍රලේඛය අනුව PL වැටුප් කාණ්ඩයට ඇතුළත් වෙන රාජ්‍ය සේවකයෙක් ගත්තොත්, තමන් බැඳුණු තනතුරට අතිරේකව ඔහුගේ සේවා කාලය ඇතුළේ MN 2, MN7 වැනි විවිධ උසස්වීම් පටිපාටිවලට ඇතුළත් වීමේ හැකියාව තිබෙනවා. රාජ්‍ය සේවාවේ සමස්තය තුළම ඒ වාගේ තිබෙනවා. PC මහත්මයෙක්, WPC නෝනා කෙනෙක් විධියට පොලීසියට බැඳුණොත් අඩුම ගණනේ විශ්‍රාම යාමේදී sergeant, sergeant major තනතුරුවල විශ්‍රාම යාමේ පටිපාටියක්, සාමාන්‍ය ක්‍රමවේදයක් තිබෙනවා. හැබැයි රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරියෙක් විධියට, ආශ්‍රිත සේවාවේ උපාධිධාරියෙක් විධියට බඳවා ගන්න කොට ඒ බඳවා ගන්න තනතුරෙන්ම තමයි වසර 20ක්, 25ක් සේවය කරලා විශ්‍රාම යන්න නියමිතව තිබෙන්නේ. ඉතිහාසයේ තිබුණේ එහෙමයි. ඒක වෙනස් කිරීම සඳහා අපට වගකීමක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම රාජ්‍ය සේවයේත්, පළාත් රාජ්‍ය සේවයේත් මේ MN 4 වැටුප් තලයට අයත් සියලු ආශ්‍රිත සේවා උපාධිධාරින්ට, සංවර්ධන නිලධාරින්ට මෙතෙක් - වසර 20ක් තිස්සේ - උසස්වීම් පටිපාටියක් තිබුණේ නැහැ. අපි විශේෂයෙන්ම MN 4 වැටුප් තලයේ ඉන්න උපාධිධාරින් MN 5 වැටුප් තලයට ඇතුළත් වෙන ආකාරය සම්බන්ධයෙන් පිළිගත් ක්‍රමවේදයක් සකස් කරන්න කියලා 2006 ඉඳලා වසර 20ක් තිස්සේ ඉල්ලීම් කළා. නමුත් ඒ ගෙවුණු වසර 19 ඇතුළතම පැවති ආණ්ඩු ඒවාට අවශ්‍ය කරන විසඳුම් ලබා දුන්නේ නැහැ. ඒ නිසා අද ඒ අය පීඩාවට ලක් වෙලා ඉන්නවා. ඒ නිසා අවශ්‍ය කරන උසස්වීම් පටිපාටියක් නිර්මාණය විය යුතුව තිබෙනවා.

වැටුප් විෂමතාව සම්බන්ධයෙන් වැටුප් කොමිසමක් ස්ථාපිත කිරීම පිළිබඳව ගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට යෝජනාවක් කළා. ඒ යෝජනාව අනුව ස්ථාපිත වෙන්න නියමිත වැටුප් කොමිසම ඇතුළේ රාජ්‍ය සේවයේ වැටුප් විෂමතා විසඳෙද්දී, ඒ වැටුප් විෂමතාවට විසඳුමක් ලැබෙනවා කියලා අපි විශ්වාස

[ගරු චන්දන සූරියආරච්චි මහතා]

කරනවා. හැබැයි අද රාජ්‍ය සේවයේ මේ ආශ්‍රිත සේවා උපාධිධාරීන් ගත්තොත්, මේ උසස්වීම් පටිපාටිය ගැන වාගේම වෘත්තීමය වශයෙන් ඉටු කළ යුතු රාජකාරිය මොකක්ද කියාත් ඔවුන්ට නිශ්චිත පැහැදිලිකමක් නැහැ. අවශ්‍ය නම් පිළිගැනීමේ කවුන්ටරයේ රාජකාරියේ යොදවනවා, එහෙම නැත්නම් ගබඩා භාරකාර රාජකාරියේ යොදවනවා, එහෙම නැත්නම් මුදල් අයකැමි රාජකාරියේ යොදවනවා, එහෙමත් නැත්නම් ලිපිකරු හා සමාන්තර රාජකාරිවල යොදවනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ කාරණා පිළිබඳව සැලකිලිමත් වෙලා සමස්ත රාජ්‍ය සේවයේත්, පළාත් රාජ්‍ය සේවයේත් ඉන්න ආශ්‍රිත සේවාවලට අයත් සංවර්ධන නිලධාරීන් ඇතුළු උපාධිධාරීන්ට අනෙක් සේවාවලට අගතියක් නොවන පරිදි, ඒ රාජ්‍ය සේවකයන්ගේ අයිතිවාසිකම් සුරකින, ශක්තිමත් කරන වටපිටාවක රජය කටයුතු කරමින් තිබෙන මොහොතක, මෙන්න මේ වෘත්තීමය කාරණා පිළිබඳ පිළිගත් විද්‍යාත්මක, නිවැරදි විසඳුම් කරා ආ යුතුයි කියන යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු අජන්ත ගම්මැද්දෙගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.16]

**ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1994 සිට 2021 දක්වා රාජ්‍ය සේවයට බඳවා ගත් සංවර්ධන නිලධාරීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම සහ උසස් ක්‍රමවේදයක් සැකසීම හා වෘත්තීය ගැටලු කඩිනමින් විසඳිය යුතු යැයි අපේ චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මේ අවස්ථාවේදී මා ස්ථිර කරනවා.

ඇත්තටම මේ සම්බන්ධව අදහස් දක්වන්න ලැබීමත් මම භාග්‍යයක් කොට සලකනවා. මොකද, මම පාර්ලිමේන්තුවට එන්නට කලින් සංවර්ධන නිලධාරීන් වෙනුවෙන් වෘත්තීය සමිති හරහා යම් කාර්යභාරයක් කරපු කෙනෙක්. විශේෂයෙන්ම ගරු චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමා ඇතුළු අපි සියලුදෙනා 1994න් පස්සේ මේ බඳවා ගත්ත සියලුම සංවර්ධන නිලධාරීන් - යම් යම් අවස්ථාවල බඳවා ගත්ත සියලු සංවර්ධන නිලධාරීන් - වෙනුවෙන් පාර්ලිමේන්තු ක්‍රියාවලියෙන් පිට, එළියේ ඉඳන් යම් කාර්යභාරයක් සිදු කළා, පසුගිය දශක කිහිපය ඇතුළේ.

සාමාන්‍යයෙන් ගත්තාම, මේ රටේ සමස්ත රාජ්‍ය සේවයම හොඳ මට්ටමක නැහැ කියලා අපි දන්නවා. රාජ්‍ය සේවයේ අනෙක් හැම කෙනෙක්ම තමන්ගේ කාර්යභාරයන් කිරීමේදී ඉතාම හොඳ තෘප්තිමත්භාවයක නැහැ කියාත් අපි දන්නවා. එහි එක කොටසක් තමයි මේ සංවර්ධන නිලධාරීන්. සංවර්ධන නිලධාරීන්ට තිබෙන මේ ගැටලු පිළිබඳව මුළුමහත් සමාජයම ඒ වාගේම රාජ්‍ය සේවය ඇතුළේ ඉන්න හැම කෙනෙක්ම ඕනෑවටත් වඩා වැඩියෙන් දන්නවා. මම හිතන විධියට, ඔවුන්ට තිබෙන මේ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම සඳහා විශේෂයෙන්ම අපේ ආණ්ඩුව ඉතාම සාධනීය මැදිහත්වීමක් මේ වෙනකොටත් කරමින් සිටිනවා. ඒ පිළිබඳ විශේෂයෙන්ම මේ ගරු සභාවේ අවධානය යොමු කරවනවා.

සංවර්ධන නිලධාරීන් කියන්නේ, මේ රටේ නිදහස් අධ්‍යාපනයෙන් විශ්වවිද්‍යාලය දක්වා අධ්‍යාපනය ලබලා, විශ්වවිද්‍යාල අධ්‍යාපනය නිම කරලා රාජ්‍ය සේවයට එකතු වුණු පිරිසක්. සංවර්ධන නිලධාරීන් විශාල පිරිසක් ඉන්නවා. ඒ පිරිස මේ රටේ නිදහස් අධ්‍යාපනයේ උපරිම ඵල නෙළා ගත් කොටසක්. හැබැයි, ගරු චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමා කිව්වා වාගේ, සංවර්ධන නිලධාරීන් කියන්නේ, උසස්වීම් ක්‍රියා පටිපාටියක් නැතුව, තමන්ගේ රැකියා ජීවිතයෙන් ඉස්සරහට යන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් අදහසක් නැතුව, රාජ්‍ය සේවයේ එක තැන පල් වෙමින් වැඩ කරන කොටසක්. එම නිසා අපි ඒ පිරිස පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. එසේ විශේෂ අවධානයක් යොමු කරලා, ඒ අය වෙනුවෙන් මැදිහත් වෙලා MN 4 වැටුප් තලයේ ඉඳලා MN 5 වැටුප් තලයට ගෙන එන ගමන් උසස්වීමේ පටිපාටියක් ද සකස් කරන්න ඕනෑ. අපි දන්නවා, එම නිලධාරීන්ට අධීක්ෂණ සංවර්ධන නිලධාරි, පරිපාලන සංවර්ධන නිලධාරි යනාදි වශයෙන් ඒ path එකේ උඩට යන්න පුළුවන් විධියට අවශ්‍ය මැදිහත් වීම් කරන්න කියලා මීට කලින් සමහර අවස්ථාවලදී සමාජයේ යෝජනා වුණු බව. ඒකට අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. ඒ සාකච්ඡාවත් එක්ක තමයි මේ යෝජනාව අද මේ ගරු සභාවට ඉදිරිපත් වන්නේ.

මෙම යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේ විශේෂයෙන්ම කියන්න ඕනෑ, සමස්ත රාජ්‍ය සේවය සම්බන්ධයෙන් වර්තමාන ආණ්ඩුව ඉතා සාධනීය විධියට වැඩ කටයුතු කරමින් ඉන්න බව. රාජ්‍ය සේවය සක්‍රියව ක්‍රියාත්මක කර ගැනීම සඳහා සංවර්ධන නිලධාරීන් වාගේම මේ රටේ සමස්ත රාජ්‍ය සේවකයන් වෙනුවෙන් අපි අපේ පැත්තෙන් අවශ්‍ය මැදිහත්වීම් කරමින් ඉන්නවා. ඒ නිසා තමයි පසුගිය අවුරුදු දෙකේදීම ඉදිරිපත් කළ අය වැය තුළින් රාජ්‍ය සේවකයින් බලාපොරොත්තු නොවුණු විධියට වැටුප් වැඩි කරන්න අපට පුළුවන් වුණේ. ඒ වැටුප් වැඩි කිරීම් හැම රාජ්‍ය සේවකයෙකුටම ලැබුණා. සමහර ශ්‍රේණිවල තිබුණු ගැටලු, සමහර නිලධාරීන්ට තිබුණු ගැටලු විසඳන්න අවශ්‍ය මැදිහත්වීම් ද අපි කළා. ඒ වාගේම මේ අවස්ථාව වනකොට සංවර්ධන නිලධාරීන්ට තිබෙන ගැටලු කෙරෙහිත් ගරු ඇමතිතුමාගේ සහ මේ ගරු සභාවේ අවධානය මා යොමු කරවනවා. එම ගැටලු විසඳීම වෙනුවෙන් මැදිහත් වන සියලුදෙනාට ප්‍රණාමය පුද කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[5.20 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Hon. Presiding Member, I would like to thank the Hon. Chandana Sooriyaarachchi for moving this Motion. I also have a moral duty to speak about the Development Officers since a number of times, those Officers had met me, seeking some legal and judicial remedies, which I could not give them. Now that the Hon. Member has brought this matter up, I thought that I have a moral duty to say a few words about them.

Sir, I have seen these people. සංවර්ධන නිලධාරින් ඇවිල්ලා තමන්ගේ සේවා ප්‍රශ්න ගැන කථා කරන කොට ඇඬෙන තරම් දුකක් තමයි දැනෙන්නේ. ඇත්ත වශයෙන්ම, එය ඉතා ඛේදනීය තත්ත්වයක්. මොකද ඒ අය හිතනවා, 'පෙර කරපු පවකට තමයි අපි ඒ තනතුරට බැඳුණේ, අධිකරණයට ගිය හැම අවස්ථාවකම ඒ අධිකරණ ක්‍රියාවලි හැම එකක්ම අපි පැරදුණා' කියලා. පරදින්න හේතුව, අධිකරණයේ වරදක් නොවෙයි. ඒ කාලයේ පැවැති රජයට වැරදි කියන එකත් හරිද කියලා මට තේරෙන්නේ නැහැ. පොඩ්ඩක් හිතලා බලලා නීත්‍යනුකූලව එම බඳවා ගැනීමේ කටයුතු කරන්නේ නැතුව හදිසි වෙලා, on impulse, "අපි ඉක්මනටම graduatesලා ටික DOsලා විධියට බඳවා ගනිමු" කියලා ඒ අය බඳවා ගත්තු එකත් මේ ගැටලුවට හේතුවක්. ඒ අයත් එම තනතුර පැනලා භාර ගත්තා. හැබැයි සමහර තැන්වල ඒ සංවර්ධන නිලධාරියාගේ යාළුවෝ, අයියා, මල්ලි ආදි අය උපාධිධාරි වෙනත් පත්වීම් - appointments - අරගෙන සංවර්ධන නිලධාරියාට වඩා හොඳ මට්ටමක ඉන්නවා. එකම ගෙදර ඉන්න ඒ දෙදෙනාගෙන් සංවර්ධන නිලධාරි නොවන කෙනාට හොඳ වැටුප් scale එකක් ලැබෙනවා; service Minute එකක් තිබෙනවා.

සංවර්ධන නිලධාරි පත්වීම් ලබපු ගැහැනු ළමයි ගොඩක් ඉන්නවා. ඒ අය පත්වීම් ලබපු මුල් අවස්ථාවේ ගෙදර ගිහිල්ලා ඇඬුවා. මොකද, රාජකාරියට ගිය මුල් දවස්වල ඒගොල්ලන්ට වාඩි වෙන්න පුටුවක්වත් දීලා නැහැ. ඒ අය unskilled labourersලා නොවෙයි නේ. ඒවා උපාධිධාරි පත්වීම්. ඒ සමහර අයට diplomas තිබුණා. ඒ අය විශේෂයෙන්ම තරුණ, තරුණියන්; පුහුණුව ලත්, මේ රටට මහා වැඩ කොටසක් ඉටු කළ හැකි මානව සම්පතක්. ඇයි ඒ මානව සම්පත නිසි පරිදි පාවිච්චි නොකරන්නේ?

ගරු චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමනි, ඔබතුමා ගෙන ආපු මේ යෝජනාව ඉතාම හොඳ යෝජනාවක්. කාලය ගත වුණත් කමක් නැහැ, අද කොහොම හරි රෑදී ඉඳලා මේ යෝජනාව ගැන කථා කරන්න ඕනෑ කියලා මා කල්පනා කළේ ඒ නිසායි. ගරු ඇමතිතුමනි, බැරිද ඒ අයට ආවේණික වූ නීති පද්ධතියක් හදන්න? ඕනෑ නම් මටත් පුළුවන් යම්කිසි දායකත්වයක් ලබා දෙන්න. එහෙම නොවුණොත් මේක මහා පවක්. එය මේ රටටත් හරි නැහැ. ඒ වාගේම එය මහත් අසාධාරණයක්. Actually, they are just doing routine work; they have been assigned routine work and they idle without proper duties. Qualifications අනුව responsibilities මෙලෝ දෙයක් ඉටු කරන්න නැහැ. ඒගොල්ලන්ට clear Service Minute එකක් නැහැ; structural career path එකක් නැහැ; meaningful promotion scheme එකක් නැහැ; proper grading system එකක් නැහැ. අන්තිමට, ඒ මිනිස්සුන්ට අනාගතයක් නැහැ. ඒ අය නැත්තටම නැති කරලායි තිබෙන්නේ.

ඉතින් ඔබතුමන්ලාගේ මෙච්චර ප්‍රබල ආණ්ඩුවේ මන්ත්‍රීවරු 159දෙනෙක් ඉන්නවා. ජනාධිපතිතුමාත් ඉන්නවා. අයියෝ! ඒ සංවර්ධන නිලධාරින්, ගුරුවරුන් තමන්ගේ ප්‍රශ්න කථා කරන්න ගිහිල්ලා වෙච්ච අකරතැබ්බය මතකද? යන්තම් ජනාධිපතිතුමා මොනවා හෝ කථා කළාම ඒ මිනිස්සු ඒක භාර අරගෙන ගියා. මෙතැන තිබෙන්නේ මානුෂීය ප්‍රශ්නයක්. මට ඒක හොඳටම තේරෙනවා. මොකද, මා පෞද්ගලිකවම දන්නා, සංවර්ධන නිලධාරි තනතුර දරන අය සිටින පවුල් කිහිපයක් තිබෙනවා. ඇත්තටම ඒ මිනිසුන්ගේ ජීවිතයේ ඒ අයට සිදු වන මේ අවනම්බුව දැක්කාම දුක හිතෙනවා. ඒගොල්ලෝ ඇවිල්ලා ඒ කාලයේ වාගේ මගෙන් අහනවා, "මන්ත්‍රීතුමාට බැරිද අර staff එකට මාව දාලා දෙන්න? මේක මහා අවනම්බුවක්. මේකෙන් මෙලෝ දෙයක් කර ගන්න බැහැ" කියලා. තමන්ට කියලා ලැබුණු රැකියාවේ තමන්ගේ රාජකාරිය පිළිබඳව පැහැදිලි අවබෝධයක් නැති, අනාගතයක් නැති පිරිසක් බවට ඒ අය පත් කරපු එකට හැමෝම වග කියන්න ඕනෑ. ඒ මිනිස්සුත් හදිසි වෙලා එම තනතුර භාර ගත්තා. ඒ තනතුරට හරියාකාරව බඳවා ගැනීම කරන්න අවශ්‍ය නීති පද්ධතිය හදලා තිබුණේත් නැහැ. මම දැන් නම් ඔබතුමන්ලාගෙන් ඉතාම බැගෑපත්ව ඉල්ලා සිටින්නේ, යම්කිසි නීත්‍යනුකූල රාමුවක් තුළ ඒ අය absorb කර ගන්න විධික්‍රමයක් හදන්න කියලායි. නීතිපතිගෙන් ද උපදෙස් ලබා ගන්න.

මේ Development Officers සම්බන්ධයෙන්, ගුරු වෘත්තිය සම්බන්ධයෙන් තිබුණු ප්‍රශ්නය පිළිබඳව නීතිමය වශයෙන් සාකච්ඡා කරලා තිබෙනවා. ඕනෑ නම්, මටත් පුළුවන් දායකත්වයක් ලබා දෙන්නම්. නීති පද්ධතියක් තුළ ඔවුන්ට යම්කිසි විධියකින් අවම සාධාරණයක්, the bare minimum justification හෝ ඉටු කරන්න ඕනෑ. ඒ කියන්නේ මේකයි. ඉල්ලන හැම දෙයක්ම දෙන්න බැරි වුණත් කමක් නැහැ. ඒගොල්ලන්ට මේ සමාජය ඉදිරියේ සාධාරණයක් ඉටු වන විධියට කටයුතු කරන්න. මොකද, ඒගොල්ලන් කරපු වරදක් නැහැ. ඒගොල්ලන් graduate වෙලා තමයි එම රැකියාව ලබා ගත්තේ. ඒ නිසා ඒ අයට සාධාරණයක් කරන්න කියා ඉල්ලා සිටිමින්, මේ යෝජනාව ගෙන ආ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[පි.ව. 5.25]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்றைய தினம் கௌரவ சந்தன சூரியஆரச்சி அவர்கள் கொண்டுவந்து இருக்கின்ற ஒத்திவைப்புப் பிரேரணை மிகவும் பிரயோசனமானது. 2016ஆம் ஆண்டுக்குப் பிறகு நியமிக்கப்பட்ட அபிவிருத்தி உத்தியோகத்தர்களை முறையான கட்டமைப்புக்குள் கொண்டுவர வேண்டுமென்ற நோக்கிலே அவர் இந்த ஒத்திவைப்புப் பிரேரணையைக் கொண்டுவந்திருக்கிறார். இது தொடர்பில் சற்று ஆழமான விடயங்களைக் கூற வேண்டுமென நினைக்கின்றேன்.

பல்கலைக்கழகம் சென்று pass outஆகி வெளியில் வந்தால் வாழ்க்கையில் தங்களது சொந்தக்காலில் நிற்கலாம் என்ற நம்பிக்கை பல்கலைக்கழகத்துக்குச் செல்கின்ற ஒவ்வொரு மாணவனுக்கும் இருக்கின்றது. ஆனால், இலங்கையில் பல்கலைக்கழகங்களில் மருத்துவம், பொறியியல், சட்டம் ஆகிய துறைகளில் பட்டம்பெற்று வெளியேறுகின்றவர்களைத் தவிர வணிகம், Arts, Science போன்ற துறைகளில் பட்டம்பெற்று வெளியேறுகின்றவர்களுக்கு pass out பண்ணுவது என்பது மிகப் பெரிய தலையிடியாக இருக்கின்றது. அவர்கள் என்றைக்கு pass out பண்ணுகிறார்களோ, அன்றிலிருந்து “எங்கே வேலை? Government job கிடைத்து விட்டதா? ” என்ற கேள்விகள்தான் அவர்களிடம் மிக முக்கியமாகக் கேட்கப்படுகின்றன.

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

2016இல் ஆட்சியிலிருந்த அரசாங்கம் அந்த நேரத்திலிருந்த நெருக்கடிகளைச் சமாளிப்பதற்காக 'அபிவிருத்தி உத்தியோகத்தர்' என்ற பதவியை உருவாக்கி பட்டதாரிகளுக்கு வழங்கியது. கௌரவ நிசாம் காரியப்பர் அவர்கள் சொன்னது போன்று, இந்தப் பதவி தொடர்பில் எந்தவொரு job description உம் இல்லை. அதாவது, அபிவிருத்தி உத்தியோகத்தர்கள் என்ன வேலை செய்ய வேண்டும், அவர்களுடைய SL standards என்ன, அவர்களுடைய scheme என்ன, அவர்கள் promotion போகலாமா போன்ற விடயங்கள் இல்லை. சாதாரணமாக நாங்கள் வைத்தியராவதற்குப் படிக்கும்போது, post-graduate படிக்கலாம் என்ற நம்பிக்கை இருக்கும். அதேபோல், lawyer ஒருவர் LLBஇனை முடித்துவிட்டு LLM செய்யக்கூடியதாக இருக்கும். ஆனால், இந்த அபிவிருத்தி உத்தியோகத்தர்களுக்கு அப்படியான வாய்ப்பு இல்லை. 2019ஆம் ஆண்டில் இருந்து 2024ஆம் ஆண்டு வரையான காலப்பகுதியில் நியமனம் பெற்ற அபிவிருத்தி உத்தியோகத்தர்கள் இன்றுவரை அதே நிலையில்தான் இருக்கிறார்கள். சிலர் அபிவிருத்தி உத்தியோகத்தர் நியமனத்தைப் பெற்றுக்கொண்டு, 5 வருடங்களுக்கும் மேல் ஆசிரியராக வேலைசெய்து இருக்கிறார்கள். அவர்கள் எந்த நம்பிக்கையில் இந்த அரச சேவைக்குள் வந்தார்களோ, அந்த நம்பிக்கை இப்போது இல்லாமல் போயிருக்கிறது.

இதேபோன்றுதான் சுதேச மருத்துவப் பட்டதாரிகளின் நிலையும்! கிட்டத்தட்ட 10,000 சுதேச மருத்துவ பட்டதாரிகள் இற்றைவரைக்கும் தங்களது எதிர்காலம் என்னவென்று தெரியாமல் இருக்கிறார்கள். தமது பெயருக்கு முன்னால் இருக்கும் "Mr.", "Miss"ஐ "Dr." என்று மாற்றக்கூடிய ஒரு பட்டத்தை எடுத்த பிறகும்கூட, அபிவிருத்தி உத்தியோகத்தர்களாக வேலை செய்கின்ற நிலைமை ஏற்பட்டிருக்கிறது. NPP அரசாங்கம் ஆட்சிக்கு வருவதற்கு முன்னர், நாங்கள் சொன்ன விடயம் என்னவெனில், இது 76 வருடங்களாக இந்த நாட்டை ஆட்சி செய்தவர்கள் செய்த அநியாயம் என்றுதான். நீங்கள் ஆட்சிக்கு வந்து இப்போது ஒன்றரை வருடங்களாகின்றது. ஒன்றரை வருடங்களுக்குப் பிறகுதான், அபிவிருத்தி உத்தியோகத்தர்களுக்கென சட்டவரையறை ஒன்றை வகுத்து, அவர்களை define பண்ண வேண்டுமென்ற விடயத்தைக் கொண்டுவந்து இருக்கிறீர்கள். உண்மையிலேயே நான் சந்தோஷப்பட்டேன். இன்று நான் 5.30 மணி வரைக்கும் இருந்து கதைப்பதற்கு முக்கியமான காரணம், இதுவொரு முக்கியமான விடயம் என்பதனால்தான்.

சுதேச வைத்தியத்துறையில் பட்டப்படிப்பை முடித்துவிட்டு pass outஆகி வருகின்றவர்களுக்கு அபிவிருத்தி உத்தியோகத்தர் பதவிதான் கொடுக்கப்படுகின்றது. அவர்கள் சில நேரங்களில் ஆரம்பப் பாடசாலைகளில் கற்பிக்கின்ற நிலைமை காணப்படுகின்றது. சுதேச வைத்தியத்துறையில் பட்டம்பெற்று pass outஆகின்ற ஒருவர், A/L மாணவர்களுக்கு giology, chemistry, physics ஆகிய மூன்று பாடங்களில் ஒரு பாடத்தையாவது கற்பிக்க முடியாத வகையில், நீங்கள் ஆட்சிக்கு வந்தபிறகு சட்ட ஏற்பாடு கொண்டுவரப்பட்டு இருக்கின்றது. அதாவது, சுதேச வைத்தியம் பயின்றவர்கள் A/Lக்கு Bioஐக்கூட படிப்பிக்க முடியாதுள்ளது. அதாவது, A/L Bio teachersஇன் தகைமைகளுக்குள் சுதேச வைத்தியத்துறையில் pass out ஆகியவர்களை நீங்கள் உள்வாங்கவில்லை என்பதை நினைக்கும்போது சரியான கவலையாக இருக்கின்றது.

இன்னுமொரு விடயத்தைப் பார்க்க வேண்டும். அண்மைய தினங்களில் அபிவிருத்தி உத்தியோகத்தர்கள் சாகும் வரை உண்ணாவிரதப் போராட்டத்தை மேற்கொண்டிருந்தார்கள். 2021-2024 வரைக்கும் அதிபர்களாகத் தெரிவு செய்யப்பட்டவர்களில் 1,500 பேருக்கு மட்டுமே appointments வழங்கப்பட்டுள்ளது. Pass marksஐத் தாண்டிய எத்தனையோ பேருக்கு இன்று வரைக்கும் நியமனங்கள் வழங்கப்படவில்லை. அது மட்டுமல்ல, Library Assistants பற்றியும் சொல்ல வேண்டும். அதுபற்றி முல்லைத்தீவு, கிளிநொச்சி, யாழ்ப்பாணம் ஆகிய மாவட்டங்களிலிருந்து எனக்கு முறைப்பாடுகள் கிடைத்துக்கொண்டு இருக்கின்றன. 10 வருடங்களுக்கும் மேலாக Library Assistants பதவிக்கான vacanciesஐ fill பண்ணப்படவில்லை.

மேலும், திருகோணமலை, மட்டக்களப்பு ஆகிய மாவட்டங்களில் சம்பந்தப்பட்ட திணைக்களங்களில் இருக்கின்ற குறைகேள் அதிகாரிகள் 20-25 வருடங்களாகப் பணியாற்றுகின்றார்கள். அறுபது வயதில் retire பண்ண வேண்டிய இவர்கள் semi-government என்ற படியால் 70-75 வயது வரை அந்தத் திணைக்களங்களில் வேலை செய்கின்ற நிலைமை இருக்கின்றது. அதைவிட சரியான கவலை என்னவென்றால், இந்த அபிவிருத்தி உத்தியோகத்தர்களுக்கு முறையான increment இல்லை. சாதாரணமாக ஒரு வைத்தியராக appointment கிடைத்தால், 3 வருட probation periodஐ முடிக்க வேண்டும். பின்னர், முதலாவது increment இரண்டாவது increment, மூன்றாவது incrementஐப் பெற முடியும். மேலும், E-code exam எழுதி, சித்தியடைந்தால், சுகாதாரத் துறையில் permanent அரச வைத்தியர்களாக வரலாம். ஆனால், இந்த அபிவிருத்தி உத்தியோகத்தர்களுக்கு முறையான increment இல்லை. இவர்களிடத்தில் எந்தவொரு நம்பிக்கையும் இல்லை. இன்றைக்கு ஒரு bike உடனும் ஒரு bag உடனும் petrol shedஇல் நிற்பவர்களைப் பார்த்தால், அது இந்த அபிவிருத்தி உத்தியோத்தர்களாகத்தான் இருப்பார்கள்.

சில பாடசாலைகளில் வேலை செய்கின்ற அபிவிருத்தி உத்தியோகத்தர்களைப் பார்த்தீர்கள் என்று சொன்னால், அவர்களுடைய appointment 'அபிவிருத்தி உத்தியோகத்தர்' என்றிருந்தும் teacherஆக வேலை செய்கின்றபடியால், பி.ப 2.00 மணிக்குப் பாடசாலை முடிவடைந்த பிறகுகூட மாலை 4.15 மணி வரை காத்திருந்து sign பண்ணி செல்ல வேண்டிய நிலை இருக்கின்றது. ஆகவே, அரசாங்கம் வார்த்தைகளில் மட்டுமல்லாது, அபிவிருத்தி உத்தியோகத்தர்கள், சுதேச வைத்தியர்கள் போன்ற அரச ஊழியர்களுடைய படிநிலை தொடர்பான விடயங்களை சட்டமூலமாக பாராளுமன்றத்துக்குக் கொண்டுவர வேண்டுமென்று நான் விரும்புகின்றேன். அதேநேரத்தில், மாகாண சபை முறைமை நடைமுறைக்கு வருகின்ற சந்தர்ப்பத்தில், அதன் வரம்புகளுக்குள்ளே இந்தப் பிரச்சினைகளுக்குத் தீர்வு காணலாம் என்று நான் நினைக்கின்றேன். அந்த வகையில், மகாண சபைத் தேர்தலை நாங்கள் எதிர்பார்க்கின்றோம். இந்தச் சிறப்பான ஒத்திவைப்பு வேளைப் பிரேரணையைக் கொண்டுவந்த கௌரவ சந்தன சூரியஆரச்சி அவர்களுக்கு மனமார்ந்த நன்றிகள்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු ඒ.එච්.එම්.එච්. අබයරත්න අමාත්‍යතුමා. ඔබතුමාට පිළිතුරු කථාව සඳහා විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.32]

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු වන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමා විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද ඉතාම කාලෝචිත මේ යෝජනාව පිළිබඳව අදහසක් ඉදිරිපත් කරන්න මම කැමැතියි.

උපාධිධාරීන්ගේ රැකියා වියුක්තියට පිළියමක් ලෙස පැවති එක් එක් රජයන් විසින් 1994 සිට 2022 දක්වා රැකියා විරහිත උපාධිධාරීන් රාජ්‍ය සේවයට බඳවා ගැනීම සිදු කරන ලද අතර, විවිධ විෂය ක්ෂේත්‍රවල උපාධිධාරීන් ඒ අතර වෙනවා. 1994 සිට 2010 දක්වා බඳවා ගත් ආශ්‍රිත සේවා නිලධාරීන් අතුරින් සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරන ලද නිලධාරීන් 2011 අගෝස්තු 01වන දින සිට සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය කිරීම සිදු කරනු ලැබුවා. සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාව තුළ III, II සහ I ලෙස ශ්‍රේණි ක්‍රමයක් පවතින අතර, අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන්ට පිළිවෙළින් II සහ I ශ්‍රේණිවලට උසස් වීමේ හැකියාව පවතිනවා. ඉහත බඳවා ගැනීම් සිදු කරන ලද්දේ ඒ වනවිට රාජ්‍ය සේවයේ පැවති පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කරගෙන නොවන අතර, එම බඳවා ගැනීම් හේතුවෙන් රාජ්‍ය සේවයේ අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා යෑම සිදුව ඇත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පුරප්පාඩු සංඛ්‍යාව පදනම් නොකරගෙන බඳවා ගැනීම් නිසා ඇත්තටම විවිධ ක්ෂේත්‍රවල විශේෂඥයන් බවට, විශිෂ්ට වෘත්තිකයන් බවට පත් වීමට හිටපු උපාධිධාරීන්ට ඒ අවස්ථාව අහිමි වූ බවත් පැහැදිලිවම පෙනෙන්න තිබෙනවා. ඒක අනෙකුත් වෘත්තීන්වල මේ වනවිට ඇති වෙලා තිබෙන යම් යම් තත්ත්වයන්ට වගකිව යුතු මූලික කාරණය හැටියට තිබෙනවා. අපේ රජය ඉදිරි බඳවා ගැනීම්වලදී - විශේෂයෙන් උපාධිධාරීන් බඳවා ගැනීමේදී- අදාළ පුරප්පාඩුවලට පමණක්ම උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා තීරණයක් ගත්තේ මෙන්න මේ කියන තත්ත්වය වළක්වා ගැනීමට කියන කාරණයත් මේ අවස්ථාවේදී සඳහන් කළ යුතු වෙනවා.

රාජ්‍ය සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් හා ආශ්‍රිත සේවා නිලධාරීන්හට මේ වනවිට ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවය ඇතුළු දීප ව්‍යාප්ත සේවා සඳහා සීමිත පදනමින් ඇතුළත් වීමේ හැකියාව පවතිනවා. මේ වනවිට උක්ත සේවා සඳහා සංවර්ධන නිලධාරීන්ගෙන් සැලකිය යුතු පිරිසක් ඇතුළත්ව තිබෙනවා. ඒ වාගේම ඒ ඒ විෂය ක්ෂේත්‍රවල ප්‍රවීණත්වයක් ලබාගත් සංවර්ධන නිලධාරීන්හට දෙපාර්තමේන්තුගත මට්ටමින් මාණ්ඩලික සහ විධායක තනතුරුවලට සීමිත පදනමින් ඇතුළත් වීමේ හැකියාව ද මේ වනවිට පවතිනවා. එම පුරප්පාඩු සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව බඳවා ගැනීම් සම්බන්ධ කටයුතු ද මේ වනවිට සිදු කරමින් පවතිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණත්වයක් ලබා ඇති සංවර්ධන නිලධාරීන් එම උපාධියට අදාළ ආයතනවලට අනුයුක්ත කිරීම මඟින් ඵලදායී ලෙස රැකියාගත කිරීම සිදු කළ හැකි අතර, ඒ සම්බන්ධ කටයුතු ද මේ වනවිට සිදු කරමින් පවතිනවා. එසේ අනුයුක්ත කරන ලද ආයතනවල අදාළ සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව දෙපාර්තමේන්තු සහ මාණ්ඩලික නිලධාරි තනතුරු සඳහා ඒ ඒ බඳවා ගැනීම් පටිපාටිවල සුදුසුකම් අනුව උක්ත නිලධාරීන්ට අයදුම් කිරීමේ හැකියාව පවතිනවා.

සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්හට සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව අදාළ සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සංවර්ධන නිලධාරි සේවයේ I ශ්‍රේණියට උසස්වීමේ හැකියාව පවතින අතර, මේ වනවිට සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන් සංවර්ධන නිලධාරි සේවයේ I ශ්‍රේණියට උසස් කිරීමට කටයුතු කරලා තිබෙනවා. අන්තර්ග්‍රහණයට මනාපය පළ නොකරන ලද බහුතරයක් නිලධාරීන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2012 ප්‍රකාරව උසස්වීම් පටිපාටි සකසා තිබෙනවා. ඒ අනුව එම නිලධාරීන්ට ද උසස්වීමේ හැකියාව පවතිනවා.

ඉහත සඳහන් කළ කරුණු අනුව වෙනත් තනතුරු සඳහා පත් වූ සංවර්ධන නිලධාරීන්හට MN 04 වැටුප් පරිමාණයට ඉහළ වැටුප් පරිමාණයක් හිමි වෙනවා. එසේම, රාජ්‍ය සේවයේ වැටුප් පිළිබඳ තීරණ ගනු ලබන්නේ විධිමත් නෛතික රාමුවලට අදාළව වැටුප් කොමිෂන් සභාව මඟින් වන අතර, ඒ ඒ සේවාවල රාජකාරි ස්වභාවය අනුව වැටුප තීරණය වේ. කොහොම වුණත්, ගරු වන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාවේ දැක්වෙන ආකාරයට මේ වන විට මෙකී නිලධාරීන්ට බලපාන ප්‍රශ්න විසඳීම සඳහා රජය කටයුතු කරමින් ඉන්නවා, විශේෂයෙන්ම පසුගිය අය වැය යෝජනාවේ දී ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද වැටුප් කොමිෂන් සභාව සහ විශ්‍රාම වැටුප් කොමිෂන් සභාව. වැටුප් කොමිෂන් සභාවට දැනට සේවයේ නියුතු මේ නිලධාරීන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීමේ ඉඩකඩ තිබෙන බව අපි දකිනවා.

අවසන් වශයෙන්, මේ ඉදිරිපත් කර තිබෙන යෝජනාවේ ගැටලු පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් දශක ගණනක් තිස්සේ නොවිසඳී පවතින මේ නිලධාරීන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වශයෙනුත්, රජය වශයෙනුත් මැදිහත් වන බව මා සඳහන් කරන්න කැමැතියි.

ස්තූතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.38ට, අද දින සභා සම්මතිය අනුව, 2026 මාර්තු 19වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.38க்கு, பாராளுமன்றம் அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க, 2026 மார்ச் 19, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.38 p.m. until 9.30 a.m. on Thursday, 19th March, 2026, pursuant to the Resolution of Parliament of this Day.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් අංක 1849/2026 දරන ප්‍රශ්නයට පිළිතුර දීමට අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මහතා සති තුනක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு அஜித் பி. பெரேரா அவர்களால் கேட்கப்பட்ட, இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 1849/2026ஆம் இலக்க வினாவுக்கு விடையளிப்பதற்கு, நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார அவர்கள் மூன்று வார கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. Harshana Nanayakkara, Minister of Justice and National Integration has requested for three weeks' time to reply to Question No. 1849/2026 raised by the Hon. Ajith P. Perera appearing in today's Order Paper.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau at the Department of Government Information, No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.